| (*c*) *Boards 1″ & over in thickness :* | *Under 9″ in width* | *9″ & over upto 12″ in width* | *12″ & over up to 15″ in width* | *16″ & over in width* |
|---|---|---|---|---|
| Class I | 14.30 | 14.90 | 16.20 | 16.80 |
| Class II | 10.10 | 10.60 | 11.60 | 12.10 |
| Class III | 8.80 | 9.20 | 10.10 | 10.50 |
| (*d*) *Boards under 1″ in thickness :* | | | | |
| Class I | 14.80 | 15.50 | 16.80 | 17.50 |
| Class II | 10.60 | 11.10 | 12.10 | 12.70 |
| Class III | 9.20 | 9.60 | 10.50 | 11.00 |

D. *Boosa Depot*

| *Logs* | *Under 16′ in length* | *16′ & over up to 20′ in length* | *20′ & over in length* |
|---|---|---|---|
| (*a*) *Logs under 5′ in girth :* | | | |
| Class I | 7.50 | 8.10 | 8.40 |
| Class II | 4.50 | 5.00 | 5.20 |
| Class III | 3.70 | 4.10 | 4.30 |
| (*b*) *Logs over 5′ in girth :* | | | |
| Class I | 8.50 | 9.10 | 9.40 |
| Class II | 5.00 | 5.30 | 5.70 |
| Class III | 4.20 | 4.60 | 4.90 |

*Sawn Timber*

| (*a*) *Scantlings 16″ & under in perimeter :* | *Under 9′ in length* | *Under 16′ in length* | *16′ & over up to 20′ in length* | *20′ & over in length* |
|---|---|---|---|---|
| Class I | 12.60 | 13.20 | 14.40 | 14.90 |
| Class II | 8.70 | 9.20 | 10.10 | 10.60 |
| Class III | 7.50 | 7.90 | 8.70 | 9.10 |
| (*b*) *Scantlings 16″ & over in perimeter :* | | | | |
| Class I | 13.80 | 14.40 | 15.70 | 16.40 |
| Class II | 9.60 | 10.10 | 11.20 | 11.70 |
| Class III | 8.30 | 8.70 | 9.60 | 10.00 |

| (*c*) *Boards 1″ & over in thickness :* | *Under 9″ in width* | *9″ & over up to 12″ in width* | *12″ & over up to 15″ in width* | *15″ & over in width* |
|---|---|---|---|---|
| Class I | 14.80 | 15.40 | 16.70 | 17.30 |
| Class II | 9.60 | 10.10 | 11.10 | 11.60 |
| Class III | 8.30 | 8.70 | 9.60 | 10.00 |
| (*d*) *Boards under 1″ in thickness :* | | | | |
| Class I | 15.30 | 16.00 | 17.30 | 18.00 |
| Class II | 10.10 | 10.60 | 11.60 | 12.20 |
| Class III | 8.70 | 9.10 | 10.00 | 10.50 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

E. *Prices of other categories will be on the following basis at all central Conversion Depots and Sales Depot :—*

*Sleepers*

| | |
|---|---|
| Broad Gauge | Rs. 30.00 |
| Narrow gauge | Rs. 15.00 |
| Broad Gauge rejections | Rs. 15.00 |
| Narrow Gauge rejections | Rs. 7.50 |

*Reepers*

| | | |
|---|---|---|
| Hardwoods | 2″×1″ | = /08 cts. per lft. |
| | 2″×½″ | = /06 cts. per lft. |
| Softwood | 2″×1″ | = /06 cts. per lft. |
| | 2″×½″ | = /04 cts. per lft. |
| Halmilla | 2″×1″ | = /12 cts. per lft. |
| | 2″×½″ | = /09 cts. per lft. |
| Teak | 2″×1″ | = /18 cts. per lft. |

## Annexure "B"

### CLASSIFICATION OF TIMBER AS FROM 1.7.69 FOR PURPOSE OF SALE

*Special Class.*

Calamander, Ebony, Mahogany (narrow leaved), Nedun, Satin Flowered or Streaked, Tamarind flowered, Hulanhik, Jak, Margosa, Suriyamara, Teak and Halmilla logs 3′.0″ and over in girth, Plain Satin 4′.6″ and over in girth.

*Class I—Preferred species.*

Gammalu, Milla, Palu, Mahogany (broad leaved), Ranai, Plain Satin below 4′ 6″ in girth, Tawenna, Kirihambiliya, Uva Mendora, Munamal, Ubberiya, Kolon.

*Class II—Durable species.*

All Duns other than Thiniya Dun, all Keena other than Walu Keena, Alubo, Acacia Melanoxylon, Del, Dawata, Dawul-Kurundu, Eucalyptus species, Godapara, Halmundora, Hedawaka, Helamba, Hora, Kon, Kumbuk, Ketakala, Liyan, Mendora, Mi, Na, Neralu, Panamora, Pihimbiya, Wa, Wanami, Welang, Welipenna, Cypress, Toona, Panakka, Mihiriya, Kiriya, Madan, Dambu, Karaw, Panu-Dun, Rathatiya.

*Class III—Utility.*

All species not otherwise classified.

IN TERMS OF THIS CLASSIFICATION SALE RATES APPLICABLE TO SPECIAL CLASS TIMBER ARE AS FOLLOWS :

*Special Class* (all depots including Colombo and Boossa)

A. *Logs*

| | | |
|---|---|---|
| 1. | Calamander, Ebony, mottled Satin, Flowered & Streaked, Tamarind flowered, Teak 3′ and over in girth (Teak under 3″ in girth will be classified as Cl. I) | Will be sold from K. V. Yard only and rates will be fixed from time to time |
| 2. | Ebony Plain | |
| | Logs 3′ and over in girth .. .. | Rs. 15 per c. ft. |
| | Logs under 3′ in girth .. .. | Rs. 13 per c. ft. |
| 3. | Mahogany (narrow leaved) Nedun, Hulanhik, Plain Satin, Margosa, Jak and Suriyamara | (*a*) Logs 4′.6″ and over in girth, Rs. 15 per c. ft.<br>(*b*) Logs below 4′.6″ in girth (except Satin which will be sold at Cl. I at Rs. 10 per c. ft. |
| 4. | Halmilla .. .. .. | Logs 3′ and over in girth at Rs. 9 per c. ft. (Under 3′ in girth will be classified as Cl. I) |

*Sawn Timber Species*

*Rate per cubic foot*

| | Boards below 9″ width & Scantlings of any size<br>Rs. c. | | Boards 9″ & up and below 12″ width<br>Rs. c. | | Boards 12″ and up & below 15″ width<br>Rs. c. | | Boards 15″ and over in width<br>Rs. c. |
|---|---|---|---|---|---|---|---|
| Nedun, Narrow leaved, Mahogany, Flowered Tamarind, Hulanhik, Jak, Margosa, Suriyamara .. | 17 50 | .. | 18 40 | .. | 20 20 | .. | 26 70 |
| Teak .. .. | 15 90 | .. | 16 70 | .. | 21 70 | .. | 23 90 |
| Ebony .. .. | 20 60 | .. | 21 70 | .. | 23 90 | .. | 25 0 |
| Halmilla .. .. | 15 90 | .. | 16 70 | .. | 18 60 | .. | 19 40 |

No special rates are applicable to logs below 3′ in girth in Class I and II species. They should be sold at the rates presently applicable to logs over 3′ in girth.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## විසර්ජන පනත් කෙටුම්පත, 1969-70

ஒதுக்கீட்டு மசோதா, 1969-70

## APPROPRIATION BILL, 1969-70

**කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [අගෝස්තු 2.]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."**—[ගරු ඩූ. බී. වන්නිනායක.]

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

ஓகஸ்ட் 2 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

" மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப் படுமாக " [கௌரவ யூ. பி. வன்னிநாயக்க].

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question*—[*2nd August.*]

"That the Bill be now read a Second time."—[*The Hon. Wanninayake.*]

*Question again proposed.*

පූ. භා. 10.6

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)

(*திரு. பி. எச். பண்டார—பதுளை*)

(Mr. B. H. Bandara—Badulla)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ පස්වෙනි අයවැය විවාදයට සහභාගි වන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. දැන් දවස් 4 ක් තිස්සේ මෙය විවාදයට භාජනය වෙමින් පවතිනවා. මේ රටේ ජනතාව තුළ ලොකු බලාපොරොත්තුවක් තිබුණා, මෙදා පොවේවත් දැවෙමින් තිබෙන ප්‍රශ්න සෑහෙන තරමකින්වත් නිරාකරණයවෙයි කියා. එහෙත් මේ රටේ සාමාන්‍ය ජනතාවට වැදගත් දෙයක් මේ අයවැය ලේඛනයේ සඳහන් වී නොතිබීම නිසා අද ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වී ගොස් තිබෙනවා. මෙයින් රජයේ සේවකයන්ගේ, කම්කරුවන්ගේ ගොවීන්ගේ නැත්නම් ගැමි ජනතාවගේ බලාපොරොත්තු කිසිවක් ඉෂ්ට වෙලා නැහැ. රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීමක් ගැන එක පැත්තකින් සඳහන් වී තිබුණත්, අනික් පැත්තෙන් සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන භාණ්ඩ රාශියක බදු වැඩි කිරීමෙන්, පිරිවැටුම් බද්ද වැඩි කිරීමෙන් වැඩි වන පඩිය ආපසු හොරාගන්න තත්ත්වයක් මුදල් ඇමතිතුමාගේ කථාවෙන් පෙනී යනවා. මේ අය වැය ලේඛනය අනුව සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන භාණ්ඩ රාශියක මිළ වැඩි වෙනවා. භාණ්ඩ රාශියක පිරිවැටුම් බද්ද සියයට 10 සිට 20 දක්වා වැඩි කර තිබෙනවා. මේ නිසා සිගරැට් එකක මිළ ශතයකින් වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, දවසට සිගරට් පැකට් තුනක් බොන කෙනෙකුට ශත 30 ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙනවා.

එපමණක් නොවෙයි, වායු සමීකරණ යන්ත්‍ර, සුවඳ විලවුන් වර්ග, හිස ආලේප කරන තෙල් හා දත් බෙහෙත් හැර කොණ්ඩා සැරසිලි හා ප්‍රසාදන ද්‍රව්‍යවලටත්—සාමාන්‍යයෙන් මෙම සුඛෝපභෝගී ද්‍රව්‍ය පෝසත් උදවියයි පාවිච්චි කරන්නෙ. —පින්තාරු තීන්ත ඉවත් කරණයන්, තිනර්, වාර්නිස්, ලැකර් හා ෆ්‍රෙන්ච් පොලිස් ද ඇතුළු ඩිස්ටැම්පර්, එමල්ෂන්, ඉනැමල්, ලැකර් හා තෙල් සායම් වර්ග, භූමිතෙල් උදුන්, රේඩියෝ යන්ත්‍ර උපකරණ, අනුයුක්ත කොටස් හා අමතර කොටස්, අමිශ්‍ර කපු රෙදිපිළි හැර අනෙකුත් රෙදිපිළි, මළ නොබැඳෙන වානේ භාණ්ඩ, යනාදි ද්‍රව්‍යවලට සියයට විස්ස දක්වා බදු වැඩි කර තිබෙනවා. ඒ හැර ඇලුමිනියම්, පිත්තල හා ඉනැමල් භාජන, චොකලට් හැර අනෙකුත් රස කැවිලි,. විදුලි පංකා සඳහා පිරිවැටුම් බද්ද සියයට 15 දක්වා වැඩි කර තිබෙනවා.

මේ අන්දමට මහජනතාව එදිනෙදා පාවිච්චි කරන ද්‍රව්‍ය සඳහාත් පිරිවැටුම් බද්ද වැඩි කිරීම නිසා සාමාන්‍ය ජනතාව සෑහෙන අමාරුවකට වැටෙනවා. විශේෂයෙන්ම පාරිභෝගික ද්‍රව්‍ය සඳහා පිරිවැටුම් බද්ද වැඩි කිරීමෙන් පාරිභෝගිකයන් අමාරුවේ වැටෙන බව සඳහන් කළ යුතුයි. තීන්ත වර්ගවල මිල වැඩි වීමෙන්, ගොඩනැගිලි උපකරණ මිල වැඩි වීමෙන් නිවාස සාදා ගන්නට උත්සාහ කරන අය අමාරුවේ වැටෙනවා. එම නිසා මේ රටේ ජනතාව බලාපොරොත්තු වූ සහනයන මෙම අයවැය ලේඛනයෙන් ඉටු වී නැහැ. එසේ වුණත්, විදේශීය ධනපතියන්ට සහනයක් මෙම අයවැය ලේඛනයෙන් සලසා දී තිබෙනවා. අප රට විදේශිකයන් සතු තේ වතුවලින්, බැංකුවලින්, වෙනත් ව්‍යාපාරවලින් ලැබෙන ලාභය, පොලී මුදල් පිටරට ගෙන යාමේ තහනම මෙවර ඉවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර තිබෙනවා. ඒ අඳුමට තහනම ඉවත් කිරීමෙන් විශාල සහනයක් විදේශීය ධනපතියන්ට සලසා දී තිබෙනවා. විදේශීය ධනපතියන්ට ඒ අන්දමට සහනයන් සලසා දුන් මුදල් ඇමතිතුමා, මේ රටේ සාමාන්‍ය ජනතාවට සලසා දී ඇති සහනය කුමක්දැයි එතුමාගෙන් ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, 1965 මේ රජය බලයට පැමිණෙන විට කීවා, ආණ්ඩුව නවම බලයට පත් වුණා පමණයි, ළමයකු උපන් හැටියේම දණගාන්නෙ නැත, එනිසා ටිකක් කල් ඕනෑ කරනවාය කියා. මේ 1969 අවුරුද්දයි, රජයේ කාල සීමා වේ අවසාන අවුරුද්දයි. ඊළඟ මහා මැතිවරණයකට සූදානම් වන මේ අවස්ථාවේදී ඒ ගැන රජය කියන්නේ මොනවාදැයි දැනගන්න කැමතියි. ඇත්ත වශයෙන්ම ජනතාව බලාපොරොත්තු වුණා, ඊළඟ මහා මැතිවරණයකට මුහුණ දෙන නිසා ජනතාව තුළ එක්තරා විශ්වාසයක් තිබුණා, මෙම අයවැය ලේඛනයෙන් යම් යම් පහසුකම්, සහනයන්, සලසා දේවිය කියා. නමුත් ජනතාවගේ ඒ බලාපොරොත්තු කිසිවක් දැන් ඉටු වී නැහැ.

ගරු කථානායකතුමනි, අපි මේ රටේ දැවෙන ප්‍රශ්න එකින් එක ගෙන සලකා බලමු. රැකීරක්ෂා ප්‍රශ්නය, ජීවන වියදම ඉහළ යාමේ ප්‍රශ්නය, අධ්‍යාපන ප්‍රශ්නය, ලෙඩ දුකින් මිදීමේ ප්‍රශ්නය වැනි දැවෙන ප්‍රශ්න ගණනාවක් මේ රටේ තිබෙනවා. මේ රජයේ 5 වැනි අය වැය ලේඛනයත් ඉදිරිපත් කර තිබෙන මේ අවසථාවේදී මා අහන්නට කැමතියි, මේ ප්‍රශ්න සම්බන්ධයෙන් මේ රජය කොයි තරම් දුරට පිළියම් යොදා තිබෙනවාද කියා.

අපි පළමුවෙන්ම අධ්‍යාපන ප්‍රශ්නය ගැන සලකා බලමු. අධ්‍යාපන ප්‍රශ්නය දෙස බලන විට පෙනෙනවා, මේ රටේ දුප්පත් දරුවන්ට අනාගතයක් නැති වන අන්දමේ වැඩ පිළිවෙළක් අද සකස් වී තිබෙන බව. කොළඹ වගේ උසස් පාඨශාලා රාශියක් නැති අපේ ගම්බද ප්‍රදේශවල, අධ්‍යාපන ඇමතිතුමාගේ පාසල් ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙල නිසා සිදු වී තිබෙන අමාරුව සුළු කොට සලකන්නට බැහැ. අද කණිෂ්ඨ විද්‍යාලයක 7 වැනි පන්තිය සමත් වූ ළමයකුට තව දුරටත් ඒ විද්‍යාලයේම ඉගෙන ගන්නට බැහැ. ඒ සඳහා ඔහු හැතැප්ම 18, 20—සමහරවිට ඊටත් වඩා—දුර ගෙවා මහා විද්‍යාලයකට යන්නට ඕනෑ. දවසකට රුපියල් දෙකක්, තුනක් උපයන සාමාන්‍යය ගැමියකුට, සමහර විට ඒ මුදල වත් දිනපතා නොලැබෙන සාමාන්‍යය ගැමියකුට පුළුවන්කමක් නැහැ, දිනපතා බස් ගාස්තු ගෙවා හැතැප්ම 18, 20, 25 ඈත ප්‍රදේශයක මහා විද්‍යාලයකට තමන්ගේ දරුවා යවන්නට. තමන්ගේ එක දරුවකු වෙනුවෙන් දිනකට රු. 1.50ක් 2.00ක් බස් ගාස්තු වියදම් කරන්නට ඒ දුප්පත් දෙමව්පියන්ට බැහැ. බස් ගාස්තු සඳහා පමණක් නොවෙයි, ඔහුට වියදම් වන්නේ. නගරයේ තිබෙන මහා විද්‍යාලයකට තමන්ගේ දරුවා යවන විට ඒ විද්‍යාලයේ සිටින අනික් දරුවන්ගේ ඇඳුම් පැළඳුම්වල තත්ත්වයට තම දරුවාගේත් ඇඳුම් පැළඳුම් සකස් කරන්නට ඔහුට සිදු වෙනවා. ඒ නිසා අද ගම්බද බොහෝ දරුවන්ගේ ඉගෙනීම 7 වැනි පන්තිය දක්වා පමණක් සීමා වී තිබෙනවා. මා මේ කියන්නේ සම්පූර්ණ සත්‍යයක්. දුප්පත් ගම්බද දෙමව්පියන්ට බස් ගාස්තු සහ වෙනත් වියදම් දරා තමන්ගේ දරුවා මහා විද්‍යාලයකට යැවීමට බැරි නිසා හත පාස් කළ පසු ඒ දරුවන්ට හත වැදී ගෙදරම නවතින්නට සිදු වී තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා මේ ගැන නොදන්නවා වෙන්නට පුළුවන්. එතුමා ජීවත් වන්නේ වෙනත් ලෝකයකයි. දුප්පත් දෙමව්පියන්ගේ දරුවන් ඉගෙනීම ලබන්නේ කෙසේද කියා එතුමා දන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, 1956 ට පෙර තිබුණු තැනට මේ රට නැවතත් ගෙන යන්නට ලැස්ති වන බව අපට පෙනෙනවා. 1956 ට පෙර මේ රටේ උසස් අධ්‍යාපනය ලැබීමේ වරප්‍රසාදය තිබුණේ ධනපති දෙමව්පියන්ගේ දරුවන්ට පමණයි. අනියම් මාර්ගයකින්, අයුතු මාර්ගයකින් මේ රජය දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට හතෙන් එහාට යන්නට ඉඩ නොදී නුඹලා ඔතැනම නවතින්නට ඕනෑය කියා ඇණවීමක් කර තිබෙන බව පෙනෙනවා. ඒ නිසා ඒ දරුවන්ගේ අධ්‍යාපනය හත දක්වා පමණක් සීමා වී තිබෙනවා. මෙය, පන්ති භේදය ආරක්ෂා කිරීමට—තමන් කැමති අයට පමණක් 1956 ට පෙර තිබුණු වරප්‍රසාදය ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

දීමට—යොදන ලද වැඩ පිළිවෙළක් වශයෙන් සලකන්නට පුළුවන්. මේක ඉතා භයානක තත්ත්වයක්. මේ රටේ සෑම දරුවකුටම එක හා සමාන අධ්‍යාපනයක් ලැබී මේ වරප්‍රසාදය තියෙන්නට ඕනෑ.

මා මේ විස්තර කළේ සම්පූර්ණ සත්‍ය සිද්ධියක්. ගම්බද ප්‍රදේශවල බොහෝ තැන්වල හත පාස් කළ දුප්පත් දරුවන්ට ගෙදර නැවතී සිටීමට සිදු වී තිබෙනවා. මා දන්නවා මගේ කොට්ඨාශයේ සෑහෙන සංඛ්‍යාවක් අද පාසැල්වලට නොයන බව. ළමයින් පාසැල්වලට යවන්නට දෙමව්පියන්ට පුළුවන්කමක් නැහැ. දෙමව්පියන් අපත් සමග කියනවා බස් ගාස්තු ගෙවන්නට බැරිකම නිසා ළමයි පාසැල් යවන්න පුළුවන්කමක් නැහැ කියා. අධ්‍යාපන ඇමතිතුමාට නම් ඒ අයගේ අමාරුව නොතේරෙනවා වෙන්න ඇති. අපි කොයි පැත්තේ සිටියත් මේ රටේ ගම්බද දරුවන්ගේ අධ්‍යාපනය කාබාසිනියා කරන්නට ඉඩ දෙන්න බැහැ. මේ රටේ තිබෙන නිදහස් අධ්‍යාපනය හැම කෙනෙකුටම එක හා සමානව ලැබෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. එසේ නොකළොත් එය ජාතික අපරාධයක්. අද පාසැල් ගුරුවරුන්ට උගන්වන්නට වෙලාවක් නැහැ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ ඡන්ද කොට්ඨාශයේ වුණත් ඒ තත්ත්වය පවතින බව තමුන්නාන්සේට පෙනෙනවා ඇති. ගුරුවරුන්ගේ කාලය මිඩංගු කරන්නට සිදු වී තිබෙන්නේ ඉගැන්වීමේ කටයුතුවලට නොවෙයි වෙනත් කටයුතුවලටයි. ගුරුවරුන්ට සිදු වී තිබෙන්නේ ටිකට් විකුණන්නයි. එක ගුරුවරයෙක් සියවස ටිකට් 50 ක් ගන්නම ඕනෑ. එක ළමයෙක් ටිකට් 2ක් ගන්නම ඕනෑ. ගුරුවරයාට දෙන ටිකට් 50 විකුණුවේ නැත්නම් ගුරුවරයා රුපියල් 50ක් ගෙවන්නට ඕනෑ. ගුරුවරු තමන් බේරෙන්නට ළමයින්ට ටිකට් දෙනව. ඒ ළමයින්ට ටිකට් විකුණා ගන්නට බැරි වූ විට ඔවුන් පාසැලට එන්නේ නැහැ. පාසැලට නොඑනවා පමණක් නොවෙයි ගෙදරිනුත් පැනලා යනවා. මේක විශාල අපරාධයක්. පාසැල් තිබෙන්නේ ටිකට් විකුණන්න නොවෙයි, ළමයින්ට උගන්වන්නයි. එහෙත් අද ගුරුවරුන්ට සිදු වී තිබෙන්නේ ලොතරැයි ටිකට් විකුණ විකුණා ඉන්නයි. මේ නිසා අධ්‍යාපනයට සම්පූර්ණයෙන්ම පහර වැදී තිබෙනවා. එපමණක් නොවෙයි දැන් මාස ගණනාවක් තිස්සේ සූදානම් වෙනව සියවස ප්‍රදර්ශනයට. මගේ කොට්ඨාශයේ සියවස ප්‍රදර්ශන ගණනාවකටම යන්නට මටත් සිදුවුණා. ගුරුවරු කියනවා ඔවුන්ට කරන්න දෙයක් නැතිලු. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් චක්‍ර ලේඛන එව්වාම ඒ අනුව කටයුතු කරන්න ඔවුන්ට සිදු වෙනවාලු. ඉගැන්නුවේ නැතුවට කමක් නැහැ මේ වැඩේ කරන්න ඕනෑ කියා පාඨශාලා පරීක්ෂකවරුත් ගුරුවරුන්ට කියනවා. අපි ඒ ප්‍රදර්ශනවලට ගියාම ගුරුවරු කියනවා උගන්වන්න වේලාවක් නැහැ ප්‍රදර්ශනයේ වැඩ කටයුතු කරන්නට සිදු වී තිබෙනවාය කියා. සියවස ප්‍රදර්ශනය කියන්නේ ලබන මහ මැතිවරණයේදී මේ රටේ මහජනතාවගේ අදහස් වෙනස් මාර්ගයක ගමන් කරවීමට යොදා ඇති වැඩ පිළිවෙළක්. එන මහ මැතිවරණයේදී ප්‍රයෝජනවත් වන අන්දමේ කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා මේ සියවස ප්‍රදර්ශන පවත්වා ළමයින්ගේත් ගුරුවරුන්ගේත් කාලය නාස්ති කර දවසකට දහස් ගණනක් මහජන මුදල් කාබාසිනියා කරමින් මේ කරන වැඩෙන් අධ්‍යාපනයේ දියුණුවක් ඇති වෙනවාද කියා මා අහනවා.

අනික වැඩ හුරුවයි. කොළඹ වැනි නගරවල ළමයින්ට නම් වැඩ හුරුවක් දුන්නට කමක් නැහැ. එහෙත් ගම්බද ළමයින්ට එවැනි වැඩ හුරුවක් අවශ්‍ය නැහැ. ඒ ළමයින්ට හොඳට වැඩ හුරුව තිබෙනවා. ගම්බද ළමයින් පාසැල ඇරී ගෙදර ගියාම හොඳට වැඩ කරනවා. ඒ ළමයින්ට පාසැලෙන් වැඩ හුරවක් දීම අවශ්‍ය නැහැ. එහෙත් අද ගම්බද ළමයෙක් පාසැලට ගියාම ඔහුටත් වැඩ හුරුවට යන්නට සිදු වෙනවා. වැඩ හුරුවට ගිහින් ඒ ළමයින් අත පය කඩා ගෙන ආරෝග්‍ය ශාලාවලට ගියාම කරදරේ වැටෙන්නේ දුප්පත් දෙමව්පියන්.

ගරු කථානායකතුමනි, ඊයේ පෙරේදා ප්‍රතිඵල නිකුත් වූ අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් කීදෙනාද සතුටුදායක අන්දමට සාමාර්ථ්‍යය ලබා සිටින්නේ? එක ශිෂ්‍යයෙක් විභාගයෙන් අසමත් වුණ නිසා විෂ වර්ගයක් පානය කර මැරුණාය කියා ප්‍රවෘත්ති පත්‍රවල සඳහන් වී තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. මගේ කොට්ඨාශයේ ගැහැණු ළමයෙකුත් විභාගයෙන් අසමත් වුණාය කියා ඇඟට පැට්‍රල් වක්කර ගිනිතබා ගෙන දැන් අසාධ්‍ය තත්ත්වයකින් ආරෝග්‍ය ශාලාවේ සිටිනවා. අධ්‍යාපන ඇමතිතුමා මිනී මරණවාය කියා මා කියන්නේ නැහැ. දරුවන්ගේ කාලය නුවුමනා වැඩවලට ගත වීම නිසා ඔවුන්ට ඉගෙන ගන්න කාලයක් නැහැ. ගුරුවරුන්ට ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන්නට වේලාවක් නැහැ. අද මෙවැනි කනගාටුදායක තත්ත්වයකට අපේ අධ්‍යාපනය පත් වී තිබෙනවා. පාඨශාලාවලින් නියම අධ්‍යාපනයක් නොලැබෙන නිසා විභාගවලට පෙනී සිටින ශිෂ්‍යයන් ඒවායින් අසමත් වෙනවා. විෂ වර්ග පානය කොට, ගිනි තබා ගෙන ඒ සමහර ශිෂ්‍යයන් මිය යන්නේ නියම අධ්‍යාපනයක් නොලැබීමේ හේතුවෙන් විභාගවලින් අසමත් වන නිසයි. නව මාස කීපයකින් මේ ආණ්ඩුවේ පාලන කාලය අවසාන වේවි. ඊළඟ මැතිවරණයෙන් පසුව අද ආණ්ඩු පැත්තේ සිටින උදවිය මේ පැත්තට ඒවි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ දරුවන්ගේ අධ්‍යාපනය කා දමා යන්නට එපා යයිද, අනාගත පරම්පරාව විනාශ කර දමා යන්නට එපා යයිද මා ආණ්ඩු පක්ෂයට මතක් කරන්නට කැමතියි. 1956ට පෙර මේ රටේ පැවති තත්ත්වය නැවතත් ඇති කරන්නටයි, මේ ආණ්ඩුව මහන්සි ගන්නේ. තියෙන එකාගේ දරුවාට පමණක් නොව නැති එකාගේ දරුවාටත් සමාන අධ්‍යාපනයක් ලැබිය යුතුයි. කාටත් එක හා සමාන වරප්‍රසාද දෙන්නට වුවමනා බව මා මේ ආණ්ඩුවට ඉතාමත්ම තදින් කියා සිටිනවා. තමන් අයත් පංක්තිය ආරක්ෂා කිරීමට වඩා සෑම පුරවැසියකුටම සම අයිතිය දීම වැදගත් බව කල්පනා කරන්නට ඕනෑ.

අද ඌව වැනි පළාත්වල පාඨශාලාවල උගන්වන්නට ගුරුවරුන් නැහැ. නොයෙකුත් ප්‍රදේශවල කණිෂ්ඨ කාර්මික විද්‍යාල ආදී ආයතන ඇතත් ඌව පළාතට කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක්වත් දුන්නේ නැහැ. කුලියාපිටියට, ගාල්ලට, මහනුවරට, කොළඹට කණිෂ්ඨ විශ්ව විද්‍යාල දී ඇතත් නොදියුණු ඌව පළාතට කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් දී ඒ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් සේවයක් කරන්නට මේ ආණ්ඩුව ක්‍රියා කර නැහැ. මේ සම්බන්ධයෙන් මා නොයෙක් වර ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියා තිබෙනවා. එහෙත් ඒ කීමෙන් ප්‍රයෝජනයක් ලැබුණේ නැහැ.

අපේ පාලනය පවතිද්දී ඌව පළාතේ බදුල්ලේ සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලයක් ඇති කිරීම සඳහා මුදල් වෙන් කර ඉඩම්ද ලබාගෙන තිබුණු නමුත් මේ ආණ්ඩුව ඒකත් නැති කර දමා තිබෙනවා. මේ පළිගන්නේ කාගෙන්ද? මේ රටේ නොයෙකුත් දේශපාලන පක්ෂ තිබෙන බව ඇත්තයි. මහජනයාගේ කැමැත්ත අනුව කුමන පක්ෂය බලයට පත් වුණත්, සෞඛ්‍යය, අධ්‍යාපනය හා වෙනත් පහසුකම් සම්බන්ධයෙන් සෑම ප්‍රදේශයකටම එක හා සමානව සැලකීම ඒ බලයට පත් වන පක්ෂයේ යුතුකමයි. එහෙත් මේ ආණ්ඩුව ඒ යුතුකම සම්පූර්ණයෙන්ම අමතක කර දමා තිබෙනවා. බදුල්ලට කණිෂ්ට කාර්මික විද්‍යාලයක් දුන්නේ නැහැ. සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලය පිහිටුවීමත් අහෝසි කර දමා තිබෙනවා. මේ අතර අප ඉතාමත්ම අමාරුවෙන් ලබා ගත් විදුලිබල පේෂකමී මධ්‍යස්ථානයද නවම පිහිටුවා නැහැ. ඒ සඳහා ඉඩම්ද ලබා ගත් නමුත් දැන් ඒ මධ්‍යස්ථානය පිහිටුවීමත් අතහැර දමා තිබෙන බව පෙනී යනවා. ඌව පළාතට කුඩම්මාගේ සැලකිල්ල දක්වන්නේ මන්දැයි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන්නට පවා අපට සිදු වුණා. ඇත්තෙන්ම ඌව පළාතට කිසිම කම්මාන්ත ශාලාවක් දී නැහැ. ඒ පළාතේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට මඟක් නැහැ. කර්මාන්ත ශාලා සියල්ලම වාගේ තිබෙන්නේ කොළඹ අවට ප්‍රදේශයේයි. ගරු කර්මාන්ත ඇමතිතුමා අවිස්සාවේල්ල කොට්ඨාශයට තුනී ලැලි කම්මාන්ත ශාලාවක් දී තිබෙනවා. ඇමතිවරුන් වැඩ කරන්නේ තමන් නියෝජනය කරන කොට්ඨාශවලට පමණයි. අනෙක් කොට්ඨාශ ගැන සලකන්නේ නැහැ. ඌව ප්‍රදේශයේත් අමු ද්‍රව්‍ය තිබෙනවා. ඒ වාගේම රැකීරක්ෂා නැති උදවිය දහස් ගණන් සිටිනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේත් කර්මාන්ත ශාලා පිහිටුවීම යුතුකමක්. සාධාරණ අන්දමට මුළු රට පුරාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

කර්මාන්ත ශාලා බෙදා හැරිය යුතුයි. කෙසේ වුණත් මේ දක්වා ඌව පළාතට නම් කිසිම කර්මාන්ත ශාලාවක් ලැබී නැහැ. ඒ ප්‍රදේශවල අහිංසක මිනිසුන් තේ වතුවල රුපියල් දෙකට වැඩ කරනවා. සමහර විට එවැනි රැකියා පවා ලබා ගන්නට බැරි වෙනවා.

සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව ඉන්දියානුවන්, 5,25,000ක් ඉන්දියාවට යවන්නට තීරණය වුණා. එහෙත් අවාසනාවකට මෙන් ඒ ගිවිසුම අත්සන් කළ ඒ ආණ්ඩුව ඉකුත් මැතිවරණයේදී පරාජයට පත් වුණා. රටක් නැත්තවුන් වශයෙන් හැඳින් වෙන ඒ විශාල පිරිසෙන් සෑහෙන කොටසක්වත් ඉන්දියාවට යවන්නට සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම මගින් බලාපොරොත්තු වූ නමුත් අද එයත් සම්පූර්ණයෙන් ඇනහිට තිබෙනවා. අපේ ප්‍රදේශවල රජයේ කර්මාන්තශාලා පිහිටුවා නැත්නම්, රැකීරක්ෂා ලබා ගැනීම සඳහා වෙනත් වැඩ පිළිවෙළක් සකස් කර නැත්නම්, ඔවුන්ට තිබෙන එකම බලාපොරොත්තුව වත්තක වැඩ කර කීයක් හෝ උපයා ගැනීමයි. උඩරට වතුවල වැඩ කරන, මේ රටේ පුරවැසිකම පවා නොමැති ලක්ෂ ගණනකට නිවාස පහසුකම්, වෛද්‍ය පහසුකම් ආදී පහසුකම් රාශියක්ම තිබෙනවා. එහෙත් ඒ ප්‍රදේශවලම උපන්, පාරම්පරික ලාංකිකයන් වන සිංහලයන්ට අර කොටසට ලැබෙන පහසුකම්වලින් එකක්වත් ඇත්තේ නැහැ. එම නිසා ඔවුන් තුළ විශාල බලාපොරොත්තුවක් තිබුණා, අඩු තරමින් 5,25,000ක් මේ රටින් ඉන්දියාවට යැවීමෙන් පසුවවත් ලාංකිකයන් 5,25,000කට වතුවල රැකීරක්ෂා හිමි වේය කියා. එහෙත් සිදු වී තිබෙන්නේ මොකක්ද ?

බලාපොරොත්තු වුණු අන්දමින් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක වී නැහැ. මේ රටේ පුරවැසිකම නොමැති 5,25,000 ක් ඉන්දියාවට යැවීම ගැන තොණ්ඩමන් හා අන්නමලේ වැනි මහතුන් දැඩි විරෝධයක් දක්වනවා. මේ රජය ඔවුන්ට භයයි. එම නිසා සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම නියම විධියට ක්‍රියාත්මක කරන්නේ නැහැ. ලාංකිකයන් 5,25,000 කට රැකීරක්ෂා ලැබේය යන බලාපොරොත්තුව පවා දැන් සුන් වී තිබෙන්නේ ඒ නිසායි. එම නිසා, කරුණාකර දැන්වත් ඒ ගිවිසුම නියම විධියට ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙස මේ රජයෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. දැන් නම් එය ක්‍රියාත්මක කිරීම සඳහා කාලයත් මදි. එම නිසා එය ක්‍රියාත්මක කිරීමට සිදු වන්නේ තව මාස කීපයකින් අප නැවතත් බලයට ආ පසුවයි. ඒ කොහොම වුණත්, රැකියාවක් නොමැතිව දුක් විඳින ලාංකික පිරිසෙන් අඩු තරමින් 5,25,000 කටවත් රැකියා සැපයීමට ඇති අවස්ථාව අපතේ නොහැරීමට වගබලා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ රටේ ඇති දැවෙන ප්‍රශ්න මොනවා දැයි මා මුලින්ම පෙන්වා දුන්නා. ඒ දැවෙන ප්‍රශ්න අතුරින් රැකියා ප්‍රශ්නයත් ඉතා ප්‍රබල එකක්. මේ රජය මගින් සෑහෙන තරම් දුරට රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා තිබෙන බවක් පෙන්නීම සඳහා විද්‍යා පර්යේෂණ හා නිවාස ඇමතිතුමා සංඛ්‍යා ලේඛන වගයක් ඉදිරිපත් කළා. එතුමාගේ කථාවට මා ඉතා ඕනෑකමින් ඇහුම්කන් දීගෙන සිටියා. තමුන්නාන්සේලාගේ හෙන්චයියලා කීප දෙනකුටවත් රැකීරක්ෂා සපයන්නට තමුන්නාන්සේලාට පුළුවන්කම ලැබුණේ අපේ ආණ්ඩු විසින් ඇති කරනු ලැබූ සංස්ථා නිසා බව මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි. ලංකා ගමනා ගමන මණ්ඩලයට පමණක් 15,000 කට අධික පිරිසක් තමුන්නාන්සේලා පත් කර තිබෙනවා. ඉවක් බවක් නැතිව එසේ පත්වීම් දීම නිසා අද ලංගමය ඉතාමත් අවාසනාවන්ත විධියට පිරිහී තිබෙනවා. වුවමනාවටත් වැඩි සේවක පිරිසක් ලංගමයේ සිටින නිසා ඔවුන්ට පඩිනඩි දෙන්නටවත් ලංගමයට පුළුවන්කමක් නැහැ. බසයකට සේවකයන් කී දෙනෙක් ඉන්නවාද? කොළඹින් බොහෝ දෙනෙක් අළුතින් පත් කර එවා තිබෙන නමුත් ඔවුන්ට දීමට තරම් තනතුරු නැතැයි ලංගම ඩිපෝ කළමනාකරුවන් කියනවා. ඒ අයට පඩි ගෙවන්නේ නිකම් ඉන්නවාටයි. අළුතින් මිකැනික්වරුන් පත් කර ඇතත් ඔවුන්ගෙන් බොහෝ දෙනකුට ඒ පිළිබඳ කිසිම දැනීමක් නැහැ. එම නිසා, තිබෙන බස් [illegible] පවා දිනෙන් දින අබලන් වී යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා තමුන්නාන්සේලා අළුතින් ඇති කළ ජනසතු ව්‍යාපාරය නැත්නම් වැඩ පිළිවෙළ මොකක්ද? අප ඇති කළ ලංගමය, තෙල් සංස්ථාව, රක්ෂණ සංස්ථාව වැනි ඒවාට තමුන්නාන්සේලාගේ ආධාරකාරයන් පත් කිරීමයි, තමුන්නාන්සේලා කරන්නේ. ඒ මිස රැකියා සැපයිය හැකි අළුත් ව්‍යාපාරයක් අරඹන්නට තරම්වත් තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබුණේ නැහැ.

රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වූ සංඛ්‍යාව නොවෙයි, රැකියා නැත්තවුන්ගේ නියම සංඛ්‍යාව. රැකියාවක් නැතත් රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි නොවූ අය ඕනෑ තරම් ඉන්නවා. එම නිසා, රැකීරක්ෂා කාර්යාලවලින් ඉදිරිපත් කෙරෙන සංඛ්‍යා ලේඛන බලා මුළා වන්න එපා.

රජයේ සේවකයන්ගේ පඩි වැඩි කිරීම සඳහා කටයුතු කර තිබෙනවා යයි මේ අය වැය ලේඛනයේ දැක්වෙනවා. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. රජයේ සේවකයන්ගේ පඩි වැඩි කළා යයි තමුන්නාන්සේලා කොයිතරම් කෑ ගැහුවත් ඒ වැඩි කරන මුදලට වඩා වැඩි මුදලක් අනෙක් පැත්තෙන් ආපසු ලබා ගන්නටයි, තමුන්නාන්සේලා කටයුතු කර තිබෙන්නේ. එහෙත් පඩි වැඩිවීමක් තබා කිසිම පඩියක් නොලබන, රැකීරක්ෂා නැති අයගේ ප්‍රශ්නය විසඳන්නට තමුන්නාන්සේලා කිසිම පියවරක් ගෙන නැහැ. බඩු මිළ ප්‍රශ්නය ගැන අප සැමදාම කථා කරනවා. පඩි වැඩි කළත් ජීවන වියදම ඉහළ ගොස් තිබෙනවා නම් සහනයක් ලැබෙන්නේ නැහැ. අද ජීවන අංකය ඉතාම ඉහළ ගොස් තිබෙනවා. එම නිසා බඩු මිළ අඩු කිරීමෙන් මිනිසුන්ට ටිකක් ලාභයට කාල ඇඳල ජීවත් වන්නට ඉඩ හරින්න. බඩු මිළ අඩු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළොත් අර රක්ෂාවක් නැතිව සිටින පිරිසටත් විශාල සහනයක් ලැබෙනවා.

රක්ෂාවක් නැති උදවිය ගැන කවුරුවත් කල්පනා කරන්නේ නැහැ. ඒ වාගේම කිසිම රක්ෂාවක් නැතිව රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වන්නේත් නැතිව මහන්සියෙන් යන්තමින් ජීවත් වන මනුෂ්‍යයින් කී දහසක් ලංකාවේ සිටිනවාද? ඒ පිරිස ගැන කවුද කල්පනා කරන්නෙ? ඔවුන්ට පිං පඩියක්වත් ලැබෙනවාද? නැහැ. ලැබුණු පිං පඩිත් කපා තිබෙනවා. දැන් අවුරුදු දෙකක පමණ කාලයක සිටම බදුල්ලේදී මට නිතර නිතර ලැබෙන පැමිණිල්ලක් තමයි ඒක. පිං පඩියක් නැත්නම් මහජනාධාර මුදලක් වශයෙන් මට රුපියල් දහයක පහළොවක මුදලක් ලැබුණා, නමුත් ඒ මුදල ගෙවීම දැන් නතර කර තිබෙනවාය යන පැමිණිල්ල දිනපතාම වාගේ මට ලැබෙනවා. මේ පිළිබඳව දිසාපති තුමා හමුවූවාම සමාජ සේවා අමාත්‍යාංශයෙන් දැන් කිසිම මුදලක් නොගෙවන බවත්, තිබෙන අයගේ ඒවා කපා දමන්නටත් නියමයක් කර තිබෙන බවත් අපට දැනගන්නට ලැබුණා. මේ ආණ්ඩුව මහජනතාවගේ පිං පඩියටත් තට්ටු කර තිබෙනවා.

ගොවි හමුදාව පිහිටුවීමෙන් මේ රටේ හතළිස් දහසකගේ පමණ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා තිබෙනවාය කියා සෞඛ්‍ය උප ඇමතිනිය ඊයේ ප්‍රකාශ කළා. ගොවි හමුදාවට බැඳුණු අය කීප දෙනෙකු මට ලියුම් කීපයක් එවා තිබෙනවා. ඒවා ගෙනෙන්නට බැරි වුණා. ජ්‍යොෂ්ඨය සමඹ වූ ළමයින් කරන්නට දෙයක් නැති නිසා ගොවි හමුදවට බැඳී රුපියල් දෙකක සුළු වැටුපකට උදේ සිට රෑ වන තුරු දහඩිය මුගුරු හෙළාගෙන දිනකට පස් කියුබ් එකහමාරක් කපන්නට ඕනෑ. ගොවි හමුදාවේ අද තත්ත්වය කුමක්ද? සියයක් යන කොට හැත්තෑපහක් ආපසු එනවා. මගේ කොට්ඨාශයෙන් සැමදාම ගොවි හමුදාවට තරුණයින් බඳවා ගන්නවා. මේ මාසයේ සියයක් යනවා. ඊළඟ මාසයේ හැත්තෑපහක් ආපසු ගෙදර එනවා. මුලින් බලාපොරොත්තුවක් ඇතිව ගොවි හමුදාවට බැඳෙනවා. නමුත් ගියාට පසු තත්ත්වය තේරෙනවා.

තවත් කාරණයක් තිබෙනවා. මේක පුදුම සෙල්ලමක්. ගොවි හමුදවට තරුණයින් බඳවා ගැනීමත් එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ වැඩ පිළිවෙළක්. මගේ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයේ එක්තරා කාර්යාලයක් තිබෙනවා. ගොවි හමුදාවට බැඳෙන්නට වුවමනා නම් පළමුවෙන් ඒ කාර්යාලයට ගිහින් රුපියලක් ගෙවා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

ලබාගන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකු වුණොත් පමණයි ගොවි හමුදාවට ගන්නෙ. ඉඩම් ඇමතිතුමාත් ගොවි හමුදා නායක කපිතන් සෙනෙවිරත්න උප ඇමතිතුමාත් සිටින අවස්ථාවක බදුල්ලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේදීත් මා ඒ කාරණය මතු කළා. මේ විහිළුව කුමක්ද කියා මා ප්‍රශ්න කළා. ගොවි හමුදාව එක්සත් ජාතික පක්ෂයේ අරමුදලින් කරන වැඩක්ද? ගොවි හමුදාවේ රක්ෂාව දෙන වාය යනා මුවාවෙන් අර රක්ෂාවක් නැතිව බොහොම අසරණ තත්ත්වයක සිටින තරුණයා මුළා කර බලහත්කාරයෙන් එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකු කරනවා. නමුත් අවසානයේදී යූ. එන්. පී. කියන නමත් එපා වී ඔවුන් ආපසු ගෙදර එනවා.

ගොවි හමුදවෙන් පිට වී පැමිණි සමහර තරුණයින් අප සමඟ ප්‍රකාශ කළ අදහස් මොනවාද කියා තමුන්නාන්සේලා දන්නවාද? එක් පක්ෂයක වාසිය පිණිස නොව මේ රටේ සියලු දෙනාටම එක හා සමානව සාධාරණ අන්දමට රැකීරක්ෂා ලැබීමේ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන අවස්ථාවේදී ඒකට පන්දම් අල්ලන උදවියටවත් එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩු කරන අවස්ථාවේදී ඒකට පන්දම් අල්ලන උදවියටවත් නොවෙයි, මේ රටේ සියලු දෙනාටම, කවුරු ආණ්ඩු කළත් මේ රටේ සියලු දෙනාටම එක හා සමානව සාධාරණ අන්දමින් රැකීරක්ෂා සැපයීමේ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. මොකක්ද මේ විහිළුව? ජීවත්වීම සඳහා මේ රටේ මනුෂ්‍යයින් දෙතුන් පැත්තකට බෙදෙන්නට ඕනෑද? කුමන පක්ෂයකට අයත් වුවත් මේ රටේ සියලු දෙනාටම මනුෂ්‍යයින් හැටියට මේ රටේ ජීවත් වෙන්නට අයිතිවාසිකම් සහ නිදහස තිබෙන්නට ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා ඔය ලංගමයට බස් කොන්දොස්තරවරුන් ගැනීමේදී පවා අපි අනුගමනය කළ වැඩපිළිවෙල මොකක්ද කියා. සමහර විට ඉල්ලුම් පත්‍ර 30ක් 40ක් ලැබුණ විට ඊළඟට ඔවුන්ගේ සුදුසුකම් අනුව කිහිප දෙනෙක් තෝරා ගෙන වුවමනා කරන ප්‍රමාණය පමණක් බඳවා ගැනීමට අවශ්‍ය වූ විට ලොතරැයි ඇදීමෙන් ඒ පිරිස තෝරා ගත් අවස්ථා තිබෙනවා. ඉල්ලුම්කරුවන් 30 දෙනෙක් සිටියොත් අවුරුද්දකට බඳවා ගන්නේ 12 දෙනෙක් බැගින් නම් අපි ඒ 12 දෙනා තෝරා ගන්නේ ලොතරැයි ඇදීමෙනුයි. ඒ ඒ ඡන්ද කොට්ඨාශවල සිටින දිසාපතිවරුන් ඇතුලු තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් ඉදිරියේ ලොතරැයි ඇදීමෙනුයි ඒ සුදුසු අය තෝරා ගත්තෙ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

ගුණදාස මහත්මයාට අස් වෙන්න වුණ හේතුත් දන්නවා නේ.

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

අපි වැඩ කළේ ඒ විධියටයි. එපමණක් නොවෙයි, අපි ශිෂ්‍ය ගුරුවරුන් තෝරා ගත්තේ ඔවුන්ගේ සුදුසුකම් අනුවයි ඔවුන්ගේ දක්ෂකම් අනුව, ලබා ගත් ලකුණු ගණන් අනුව යූ. එන්. පී. පක්ෂයේ හෝ මොන පක්ෂයේ හෝ වේවා සුදුසුකම් අනුවයි පත්වීම් දුන්නේ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

23 වෙනි ස්ථානයට පැමිණි ශිෂ්‍යයෙකුටත් ශිෂ්‍යත්වයක් දී තිබෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

රිරියගොල්ල ඇමතිතුමාගේ දුවටත් ශිෂ්‍යත්වයක් දී ආපසු එක්ක ආ බවත් අපි දන්නවා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

ඒවා ගැන කියන්න වුවමනා නැහැ. අය වැය ලේඛනය ගැන කථා කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

අද ශිෂ්‍ය ගුරුවරුන් පත් කරන්නේ දක්‍ෂතා අනුව නොවෙයි. ලබා ගත් ලකුණු සංඛ්‍යාව අනුව, විභාග ප්‍රතිඵල අනුව අද පත්වීම් ලැබෙන්නේ නැහැ. සමහර විට සමත් වී තිබෙන ශිෂ්‍යයාගේ ලකුණු සංඛ්‍යාවට වඩා එක්සත් ජාතික පක්ෂයේ පැරදුන අපේක්‍ෂකයා හෝ මන්ත්‍රීවරයා හෝ විසින් නම් කර යවන ලද ශිෂ්‍යයා ගේ ලකුණු සංඛ්‍යාව අඩු නම් මොකද කරන්නෙ? ඊළඟ ප්‍රයෝගය කරන්නේ සම්මුඛ පරීක්ෂණයේදීයි. ශ්‍රී ලංකා නිද හස් පක්ෂයේ ළමයෙක් විභාගයෙන් වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා සිටිනවා නම් සම්මුඛ පරීක්ෂණයේදී එක්සත් ජාතික පක්‍ෂයෙන් නම් කරන ලද ශිෂ්‍යයාට වැඩි පුර ලකුණු සංඛ්‍යාවක් ලැබෙන්න කට යුතු කරනවා. අධ්‍යාපන කාර්යාලයේම වැඩ කරන නිලධාරි මහත්මයෙකුයි මට මේ කරුණු කිව්වෙ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

කොළොන්නාවේ සමරසිංහගෙ නඩුවෙන් මොකක්ද ඔප්පු වුණේ ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ඒ විධියට සම්මුඛ පරීක්‍ෂණයක් තබා ඔවුන්ට වුවමනා කරන අය පමණක් තෝරා ගන්නවා. මොකක්ද මේ විහිලුව? ඒ නිසා මේ විධියට—අසාධාරණ විධියට—තමුන්නාන්සේලා මේ රැකියා ප්‍රශ්නය විසඳීමට යනවා නම් එය සම්පූර්ණයෙන්ම ප්‍රඥාගෝචර වැඩක් නොවන බව කිව යුතුයි. කවුරුන් විසින් ආණ්ඩුව කර ගෙන ගියත් එවැනි වැඩ ප්‍රඥාගෝචරය කියා කියන්න බැහැ.

ඊළඟට පොලීසියට මොකක්ද වෙලා තිබෙන්නෙ? සමහර විට තරුණයෙක් පොලීසියට ඇතුල් වීමට සුදුස්සෙක් වශ යෙන් තේරුන හොත් දේශපාලන වශ යෙන් ඔහුගේ විගතුග සම්පූර්ණයෙන්ම සොයා බලනවා. ඔහුගේ දෙමව්පියන් පසු ගිය මැතිවරණයේදී මොන දේශපාලන පක්‍ෂයට වැඩ කර තිබෙනවාද කියා සොයා බලනවා. එය තමයි ප්‍රධානම සුදුසුකම වන්නෙ. බැරිවෙලාවත් ඔහුගේ දෙමව්පියන් පසුගිය මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ ලංකා සම සමාජ පක්ෂයට හෝ කොමියුනිස්ට් පක්ෂයට වැඩ කර තිබුණොත් ඔහු කොයි තරම් සුදුසුකම් තිබෙන පුද්ගලයෙක් වුණත් ඔහුට පොලීසි යට ඇතුල් වෙන්න ඉඩක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ ස්ථානයේදී මොන විධියට කිව්වත් කාරණා සිදු වන්නේ ඔය ආකාරයටයි. ඒ නිසා මා කියනවා මේ කටයුතු කරන පිළිවෙළ සම් පූර්ණයෙන්ම වැරදිය කියා.

ගරු කථානායකතුමනි, මා මීට වැඩියෙන් ඒ ගැන කතා කරන්න යන්නේ නැහැ. මේ ආණ්ඩුවේ ලොකුම සින්දුව තමයි වගා සින්දුව. කොළඹ පළාතේ නොවෙයි, අපේ පළාත්වල තමයි මේ වගාව තිබෙන්නෙ. ඇත්ත වශයෙන්ම අපි සතුටුයි, මේ රටේ වගාව දියුණු වී මේ රට ආහාර අතින් ස්වයං පෝෂිත වෙනවා නම්. අපි විරුද්ධ පක්ෂ යේ සිටියත් අපි පාර්ලිමේන්තුවේ නොසිටි යත් එවැනි තත්ත්වයක් ඇති වෙනවා නම්—වගාව අතින් රට දියුණු වෙනවා නම්—රට ස්වයංපෝෂිත වෙනවා නම් අපි ඉතා මත් සතුටු වෙනවා. නමුත් අද රටේ එහෙ ම දෙයක් අපට පෙනෙන්න නැහැ. වගා වේ යම්කිසි දියුණුවක් ඇති වී තිබෙනවාය කියා අපට පෙනෙන්නෙ නැහැ. අපි වී වගාව පැත්තකින් තබමු. ඒ ගැන වල පනේ මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) හුඟක් කරුණු ඉදිරිපත් කළානේ. ඒ නිසා ඒ ගැන නැවතත් කරුණු කිය මින් මේ ගරු සභාවේ කාලය නාස්ති කිරී මට මා අදහස් කරන්නේ නැහැ.

මා උඩරට ප්‍රදේශයේ අල වගාව ගැන යමක් කියන්න අදහස් කරනවා. අර්තාපල් අල වගා කර තිබෙන ඉඩම් අක් කර 1,500 ක පමණ ප්‍රමාණයක් සම්පූර්ණ යෙන්ම විනාශ වී තිබෙන බව කියන්න සිදු වී තිබෙනවා. මොකක්ද හේතුව? නුසු දුසු නැත්නම් රෝග සහිත බීජ අල ගොවීන් අතරේ බෙදා හැරීම නිසා ලෙඩ බෝවීමයි. අක්කර 1,500ක් පමණ විනාශ වී යෑම නිසා ගොවීන් අතරමං වෙලයි සිටින්නේ, අධෛර්‍යමත් වෙලයි සිටින් නේ. කිසිම විගකීමක් නැතුව රෝග සහිත බීජ අල ගොවීන් අතර බෙදා දීමයි මීට මූලික හේතුව. උඩරට ප්‍රදේශවල එවැනි බීජ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

අල බෙදුවාට මොකද යාපනයට නම් කිසිම ලෙඩක් නැති හොඳ බීජ අල බෙදා තිබෙන බව පෙනෙනවා. මෙම විනාශය නිසා වන්දි ගෙවනවා නම් අක්කරයකට රුපියල් 2,500ක් වත් ගෙවන්නට ඕනෑ. ඒ අනුව බලන විට ගොවීන්ට රුපියල් ලක්ෂ 37½ක් පමණ ගෙවන්නට සිදු වෙනවා. එහෙත් එවැන්නක් කෙරෙන්නේ නැහැ. සමහර නිලධාරීන් කිසිම වගකීමක් නැතුව ක්‍රියා කිරීම නිසා ඒ පළාතේ අර්තාපල් වගාවට ලබා තිබෙන කලදසාව ඒකයි.

අද පමණක් නොව 1953 ඩඩ්ලි සේනානායක මහතා අගමැතිකම් කරන කාලයේ දීත් මෙම තත්ත්වය පැනනැගී තිබුණා. එම අවස්ථාවේදීත් ඔය පිළිවෙළට ලෙඩ සෑදුනා. එදා අර්තාපල් වගාව පිළිබඳව හොඳ දැනුමක් තිබෙන නෝමන් ගුණතිලක නමැති මහත්මයෙක් එම ප්‍රදේශයේ සිටියා. අද ඔහුගේ සේවය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම කාර්යාලයේ ලිපිකරුවකු හැටියටයි අද ඔහු සේවය කරන්නේ. අර්තාපල්වලට ඒ ආකාරයට ලෙඩ රෝග බෝ වුණු විට ඔහු කිව්වා "අර්තාපල්වලට රෝග වැළඳී විනාශ වීම වළක්වන්නට මට ඉඩ දෙන්න; ඒ වැඩේ කරන්න බැරි වුණොත් මම රක්ෂාවෙන් අස් වෙනවා; එහෙම නැති නම් ඒ සඳහා යන මුදල් මගේ පඩියෙන් කපා ගන්න" යන පිළිවෙළට. එදා එතරම් ධෛර්‍ය සම්පන්න පිළිවෙළට ඔහු ඉදිරිපත් වුණා. ජනතාවටත් ඔහු ගැන ලොකු විශ්වාසයක් තිබුණා.

1963 අපි ආණ්ඩු කරන කාලයේදී මොකද සිදු වුණේ? පිලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා කෘෂිකර්ම ඇමති වුණායින් පසු එතුමා ඔහුගේ උපදෙස් අනුව ක්‍රියා කොට අර්තාපල් වගාව ලෙඩරෝගවලින මුදවාගෙන නැවතත් යථා තත්ත්වයට පත් කර ගත්තා. එහෙත් අද එවැනි දැනුමක් තිබෙන උදවිය අයින් කර දමා සිටිනවා. අද ඔහු වැඩ කරන්නේ නිකම් ලිපිකරුවකු හැටියටයි. මේ රටේ දේශගුණය සහ පස පිළිබඳ දැනුමක් ඇති පිටරට විශෙෂඥයන් ගෙන්වාගෙන කටයුතු කරන්නට යාමෙන් අර්තාපල් වගාව සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් තිබෙනවා.

මා දන්නවා රහංගල ප්‍රදේශයේ ගොවීන් විසින්ම නිපදවන ලද බීජ අල බොහොම හොඳට තිබෙන බව. වගාව ගැන බොහොම හයියෙන් කතා කළාට මොකද වගාව විනාශ වන ව්‍යාපාරයි ක්‍රියාවට යෙදෙන්නේ. එම වැඩ පිළිවෙළ වෙනස් කොට දැනුමක් තිබෙන උදවියගෙන් වැඩ කට යුතු කරවා ගත යුතුයි. වගාව ගැන ක්‍රියා කරනවා නම් සාමාන්‍ය ගොවියාගේ ජල ප්‍රශ්නය, පොහොර ප්‍රශ්නය සහ වගා ණය ප්‍රශ්නය වැනි දේට මුල් තැන දී ක්‍රියා කළ යුතුයි. එම ප්‍රශ්න නොවිසඳා නිකම් බොරුවට අක්කරයකින් වී බුසල් 290 ක් 300 ක් පමණ ලැබුණායයි කියනවා. නිෂ්පාදනය අතින් බොහොම ඉදිරියට ගිහිල්ලායයි එදා මුදල් ඇමතිතුමා කිව්වා. නිෂ්පාදනය අතින් බොහෝ දුරට ඉදිරියට ගමන් කර තිබෙනවා නම්, කැපූ හාල් සේරුව ආපසු දෙන්නට බැරි මන්දැයි මම අහනවා. අපේ නිෂ්පාදන වැඩි වී තිබෙනවා නම් කෘෂිකර්ම ද්‍රව්‍යවල මිල අඩු නොවන්නේ මන්දැයි මම අහනවා. මේ රටේ නිෂ්පාදන සීඝ්‍රයෙන් වැඩි වී ගොස් ඇතැයි ගරු මුදල් ඇමතිතුමා කොයි තරම් කීවත් ඓ තත්ත්වය අනුව අපට එය පිළිගන්නට නම් පුළුවන්කමක් නැහැ. නිෂ්පාදන අතින් විශාල දියුණුවක් ලැබී තිබෙනවා නම්, එක්කෝ කැපූ හාල් සේරුව ආපසු දෙන්නට ඕනෑ; එහෙම නැත්නම් ද්‍රව්‍ය මිල බහින්නට ඕනෑ. ඔය දෙකෙන් එකක් වත් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා කොයි විධියට කිව්වත් ගරු මුදල් ඇමතිතුමාගේ කථාව පිළිගන්නට පුළුවන්කමක් නැහැ.

රැකීරක්ෂා ප්‍රශ්නය ගැන විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. බොහෝ විට දොස්තරවරුන් නැති නිසා ආරෝග්‍යශාලාවල ලෙඩුන් පෝලිමේ ඉන්න හැටි අපට දකින්නට ලැබී තිබෙනවා. සමහර ආරෝග්‍යශාලාවල ඉන්නේ දොස්තර මහත්වරුන් එක්කෙනයි, නැත්නම් දෙන්නයි. විශාල සංඛ්‍යාවක් ප්‍රතිකාර ගන්නට ආවාම සතුටුදායක ලෙස වැඩ කරන්නට පුළුවන්කමක් ඒ උදවියට ලැබෙන්නේ නැහැ. වෛද්‍ය අධිකාරි තැනගෙන් මේ ගැන අසා බැලුවාම එතුමා කියන්නේ දොස්තර මහත්වරුන් මදි බවයි. එහෙත් ඇත්ත වශයෙන්ම අද සිද්ධ වෙලා තිබෙන්නේ වෛද්‍යවරුන් හැටියට උපාධි ලබා සිටින උදවියටවත් රක්ෂාවල් දෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට ආණ්ඩුවට පුළුවන්කමක් නැති වීමයි. මේ රටේ මුදලින් අධ්‍යාපනයක් ලබා සිටින අයගෙන් මේ රටට ප්‍රයෝජනයක් නැතිව යෑමයි එයින් සිදු වන්නේ. බොහෝ දෙනාට දන් පිටරටවල රැකීරක්ෂා සොයන්නට සිදු වී තිබෙනවා. ජනතාවගේ සෞඛ්‍ය ප්‍රශ්නය වැනි වැදගත් ප්‍රශ්න නිරාකරණය කිරීමට අවශ්‍ය දොස්තර වරුන්ගේ හිඟය පවා නැති කරන්නට මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ.

උපාධිධාරීන් කී දෙනෙක් අද රැකියා වල් නැතිව ඉන්නවාද? එහෙත් අපේ කාලයේදී නම් එකම උපාධිධාරියෙක්වත් රැකියාවක් නැතිව සිටියේ නැහැ. මෙවැනි ප්‍රශ්නවත් විසඳන්නට වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ඒ ඒ ඡන්ද කොට්ඨාශ යට මේ මේ තරම් සංඛ්‍යාවක් උපාධිධාරීන් ගුරුවරුන් හැටියට පත් කරනවායයි පසු ගිය දවස්වල පුවත්පත් මගින් අපට දන ගන්නට ලැබුණා. අපේ ප්‍රදේශයෙන් නම් ලංකාවේ වෙනත් ප්‍රදේශත් සමග සසඳා බලන විට උපාධිධාරීන් සුළු සංඛ්‍යාවක් පම ණයි සොයා ගන්නට පුළුවන් වන්නේ. ඇතැම් අය තමන්ගේ නිත්‍ය පදිංචි ප්‍රදේශ යෙන් පිට ප්‍රදේශවලට ගොස් තමන්ගේ හාල් සලාක පොතත් මාරු කරගෙන උපාධි පත්වීම් ලබා ගන්නට උත්සාහ කළා. සුළු සංඛ්‍යාවකට හෝ ලැබෙන්නට තිබෙන ඒ වරප්‍රසාදය ඒ උදවියට අහිමි වන ලෙස පිට ප්‍රදේශවලින් පැමිණ පදිංචි වී ඒ පත්වීම් ටික පවා මංකොල්ල කන්නට වැඩ පිළි වෙළක් ගෙන යනවා නම් ඊට ඉඩ නො දෙන්නැයි මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මට කියන්නට තිබෙන්නේ මෙයයි. මා මුලින්ම මතක් කළා වාගේ රැකීරක්ෂා ප්‍රශ්නය අතිනුත්, සෞඛ්‍ය ප්‍රශ්නය අතිනුත්, අධ්‍යාපන ප්‍රශ් නය අතිනුත් ඉතාමත් දුර්වල තත්ත්වයක තිබෙන ඌව පළාත වැනි ප්‍රදේශවල උන් නතිය සඳහා අප පටන් ගත් දේවල් පවා දන් අයින් කර දමා තිබෙනවා. ඒ විධි යට අපේ ප්‍රදේශවලට කුඩම්මාගේ සැළ කිල්ල නොදක්වන්නැයි මා ගෞරවයෙන් කියනවා. නොයෙක් දුෂ්කරතාවන් මධ්‍ය යේ ජීවත් වන්නටයි මේ ජනතාවට සිදු වී තිබෙන්නේ. හැම පැත්තෙන්ම වාගේ වතුකරයෙන් මිරිකී ජීවත්වන විශාල පිරි සක් මෙහි සිටිනවා. සමහර වතුවල අධි කාරීන් එක්සත් ජාතික පක්ෂයටත් මේ ආණ්ඩුවටත් හිතවත්කම් දක්වන අය බව අපි දන්නවා. ඒ උදවියත්, මැනේජර්ලාත් කම්කරුවන්ගෙන් පලි ගන්නට පටන් ගෙන තිබෙනවා; ජනතාවගෙන් පලිගන් නට පටන් ගෙන තිබෙනවා. ඒ ගැන ගරු සොරණාතොට මන්ත්‍රීතුමා ඊයේ මතක් කළ බව මට ආරංචියි. රංජිත් විජේරත්න නම් මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙක්. දෙමෝදර වත්තේ මැනේජර්. ගම්බද ජනතාවට වතුර ටික පවා ලබා ගන්නට ඔහු ඉඩ දෙන්නේ නැහැ. වතුර ටිකක් ඉල්ලුවොත් ඊටත් ඔහු අවහිර කරනවා. වතුවලට යාව ඇති අවට ගම්වලින් පැමිණ වැඩ කරන උදවිය පසු ගිය ගම්කාර්ය සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළාය කියා හිරිහැර කරනවා. වේවැල්හේන කියන ගමේ සිටින උදවියට විශේෂයෙන් අවහිර කම් කර තිබෙනවා. ඇතැමුන් වෙනත් වත්තකට පවා යවා තිබෙනවා. සමහර විට ඒ උදවියට වැඩ නැති කරනවා. ඔය විධියේ බලපෑම් කර තිබෙනවා. ඊයේ පෙරේදා ගරු ඩඩ්ලි සේනානායක මැති තුමා—ගරු අගමැතිතුමා—හිය අවස්ථාවේ එහි ලැගුම් ගත්තායයි මට ආරංචියි. මේ වාගේ වතු පාලකවරුන් තමන්ගේ බලය පාවිච්චි කර අහිංසක ගම්බද ජනතාවගෙන් පලිගන්නා ව්‍යාපාරය නතර නොකළොත් ඊට සුදුසු පිළියම් යොදන්නට අපට සිද්ධ වන බව මතක් කරන අතර ගම්බද ජනතා වට හිරිහැර කරන්නට ඉඩක් නොතැබීමට කටයුතු කරන ලෙසද මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

අවසාන වශයෙන් කියා දන් කී සැරයක් කිව්වද ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

මා ඉදිරිපත් කළ ඔය ප්‍රශ්න ආණ්ඩුවේ සැළකිල්ලට යොමු වේවායි ප්‍රාර්ථනා කරන අතර තමුන්නාන්සේගේ ඉල්ලීමට කීකරු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.55

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ හෝ ගරු මන්ත්‍රීවරුන් කථා කරන අවස්ථාවේදී තමන්ගේ පෞද්ගලික දේවල්, පෞද්ගලික හැඟීම්, පෞද්ගලික විරුද්ධවාදීකම් සම්බන්ධව සැහෙන ඇත්තන්ගේ නම් ඉදිරිපත් කර කථා කිරීම ඉතාමත් දුර්වල ක්‍රියාවක් බව මා මතක් කර දෙන්න කැමතියි. බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් රංජිත් විජේරත්න මහතා සම්බන්ධව විශාල චෝදනාවක් මේ සභාවේදී කරන්නට යෙදුණා. එහෙත් රංජිත් විජේරත්න මහත්මයාට මොන ක්‍රමයකින්වත් එය නැතැයි කියන්න අවස්ථාවක් නැහැ. කරන ලද චෝදනාව සම්පූර්ණ බොරුවක් වුණත් ඒ සම්බන්ධව ක්‍රියා කරන්නට නීතියක් නැති බව මේ ගරු මන්ත්‍රීතුමා දැනගන්න ඕනෑ. නීතියේ හැටියට වුණත් අප මේ සභාවේදී ඕනෑම බොරු බේගලයක් ඇද බා පෞද්ගලික විරුද්ධවාදියෙකුට අපහාස කළත්, නීතිඥයකු හැටියට තමුන්නාන්සේත් දන්නවා, ඒ ගැන කිසිම උසාවියකට යන්න බැරි බව. එ නිසා බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාට සුළු අවවාදයක් කරන්න මා සතුටුයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

තමුන්නාන්සේගේ අවවාද අපි පිළිගන්නෙ නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අපොයි, පිළිනොගන්න එක වෙනම දෙයක්. ඔය මන්ත්‍රීතුමාට පුළුවන් නම් එළියට ගිහින් ඒ ගැන කථා කරන්නය කියා මා මතක් කරන්න කැමතියි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

කථා කරලත් තිබෙනවා, කථා කරන්නත් සූදානම්.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

මට තිබෙන කනගාටුව ඉතාමත් හොඳ මහත්මයෙක් ගැන—

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

තමුන්නාන්සේට හොඳයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඔව්, අපට හොඳයි. හොඳ මිනිහ කාටත් හොඳයි.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

හොඳ තමයි, මහජනයාට හිරිහැර කරන කාලකන්නි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

බදුල්ලෙ ගරු මන්ත්‍රීතුමා කථා කර අවසානයි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

අර පේන්නෙ නැද්ද, සැහෙන මිනිහෙකුට සැහෙන විධියටද කථා කරන්නෙ? මේ ගරු සභාවෙදි කියනවා කාලකන්නි කියා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

එහෙම කියන්නෙ නොසැහෙන වැඩ කරන නිසා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

නොසෑහෙන වැඩ කරනවා නම් එහෙ ගිහින් කථා කරගන්නවා. ඇයි මට මේ ගැන කැක්කුමක් තිබෙන්නෙ ? හොඳ මිනිහෙකුට බණින කොට කාටත් කැක්කුමක් ඇති වෙනවා. ඒ නිසයි ඒ වෙනුවෙන් වචනයක් කියන්න අපට සිද්ධ වෙන්නෙ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

තමුන්නාන්සේලාට කැක්කුම බව අපි දන්නවා.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

කථානායකතුමනි, කියන දේවල් කියන්න බොහොම ලෙහෙසියි. ඒ මන්ත්‍රීවරුන් නොයෙක් විශාල තර්ක ඉදිරිපත් කරමින්, හාල් සේරුවේ ගණන අඩු කරන්නය, වගා ව්‍යාපාරය සාර්ථක වී තිබෙනවා නම්, දියුණු වී තිබෙනවා නම්, හාල් සේරුවෙ ගණන අඩු කරන්න බැරි ඇයි, දෙකක් දෙන්න බැරි නම් මිළ අඩු කරන්නෙ නැත්තෙ ඇයි, ආදී වශයෙන් කෑ ගසනවා. යම් කිසි විධියකින් වීවලට දෙන සහතික මිලෙන් රුපියලක්වත් අඩු කර එය රුපියල් 13 කළොත් මේ උදවියම කෑ ගසාවි, අපොයි ගොවියා ඉවරයි, කියා. මේක විශාල තර්කයක්. ඔය විධියට බලන විට, වගාව දියුණු කරන්නත් ඕනෑ. ගොවියාට තෑන දෙන්නත් ඕනෑ, හාල් අඩු කරන්නත් ඕනෑ, හාල් නිකම් දෙන්නත් ඕනෑ—

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)
*(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)*
(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

කවුද නිකම් ඉල්ලුවෙ ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

නිකම් ඉල්ලනවාට වඩා නරකයි ගණන අඩු කරන්නය කියන එක. ඔන්න ඔය විධියට වගා ව්‍යාපාරය ගැන විශාල තර්ක ඉදිරිපත් කරමින් කථා කරනවා.

අද ජීවන තත්ත්වය ගැන කල්පනා කර කියනවා, ලූනු ගණන් වැඩි වී තිබෙනවාය, මිරිස් ගණන් වැඩි වී තිබෙනවාය, ඒ සියලුම මිල ගණන් පහත් කර මහජනතාවට සහනයක් දෙන්නය කියා. කථානායකතුමනි, කවදාවත් රටක් ආර්ථික තත්ත්වයෙන් දියුණු කරන්නට පුළුවන්කමක් නැහැ, ඒ රටේ උපද්දවන ද්‍රව්‍ය සඳහා ඒ ගොවිජනතාවට සෑහෙන මිලක් නොගෙවනවා නම්. ගොවියාට අඩු මිලක් දෙන්න පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේ දන්නවා අපේ ජීවන තත්ත්වය ගැන කල්පනා කරන විට 1965, 1966, 1967 අවසානය දක්වා ගණන් ඉලක්කම් විමසා බැලුවොත් ඒ අවුරුදු 3 ඇතුළත ජීවන වියදම නැග ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයකින් බව. 1967 දෙසැම්බර් මාසයේදී රුපියලේ මිළ අඩු කළ අවස්ථාවේදී ජීවන වියදම හුඟක්ම නැග්ගා. රුපියලේ මිළ අඩු කිරීමත් සමගම, සාමාන්‍ය ජනතාව භාවිතා කරන බොහෝ ද්‍රව්‍යවල මිළ ඉහළ යාම නිසා ජීවන වියදම ඒ විධියට වැඩි වුණා. රුපියලේ මිළ අඩු කිරීම විශාල ආර්ථික ප්‍රශ්නයක්. එහෙත් ඒ අවස්ථාවේ තිබුණු තත්ත්වයේ හැටියට, එසේ නොකර කටයුතු කරන්නට පුළුවන්ද යන ප්‍රශ්නයට නියම විධියේ පිළිතුරක් මෙතෙක් මේ ගරු සභාවේ කථා කළ කිසිවකුගෙන් ලැබුණේ නැහැ. අප වෙනත් රටක මුදල් සමග සම්බන්ධකම් ඇතිව කටයුතු කරගෙන යන නිසා ඒ අවස්ථාවේදී රුපියලේ මිළ අඩු නොකළා නම් අපට මීටත් වඩා දුර්භාග්‍යසම්පන්න තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වනවාට කිසිම සැකයක් නැහැ. රුපියලේ මිළ අඩු කළ අවස්ථාවේදී අප මොනවාද කෙළේ ? ඒ වෙනුවෙන්ම ආණ්ඩුවේ නිලධාරීන්ට සහනයක් සැලසූ බව තමුන්නාන්සේලාට මතක ඇති. ඒ වාගේම, පාරිභෝගික ද්‍රව්‍ය කීපයක මිළ සීමා කළා. වී බුසලකට වැඩිපුර රුපියල් දෙකක් ගොවි ජනතාවට ලැබෙන්නට සැලැස්වූයේත් රුපියලේ මිළ අඩු කළ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
අවස්ථාවේදීයි. මේ සෑම දෙයක්ම කෙළේ රුපියලේ මිළ අඩු කිරීම නිසා ඇති වුණු බඩු මිළ ඉහළ යාමේ අමාරු තත්ත්වයෙන් ජනතාව බේරා ගැනීමටයි.

වගා ව්‍යාපාරය ගැන කෙරුණු කථා කීප යකටම මා ඊයේත් ඇහුම්කන් දුන්නා. ඒ හැම මන්ත්‍රීවරයකුම ඇසුවේ, වගාව දියුණු කිරීම සඳහා වතුර කෝ, ඇළ වේලි කෝ යනාදී ප්‍රශ්නයි. තවත් සමහර මන්ත්‍රී වරුන්, ගොවිතැන් පාළු වෙනවා, නියඟ නිසා කුඹුරු විනාශ වී යනවා යනාදී චෝදනා එල්ල කළා. මේවා පුදුම කථා. වර්ෂාව ඇති වීම නැති වීම නතර කරන්නට මොනම ආණ්ඩුවකටවත් මොනම පක්ෂයකටවත් මොන තරම් බලසම්පන්න ජාතියකටවත් පුළුවන් වේයයි මා හිතන්නේ නැහැ. බජට් එකෙන් නම් එය කොහොමවත් කරන්න බෑ. මෙවැනි දේවල් තර්ක වශයෙන් ඉදිරි පත් කරමින් සමහර අය වගාව දියුණු වී තිබෙන්නේ කොහේදැයි අපෙන් අහනවා. සාමාන්‍ය වශයෙන්, වර්ෂාව නියම අන්දමට ලැබුණු කාලවල වගාවෙන් ලැබුණු ප්‍රතිපල ගැන කල්පනා කිරීමෙන් විනා එසේ නො මැති අවාසනාවන්ත යුගවල ප්‍රතිඵල අනුව සලකා බලා වගාවට දොස් කීම ඥානාන්විත යයි මා අදහස් කරන්නේ නැහැ. වගාව දියුණු කිරීමට වතුර කෝ, ඇළ වේලි කෝ, අරක කෝ, මේක කෝ ආදී වශයෙන් මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා ඇසුවා. එතුමා කථා කරන්නේ, අප මේ රටේ අවුරුදු 50 ක් පමණ කල් රාජ්‍යය කළ බවක් හිතාගෙන වෙන්න ඇති. එතුමන්ලා 1956 සිට 1965 වනතුරු මේ රටේ ගොවිතැන දියුණු කිරීමට කිසිම උනන්දුවක් නො ගෙන, වැවක් අලුත් වැඩියා නොකර, ඇළක් වේල්ලක් නොබැඳ ඉඳලා රට අන්ත දුගී තත්ත්වයට හෙළුවා මදිවාට, දැන් අපෙන් වගාව දියුණුදැයි අහනවා.

අපේ පළාත්වල සිදු වුණු දේවලින් සමහ රක් මා පෞද්ගලික වශයෙන් කියන්න සතු ටුයි. මාත් අවුරුදු 40 ක පමණ කාලයක් තිස්සේ වගා ව්‍යාපාරය සම්බන්ධව පෞද් ගලික වශයෙන් උනන්දු වුණු කෙනෙක්. මගේ කොට්ඨාශයේ හම්බන්තොට දිස්ත්‍රික් කයේ කුඹුරු අක්කර 13,000 ක් පමණ තිබෙනවා. අවුරුදු 20 ක පමණ කාලයක් මුළුල්ලේ ඒ කුඹුරු වෙනුවෙන් නියම විධියේ වාරිමාර්ග සැලැස්මක් ඇති වුණේ නැහැ. වර්ෂාවට පින් සිදු වන්නට සමහර කාලවලදී මේ කුඹුරු වැඩ කරන්න පුළුවන් වුණා. ඉඩෝර කාලවලදී වැඩ කෙළේ නැහැ. ඒ කුඹුරු අක්කර 13,000 වෙනුවෙන් නියම විධියේ වාරිමාර්ග සැලැස්මක් ඇති වුණේ 1954 අවුරුද්දේයි. ඒ සැලැස්ම සකස් කළ ඉන්ජි නේරු මහත්වරු කියා සිටියා, මේ ව්‍යාපා රය සඳහා විශාල මුදලක් වැය වන නමුත් මේ වාරිමාර්ග කර්මාන්තය සම්පූර්ණ වී අවු රුදු 3 ක් ගතවන විට ඒ වැය වුණු හැම ශතයක්ම ආපසු ආණ්ඩුවට ලැබෙනවා කියා. 1956 සිට 1965 දක්වා ගත වුණු අවු රුදු 9 තුළ මගේ මිත්‍ර මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමාත් (ජෝර්ජ් රාජපක්ෂ මයා.) ඒ වගේම මගේ මිත්‍ර බෙලිඅත්තේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දිවංගත ඩී. ඒ. රාජ පක්ෂ මහත්මයාත් නොයෙක් විධියේ මහන්සි ගත්ත, පසුගිය රජය මගින් මේ කටයුත්ත ඉටු කරවාගන්න. එහෙත් ඒ කටයුත්ත ඉෂ්ට කරවා ගන්න බැරි වුණා. මෙදා නම් තමුන්නාන්සේ ජාතික ආණ්ඩු පක්ෂයෙන් පත්වී සිටින නිසා මේ කට යුත්ත කරවා ගන්න පුළුවන් වෙයි කියා පසුගියදා මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා මට කියා සිටි බව මතකයි. මේ මුරුතවෙල ව්‍යා පාරය සම්බන්ධයෙන් මා අවුරුදු 2 ක් බලා සිටියා. කොයිතරම් බැණුම් අහන පුද්ගලයකු වුණත් මේ කටයුත්ත සඳහා සෑහෙන මුදලක් වෙන් කර දෙන්නට ගරු ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා ගත් උත් සාහයට එතුමාට ප්‍රශංසා කරන්නට ඕනෑ. එහෙත් මේ යෝජනාව මුදල් ඇමති අංශ යට ඉදිරිපත් වුණාම එය අනුමත කරන්නෙ නැහැ. මුදල් ඇමතිතුමා ඉඩ දෙන්නෙ නැහැ. කොහොමද ඉඩ දෙන්නෙ? මුදල් තිබිල එපායැ, දෙන්න. අපි ගිහින් මේ ගැන ප්‍රශ්න කළාම එතුමා කියනව, "කරදර කරන්ට එපා සල්ලි නැහැ ; විදේශ විනිමය තිබෙන්නෙ මෙච්චරයි. අපට රටේ ඉන්න ටත් බැරිවයි තිබෙන්නෙ. ඒ නිසා ලක්ෂ ගණන් වැය වන වැඩ ගැන මා සමග කථා කරන්නවත් එපා" කියා.

වැඩි කලක් නොවෙයි, ගිය අවුරුද්දේ 1967-68 අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී මා අගමැතිතුමාට කියා සිටියා, "මේ වගේ සංවර්ධන වැඩක්වත් කර ගන්න බැරි නම් අපි මෙතරම් මහන්සි වී මේ ස්ථානයට පත්වීමෙන් වැඩක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසා කරුණාකර මේ ව්‍යාපාරය පටන් ගන්න" කියා. රුපියල් ලක්ෂ 300 කටත් වැඩි මුදලක් වැය වන මේ ව්‍යාපාරයේ කට යුතු දැන් ආරම්භ කර තිබෙන අතර දකුණු පළාතේ අළුතෙන් ඉදිවුණු විශාලම ජලාශ යයයි කියන්නට පුළුවන් මේ මුරුතවෙල වාරි මාර්ග ක්‍රමයෙන් ලබන අවුරුද්දේ මහ කාලයේදී ඒ අක්කර 13,000 ටම යල මහ වැඩ කරන්නට වතුර දෙන්න පුළුවන් බව මා කියන්ට සතුටුයි. මේක ඉතිහාස ගත වන දෙයක්. අද දවසේ කෙරෙන ගොවි තැන් කටයුතුවලට නිසි විධියට ජලය ලබා ගැනීමට අපිත් ගොවීනුත් දුක් වින්දා. නිසි වාරිමාර්ග නැත්නම් කවදාවත් හරියා කාර ගොවිතැන් කරන්නට බැහැ. ඔය මම සඳහන් කළේ පසුගිය අවුරුදු 5 ඇතු ළත මගේ පළාතට සිදුවූ සුළු සේවයක්.

ගරු කථානායකතුමනි, වගා ව්‍යාපාරය ගැන කථා කරන විට මේ කාලය තුළ සිදු වී තිබෙන සේවයන් මොනවාද කියා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් පමණක් නොව මුළු රටේම ජනතාව දැන ගන්නට ඕනෑ. මා මිත්‍ර වර්තමාන තිස්සමහාරාම මන්ත්‍රීතුමා (එදිරිසූරිය මයා.) තංගල්ල ඇතුළු මන්ත්‍රී කොට්ඨාශයක් නියෝජනය කළ අවස්ථාවේ ඉදිරිපත් කළ සැලැස්මක් අනුව සකස් වුණු තංගලුඔය ව්‍යාපාරය නමැති යෝජනා ක්‍රමයක් තිබුණා. දැන් අවුරුදු ගණනාවක් ගත වී ඇති නමුත් ඒ ව්‍යාපාරය පිළිබඳ යම්කිසි පියවරක් ගන්නට මෙතෙක් කිසිවකු ඉදිරිපත් වුණේ නැහැ. මහපාර අද්දර හැමදාම වැඩ කරන්නට පුළුවන් අක්කර 1,800ක් පමණ කරිජ්ජ ගැලීම නිසා සම්පූර්ණයෙන්ම අත හැර දමා තිබුණා. කරිජ්ජ ගැලීම වළක්වා ඒ කුඹුරු අස්වැද්දීමේ වැඩපිළිවෙලකුත් දැන් ආරම්භ කර තිබෙනවා. මේ මුදල් වර්ෂය ගත වන විට ඒ ව්‍යාපාරයේ කට යුතුත් සම්පූර්ණ වෙන්නට ඉඩ තිබෙන බව මා ඉතා ආඩම්බරයෙන් මතක් කරන්ට සතුටුයි. ගත වූ අවුරුදු 4½—5 ඇතුළත ගොවිතැන් කටයුතු අතින් සිදු වූ සේවා ඔවායි.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ අපේ පළාත්වල පැඟිරි වැවිල්ල ඉතා විශේෂ කර්මාන්තයක් වශයෙන් සිදු වුණා. මගේ මිත්‍ර කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) දැනට මේ සභාවේ සිටිනවා. ඒ ප්‍රදේශයේත් මේ වගාව සිදුවුණු අතර ගාල්ල තරම දක්වා එය විහිදී තිබුණා. පැඟිරි වැවිල්ලේ තිබුණු විශේෂ ලක්ෂණයක් මා මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් මතක් කරනවා. යම් ගමක පැඟිරි අක්කර සියයක් වගා කර තිබුණා නම් ඒ ගමේ ජීවත්වන, වැඩ කරන්න කැමති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම හැමදා මත් රැකියාව තිබුණා. නමුත් පොල් අක්කර සියයක් වගා කළාම හෝ රබර් අක්කර සියයක් වගා කළාම කොපමණ සංඛ්‍යාවකටද රැකියාව දෙන්න පුළුවන්? නමුත් පැඟිරි අක්කර සියයක් වගා කර තිබුණාම වැඩ කරන ජනතාවට, වැඩ කරන්න කැමති ජනතාවට ඒකාන්ත යෙන්ම ජීවත්වන්න මාර්ගයක් සැල සෙනවා.

මෙහිදී එක්තරා සුළු සිද්ධියක් මට මතක් වෙනවා. විශේෂයෙන්ම මේ කාර ණය ගැන සඳහන් කරන්නෙ මෙබඳු හැඟීම් ඇති අය අපේ ප්‍රදේශවල ජීවත් වන බව පෙන්නා දෙන්නටයි. ඊළඟට මා කියන කාරණය සම්බන්ධයෙන් අපේ විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීවරුන් සමච්චල් කිරීමට මෙන් කථා කරන නිසයි. "හාල් සේරුවක් නිකම් දෙනවාය කිය නවා, හාල් සේරු දෙකක් දෙනවා නම් මෙපමණ මුදලක් යනවා, නිකම් හාල් සේරුවක් දීමෙන් මෙපමණ ලාභයක් ලැබෙනවා, මෙය කිසි ප්‍රයෝජනයක් නැති දෙයක්, හාල් සේරුව නිකම් ගඟට වීසි කරනවා වාගේ" ය කියන කථාවත් විරුඬ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීවරුන් සමච්චල යට වාගේ ප්‍රකාශ කරනවා. ඇත්තවශ යෙන්ම මේ සම්බන්ධයෙන් නියම අවබෝ ධයක් ඇති කර ගන්න නම් ගම්බද ජීවත් වන අය සමග සාකච්ඡා කර ඒ අයගේ හැඟීම් දැනගන්න ඕනෑ.

මා පැඟිරි ව්‍යාපාරය සම්බන්ධයෙන් කථා කරගෙන ආ නිසා කියන්න කැමතියි, මා කලින් සඳහන් කළ මෙයට අවුරුදු එක හමාරකට උඩදී ඇති වුණු සිද්ධියක් ගැන. එක් දිනයක රාත්‍රියේ හතට හත හමාරට පමණ එක්තරා ස්ත්‍රියක් මා හමුවන්නට ඇවිත් මට ලිපියක් දුන්නා. මා එය කඩා බැලුවාම මට වැටහී ගියා එබඳු ලිපියක් ඒ ස්ත්‍රියට ලියන්නට බැරි බව. අවසාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

පිටුව පෙරළා බැලුවාම මට පෙනී ගියා එය ලියා ඇත්තේ ඇගේ දුව වෙන්නට ඇතැයි කියා. එම ලිපියේ සඳහන්ව තිබුණේ මෙන්න මේ දෙයයි. මැතිතුමණි, අප ජීවත්වන්නේ මේ පළාත්වල පැඟිරි කපලා. මගේ පුරුෂයා පැඟිරි වතුවල වැඩ කළා. අපේ ළමයිනුත් නොයෙක් අවස්ථා වලදී එම වතුවල වැඩ කර ලැබෙන ආදාය මින් අප ජීවත් වුණා. අද මුහුණ පාන්න සිදු වී තිබෙන්නේ දුෂ්කර අවස්ථාවකටයි. පැඟිරි වතුවල වැඩ සම්පූර්ණයෙන්ම අත් සිටුවා තිබෙනවා, කිසි කෙනෙකු පැඟිරි කපන්නේ නැහැ, තෙල් විකුණා ගන්නට බැරිනිසා. මේ ආණ්ඩුවට පිංසිදුවන්න හාල් සේරුවවත් නොමිලයේ නොදෙනවා නම් අපට හාමතේ මිය යන්නට වෙනවා. මට කියන්නට තිබෙන්නේ ඉස්කෝලෙ යන ළමයින්ට පොත් ගන්නට ක්‍රමයක් නැති බවයි. එනිසා ඊට ආධාරයක් කරන්නට යයි එම ලිපියෙන් කියා තිබුණා. එය ඉතාමත්ම සුළු දෙයක්. නමුත් මට මෙවැනි දේවලින් හැඟී ගියේ කොපමණ සංඛ්‍යාව කට හාල් සේරුව නොමිලයේ දීම නිසා ප්‍රයෝජනයක් සැලසී තිබෙනවාද කියායි. සමහර විට තමුන්නාන්සේ පුදුම නොවන්නට ඇති, හාල් සේරු දෙක ලැබුණු අවස්ථාවේදී ඇතැම් උදවියට එම හාල් සේරු දෙකින් ප්‍රයෝජනයක් කවදාවත් ලබා ගන්නට බැරි වී තිබුණු බව පත්‍ර මාර්ග යෙන් දැනගන්නට ලැබුණු විට. බොහෝ විට හාල් ගැනීමට පවා මුදල් නොමැති නිසා හාල් පොත් උගස් තබා එයින් ලැබෙන සුළු මුදලින් ජීවත් වුණු අවස්ථා තිබෙනවා. හාල් සේරු දෙක මිලදී ගැනීමට තරම් වත්කමක් නොමැති පුද්ගලයන් ගැන අපට දැනගන්න ලැබුණා. එවැනි පුද්ගලයන් ජීවත්වන දුෂ්කර ප්‍රදේශවල ජනතාවට හාල් සේරුව නොමිලයේ දීමෙන් ලැබෙන සහනය ගැන අමුතුවෙන් විස්තර කරන්න වුවමනාවක් නැතැයි මා කල්පනා කරනවා. මා ඒ කාරණය ගැන විශේෂයෙන් සඳහන් කළේ මේ ගරු සභාවේ ඇතැම් මන්ත්‍රීවරුන් සමච්චලයට වාගේ ඒ පිළිබඳව නොයෙකුත් ප්‍රකාශයන් කරන නිසයි.

ගරු කථානායකතුමනි, ගිරුවාපත්තුවය කීවාම ඉස්සර අපේ කඹුරුපිටියේ මන්ත්‍රී තුමා වැනි උදවිය අපට සරදම් කරනවා. අප කුරක්කන් කාලා ජීවත්වන පිරිසක්ය කියා. ඒක සම්පූර්ණයෙන්ම ඇත්ත. අපේ ප්‍රදේශ එතරම්ම දුෂ්කර පළාත්. ජීවත්වීම සඳහා ඉතාමත්ම වෙහෙස ගන්න ඕනෑ. ඒ කෙසේ වුණත් අද පැඟිරි වගාවට දී තිබෙන ස්ථානය ගැන, පැඟිරි වගාව සම්බන්ධ යෙන් ඇති වී තිබෙන උනන්දුව ගැන කල්පනා කර බලන විට එයට වඩා ලොකු සේවයක් එම ප්‍රදේශවාසීන්ට කරන්නට බැරි බව අපට වැටහී යනවා. මා මේ සභා ගර්භයට ආදා සිටම ගරු වෙළඳ ඇමතිතුමාත්, වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්තුමාත්, හම්බන් තොට දිසාපතිතුමාත් සමග සාකච්ඡා කොට පැඟිරි කර්මාන්තය දියුණු කිරීමට විශාල වැඩ කොටසක් කළා. එහි ප්‍රතිඵල යක් වශයෙන් අද පැඟිරි මිල සෑහෙන තත්ත්වයකට නැග තිබෙන බව අපට කියන්නට පුළුවන්. අපේ මුදල් ඇමති තුමාට මා ඒ ගැන ප්‍රශංසා කරන්නේ නැහැ. ටිකක් මිල වැඩි වන විට ඒකටත් බද්දක් දමා තිබෙනවා. ඒකට කරන්නට දෙයක් නැහැ. බදු පනවන්නේ නැතිව කිසිම රටක අය වැය ලේඛනයක් සකස් කරන්නට බැහැ. දුප්පතා පිට වැඩියෙන් බර පටවන්නේ නැතිව තියෙන අයගෙන් හැකි තරම් බදු අය කිරීමයි, කරන්නේ.

ගරු කථානායකතුමනි, කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) කිව්වා, මේක අය වැය ලේඛනයක් නොවේය ණය වැය ලේඛනයක්ය කියා. ඇයි අප ණය වෙලා තියෙන්නේ ? කොලොන්නාවේ මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කීවා, මේ අය වැය ලේඛනයේ තියෙන්නෙ ණයය, අප කවදාවත් මේ තරම් ණයක් ගත්තෙත් නැත, ගන්නට බලාපොරොත්තුවකුත් නැත කියා. මේකද වැඩේ කියා එතුමා ප්‍රශ්න කළා. මේ ආණ්ඩුව භාණ්ඩ ණය අරගෙන තිබෙනවාය, ඒ ආණ්ඩුව භාණ්ඩ ණය ගත්තේ නැත, 1964 අයවැය ලේඛනය බලන්නය කියා එතුමා කිව්වා. එවකට මා මේ සභාවේ නොසිටියත් රහස මොකක්ද කියා දන්නවා. කව්රුවත් එතුමන්ලාට ණය දුන්නෙ නැහැ. ණය ගන්නට ණය දෙන කෙනෙක් ඉන්නට ඕනෑ. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ඇමෙරිකන් කාරයන්ට තිබුණු පෙට්රල් ෂෙඩ්ස් ටික ඔක්කොම අල්ලා ගත්තා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඒක නරකද?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ගැනීම නරක නැහැ. හොඳයි. නමුත් ගත යුතු පිළිවෙළක් තියෙනවා. අපේ ප්‍රතිපත්තිය නම් බලහත්කාරයෙන් නොගැනීමයි. ඒ අය සමග සාකච්ඡා කර සෑහෙන අන්දමට මුදල් ගෙවා හෝ ගෙවන්නට පොරොන්දු වී ගැනීමයි, අපේ ප්‍රතිපත්තිය. පිටරටියකුගේ දෙයක් හෝ මේ රටියකුගේ දෙයක් හෝ බලහත්කාරයෙන් ගැනීම අපේ ප්‍රතිපත්තිය නොවෙයි. එසේ ගැනීමෙන් මොකද වුණේ? ඒ කාලයේදී ඒ අයටත් ඇමෙරිකන් ආණ්ඩුවෙන් විශෙෂ ආධාර ලැබෙමින් තිබුනා. විරුද්ධ පාර්ශ්වයේ අයත් ණය ගත්තා. ඒ අය තමයි, ණය ගන්නට අපට ඉගැන්නුවේ. 1956 දී අප රජය භාර දෙන විට අපේ විදේශ විනිමය අහස උසට නැග තිබුණා. එහෙත් ඒ අය ණය වුණා. අපි දැන් ඒ ණය ගෙවනවා. 1964 අවුරුද්දේ කිසිම භාණ්ඩ ණයක් නොගත්ත බව කොලොන්නාවේ මන්ත්‍රීතුමා කියනවා. නමුත් ඒ කාලයේදී සිදු වුණේ මොකක්ද? ඒ අවුරුදු නවයේ කාලය ඇතුළත අපේ ප්‍රදේශයේ එකම වාරි මාර්ග ක්‍රමයකවත්, එකම පාරකවත් වැඩක් කෙරුණේ නැහැ. පාර හරිගස්සන එකම රෝලක්වත් තිබුනේ නැහැ, ආණ්ඩුව රෝල් වුණා. එක ට්‍රැක්ටරයක්වත් තිබුණේ නැහැ. ඉතින් කොහොමද වැඩ කරන්නේ? ඒ කාලයේදී තිබුණු විදේශ විනිමය වියදම් කළාට කමක් නැහැ. එයින් සංවර්ධන වැඩ කළා නම්. දොම්පේ මන්ත්‍රීතුමා (ඒෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) එදා කී විධියට, සංවර්ධන වැඩ නොකර විදේශ විනිමය ඉතිරි කර තබා ගත යුතුය කියා අප කියන්නේ නැහැ. ඒවා ප්‍රයෝජනයට ගන්නට ඕනෑ. ඒ කාලයේදී විදේශ විනිමය අහස උසට තිබියදී ඒවායින් නියම විධියට ප්‍රයෝජනයක් නොගත් බවයි, අප කියන්නේ. මේ තරම් ණය ගෙන තිබෙනවාය, මේ ණය ගෙවන්නේ කොහොමද කියා කොලොන්නාවේ මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. මුදල් ඇමතිතුමා වෙනදා විධියටම කිව්වා, අපි ඒක බලාගත්තම් කියා. මුදල් ණයට අරගෙන අප ලොකු වැරද්දක් කළ බවයි, කියන්නේ. ප්‍රශ්නය නම් විශාල ණය මුදලක් නොගෙන දියුණු වේගෙන යන ජාතියකට කටයුතු කරගෙන යන්නට පුළුවන්ද කියන එකයි. පෞද්ගලික අංශය ගැන බලන්න. කවුද ගෙදර තිබෙන සල්ලි ගෙනත් බිස්නස් කරන්නේ? මුදල් ඇති අයගෙන් හෝ බැංකුවකින් ආධාර නොගෙන දියුණුවට යමක් කරන්නට බැහැ. අපි ඒ ණය මුදල් අරගෙන ඒවා දියුණුවට අදාළ කටයුතු සඳහා යෙදුවා මිස කෑම් බීම් සඳහා පාවිච්චි කළේ නැහැ. ණයට මුදල් ගන්නවාය කියා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට (ඉලංගරත්න මයා.) ලොකු කැක්කුමක් ඇති වුණා. එහෙත් ඒ අය ආණ්ඩු කළ කාලයේදී අවුරුදු 4 ක් ඇතුළත මුදල් ඇමතිවරු 5 දෙනෙක් සිටියා.

අන්තිමේදී මුදල් ඇමති කෙනෙක් සොයා ගන්නට බැරිවූ විට කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට පින් සිදු වෙන්න එතුමා මගුල් කපුකමක් කර යටියන් තොට මිත්‍රී ආචාර්ය එන්. එම්. පෙරේරා මහතාට මුදල් ඇමතිකම දුන්නා. එතුමා මුදල් ඇමතිකම බාරගෙන කීවේ කුමක්ද? එදා එතුමා කීවේ ඕනෑ තරම් මුදල් ණයට නොගෙන දියුණු වේගෙන යන රටක් කවදාවත් දියුණු කරන්න බැරිය කියලයි, ණයට මුදල් අරගෙන ඒවා කාබාසිනියා කරනවා නම් එය නරකයි. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කීවා 1964 අවුරුද්දේ පාරිභෝගික ද්‍රව්‍ය කිසිවකට පිටරටින් මුදල් ලැබුණේ නැත කියා. එය ඇත්ත. තමුන්නාන්සේලාට ඒ කාලයේ සිදු වූ හරිය මතකද? අද කෑගහනවා එළවලු වගාව කෙරෙනවාය. එළවලු තිබෙනවාය නමුත් ඒවා විකුණා ගන්නට "ට්‍රාන්ස්පෝට්" පහසුකම් නැහැ කියා. ඒ කාලයේ එක ලොරියක්වත් ගන්නට තමුන්නාන්සේලාට විදේශ විනිමය තිබුණෙත් නැහැ; පිටරටවලින් දුන්නෙත් නැහැ. ඉතින් 1964 දී ණය නොගත්තාය කියන එක පුදුමයක්ද? අද තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

බලන්න. දැන් ලොරි විශාල සංඛ්‍යාවක් ලංකාවට ගෙනැවිත් තිබෙනවා. ඒ හැම එකක්ම ආධාර ක්‍රමයටයි. සමහර අය කිව්වා ඒ ලොරි දුන්නේ එක්සත් ජාතික පක්ෂයේ පන්දම්කාරයින්ටය, අර පන්දම් කාරයින්ටය, මේ පන්දම්කාරයින්ටය කියා. ගරු කථානායකතුමනි, මගේ කොට්ඨාශයටත් ලොරි හත අටක්ම ගිහින් තිබෙනවා. මගේ ආසනයේ නම් කොමියුනිස්ට් පක්ෂයේය කියා හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේය කියා හෝ කොටසක් ඇත්තේ නැහැ. ඔහේ අහුමුළුවල ඉන්නවා. අවස්ථාව පැමිණි විට යූ. එන්. පී., ශ්‍රී ලංකා ආදි කොටස් එළියට එනවා. එහෙම නැතිව පක්ෂ බේදයක් නැහැ. මට විරුද්ධව මැතිවරණයේදී වැඩ කළ හුඟ දෙනෙක් ඇවිත් මට කීවා මේ ලොරි අපට දෙන්නට සුදුසුකම් තිබෙනවා කියා ඇමතිතුමා කියා තිබෙනවාය. ඒ නිසා අපට අනුමැතියක් දෙන්නය කියා. මම කිව්වා එහෙනම් මගේ අනුමැතිය ගන්න, මගේ විරුද්ධයක් නැහැ කියා. ඒ අන්දමට "ට්‍රාන්ස්පෝට්" අතිනුත් අපේ පළාත් හුඟක් දියුණු වී තිබෙනවා.

අපේ දෙවිනුවර මන්ත්‍රීතුමාට (ද මෙල් මයා.) තෝරා ගන්නට බැරි ප්‍රශ්නයක් ඇති වුණා. එතුමා කථාව පටන් ගත්තේ කොහොමද? ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේදී කළ කථාව තමුන්නාන්සේලා හුඟදෙනෙක්ම අහගෙන ඉන්න ඇති. එතුමාගේ අදහස්වලට තමුන්නාන්සේලා එකඟ වුණත් නොවුණත් එතුමාගේ කථාව ඉතාමත්ම ලක්ෂණට කරුණු සහිතව කාරණයට අදාළව කළ කථාවක්ය කියන එක කවුරුත් අවිවාදයෙන් පිළිගන්නට ඕනෑ. අපේ කථා වගේ නොවෙයි, ඒ කථාව මේ විවාදයට ඔබින කථාවක්. එහෙත් දෙවිනුවර මන්ත්‍රීතුමා එතුමාගේ කථාව පටන් ගත්තේ කොහොමද? රාජ්‍ය ඇමතිතුමාගේ ඒ කථාව ෂේක්ස්පියර්ගේ කෘතියක එන "වර්ඩ්ස් වර්ඩ්ස් වර්ඩ්ස් පමණයි" කියමිනුයි. මට පුදුමයි. ඒ මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන සිටි විට මට කියන්නට හිතුණා එතුමාගේ කථාව නම් ෂේක්ස්පියර්ගේ "වර්ඩ්ස් වර්ඩ්ස් වර්ඩ්ස් මිස තේරුමක් නැත" කියන කථාවට ගැලපෙන බව. දෙවිනුවර මන්ත්‍රීතුමා හිටපු සිවිල් නිලධාරියෙක්. භාෂා පිළිබඳව දන්නවා. භාෂා දැනගෙන හිටි පළියට ෂේක්ස්පියර් දැනගත් පළියට ලැටින් දැනගත් පළියට ඒවා නොයෙදිය යුතු තැන්වලට යෙදීම හරි නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේ තිබෙන්නේ වචන පමණක්ය කියා කියන්නේ කවුද? අනෙක් අතට වචන නැතිව කථා කරන්නටත් බැ නොවැ? කථා කරන විට ලස්සන වචන තිබෙන්නට ඕනෑ. ඒ වාගේම ලස්සන අදහස් තිබෙන්නට ඕනෑ. කථාව තේරුම් ගන්නට බැරි වීම වෙනම ප්‍රශ්නයක්. මා කියාගෙන ආවේ කෘෂිකාර්මික දියුණුව ගැනයි.

ඊළඟට ධීවර කර්මාන්තය ගැන කල්පනා කර බලමු. ධීවර කර්මාන්තය අතින් දෙවිනුවර ප්‍රදේශයේ කිසි දියුණුවක් නැති බව දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය ගැන මා පුදුම වෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමා දෙවිනුවර කොට්ඨාශය නියෝජනය කළත් ධීවර කාර්මිකයාගේ තත්ත්වය පිළිබඳ අවබෝධයක් එතුමාට ඇද්දැයි මට සැක හිතෙනවා. නියම අවබෝධයක් තිබෙනවා නම් ඒ විධියට කථා කරන එකක් නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේත් ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් සැහෙන පිරිසක් සිටිනවා. දැනට අවුරුදු දහයකට පෙර පැවති තත්ත්වයත්, අද පවතින තත්ත්වයක් සසඳා බලන විට, ඒ ප්‍රදේශය ධීවර කර්මාන්තය අතින් සැහෙන දියුණුවක් ලබා තිබෙන බව පෙනී යනවා. තවත් දියුණු වන්නට වුවමනා බව ඇත්තයි. තව තවත් බෝට්ටු ලබා ගන්නට, වුවමනා කරන වෙනත් උපකරණ ලබා ගන්නට මහන්සි ගන්නවා. නියම විධියේ සැලැස්මක් ඇති වුණායින් පසු ඒ කාර්මිකයන්ට ඇති අනෙක් අඩු පාඩුකම්ද නැති කරන්නට පුළුවන් වේවි. ඔවුන්ගේ වුවමනා ඉෂ්ට කර දෙන්නට පුළුවන් වේවි.

ගරු කථානායකතුමනි, මෙම රජය පිහිටුවූවායින් පසු ගරු ධීවර ඇමතිතුමා තංගල්ලේ ධීවර වරායක් ඇති කරන්නට කටයුතු කළා. දැන් ඒ වරාය පිහිටුවා ඉවරයි. අනෙක් වුවමනා කරන කටයුතු සකස් කරගෙන යනවා. කොළඹ සිට තිස්සමහාරාමයට යන තුරු ඇති මුහුදු තීරය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල්පනා කරන විට මාලු ඇල්ලීම අතින් අද තංගල්ල ප්‍රමුඛස්ථානය නොවෙයි නම් දෙවැනි ස්ථානය ගන්නවා. ඒ අංශයෙන් ඒ තරම් දියුණුවක් අද ලබා තිබෙනවා. ඔය වැඩ තමයි, විදේශ විනිමය පාවිච්චි කරමින් අප කර තිබෙන්නේ. විදේශීය රටවල් අප ගැන ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. අප බංකොලොත් නොවන බවට ඒ රටවල් තුළ විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා අපට ලොකු සැලකිල්ලක් ලැබෙනවා. අපේ ගරු මුදල් ඇමතිතුමාට ලෝක බැංකුවේ මුදල් මණ්ඩලයේ සභාපති තනතුර ලැබුණු බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් දන්නවා ඇති. ඒක අපට කොයි තරම් සැලකිල්ලක්ද? එවැනි සැලකිල්ලක් ලැබෙන්නේ විදේශීය රටවල් අප කෙරෙහි විශ්වාසය තබා තිබෙන නිසයි. ඒ නිසා මේ රට බංකොලොත් වේගන යනවා යයි සමහර මන්ත්‍රීවරුන් තුළ හැඟීමක් තිබෙනවා නම් එහි කිසි හරයක් නැති බවත්, එවැනි අදහස් සිතින් ඉවත් කර ගත යුතු බවත් මා මතක් කරන්නට කැමතියි. ගරු මුදල් ඇමතිතුමා සහ මෙම ආණ්ඩුව ගැන විදේශීය ජාතීන් තුළ විශ්වාසයක් තිබෙනවා. අප හරි මඟ යන බවට ඒ අය තුළ හැඟීමක් තිබෙනවා. අපට සියයට සියයක් කාරණා ඉෂ්ට කර ගන්නට බැරි වන්නට ඇති. එහෙත් අප නිවැරදි පියවරවල් ගෙන තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා ඇති. තමුන්නාන්සේලා නොයෙකුත් විදේශීය සඟරා ආදිය කියවනවා ඇතැයි මා හිතනවා. ඒ සඟරාවලින් අපේ ආර්ථික දියුණුව ගැනත් කියවන්නට අවස්ථාව ලැබෙන්නට ඇති. අපේ රටේ දළ ජාතික නිෂ්පාදිතය සියයට 8 කින් වැඩි වීම ගැන ලෝකයේ වෙනත් රටවල් පුදුම වෙනවා. ඇත්තෙන්ම මේ තත්ත්වය අප ලබා ගත්තේ කෙසේදැයි මුදල් පිළිබඳ ගනුදෙනු කරන ජාතීන් කීපයක් මේ ගැන පුදුමය පළ කර තිබෙනවා. අප ගත් ක්‍රියා මාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් තමයි, අපට ඒ තත්ත්වය ලබා ගන්නට පුළුවන් වුණේ. මේ යන මාර්ගය දිගේ ඉදිරියට යැමෙන් තමයි, අපේ අනෙක් ප්‍රශ්නත් නිරාකරණය කර ගන්නට අපට පුළුවන් වන්නේ.

රැකීරක්ෂා ප්‍රශ්නය ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින්ම සඳහන් කරන්නට යෙදුණා. රැකීරක්ෂා ප්‍රශ්නයේ අද පවතින තත්ත්වය මා පිළිගන්නවා. ඒ වාගේම ඒ ගැන කනගාටු වෙනවා. 1956 න් පෙර තිබුණු තත්ත්වයට අපේ රටේ අධ්‍යාපනය පත් කරන්නට මේ ආණ්ඩුව උත්සාහ කරන බවට බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බණ්ඩාර මයා.) චෝදනාවක් කළා. ඇත්තෙන්ම මේ මන්ත්‍රීවරුන් මැටි උපන්නාදැයි මා දන්නේ නැහැ. පිටිසර දුප්පත් ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය අතින් නියම තැනක් දුන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආදි කර්තෘන් බව ඒ ගරු මන්ත්‍රීවරුන් දන්නේ නැද්ද? සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාට පිං සිදු වන්නට, මේ රටේ දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබන්නට පුළුවන් වී තිබෙනවා. පිටිසර ප්‍රදේශවල දරුවන්ගෙන් අපේ විශ්ව විද්‍යාල පිරෙන්නට පටන් ගත්තේ 1956 න් පසුව ඇති කරන ලද අමුතු තත්ත්වයක් නිසා නොවෙයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් අධ්‍යාපනය ගැන කථා කරන්නේ, නිදහස් අධ්‍යාපනය ගැන කිසිම මතකයක් නැතිවා වාගෙයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට කලිනුයි නිදහස් අධ්‍යාපනය ඇති කළේ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඇයි අප්පේ, කන්නන්ගර මහත්මයා කැපුවත් තිබෙන්නේ යූ. එන්. පී. ලේ නොවැ? උන්නැහේ ඩී. එස්. සේනානායක මහත්මයා සමඟ එකට වැඩ කළා. උන්නැහේ අපේ පක්ෂයේ පියා නොවෙයි මුත්තෙක්. ඒ වාගේම වර්තමාන මුදල් ඇමතිතුමා වැනි අය නිදහස් අධ්‍යාපනයේ පුරෝගාමියෝ. පැය 24 න් සිංහලය රාජ්‍ය භාෂාව කරනවාය, දෙමළත් නැති කරනවාය කියන පොරොන්දු අනුව ඇති වුණු දේශපාලන ගංවතුරට අසුවී තමුන්නාන්සේලා මේ පැත්තට ආවා. එක්සත් ජාතික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
පක්ෂයට ඡන්දය දීම අපායට යන තරමේ පවක් හැටියට ඒ කාලයේ ප්‍රචාරය කළා. හාමුදුරුවරුන් එකතු කරගෙන ඒ අන්දමටයි 1956 දී මැතිවරණ ප්‍රචාරය ගෙන ගියේ.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
එහෙම කීවේ තමුන්නාන්සේලායි.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
මා නම් කවදාවත් එහෙම කියා නැහැ. එවැනි ගජබින්නාලංකාර කථා මා නම් කියන්නේ නැහැ. මගේ ආගම මට බොහොම උතුම්. ආගම කෙරෙහි මා තුළ ලොකු ගෞරවයක් තිබෙනවා. එම නිසා මගේ දේශපාලන වේදිකාවට භික්ෂූන් වහන්සේ නමක්වත් වැඩමවන්න මා කැමැති නැහැ.

අපේ ආණ්ඩුවකින් නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇරඹුවා. එහෙත් මා කලින් සඳහන් කළ විධියේ දේශපාලන ගංවතුරකින් මේ පැත්තට ආ තමුන්නාන්සේලා අපේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා කළේ මොකක්ද? පුළුවන් තරම් එස්. එස්. සී. කාරයන් බෝ කළා. ඒ මිස රටේ අවශ්‍යතාවන් සපුරාලන විධියට අධ්‍යාපනය හැඩ ගැසුවේ නැහැ. විශ්ව විද්‍යාල කීපයක් නම් අළුතින් ඇති කළා. ඒවායේ ඉගැන්නුවේ බුද්ධ ධර්මය, සිංහල භාෂාව හා බෞද්ධ සංස්කෘතිය වැනි විෂයයනුයි. රටට අවශ්‍ය විධියේ උගතුන් බිහි කිරීම සඳහා අපේ අධ්‍යාපන ක්‍රමය හැඩ ගැස්වීමට තමුන්නාන්සේලා කටයුතු නොකළ නිසා තමයි, අද රැකීරක්ෂා ප්‍රශ්නය මේ තරම් උග්‍ර වී තිබෙන්නේ.

දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (ද මෙල් මයා.) කියනවා, තමන්ගේ වෙළඳ කටයුතු සිංහලෙන් කරන ලෙස මේ රටේ කොම්පැණිවලට බල කරන්න ඕනෑය කියා. කරන්න පුළුවන් දේවල් එපායැ, කථා කරන්න. අසුවල් භාෂාවෙන් වැඩ කරන්න ඕනෑ යයි වෙළඳුන්ට බල කරන්නේ කොහොමද? ද්‍රවිඩයා ද්‍රවිඩ භාෂාවෙනුත්, ඉංග්‍රීසි කාරයා ඉංග්‍රීසි භාෂාවෙනුත්, චීනා චීන භාෂාවෙනුත් තමන්ගේ වෙළඳ කටයුතු කරගෙන යාම නවත්වන්න බල කරන්නේ කොහොමද? ඒ විධියට මේ ගරු සභාවේ කීවාම, තමා සිංහලය වෙනුවෙන් සටන් කරන බව ඡන්දදායකයන්ට දැන ගන්නට ලැබෙන නිසා ඒ විධියට කියනවා. මේ වාගේ විකාර කථා කියන්නේ ඇයි ?

මා කලින් සඳහන් කළ අන්දමට තමුන්නාන්සේලා අධ්‍යාපනය නියම විධියට හැඩගැසුවේ නැති නිසා සිදු වුණේ මොකක්ද? සම්මාන හතර පහ ඇතිව එස්. එස්. සී. සමත් වුණු උදවිය එක පවුලේ දෙන්නා තුන් දෙනා බැගින් ඇති වුණත්, ඔවුන්ට රැකීරක්ෂා ලැබුණේ නැහැ. ඒ අයට රැකියා සැපයීම සඳහා තමුන්නාන්සේලා කළේ මොකක්ද? කළේ, එකම දෙයයි. 1964 දී තමුන්නාන්සේලා 22,000 කට රැකීරක්ෂා සපයා තිබෙනවා. එහෙත් මට මතක හැටියට නම් තමුන්නාන්සේලා 1963 දී රැකීරක්ෂා සපයා තිබෙන්නේ 9,000 කට පමණයි. 1962 දී ඊටත් අඩුයි. මේ අන්තිම අයවැය ලේඛනය මගින් අපෙනුත් එවැන්නක් කෙරෙතැයි තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණා. සුදුසුකම්, අවශ්‍යතාවන් ගැන කිසිම තැකීමක් නොකර රැකියා නැති හැමෝටම මේ අන්තිම අවුරුද්දේ රැකියා ලබා දෙතැයි සමහරුන් බලාපොරොත්තු වුණු බව අප දන්නවා. අපේ ප්‍රධාන ප්‍රශ්න දෙක—කෑම හා ඇඳීම—විසඳන අතරම නියම විධියට රැකියා සපයන්නටයි, අප කටයුතු කරන්නේ. නියම සැලැස්මක් ඇතිවයි, අප ආර්ථික ප්‍රශ්න විසඳන්නේ. රටට අවශ්‍ය, ප්‍රයෝජන සැලසෙන ආකාරයට අප රැකියා දෙනවා. ඒ මිස ඡන්දය ගරා ගැනීමේ බලාපොරොත්තුවෙන් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට අප කටයුතු කරන්නේ නැහැ. අප කටයුතු කරන විධියෙන් රටටත්, ජනතාවටත් විශාල සේවයක් සැලසෙනවා.

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දොස් කියන අතරම, ශිෂ්‍ය ගුරුවරුන් වශයෙන් පත් කර ඇත්තේ යූ. එන්. පී. කාරයන් පමණක් යයි කීවා. ඇමතිතුමා ප්‍රදේශයේ මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාට ලැයිස්තුව දුන්නාම, එයින් තමන් කැමති අය කවුරුදැයි මන්ත්‍රීතුමා ඇමතිතුමාට දන්වනවාලු. ඒ අනුවලු ශිෂ්‍ය ගුරු පත්වීම් දුන්නේ. අනේ ගරු මන්ත්‍රීතුමනි, ඔය තරම් පහත් අදහසක් ඇමතිවරයකු තුළ තබා මන්ත්‍රීවරයකු තුළවත් පහළ වෙනවාද කියා මට නම් සැකයි. ප්‍රසිද්ධ විභාගයක් පවත්වනවා. විශාල සංඛ්‍යාවක් ඒ විභාගයට පෙනී සිටිනවා. ඊළඟට දිස්ත්‍රික්ක අනුව පත්වීම් දෙනවා. එක දිස්ත්‍රික්කයක වුණත් දාහක් හමාරක් ඉන්නවා. ඔය දාහෙන් හමාරෙන් පත්වීම් ලැබෙන්නෙත් විසිපස් දෙනෙකුටයි. නැත්නම් තිස් දෙනෙකුටයි. ඒත් නැත්නම් හතළිස් දෙනෙකුටයි.

එක් අවස්ථාවකදී මගේ කොට්ඨාශයේ තිස් එක් දෙනෙකුට පත්වීම් ලැබුණා. තවත් අවස්ථාවක හතළිස් පස්දෙනෙකුට පමණ ලැබුණා. ඒ එක් අවස්ථාවක නරක තත්ත්වයක් පැන නැඟුණ බව මට මතකයි. ඔන්න ඕක මන්ත්‍රීතුමන්ලාට කරන්නට පුළුවන්ය කියා සම්මුඛ පරීක්ෂණයක් ගැන මට කිව්වා. ඒ අවස්ථාවේදී අනේ, අප ඕවාට ඇද ගන්නට එපාය කියා මා අවංකවම කියා සිටියා. ලකුණු තිබෙනවා නම්, ඇස් තිබෙනවා නම්, කන් තිබෙනවා නම් ඒ වැඩේ කරන්නට ඔය සම්මුඛ පරීක්ෂණයක් වුවමනා නැත කියා මා කිව්වා. එමනිසා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ සම්පූර්ණ අසත්‍යයක්. මා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාගෙන්ම ප්‍රශ්නයක් අසන්නට සතුටුයි. තමුන්නාන්සේලාගේ කොට්ඨාශයක එක්සත් ජාතික පක්ෂයට හිතවත් හෝ තමුන්නාන්සේලාට විරුද්ධ වෙනත් පක්ෂයකට හිතවත් ළමයකු ඒ විභාගයෙන් පළමුවන තැනට තේරී තිබෙනවාය කියමු. ඔහු අත්හැර විසි වන ස්ථානය ගෙන තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත් වෙනත් ළමයකුව ඔහුගේ ස්ථානයට පත් කරන්නට කිසිම කෙනෙකුට පුළුවන්කමක් තිබෙනවාද? කාටද එහෙම කරන්නට පුළුවන්? එවැනි දෙයක් කරන්නට තරම් තදබල උණු නොවන හෘදය වස්තුවක් තිබෙන්නේ කාටද? එමනිසා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ සම්පූර්ණ අසත්‍යයක් බව මා නැවතත් ප්‍රකාශ කරනවා. තවත් එවැනි දේවල් රාශියක් කිව්වා. මා ඒ සෑම කරුණක් ගැනම කථා කරන්නට අදහස් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකු කථා කරන ගමන් නැත්නම් කථාව ආරම්භ කරන ගමන් ඒත් නැත්නම් කථාව අවසාන කරන ගමන් අපේ ගරු මුදල් ඇමතිතුමාට විශේෂ මල් මාලාවක් පළඳවමින් දේශපාලන වශයෙන් නොව පෞද්ගලික වශයෙන් එතුමන්ලාගේ ගෞරවය මුදල් ඇමතිතුමාට හිමි වෙනවාය කිව්වා. එතුමා මේ පිහිටුවා තිබෙන වාර්තාව ලෙහෙසි පහසු වාර්තාවක් නොවෙයි. අවුරුදු හතරක් ඇතුළත මුදල් ඇමතිවරු පස් දෙනෙකු පත් කරලත් තමුන්නාන්සේලාට කරන්නට බැරි වුණා. නමුත් වන්නියේ සිට පැමිණි අපේ මුදල් ඇමතිතුමා දිගටම මුදල් අමාත්‍ය ධුරය දරමින් 1965 න් පටන් ගෙන 1975 වන තෙක් අය වැය ලේඛන ඉදිරිපත් කළොත් තමුන්නාන්සේලා පුදුම වෙනවා නේද? ගරු මුදල් ඇමතිතුමා අපේ පෞද්ගලික මිත්‍රයෙක්. අපේ ගෞරවය සදාකාලිකව එතුමාට හිමි වෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා ඉතා උසස් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. වාර්තාවක් පිහිටුවමින් එතුමාට පිට පිට පස් අවුරුද්දක් තුළම අයවැය ලේඛන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන අප ඉතාම සතුටු වෙනවා. නමුත් එතුමාට නැවතත් මුදල් ඇමතිකම ලැබේවාය කියා මා ප්‍රාර්ථනා කරන්නේ නැහැ. මා කරන්නේ ඊටවඩා උසස් ප්‍රාර්ථනයක්. මේ හේතුවෙන් එතුමාගේ ජීවිතයම වාසනාවන්ත වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

තමුන්නාන්සේලා නම් දැනටමත් දිනල ඉවරයි. ඇමැතිකම් පවා බෙදා ගෙන ඉවරයි. කෘෂිකර්ම ඇමති පදවිය දෙන්නට සිතා ගෙන සිටින තැනැත්තාට ආසනයවත් ලැබේද කියා මට නම් සැකයි. ඇමතිකම් දෙන්නට සිතා ගෙන සිටින සමහර අයට ආසනයවත් ලැබේවිද කියා මා දන්නේ නැහැ. එමනිසා මා එවැනි දේවල් ගැන කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. මට නම් පරාජය වුණත් කමක් නැහැ. ජයග්‍රහණය කරන්නටම මගේ බලාපොරොත්තුවක් නැහැ. දැන් සිටම ඕවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
කපා ගන්නට එපා. ඒ මක්නිසාද? මේ කාලය හොඳ නැහැ. එන පිළිවෙළ හොඳ නැහැ. තමුන්නාන්සේලා කොපමණ කිව්වත් දැන් මේ රටේ මහජන මතයක් ඇති වී තිබෙනවා. අපේ දුර්වලකම් තිබෙන බව ඇත්තයි. නමුත් එක් දෙයක් ගැන අප කල්පනා කරන්නට ඕනෑ. අපි යම් කිසි පියවරක් ගත්තා. අපට විරුද්ධව නොයෙකුත් චෝදනා එල්ල කළා. අල්ලස් ගන්නවාය ආදී වශයෙන් නොයෙකුත් චෝදනා එල්ල කළා. අපේ පැත්තෙ අය අතිනුත් වැරදි කෙරෙනවා ඇති; මම නැහැයි කියන්නේ නැහැ. නමුත් අපේ පැත්තේ අය අල්ලස් ගත් ආකාරය කියන්න කලින් තමුන්නාන්සේලාට හොඳට අත් සෝදා ගෙන එන්න වේවි. තමුන්නාන්සේලාගේ මිනිසුන් අල්ලස් ගත්ත හැටි හොඳට මතක ඇති නේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒවා හෝදන්න මුළු ලංකාවේම තිබෙන සබන් ටික ගත්තත් මදිලු.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
තමුන්නාන්සේලා සමග එකතු වී ක්‍රියා කළ අය කියනවා ලංකාවේ තිබෙන සබන් ඔක්කොම ගත්තත් මදිය අපේ තිබෙන ලේ සෝදා ගන්න කියා. ඒ නිසා ටිකක් පරිස්සමින් ඉන්න. අනාගතයේදී මොන මොන විධියේ දේවල් සිදු වෙයිද දන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මා මීට වැඩියෙන් කතා කරන්න අදහස් කරන්නේ නැහැ. මගේ කථාව මෙයින් අවසන් කරනවා.

පූ. භා. 11.41

**එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)**
*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*
(Mr. S. M. Rasamanickam—Paddiruppu)
கௌரவ சபாநாயகரவர்களே, இந்த ஐந்தாவது வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்த நிதி அமைச்சரவர்களை சம்பிரதாய முறைப்படி நான் வாழ்த்தக் கடமைப்பட்டவனாக இருக்கிறேன். வழக்கமாக இருக்கின்ற விறுவிறுப்பும் ஹாஷ்யமும் அவரது இந்தப் பேச்சிலே அமையவில்லை. சென்ற காலத்தில் நிதி அமைச்சர் உபகதைகளைக் கூறிப் பல கேலிச் சித்திரங்களைத் தீட்டி இந்தச் சபையிலேயுள்ள அங்கத்தவர்களைச் சிரிப்புக்குள்ளாக்கி, மிகவும் உருக்கமாகப்பேசி தமது வரவுசெலவுத்திட்டங்களைச் சமர்ப்பித்தார். ஆனால் இந்த முறை அவைகளையெல்லாம் நாம் காணவில்லை. தண்டவாளத்திலே ஓடுகின்ற ரெயில்போல இந்த முறை அவருடைய வரவுசெலவுத்திட்டம் ஐந்தாவது முறையாகத் தாமாகவே உருண்டு கொண்டு சென்றது.

நாட்டின் அபிவிருத்தி, சென்ற சில ஆண்டுகளாகக் கூடிவந்திருக்கிறதென்பதை நான் ஒப்புக்கொள்ளுகிறேன். கிருஷிகத்தில், நெல் விளைச்சலில், கைத்தொழிலில் சுகாதார முன்னேற்றத்தில், சில அபிவிருத்தியை நாம் கண்டிருக்கிறோம். ஆனால் இந்த அபிவிருத்தி, இலங்கையிலுள்ள எல்லாப்பகுதிகளிலும் பரவலாக ஒரேயளவிலே நடக்கவில்லை என்பதுதான் என்னுடைய குற்றச்சாட்டு. இதுவே நான் நிதி அமைச்சரவர்களுக்கும் இந்த அரசாங்கத்துக்கும் கூறும் குற்றச் சாட்டாகும். வரவுசெலவுத்திட்டமென்றால் வரவையும் செலவையும் சமன்படுத்துவது மாத்திரமல்ல. நாட்டின் அபிவிருத்தியை செலவின் மூலம் வழிநடத்துவதுதான் வரவுசெலவுத்திட்டத்தின் பிரதான கடமையாக இருக்க வேண்டும். உணவு உற்பத்தி, சமூக சேவை, சுகாதார சேவை ஆகிய பல சேவைகளை இந்த நாட்டிடிலே அபிவிருத்தி செய்வதற்காக அரசாங்கம் பல நடவடிக்கைகளை எடுத்த போதிலும், இந்த நடவடிக்கைகள் நாட்டின் எல்லாப் புறங்களிலும், மூலை முடுக்குகளிலும் பாமர மக்கள் வாழுகின்ற பிரதேசங்களிலும் ஒரே சமமாக நடக்கவில்லை என்பதை நான் கூறி வைக்க விரும்புகிறேன். ஆகையினாலே நகரங்களிலும் நகரங்களை அண்டியிருக்கும் பட்டணப்புறங்களிலும் கூடிய அபிவிருத்தி முன்னேற்றம் காணப்படுகையில், கிராம மக்கள் வாழும் கிராமப் புறங்கள் குறைந்த அபிவிருத்தியைப் பெறக்கூடியதாக இன்னுமிருப்பதை நாம் கேட்டு விசனிக்க வேண்டியவர்களாக இருக்கிறோம்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கிருஷிகத்தை நாம் எடுத்துப் பார்ப்போம். விளைச்சல் கூடியிருக்கிறது. ஏக்கருக்குக் கூடிய விளைச்சல் ஏற்பட்டிருக்கிறது. கூடிய நிலங்கள் அபிவிருத்திசெய்யப்பட்டிருக்கின்றன. ஆனல் உண்மையிலே விவசாயிகள் இந்தக் கூடுதலான விளைச்சலின் பலனை எல்லாப் பகுதிகளிலும் சமமாகப் பெற்றிருக்கின்றார்களோ என்ருல் இல்லையென்றுதான் கூறவேண்டும். போக்குவரத்து வசதிகள் உள்ள பகுதிகளில், தேவையான சாதனங்களைப் பெறக் கூடிய பகுதிகளில், தாங்கள் சாகுபடி செய்யும் பொருட்களைத் தகுந்த விலைக்கு விற்கக் கூடிய பகுதிகளில் விவசாயிகள் இலாபத்தைப் பெறக்கூடியதாயிருப்பதையும், தக்க வசதிகள் இல்லாத பகுதிகளில் அவர்கள் பெறும் இலாபம் எல்லாம் செலவுகளிலே விரயம் செய்யப்பட வேண்டியிருப்பதையும் நாம் காணக்கூடியதாக இருக்கின்றது. அபிவிருத்தி அடையாத பகுதிகளில் விவசாயிகள் தங்கள் விளைபொருட்களை விற்பனை இடங்களுக்கு எடுத்துச் செல்லக்கூடிய பாதை வசதிகள் இல்லை. விதை நெல்லை ஏற்றிச் செல்லத் தகுந்த போக்குவரத்து வசதிகள் இல்லை. நிலங்களை உழவு செய்ய நியாயமான விலைக்கு உழவு இயந்திரங்களைப் பெறக்கூடிய வசதி இப்பொழுது இல்லை. ஆகவே, விவசாயிகள் மிக நவீன முறையில் பசளைகள் இட்டு உற்பத்தியைப் பெருக்கிய போதிலும் அதற்காக ஏற்படும் செலவு சென்ற காலங்களைப் பார்க்கிலும் இப்பொழுது அவர்களை ஆட்கொண்டு விடுகின்றது.

சென்ற காலங்களிலே ஓர் உழவு இயந்திரம் ஏறக்குறைய பத்தாயிரம் ரூபாவுக்கு வாங்கக் கூடியதாக இருந்தது. ஆனல், இன்று இருபதாயிரம் ரூபாவுக்கு மேல் உழவு இயந்திரம் விற்கப்படுகின்றது. அவற்றை வாங்கி வாடகைக்கு விடுகின்ற பொழுது சென்ற காலங்களில் ஓர் ஏக்கரை மூன்று முறை உழவு செய்ய ஏறக்குறைய 30 ரூபா செலவானது. ஆனல், இன்று 85 ரூபா மட்டில் செலவுசெய்யவேண்டியிருக்கின்றது.

ஆகவே, இந்த நிலையில் மக்களுடைய அபிவிருத்தி ஒரு கோணத்தில் தான் சென்று கொண்டிருக்கின்றது என்று கூறிவைக்க விரும்புகிறேன். விவசாய உபகரணங்களின் இறக்குமதிக் கட்டணங்களைக் குறைக்கிருேம் என்று கூறும் அரசாங்கம் உழவு இயந்திரங்கள் போன்ற விவசாயிகளுக்கு இன்றியமையாத இயந்திரங்களைக் கூடிய விலையில் இறக்குமதி செய்ய வேண்டிய நிலையை ஏற்படுத்தி வைத்திருப்பது துக்கப்படக்கூடிய விஷயமாகும். ஆகவே, விவசாயிகளுக்காகச் செய்யக்கூடிய வசதிகளையிட்டு பிரச்சாரங்களைச் செய்யும் நாம் அவர்கள் தங்கள் விவசாயத்தைக் குறைந்த செலவில் செய்யக்கூடிய வசதிகளைச் செய்துகொடுக்கக் கடமைப்பட்டவர்களாக இருக்கின்ருேம்.

இலங்கையிலே பல பகுதிகளைப் பார்த்தால் அங்கெல்லாம் நீர்ப்பாசன வசதிகள் குறைவாக இருக்கின்றன. குடியேற்றத் திட்டங்களை எடுத்துக்கொள்வோம். அரசாங்கம் குடியேற்றத் திட்டங்களை ஏற்படுத்தி, அந்தக் குடியேற்றத் திட்டங்களில் மக்களைக் குடியிருத்தி, அவர்களுக்கு உதவிகளை அளித்த போதிலும் அவர்களுக்குப் பூரண வசதிகளைச் செய்து கொடுக்கவில்லை. உதாரணமாக, கல்லோயா அபிவிருத்திப் பகுதியின் இடது கரை வாய்க்கால் பிரதேசத்தில் குடியேற்றத் திட்டங்களை ஏற்படுத்தி அங்கு மக்களைக் குடியிருத்திய போதிலும் அவர்களுக்குப் போதிய நீர்ப்பாசன வசதிகளையோ, போக்குவரத்து வசதிகளையோ, மற்றும் சுகாதார, கல்வி வசதிகளையோ ஏற்படுத்திக் கொடுக்காத காரணத்தினுல் அவர்கள் திண்டாடிக் கொண்டிருக்கிருர்கள். பல பிரதேசங்களிலுள்ள குடியேற்றத் திட்டங்களின் நிலை இதுவாகத்தான் இருக்கும். அப்படியான குடியேற்றத்திட்டங்களில் அக்கறை செலுத்துவதும் நுணுகி ஆராய்ந்து அக்குடியேற்றவாசிகளுக்குத் தேவையான வசதிகளைச் செய்து கொடுப்பதும் மிகவும் இன்றியமையாததாக இருக்கின்றது.

மாவட்ட இணைப்புக்குழுக் கூட்டங்களிலும் விவசாயக் கூட்டங்களிலும் இப் பிரச்சினைகளை ஆராய்ந்து அவற்றுக்குப் பரிகாரம் காண வேண்டுமென்று அரசாங்கம் அறிவித்திருந்த போதிலும் அவற்றில் எடுக்கப்படும் முடிவுகளுக்கு அரசாங்கம் தக்க நடவடிக்கைகள் எடுக்காமல் இருப்பதனுல் குடியேற்றவாசிகள் இன்று ஏமாந்த நிலையில் இருக்கிருர்கள். அவர்கள் தங்களுடைய கிராமங்களில் வாழ்ந்ததும் இல்லை; புதிய குடியேற்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]
றக் கிராமங்களில் நன்கு வாழக்கூடிய நிலையிலும் இல்லை. இந்த நிலையில் அவர்கள் தத்தளிக்கிருர்கள்.

சில குடியேற்றத் திட்டங்களில் விவசாயம் செய்வதற்கு நீர்ப்பாசன வசதிகள் இல்லாலது மாத்திரமன்றி குடிநீர் இல்லாத கஷ்டமும் இருக்கின்றது. அவர்களுக்கு ஆழக் கிணறுகளை அமைத்துக் குடிநீர் வழங்கப்படுமென்று அரசாங்கம் சொன்னபோதிலும் இதுவரை எதுவும் செய்யப்படவில்லை. பல ஆண்டுகளாக இது விடயத்தில் பாராளுமன்றப் பிரதிநிதிகள் ஏமாந்தே வருகின்ருர்கள். உதாரணமாக என்னுடைய தொகுதியிலுள்ள குடியேற்றத் திட்டங்களில் உள்ள குடிநீர்த் தட்டுப்பாடு பற்றி நான் பல சந்தர்ப்பங்களில் அரசாங்கத்திற்கு எடுத்துக் கூறியும் அரசாங்கம் குடியேற்றவாசிகளின் நலன்களைக் கவனித்ததாகத் தெரியவில்லை. என்னுடைய தொகுதியிலுள்ள நிலைதான் இன்னும் பல தொகுதிகளில்—

**ටී. සිවසිතම්පරම් මයා.** (වවුනියාව)
(திரு. ரி. சிவசிதம்பரம்—வவுனியா)
(Mr. T. Sivasithamparam—Vavuniya)
வவுனியாவில்—

**රාසමානික්කම් මයා.**
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
இருக்குமென்று நம்புகிறேன். 1967-68 ஆம் ஆண்டில் நாம் எதிர்பார்த்ததை விடக் கூடுதலாக நெல் விளைவிக்கப்பட்டிருப்பதாக உணவு, விவசாய அமைச்சர் பெருமைப்படுகிருர். இது பற்றி நாமும் பெருமைப்படாமல் இருக்க முடியாது. விவசாயப் பகுதிகளாக இருக்கும் கிழக்கு மாகாணம், மன்னர்—

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்னுயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)
வவுனியா—

**රාසමානික්කම් මයා.**
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
ஆம்;

**ටී. සිවසිතම්පරම් මයා.**
(திரு. ரி. சிவசிதம்பரம்)
(Mr. T. Sivasithamparam)
ஏன் எனது தொகுதியைச் சொல்லத் தயங்குகிறீர்கள்?

**රාසමානික්කම් මයා.**
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
—தயங்கவில்லை. உங்கள் தொகுதி அடிக்கடி ஞாபகத்திற்கு வருவதில் தாமதமாகிறதே அல்லாமல் வேருென்றுமில்லை—ஆம்; வவுனியா போன்ற பிரதேசங்களில் இன்னும் போதிய அளவு உதவிகளை அரசாங்கம் விவசாயிகளுக்குச் செய்து கொடுக்க வேண்டும். ஆகவே அரசாங்கம் கூடிய அளவு விளைச்சலைப் பெற்றுள்ளோம் என்று பெருமைப்பட்டுக் கொண்டிருக்காமல் அந்தக் கூடுதலான விளைச்சலைக் குறைந்த செலவில் விவசாயிகள் பெற்றுக் கொள்ளக்கூடியதாக ஒழுங்குகள் செய்யப்பட வேண்டும். என்னுடைய நண்பர் வவுனியாப் பிரதிநிதி தலையை அசைக்கிருர்; அவரும் என்னுடைய கருத்தை ஏற்றுக் கொள்வார் என்று நம்புகிறேன்.

**ටී. සිවසිතම්පරම් මයා.**
(திரு. சிவசிதம்பரம்)
(Mr. T. Sivasithamparam)
எனது பதிலைச் சொல்ல வேண்டிய நேரத்தில் சொல்லுவேன்.

**රාසමානික්කම් මයා.**
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)
கௌரவ சபாநாயகர் அவர்களே, இந்தச் சபையில் பல சந்தர்ப்பங்களில் நான் கூறிய ஒரு விடயத்தை மீண்டும் ஒருமுறை கூற விரும்புகிறேன். எந்த ஒரு நாட்டிலும் அபிவிருத்தி வேலைகள் துரிதமடைய வேண்டுமென்ருல், மக்கள் விரைவாக முன்னேற்றமடைய வேண்டுமென்ருல் சிறந்த போக்குவரத்து, பாதை வசதிகள் அவசியம். பாதைகள்தான் மனித சமுதாயத்தின் முன்னேற்றத்திற்கு முன்னோடியாக இருக்க வேண்டுமென்று பொருளாதாரத்தில் கூறுவார்கள். சிறந்த பாதை வசதிகள் அமைந்தால் போக்குவரத்துக்கள் சிறக்கும். சிறந்த போக்குவரத்துக்களினுல் மக்கள் அபிவிருத்தி அடைவது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இலகுவாக இருக்கும். நாம் சுதந்திரம் அடைவதற்கு முன்பு இந்த நாட்டிலிருந்த போக்குவரத்து முறைகளை ஆராய்ந்தால் இந்த நாட்டின் பிரதான பொருட்களான தேயிலை, இறப்பர், தெங்குப் பொருட்களை இலங்கையிலிருந்து இலகுவான முறையில் வெளிநாடுகளுக்கு அனுப்பக்கூடிய முறையிலேயே எமது போக்குவரத்துப் பாதைகளை அன்று வெள்ளைக்காரர்கள் அமைத்து வைத்தார்கள். இந்தப் பொருட்கள் சுலபமாகத் துறைமுகங்களுக்குச் செல்லும் பாதைகளே அன்று போடப்பட்டன. ஆனால் இன்று நாட்டின் அபிவிருத்தி வேறு துறைகளில் போய்க்கொண்டிருக்கின்றது. இன்று நாட்டின் அபிவிருத்தி முக்கியமாக விவசாயத்தில் அமைந்திருக்கிறது. ஆகவேதான், இன்று போக்குவரத்துப் பாதைகளும், போக்குவரத்து வசதிகளும் விவசாயிகளுடைய வயல்களுக்கு மாத்திரமல்ல, அவர்களுடைய பண்டகசாலைகளுக்கு, அவர்களுடைய தொழிலிடங்களுக்கு செல்ல வேண்டிய நிலை ஏற்பட வேண்டும் என நான் முன்னர் பல சந்தர்ப்பங்களில் கூறியுள்ளேன். தோட்டங்களிலிருந்து பட்டினங்களுக்கூடாக துறைமுகங்களுக்குச் செல்வதைவிட்டு, பட்டினங்களிலிருந்து கிராமங்களுக்கூடாக விவசாய நிலையங்களுக்கும் பண்டகசாலைகளுக்கும் இப் பாதைகள் செல்ல வேண்டும்.

இருபத்திரண்டு ஆண்டுகளாக, இந்த நாடு சுதந்திரமடைந்ததன் பின்னர் கூட, கிராம மக்களின் முன்னேற்றத்தையிட்டு அவர்களுக்கு வேண்டிய வசதிகளையெல்லாம் செய்து கொண்டிருந்த பல அரசாங்கங்கள் அவர்களின் இன்றியமையாத வசதியாகிய போக்குவரத்து வசதியை இதுவரை கவனியாமலிருந்தது விசனிக்கத் தக்கது என்றே கூற வேண்டும். ஆகவே, மக்கள் பிரயாணம் செய்வதற்கு பாதைகள் அமைக்க வேண்டிய அவசியத்தோடு, கிருஷிகத்தை முன்னேற்றுவதற்கும் அவர்களுக்குப் பாதைகளை அமைத்துக் கொடுக்க வேண்டியது அவசியமாகும். எதிர் வரும் திதி வருடத்தில் இப்படியான அபிவிருத்தியடைந்த பகுதிகளுக்கும், பொருள்களை அனேகமாக அபிவிருத்தி செய்யும் பகுதிகளுக்கும் பாதைகள் அதி தீவிரமாக அமைக்கப்பட வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன். கிழக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், திருகோணமலை மாவட்டம் என்றால் என்ன, மட்டக்களப்பு மாவட்டம் என்றால் என்ன, அம்பாறை மாவட்டம் என்றால் என்ன இவைகளெல்லாம் இலங்கையின் தானியக் களஞ்சியங்கள் எனப் பெயர் பெற்றவை. இந்தப் பகுதிகளில் இன்று சரியான போக்குவரத்துப் பாதைகள் இல்லை. ஆறுகளைக் கடப்பதற்கு நவீன வசதிகள் இல்லை. ஆறுகளையும் வாவிகளையும் கடப்பதற்கு பாதைகள் இல்லை. இந்த நிலையில் மக்கள் தவித்துக் கொண்டிருக்கிறார்கள். இவர்களுக்கான வசதிகளை மிகவும் அவசியமாக அரசாங்கம் செய்து கொடுக்க வேண்டும்.

பாதைகளை அமையுங்கள் என்று நாங்கள் அதற்குப் பொறுப்பான அமைச்சரிடம் கேட்டால் அவர் எடுக்கும் முயற்சிகள் அங்கு பாதைகள் அமைப்பதில் ஆமைவேகத்தில் போய்க்கொண்டிருக்கின்றன. இன்று நவீன சாதனங்களைக் கொண்டு பாதைகள் அமைக்கும் யுகத்தில் நாம் இருக்கிறோம். அப்படியிருக்கும் பொழுது ஒரு சில கூலியாட்களைக் கொண்டோ, பத்தொன்பதாம் நூற்றாண்டுச் சாதனங்களைக் கொண்டோ பாதைகள் அமைப்பதில் துளி முன்னேற்றம்கூட அடைய முடியாது. ஆகவே, நவீன சாதனங்களைப் பெற்று விவசாயிகளுக்கு விமோசனம் அளிக்க வேண்டுமெனப் பல முறை கூறிய தன் பயனாக அரசாங்கம் உலக வங்கியிலிருந்து ஐந்து வருடத்துக்கு 50 இலட்சம் டொலர்கள் பெறுமதியான கடனைப் பெற்று ஒவ்வொரு வருடமும் பத்து இலட்சம் டொலர் பெறுமதியான கடனை நவீன இயந்திரங்களாகவும் கருவிகளாகவும் வரவழைத்து கிருஷிகத்துக்குத் தேவையான பாதைகளை இலங்கை முழுவதிலும் அமைக்கத் திட்டமிட்டிருக்கிறது. இப்பாதைகளில் ஒன்று முதலில் தென் மாகாணத்தில் அமைக்கப்பட்டிருக்கிறது என்று கூறப்படுகிறது. அடுத்த இரண்டு ஆண்டுகளிலே நாட்டின் எல்லாப் பாகங்களுக்கும், எல்லா மாகாணங்களுக்கும், இயந்திர சாதனத்தின் உதவியுடன் நவீன முறையில் பாதைகளை அமைத்து போக்குவரத்துச் சாதனங்களைப் பெருக்கவேண்டுமென்று நான் அரசாங்கத்தை வலியுறுத்த விரும்புகிறேன்.

இன்று கிராமப்புறங்களிலே-அபிவிருத்தியடையாத கிராமப்புறங்களிலே பாதைகள் இல்லாத காரணத்தால்—போக்குவரத்து

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ரஸமாணிக்கம் மயா.]

வசதிகள் இல்லாத காரணத்தால்—மக்களுக்குத் தொல்லையாக இருக்கிறது. குடியேற்றத்திட்டங்களை அமைத்த அரசாங்கம், அந்தக் குடியேற்றத்திட்டங்களுக்கு மக்கள் இலகுவாகப் பிரயாணஞ்செய்யக்கூடிய வசதிகளைச் செய்யாத காரணத்தால், மக்கள் தூரமான இடங்களுக்குச் செல்வதற்குத் திண்டாடுகிறார்கள். குடியேற்றத் திட்டங்களிலே யுள்ளவர்கள் போக்குவரத்து வசதிகள் இல்லாத காரணத்தால் தங்கள் விளைபொருட்களைப் பண்டசாலைகளுக்குக் கொண்டுசெல்லமுடியாமலிருக்கிறது. அங்குள்ள சிறுவர்கள் பாடசாலைக்குச் செல்வதற்குப் போதிய போக்குவரத்து வசதியில்லை. வைத்தியவசதிகள் போன்ற ஏனைய வசதிகள் அங்கு இல்லை. இதனால் அவர்கள் சிரமப்படுகிறார்கள். இலங்கைப் போக்குவரத்துச் சபையினரும், தங்களுடைய பஸ்கள் போகக்கூடிய பாதைகள் இல்லாமலிருப்பதனால் இப்பகுதிகளில் பஸ் சேவையை விஸ்தரிக்க முடியாதென்று சொல்லுகிறார்கள். பஸ்பாதைகளைப் பார்க்கின்றபொழுது, அவை தீவிரமாக அபிவிருத்தியடையமுடியாத நிலையிலே இருக்கின்றன. பாதைகளைத் திருத்தியமைப்பதில் காலதாமதமேற்பட்டு அதனால் பஸ் சேவையை விஸ்தரிக்கும் நிலைமை நீடித்துக்கொண்டிருந்தால் மக்கள் எவ்வாறு தங்களுடைய போக்குவரத்து வசதிகளைப் பெறமுடியுமென நான் கேட்கின்றேன். ஆகையினாலே விரைவில் பாதைகளைத் திருத்தியமைத்து, இலங்கைப் போக்குவரத்துச்சபை மூலம் மக்களுக்குப் போக்குவரத்துச் சாதனங்களையும் மக்கள் பிரயாணம் செய்வதற்கான வசதிகளையும் செய்துகொடுக்க வேண்டியது அவசியமாகும். அதுவும் கிழக்கு இலங்கையிலே, பிரதானமாக மட்டக்களப்புப் பகுதியிலே இது மிகவும் அத்தியாவசியமானது என்பதைக் கூறி வைக்க விரும்புகிறேன்.

அடுத்ததாக, இன்று நாட்டிலே மிக முக்கியமான பிரச்சினையாக இருப்பது வேலையில்லாத் திண்டாட்டமாகும். படித்த வாலிபர்களுக்கிடையில் வேலையின்மை தோன்றி நாட்டிலே ஒரு புரட்சியை ஏற்படுத்தக்கூடிய நிலைமை இருக்கிறது. தொழிற்சாலைகளிலே நாம் எவ்வாறு பொருட்களை உற்பத்தி செய்து வியாபாரத்துக்கு அனுப்புகிறோமோ அதைப் போலச் சர்வகலாசாலைகளிலே இருக்கின்ற மாணவர்களும் வருடா வருடம் பட்டம் பெற்று வெளியேறிக்கொண்டிருக்கிறார்கள். ஆனால் அவர்களுக்குப் போதிய தொழிலின்மையால் அவர்கள் இன்று வெகு அதிருப்தியடைந்தவர்களாக இருக்கிறார்கள். எனது உத்தேசத்தின்படி ஏறக்குறைய 14,000 பட்டதாரிகள் இந்நாட்டிலே தொழில்பெற முடியாமலிருக்கிறார்கள். அத்தோடு பட்டதாரிகளல்லாத ஏனைய கல்வித் தகைமைகள் பெற்றவர்கள் எட்டு இலட்சம் பேர் தொழில் இல்லாமல் இருக்கிறார்கள். இந்த நிலைமையைத் திருத்தியமைக்க அரசாங்கத்தினால் முடியாவிட்டால் அரசாங்கம் எந்தவிதமான முன்னேற்றத்தையும் பெற முடியாதென்பதை நான் கூற விரும்புகிறேன். ஒரு நாட்டிலே படித்த வாலிபர்கள், பட்டம் பெற்ற வாலிபர்கள், கல்வி கற்ற வாலிபர்கள் வேலையில்லாமலிருந்தால் அந்த நாட்டின் கல்வி அமைப்பிலே—பொருளாதார அமைப்பிலே கோளாறு இருக்கிறதென்பதுதான் அதன் கருத்து.

அதுமட்டுமல்ல, இன்று சாதாரண தொழிலாளர்கள்கூட தொழில் பெற முடியாத நிலையில் இருக்கிறார்கள். ஆயிரக்கணக்கான சாதாரண தொழிலாளர்கள் இன்று நாட்டிலே தொழில்பெற முடியாமலிருக்கிறார்கள். எனது தொகுதியில் ஒரு பாலம் அமைக்கப்படுகின்றது. அதில் வேலை செய்வதற்குப் பத்துக் கூலியாட்கள் தேவைப்பட்டனர். தொழில் பரிவர்த்தனைக் கந்தோர் மூலம் இந்தப் பத்துக் கூலியாட்களும் கோரப்பட்டபொழுது இருநூறு பேருக்குமேல் இந்த இடங்களுக்கு விண்ணப்பம் செய்தார்கள். சாதாரண தொழிலாளர்களுக்கிடையே எவ்வாறு வேலையின்மை நிலவுகின்றது என்பதையே இது காட்டுகின்றது. படித்த இளைஞர்களுக்கும் பட்டதாரிகளுக்கும் மற்றும் சாதாரண தொழிலாளர்களுக்கும் வேலை கொடுக்கக் கூடிய ஒரு திட்டத்தை அரசாங்கம் விரைவில் தயாரிக்க வேண்டும்.

ஒரு நாடு முன்னேற்றமடைய அதன் இயற்கை வளங்களையும் மனித சக்தியையும் ஒருங்கே பயன்படுத்த வேண்டும். அப்பொழுதுதான் நாடு உண்மையான முழு அபிவிருத்தியை அடைய முடியும் என்பது பொருளாதாரத்தில் ஒரு அடிப்படை உண்மையாகும். மனித சக்தியும் நாட்டு மூல வளங்களும் நன்கு பயன்படுத்தப்படாமல் விரயம் செய்யப்படுமானால் இந்த நாடு எவ்வாறு முன்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

னேற்றமடைய முடியுமென்று நான் கேட்க விரும்புகிறேன். நெல் உற்பத்தியில் கணிச மான முன்னேற்றம் கண்டிருக்கிறோம் என்று மட்டும் பெருமைப்படுவதில் பயன் இல்லை. நாட்டின் மனித சக்தியையும் இயற்கை வளங் களையும் பயன்படுத்தக்கூடிய முறையில் அர சாங்கம் திட்டங்களைத் தயாரிக்க வேண்டும். இதன் மூலம் படித்த பட்டதாரிகளிடையே உள்ள வேலையின்மையையும் வேலையில்லாத் திண்டாட்டத்தையும் ஒழிக்க வேண்டும். இன் றுள்ள பட்டதாரிகளிற் பலர் கலைப்பட்டதாரி களாக இருக்கிறார்கள். இவர்கள் விஞ்ஞானப் பட்டதாரிகளாக இருந்திருந்தால் நாட்டிற்கு அவர்களாற் கூடுதலான பயன் உண்டு. ஆகவே கலைப் பட்டதாரிகளைக் கூடுதலாக உற்பத்தி செய்யும் நிலை மாற்றி அமைக்கப்பட வேண் டும். தேவைக்கேற்பவே இன்று வைத்திய, பொறியியல் துறைகளுக்கு மாணவர்கள் சேர்க்கப்படுகிறார்கள். கலைத்துறைப் பட்ட தாரிகளைப் பொறுத்த அளவிலும் ஒரு வரை யறை அவசியம்.

கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவில் ஒரு குறிப்பை இங்கு கூற விரும்புகிறேன். இது எனது தொகுதிக்கு மாத்திரமன்றி ஏனைய தொகுதிகளுக்கும் பொதுவான ஒரு விடயம். எமது மாகாணத்தில் இதுவரை ஒரு தொழில்நுட்பக் கல்லூரியோ, அல்லது தொழிற்பயிற்சி அளிக்கக்கூடிய தொழிற் கல்லூரிகளோ அல்லது ஒரு சர்வகலா சாலையோ இல்லை. பெருந்தொகையான மக்களை யும் மாணவ சமுதாயத்தையுமுடைய கிழக் கிலங்கை போன்ற ஒரு பிரதேசத்திலே இது வரை தொழில் நுணுக்கங்களையும் தனித் தொழில்களையும் கற்றுக் கொள்ள முடியாத நிலை இருக்குமாக இருந்தால் அந்தப் பகுதி மக்கள் எவ்வளவு பிற்போக்குள்ளவர்களாக தள்ளப்பட்டுள்ளார்கள் என்பதை சிந்தித்துப் பார்க்க வேண்டும். ஆகவே, விரைவில் தொழில் நுட்ப வசதிகளை ஏற்படுத்த அங்கே ஒரு கனிட்ட தொழில் நுட்ப கல்லூரியை ஏற் படுத்தி அங்குள்ள மக்களுக்கு தக்க கல்வி வசதியை அளிக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

கௌரவ சபாநாயகரவர்களே, கிழக்கிலங் கையின் ஒரு எல்லை முழுவதும் கடற்பிரதேச மாக இருக்கிறது. இலங்கையின் கடற் பிர தேசத்தில் மூன்றில் ஒரு பங்கு கிழக்கிலங்கை யில் இருக்கிறது. அப் பிரதேசத்தை அபி விருத்தி செய்து கடலிலுள்ள பொருட்களை யும் செல்வங்களையும் பெறக் கூடிய வழிவகை களைச் செய்ய முடியுமானால் கிழக்கிலங்கை மக் கள் உணவு உற்பத்தியில் ஈடுபட்டு இந்த நாட்டுக்குத் தேவையான உணவுப் பொருட் களை உற்பத்தி செய்து கொடுப்பது மாத்திர மன்றி கடற் பொருட்களையும் கொடுக்க முடி யும் என்று தெரிவித்துக் கொள்ள விரும்பு கிறேன். கிழக்கிலங்கையின் கடற் பிரதேச மெல்லாம் அபிவிருத்தியில்லாமல்-நவீன முறையில் மீன்பிடித் தொழில் அபிவிருத்தி யில்லாமல்-பின்தங்கியதாக இருக்கிறது. அங்கு மீன்பிடித் துறைமுகங்கள் அமைக்கப் படவில்லை. வட கிழக்குப் பருவப் பெயர்ச்சிக் காற்றுக் காலத்தில் மீன் பிடிகாரர்கள் தங்கள் மீன்பிடித் தோணிகளைக் கடலில் வைக்க முடி யாத நிலை ஏற்பட்டிருப்பதால் கிழக்கிலங்கை யில் மீன்பிடித் துறைமுகத்தை ஏற்படுத்த வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன். முக் கியமாக கிழக்கிலங்கையில்-சிறப்பாக மட்டக் களப்பு மாவட்டத்தில்-நவீன முறையில் ஒரு மீன்பிடித் தொழிற் பாடசாலையை ஏற்படுத்த வேண்டும். அப்பாடசாலையை ஏற்படுத்தும் முயற்சியையும், கிழக்கிலங்கையின் கடற் பிர தேசங்களில் மீன்பிடித் தொழிலை அபிவிருத்தி செய்யக்கூடிய வழிவகைகளையும் உடனடியாக அரசாங்கம் மேற்கொள்ள வேண்டும். கடற் றொழில் பொறியியல் பாடசாலை ஒன்றை ஏற் படுத்தினால் ஏராளமான வாலிபர்கள் இந்தத் தொழிலில் ஈடுபடக் கூடிய நிலையை ஏற்படுத் தலாம் என்று கூற விரும்புகிறேன்.

இறுதியாக, சபாநாயகரவர்களே, ஒன்று கூற விரும்புகிறேன். கிழக்கிலங்கையில் ஒலி பரப்புக் கூட்டுத்தாபனத்தின் இரண்டு உப ஸ்தானங்களை ஏற்படுத்துவதாகப் பல வருடங் களாகச் சொல்லப்பட்டு வருகிறது. ஆனால் இது வரையிலும் அவற்றை ஏற்படுத்தவில்லை. ஆகவே, இலங்கை ஒலிபரப்புக் கூட்டுத் தாபனம் விரைவில் கிழக்கிலங்கையில் ஒரு உப ஸ்தானத்தையாவது ஏற்படுத்த வேண்டும் என்றும், எதிர் காலத்தில் நமது நாட்டிலே தொலைக்காட்சிக் கருவிகளை நிறுவ வேண்டிய வழி வகைகளைச் செய்ய வேண்டும் என்றும் கேட்டுக் கொள்ளவிரும்புகிறேன்.

At this stage, Mr. Speaker, I wish to say a few words on the achievements of the Ceylon Broadcasting

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]

Corporation recently in giving a running commentary on the flight of the "Apollo 11" to the moon and the landing of the astronauts on the moon. Sir, the commentary that was arranged by the Ceylon Broadcasting Corporation on the eve of the flight to the moon, on the landing on the moon, and the return flight of the astronauts, is an achievement that not only the Ceylon Broadcasting Corporation but the entire country should be proud of.

The commentaries given in English, Sinhala and Tamil were, Mr. Speaker, certainly the best that were broadcast in South Asia. The commentaries were picked up from distant transmitting stations in America and even though they were very indistinct they were picked up and simultaneous translations were given by the Ceylon Broadcasting Corporation in a way that it gave not only an accurate account but also an exciting account of what was taking place so much so that people really felt that they were witnessing the events.

And I am proud to mention here that three of the simultaneous interpreters who were engaged in giving these running commentaries were from the House of Representatives and the Senate. I think the commentaries were not only commended by listeners in Ceylon but also by listeners from all over India. The Director-General of Broadcasting said that he had received thousands of letters praising the commentaries.

I must join in congratulating the three simultaneous interpreters who were engaged in this effort, namely, Mr. V. Sundharalingam, Mr. P. A. Alfred Perera, and Mr. S. Kumarasamy for their excellent performance.

අ. භා. 12.19

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු කථානායකතුමනි, පද්දිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමා නැගෙනහිර පළාතේ අඩු පාඩු රාශියක් පෙන්නුම් කර දුන්නා. ඒ වාගේම බස්නාහිර සහ දකුණු පළාත්වල මන්ත්‍රීන් හැටියට අපිත් අපේ ප්‍රදේශවල අඩුපාඩු පෙන්නුම් කර දිය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම දකුණු පළාතේ කොට්ඨාශයේ ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියටයි මා කථා කරන්නේ. දකුණු පළාතේ මුහුදුබඩ ප්‍රදේශත් තවම දියුණු වෙලා නැහැ. දියුණු කරන්නට තව දුරටත් හුඟක් ඉඩ තිබෙනවා. ඒ බව විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

කොළඹ සිට හම්බන්තොට දක්වා මුහුදු බඩ ප්‍රදේශය කර්මාන්ත අතින් දියුණු කරනවා මිස වෙන අතකින් දියුණු කරන්නට බැරි බව මා නොකීවාට මේ ගරු සභාව පිළිගන්නවා ඇති. ධීවර කර්මාන්තය ඉතාමත් උසස් ලෙස දියුණු කරන්නට පුළුවන් තත්ත්වයක තිබියදී පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී ඒ සඳහා අවශ්‍ය විධිවිධාන නියම අන්දමට නොයෙදූ නිසා අපට එයින් නියම ප්‍රයෝජනයක් ගන්නට බැරි වුණා. එහෙත් ජාතික ආණ්ඩුව බලයට පැමිණි පසු ධීවර කර්මාන්තයට විශේෂ තැනක් දීම නිසා දැන් එය ක්‍රම ක්‍රමයෙන් දියුණුවේගන යනවා.

දකුණු පළාතේ ධීවර වරායවල් කිහිපයකට සැලැස්මවල් හදා තිබෙනවා. ඒ වාගේම ධීවර වරායවල් කිහිපයකම වැඩ තරමක් දුරට දැනටමත් කරගෙන ගොස් තිබෙනවා. ඒ ගැන ගරු ධීවර ඇමතිතුමාට අප හැම දෙනාම ස්තුතිවන්ත විය යුතුයි.

ධීවර වරායවල් දියුණු වෙනවාත් සමගම ධීවර කර්මාන්තය දියුණු වෙනවාත් සමගම ධීවර කර්මාන්තයේ යෙදී සිටින්නන් ගැනත් සිත් යොමු කරන්නට ඕනෑ. ඒ අයට නිවාස, ආම්පන්න ආදි සියල්ලක්ම පහසු විධියට ලබා ගැනීමට වැඩ පිළිවෙළවල් ඇති කිරීම රජයේ යුතුකමකැයි මා කල්පනා කරනවා. අප දුම්රියෙන්, බස්රියෙන් හෝ මෝටර් රථයෙන් යන විට ධීවර කර්මාන්තයේ නියුතු උදවිය ඉතාමත් දුක්ඛිත තත්ත්වයට ජීවත් වන ආකාරය පෙනී යනවා. කුඩා පැල්පත්වලයි මොවුන්ගෙන් බොහොමයක් දෙනා ජීවත් වන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉතාමත් දිළිඳු විධියටයි මේ අය වාසය කරන්නේ. මට පෙනී ගොස් තිබෙන අන්දමට නම් පසුගිය අවුරුදු පණහක් තරම් වූ දීර්ඝ කාලය තුළ මේ රටේ තිබුණු කිසිම ආණ්ඩුවකින් මේ පිරිසට සෑහෙන තරම් සහයෝගයක් දක්වා නැහැ. එහෙත් ඒ අය වෙනුවෙන් ජාතික රජය යම්කිසි වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ පුළුවන් තරම් ඉක්මනින් ක්‍රියාත්මක කරන්නැයි මා ඉල්ලා සිටිනවා. ධීවර කාර්මිකයන්ට නියම විධියේ නිවාස ක්‍රම, නියම විධියේ ළිං, නියම විධියේ වැසිකිළි, ජලසම්පාදන ක්‍රම ආදි සියල්ලක්ම ප්‍රමාද නොකර ලබා දෙන්නට ඕනෑ. ඒ අයට අවශ්‍ය නූල්, දැල් ආදි ආම්පන්නත් ලැබෙන්නට ඕනෑ.

මාලු මිල බස්සන්නැයි කවුරුත් නිතර නිතර කෑ ගහනවා. මාලු මිල බස්සන්නට නම් වැඩි වැඩියෙන් ධීවර කර්මාන්තය දියුණු කරන්නට ඕනෑ. තවද, ධීවර කර්මාන්තය දියුණු කරන්නට නම් ධීවර කාර්මිකයන්ගේ තත්ත්වය දියුණු කරන්නට ඕනෑ. ධීවරයන් උනන්දු කරවීමට ක්‍රියා කිරීම රජයේ යුතුකමකැයි මා කල්පනා කරනවා. ඒ සඳහා අවශ්‍ය පහසුකම් දැනටමත් සැලකියයුතු ප්‍රමාණයක් හරිගස්සා දී තිබෙනවා. ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාත් මාත් ධීවර කර්මාන්තය සහ ධීවර කාර්මිකයන් ගැන කිහිපවිටක්ම සාකච්ඡා කර තිබෙනවා. ධීවර කාර්මිකයන්ගේ අඩුපාඩුකම් හරි ගස්සා දෙන්නට ධීවර අධ්‍යක්ෂතුමා මහන්සි ගන්නවා. ඒ වාගේම යාන්ත්‍රික බෝට්ටුත් සැලකිය යුතු ප්‍රමාණයක් සපයා දී තිබෙනවා. මගේ ඡන්ද කොට්ඨාශයටත් කීපයක් ලැබී තිබෙන බව ප්‍රීතියෙන් සඳහන් කරන්නට කැමතියි. රු. 20,000ක් වටිනා බෝට්ටු දී තිබෙනවා. බෝට්ටු ගත් ඇතැම් අය බෝට්ටුවලට නියම විධියට මුදල් නොගෙවීම ගැන මා කනගාටු වෙනවා. එසේ නොගෙවීමෙන් දෙපාර්තමේන්තුවට විශාල හිරිහැරයක් ඇති වෙනවා පමණක් නොව, සමහර සුදුස්සන්ට ඒ බෝට්ටු ලබාදීමේ අවස්ථාවත් නැතිව යනවා. ඒ නිසා ඒ එන්නට තිබෙන මුදල් ලබාගැනීමට රජය යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නවා නම්, ඒ මුදල් ආපසු ගැනීමට පහසු ක්‍රමයක් සකස් කරනවා නම්, මා හිතන හැටියට මීට වඩා බෝට්ටු සංඛ්‍යාවක් ධීවර කාර්මිකයන් අතරේ බෙදා දෙන්නට අපට පුළුවන් වේවි. ගරු කථානායකතුමනි, රුපියල් 20,000ක් කියන මුදල දුප්පත් ධීවර කාර්මිකයන්ට ඉතාමත් විශාල මුදලක්. බෝට්ටුවක් ගැනීමට ඒ තරම් මුදලක් වියදම් කිරීම ධීවර කාර්මිකයන්ට කළ හැකි දෙයක් නොවෙයි. ඒ නිසා ඒ මිලද අඩු කිරීමට පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්, බෝට්ටු ලබා ගැනීමට මීට වඩා පහසු ක්‍රමයක් සකස් කළ හැකි නම් එය ඉතා යහපත්ය කියා මා කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ—පෙඩරල් පක්ෂයේ—මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින්ම කියන්න යෙදුනා, ඒ අයගේ පළාත්වලට මේ ආණ්ඩුවෙන් කිසිම දෙයක් කර දී නැත කියා. නමුත් දැන් මේ ළඟදී මාලු ටින් කිරීමේ කර්මාන්තශාලාවක් ලක්ෂ ගණනක් කෝටි ගණනක් වියදම් කර සකස් කර දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම අප එයට විරුද්ධ විය යුතුයි. ඊට වඩා දකුණු පළාතේ මාලු අල්ලනවා. ඒ පළාතට මාලු ටින් කිරීමේ කර්මාන්තශාලාවක් දෙනවා නම් දකුණු පළාතට ඒ විධියේ කර්මාන්තශාලා දෙකක් දෙන්න ඕනෑය කියා මා සිතනවා. අඩු ගණනේ එක කර්මාන්තශාලාවක්වත් දෙන්න ඕනෑ. ඒ නිසා මා රජයෙන් ඉල්ලා සිටිනවා, දකුණු පළාතටත්—මා කියන්නේ නැහැ, මගේ ඡන්ද කොට්ඨාශයටම කියා—දකුණු පළාතේ ධීවර කර්මාන්තය තවත් දියුණු කිරීම සඳහා මාලු ටින් කිරීමේ කර්මාන්තශාලාවක් පිහිටුවා දෙන්නය කියා.

ගරු කථානායකතුමනි, මේ විවාදයට සහභාගි වුණ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම කිව්වේ මොකක්ද? අර සිංහල කියමනක් තිබෙනවා, උදේට නැත්නම් දවාලට පරිප්පුයි බතුයි කනවා, රෑට බතුයි පරිප්පුයි කනවා කියා. ඒ දෙකම එකයි. අන්න ඒ වගේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුනුත් නැගිට කිව්වේ එකම කාරණාවල්මයි. ඒ අය කියන්නේ පරණ වන්නම මයි. පරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]

ඩෝලයමයි ගහන්නෙ. රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කිව්වා. නැති වුණ පෝලිම් ගැන කිව්වා. එහෙම නැත්නම් කරන්නට බැරි දෙයක් ගැන කියනවා. එහෙම නැතිව අපට අද වන තෙක්ම මේ විවාදයේදී අසාගන්න බැරි වුණා, අවවාදයක් වශයෙන් යම්කිසි දෙයක්. දැනමුතුකමක් විධියට කිසිම දෙයක් ගන්න බැරි වුණා. කිසිම මන්ත්‍රීවරයෙකුගෙන් දැනමුතුකමක් හෝ අවවාදයක් ලබා ගත නොහැකි වුණ බව කනගාටුවෙන් වුවද කියන්නට සිදු වී තිබෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කියනවා. රැකීරක්ෂා නැතැයි කියනවා. මාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කර තිබෙනවා. ඒ කාලයේදීත් මේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට නොහැකි වූ බව මා මේ ගරු සභාවට කියන්න කැමතියි. ඒ කාලයේදීත් මේ ප්‍රශ්නය මේ විධියටම උග්‍රයි. එදා ජනගහනය දෙස බලන විටත්, ඒ වගේම අද ජනගහනය දෙස බලන විටත්, රැකීරක්ෂා ප්‍රශ්නයේ කිසිම වෙනසක් සිදු වී නැති බව පෙනෙනවා. නමුත් අද ගෙන යන ක්‍රියා මාර්ගය දෙස බලන විට අපට පෙනී යනවා, අද හෙට බැරි වුණත් අපේ සංවර්ධන වැඩ නිසා තව අවුරුද්දක් නැත්නම් දෙකක් ගත වන විට විශාල සංඛ්‍යාවකට රැකීරක්ෂා දෙන්න අපට පුළුවන් වේවිය කියා. විශාල සංඛ්‍යාවකට රක්ෂාවල් දිය හැකි අන්දමේ ව්‍යාපාර රාශියක් අද ඇති කර ගෙන යනවා.

මේ අවස්ථාවේදී මා තවත් කරුණක් මතක් කරන්න කැමතියි. මා අද උදේ හික්කඩුවේ සිට එන විට මගේ මිත්‍රයෙක් මට කොමියුනිස්ට් ප්‍රගතිශීලී පක්ෂයේ මිත්‍ර කණ්ඩායමක්—ගාලු දිස්ත්‍රික්කයේ පිරිසක්—විසින් පළ කරන ලද දැන්වීමක් පෙන්නුවා. එය මේ ආකාරයි :

"කොමියුනිස්ට් සහ ප්‍රගතිශීලී තරුණ සමිති සම්මේලනයේ ගාලු දිස්ත්‍රික් සම්මේලන උළෙලට සැරසෙමු.

රක්ෂා දියව්, නැත්නම් ජීවනාධාර දියව්."

ඔන්න කොමියුනිස්ට් පක්ෂය රක්ෂාවල් සොයන සැටි. "දියව්". පන්සල්වලට ගොස් අත් දෙක බැඳගෙන බුදුහාමුදුරුවන්ට වඳිනවා. නමුත් මේ විධියටයි කතා කරන්නෙ. "රක්ෂා දියව්." මා මෙය පෙන්වන්නේ විරුද්ධ පක්ෂයටයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)

ගරු කථානායකතුමනි, දිවා භෝජනය සඳහා විසිර යන්නට මත්තෙන් මා කතා කරමින් සිටියේ රැකීරක්ෂා ප්‍රශ්නය පිළිබඳවයි. කොමියුනිස්ට් හා ප්‍රගතිශීලී තරුණ සමිති සම්මේලනයේ දැන්වීම පිළිබඳව තවත් ස්වල්පයක් මතක් කරන්නට ඕනෑ. මෙම දැන්වීම කියවාගෙන යන විට මෙසේ සඳහන් වී තිබෙන බව පෙනෙනවා :

"ගාලු දිස්ත්‍රික් සම්මේලන උළෙලට සැරසෙමු
'රක්ෂා දියව් නැත්නම් ජීවනාධාර දියව්'"

මේ අන්දමට ඉතා කැත පිළිවෙළට දැන්වීම් පළ කර තිබෙනවා. මෙවැනි දැන්වීම් පළ කිරීම විරුද්ධ පාර්ශ්වයට කරන අපහාසයක්. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා :

"සටන පණ ගැන්වෙන දැවැන්ත පෙළපාළිය
සමගි පෙරමුණු නායක නායිකාවන් ඔබ අමතන
යෝධ මහා ජනතා රැලිය"

මෙම උළෙලට කොමියුනිස්ට් පක්ෂය විනා වෙනත් පක්ෂයක් සහභාගි වන්නේ නැතැයි මා සිතනවා. ඒ තරම් නරක අන්දමට මෙම පත්‍රිකාව මුද්‍රණය කර තිබෙනවා. එහි අන්තිමට මෙසේද පළ කර තිබෙනවා :

"සංගීත සංදර්ශනය හා මල් වෙඩි දර්ශනය"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උළෙලට පසුව මේ විධියේ නොයෙකුත් විනෝදාංශ පැවැත්වෙන බවයි කියන්නේ. එහෙමයි ඒ උදවිය රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නේ. දහස් ගණන් මුදල් මල්වෙඩි වලට එහෙම වියදම් කරනවා. රැකීරක්ෂා නැති තරුණයන්ගේ රක්ෂා ප්‍රශ්නය විසඳන හැටි තමයි මේ.

ගරු කථානායකතුමනි, රැකීරක්ෂා ප්‍රශ්නය පිළිබඳව කතා කරන විට මා ඉතාමත් සංතෝෂයෙන් මතක් කරන්නට කැමතියි, ජාතික රජය මගින් කර්මාන්ත ජනපද රාශියක් ඇති කරගෙන යන බව. පල්ලෙකැලේ සහ ඒකල එවැනි ජනපද ඇති කර තිබෙනවා. ඒවාගේම යාපනේත් ඇති කර තිබෙනවා. ගාලු දිස්ත්‍රික්කයේ මගේ ඡන්දදායක කොට්ඨාශයේ බූස්සේද කාර්මික ජනපදයක් ඇති කරගෙන යනවා. මෙම වැඩ පිළිවෙළ ගැන මා සන්තෝෂය පලකරනවා. මෙවැනි පියවර වල් ගැනීමෙන් අප බලාපොරොත්තු වන්නේ එම පළාතේ සිටින තුන් හාර දහසක් කම්කරුවනට සුදුසු විධියේ රැකී රක්ෂා ලබා දෙන්නටයි. එසේ නැතුව එක් අයකුට හෝ දෙන්නෙකුට යම්කිසි ආයතනයක රක්ෂාවක් ලබා දීම නො වෙයි, අපේ පරමාර්ථය. රජයේ ආයතන යක වේවා, පුද්ගලික ආයතනයක වේවා, වෙනත් මණ්ඩලයක වේවා, ලිපිකරු තනතුරුවලට හෝ වෙනත් ස්ථානාන්තර වලට දෙතුන් දෙනකු පත් කිරීම නොවෙයි, රජයකින් කළයුතු කාරිය. මේ අන්දමේ විශාල කර්මාන්තායතන රට සෑමතැනම විසුරුවා හැරීමෙන් ගොවි ජනපද නො මැති, කාර්මිකයන්ටම නියමවෙච්ච පළාත් වල සිටින පිරිස්වලට විශාල සහනයක් සැළසෙනවා. විශෙෂයෙන් දකුණු පළාත වැනි ප්‍රදේශවල මේවා පිහිටුවීමෙන් දහස් ගණනකට රක්ෂා ලබා ගන්නට පුළුවන් වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ ඉඩම් ඇමතිතුමා කාගේත් විවේචනයට ලක් වන කෙනෙක්. මට මතකයි එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමති වශයෙන් සිටියදීත් එවකට සිටි විරුද්ධ පක්ෂයත් සෑම විටම එතුමාට චෝදනා එල්ල කළ බව. දැනුත් ඒ වාගේමයි. අපේ සිංහල කීමක් තිබෙනවා, හුඟක් වැඩ කළාම හුඟක් බැණුම් අහනවාය, මදක් වැඩ කළාම මදක් බැණුම් අහනවාය, වැඩ නොකර සිටියොත් කොහෙත්ම බැණුම් අහන්නෙ නැත කියා. ඒ වාගේම ඉඩම් ඇමතිතුමා වැඩ කරන්න කරන්න එය විරුද්ධ පක්ෂයට විශාල හිසරදයක්; විශාල කැක්කුමක්. අප විමසා බැලුවොත් අපට පෙනී යාවි, විරුද්ධ පක්ෂයෙන් මෙම විවාදයට සහභාගි වුණ මන්ත්‍රීවරුන් සියයට 90 ක් චෝදනා එල්ල කෙළේ ඉඩම් ඇමතිතුමාට බව. එහෙත් එතුමා කළ වැඩ ගැන විමසා බැලුවොත් අපට කිසිම බියක් නැතුව කියන්න පුළුවන්, රට සංවර්ධනය සඳහා කෙරුණු වැඩවලින් දෙකෙන් පංගුවක්ම එතුමාගේ අමාත්‍යාංශයෙන් සිදු වුණ බව.

අද විදුලි බලය ගැන අපි ටිකක් කල් පනා කර බලමු. 1965-66 වර්ෂය ආරම්භ යේදී ලංකාවේ තිබූ විදුලි බල ප්‍රමාණය මෙගවොට් 181 යි. එහෙත් මෙගවොට් 262 ක විදුලි බල ප්‍රමාණයක් තිබෙනවා. ප්‍රමාණය සියයක් පමණ වැඩි වී තිබෙ නවා. තවත් අවුරුදු දෙකකින් තුනකින් ඒ ප්‍රමාණය මීටත් වඩා වැඩි කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එසේ වැඩි කිරීමෙන් සංවර්ධන වැඩ, කුඩා කර්මාන්ත දියුණුව, කෘෂිකර්ම දියුණුව, ගෙදර දොර කටයුතු ආදී සියල්ලකටම එයින් සම් පූර්ණ ප්‍රයෝජන ලැබෙන බව මා විසින් සඳහන් කරන්න ඕනැ.

තවත් ඉතාමත් වැදගත් සේවයක් ඉටු කෙරෙන අමාත්‍යාංශයක් තමයි ප්‍රවාහණ අමාත්‍යාංශය. ප්‍රවාහණ අමැතිතුමා නිසොල් මන්ව වැඩ කළත් ඉතාමත් ක්‍රියාකාරීව විශාල සේවයක් එතුමාගේ ඇමති පදවි යෙන් මේ රටට සිදු වෙනවා. විශෙෂයෙන් අද දුම්රිය දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව බැලුවොත් 1965 ට වඩා විශාල දියුණුවක් තිබෙන බව අපට පෙනී යනවා. දුම්රිය සේවයේ නියුතු කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නය විසඳා තිබෙනවා. ඔවුන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. දුම්රියෙන් ගමන් කරන මගීන්ගේ සැපපහසුව තකා කටයුතු කර තිබෙනවා. භෝජනාගාර සේවයක් ඇති කර තිබෙනවා. අලුත් ගෙඩනැගිලි තැනීමෙන් දුම්රියස්ථාන වැඩි දියුණු කර තිබෙනවා. මගේ පළා තෙත් ස්ථාන කීපයක්ම ඒ ආකාරයට වැඩි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]

දියුණු කර තිබෙන බව මා සඳහන් කරන්නේ ප්‍රීතියෙන්. ඒ වාගේම අලුත් දුම්රිය යන්ත්‍ර ගෙන්වා තිබෙනවා. එතුමාගෙන් අපට විශාල සේවයක් සිදු වුණු බව අප කවුරුනුත් පිළිගත යුතුයි. එප මණක් නොවෙයි. එතුමාගේ අමාත්‍යාංශය විසින් ඇති කරන ලද නව ගුවන් සේවයට අයත් "ට්‍රයිඩන්ට්" නම් ගුවන් යානය අද පළමුවන ගමන අරම්භ කළ බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.—[බාධා කිරීමක්] විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට එය හිනාවට කරුණක් වෙන්න පුළුවනි. එහෙත්, විරුද්ධ පාර්ශ්වය ආණ්ඩු බලය ලබා සිටිද්දී එවැනි ගුවන් සේවයක් තබා බරකරත්ත සේවයක්වත් ඇති වුණායයි මා හිතන්නෙ නෑ. කලින් මදුරාසියට යාමට පැය දෙකක් ගත වූ ගමන දැන් මිනිත්තු 50 කින් යන්න පුළුවනි. බොම්බායට යාමට පැය 4 ක් ගත වූ නමුත් ට්‍රයිඩන්ට් අහස් යානාවෙන් ඒ ගමන පැය එකහමාරකින් යන්න පුළුවනි. මෙම ගුවන් ගමන් සේවයේ විශේෂාංගයක් නම් එහි සියලුම නිලධාරීන් ලාංකිකයන් වීමයි. ලාංකිකයන්ටම මෙවැනි රැකියා දීම ගැන අප ඇමතිතුමාට විශේෂ ගෞරවයක් කරන්න ඕනෑ.

බලපිටියේ මන්ත්‍රීතුමාද (ලක්ෂ්මන් ද සිල්වා මයා.) මතක් කළ පරිදි, "ලෙවල් ක්‍රොසිං" හෙවත් දුම්රිය පාරවල් හරහා සාමාන්‍ය පාරවල් වැටුණු තැන්වලට ගේට්ටු ඇමීම සම්බන්ධව අප අවුරුදු 50 ක් තිස්සේ කෑගැසුවා. බොහෝ තැන්වල තවමත් රේල් ගේට්ටු නැහැ. ඒ නිසා මරණ විශාල ගණනක් සිදු වෙනවා. මෙවැනි තැන්වලට ගේට්ටු ඇමීම නිසා අමතරව දෙතුන් දෙනකුට රක්ෂාව දීම සඳහා මුදලක් වැය කරන්නට සිදු වන නමුත් ඒ මගින් සිය දහස් ගණනකගේ වටිනා ජීවිත බේරා ගැනීමට පුළුවන් වීම වැදගත් කරුණක් බව මතක් කරන්න ඕනෑ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්නා පිළිවෙල සම්බන්ධව බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) ඉතාම කැත විධියේ චෝදනාවක් එම දෙපාර්තමේන්තුවට එල්ල කළා. අප පක්ෂයේ මන්ත්‍රීවරුන් අතට එම විභාගයේ ප්‍රතිඵල ලැයිස්තු ලබා දී අපට ඕනෑ හැටියට එම පත්වීම් කරන බව ඒ මන්ත්‍රීතුමා කිව්වා. එය අප හැම දෙනාටම එල්ල කළ චෝදනාවක්. එවැනි කැත චෝදනාවක් මෙම සභා ගර්භය තුළ කිරීම මන්ත්‍රීවරයකුට සුදුසු දෙයක්යයි මා අදහස් කරන්නේ නැහැ. වරප්‍රසාද තිබෙන නිසා මෙම සභා ගර්භය තුළ දී ඔවැනි චෝදනා කළ හැකි වුවත්, පිටත දී ඔවැනි දේ කිව්වොත් ගුටි කන්නට සිදු වන්නේ ගල්වලින් පමණක් නොව මුට්ටිවල පුර වන ලද වෙනත් දේවලිනුයි. එතුමා කළ චෝදනාව ඒ තරමට නින්දිතයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුව අද විශාල පරිවර්තනයකට භාජන කර තිබෙන බව අප කවුරුනුත් දන්නවා. පැරණි අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතු බව කවුරුනුත් පිළිගන්නවා. ඒ වෙනස කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා පුළුවන් තරම් වීරිය කරනවා. එය ජාතික කටයුත්තක්. ආණ්ඩු පක්ෂයට පමණක් තනිව කළ හැකි දෙයක් නොවෙයි. ඒ සඳහා ආණ්ඩු පක්ෂයත් විරුද්ධ පාර්ශ්වයත් එකතු වී සාකච්ඡා කොට නියම විධියේ සැලැස්මක් හා වැඩ පිළිවෙලක් ඇති කර ගත යුතුයි. බොරු චෝදනා එල්ල කිරීම හපන්කමක් නොවෙයි.

ඊළඟට මා පළාත් පාලන අමාත්‍යාංශය ගැනත් වචනයක් දෙකක් කිව යුතුයි. සමහර ගම්සභාපතිවරුන් අසාධාරණ බදු එකතු කිරීමේ වැඩ පිළිවෙලක් ගෙන යන බව මා පළමුවෙන්ම කියන්න ඕනෑ. ඇතැම් ගම්සභා ප්‍රදේශ දියුණු පළාත් වශයෙන් වෙන් කොට ඒ පළාත්වල දුප්පත් ජනතාවගෙන් අසාධාරණ බද්දක් අය කරනවා. රාත්‍රි කාලයට තමන්ගෙ ගෙදර ලාම්පුව පත්තු කර ගන්නවත් මුදල් නැති උදවියට බදු ගෙවන්නට සිදු වී තිබෙනවා. ඒ විධියේ ගම් කිහිපයක් මගේ ඡන්ද කොට්ඨාශයේම තිබෙනවා. පරණ නීති රීති වෙනස්කර අළුත් නීතිරීති සකස් කළොත් මේ උදවිය බදුවලින් නිදහස් කර ඔවුන්ට සහනයක් ලබා දෙන්නට අපට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. පරණ නීතිරීති ඉවත් කර අළුත් නීති පනවා පළාත් පාලන අංශයේ සංශෝධනයක් කිරීමට අපේ පළාත් පාලන ඇමතිතුමා ලොකු උත්සාහයක් දරන බව අප කවුරුත් දන්නවා. ඒ නිසා දුප්පත් ජනතාව තළා අසාධාරණ ලෙස බදු අය කිරීමේ මේ පැරණි ක්‍රමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවත්වා දුප්පත් ජනතාවට සහනයක් සැලසෙන නව බදු ක්‍රමයක් සකස් කිරීම කෙරෙහි එතුමාගේ අවධානය මා යොමු කරවනවා.

ගරු කථානායකතුමනි, ස්වදේශ කට යුතු භාර ඇමතිතුමාගෙනුත් එක්තරා ඉල්ලීමක් කරන්නට තිබෙනවා. වර්තමාන ග්‍රාම සේවක කොට්ඨාශ සම්පූර්ණයෙන්ම සංශෝධනය කළ යුතුයි. දැනට අවුරුදු 10 කට පෙර තිබුණු ග්‍රාමසේවක කොට්ඨාශ අදත් ඒ විධියටම තිබෙන අතර, අද ගම් දියුණු වී ජනගහනය වැඩි වී තිබෙන නිසා සමහර ග්‍රාමසේවක කොට්ඨාශ එක ග්‍රාම සේවක නිලධාරියකුට පාලනය කරන්නට අමාරුයි. ගංවතුර ගලන සමහර ප්‍රදේශවල ජනගහනය අඩු වී තිබෙනවා. ඒ වගේම ජනපද ආදිය පිහිටුවීමෙන් සමහර ස්ථාන පුළුල් වී තිබෙනවා. මේ අනුව කල්පනා කර බලන විට ග්‍රාම සේවක කොට්ඨාශ නැවත බෙදා වෙන් කළ යුතු බව මා මේ අවස්ථාවේදී ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

මා වැඩිදුර කථා කරන්නට යන්නෙ නැහැ. ජාතික රජයට කිසි කරදරයක් නැතිව අවුරුදු 5 ක්ම නොකඩවා රාජ්‍ය කරන්නට පුළුවන්වීම ගැන අපි සන්තෝෂ වෙනවා. විරුද්ධ පාර්ශ්වය අපට මොන විධියේ අකුල් හෙළුවත්, නොයෙක් තැන්වල කඩාකප්පල් ව්‍යාපාර ඇති කළත්, අපට ඒවාට මුහුණ පා ඉදිරියට යන්නට පුළුවන් වුණා. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදය අනුව ලබන මැතිවරණයේදීත් ජාතික රජය නැවත වරක් බලයට පත් වන බව අපට විශ්වාසයි. විරුද්ධ පාර්ශ්වයට මෙය සිනහවට කරුණක් වුණත්, ලබන වර්ෂයේදීත් අපේ අයවැය කථාවට තමුන්නාන්සේලාට විරුද්ධ පාර්ශ්වයේ සිට ඇහුම්කන් දෙන්නට සිදු වන බව මා අවසාන වශයෙන් කියන්නට කැමතියි.

අ. භා. 2.18

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.** (මිහින්තලේ)

(திரு. பீ. எம். கே. தென்னகூன்—மிகிந்தலே)

(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ පස්වෙනි අයවැය ලේඛනය පිළිබඳ විවාදයට මටත් සහභාගි වන්නට ඉඩකඩ ලැබීම ගැන මා සන්තෝෂ වන අතර එහිදී මටත් මගේ අදහස් ප්‍රකාශ කරන්නට ඉඩකඩ සලසා දීම ගැන තමුන්නාන්සේට මගේ ගෞරවය පළමුකොටම පළ කළ යුතුව තිබෙනවා. තමන් එකම තැන ඉඳගෙන පස්වෙනි අයවැය කථාවත් ඉදිරිපත් කිරීම ගැන අපි කවුරුත් මුදල් ඇමතිතුමාට ස්තුති කරනවා. මමත් ගෞරව කරන්නට කැමතියි, විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුයි, ගරු අගමැතිතුමාට. ඒ ඇයි ? එතුමාගේ කැබිනට් මණ්ඩලයේ ළඟදී වෙනසක් ඇති වුණා. හිටපු සෞඛ්‍ය ඇමතිවරයා මාරු කරල නවත් ඇමතිවරයෙකු එතැනට දමල සංශෝධනයක් කළා. එහෙත් ඒ වෙනස අපේ මුදල් ඇමතිතුමාට සිදු නොවුණු නිස යි, වාර්තාවක් පිහිටුවමින් එතුමාට පස්වෙනි වතාවටත් මේ තත්ත්වය රැක ගන්ට පුළුවන් වුණේ. ඒ නිසා මුදල් ඇමතිතුමා එහාට මෙහාට නොපන්නා මෙතැනම තබා ගැනීමෙන් එතුමාට පස්වෙනි අයවැය කථාවත් කරන්නට අවස්ථාව සලසා දීම ගැන මා විශේෂයෙන් අගමැතිතුමාට මෙහිදී ස්තුතිවන්ත වෙනවා.

අයවැය ලේඛනයකින් අපි කවුරුත් බලාපොරොත්තු වෙන්නෙ ඉදිරි අවුරුද්ද අපි මොන විධියට ගත කරනවද කියන එකයි. දැන් අවුරුදු 4 ක් තිස්සේ මේ රටේ ජනතාව අයවැය කථාවලට සවන් දුන්නා. ඒවායේ රස හෝ නිරස විඳගෙන අවුරුදු ගණනක් ජීවත් වුණා. මේ ආණ්ඩුවේ පස්වෙනි අයවැය ලේඛනයෙන්වත් මේ දුක් විඳින ජනතාවට යම් සහනයක් ලැබෙයි කියන එක්තරා විශ්වාසයක් ජනතාව තුළ තිබුණා. නමුත් ජනතාව බලාපොරොත්තු රහිතව ජීවත්වන බව මා කිව මනා නොවෙයි. එයට එක්තරා හේතුවක් තිබෙනවා.

තමුන්නාන්සේ දන්නවා, පසුගිය මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ජනතාවට පොරොන්දු රාශියක් දුන් බව. එම පොරොන්දුවල තිබුණා, ඔබට හොඳ මනුෂ්‍යයෙක් වශයෙන් ජීවත්වන්න නම්, ඔබට නිවාසයක් ලබාගන්න නම්; ඔබට රැකියාවක් ගන්න නම්, ඔබට සැප පහසු අන්දමින් ජීවිතය ගත කරන්නට නම් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නටය කියා. එදා, අපේ රටේ ජනතාව 'ඔබට' කියන වචනය වැරදියට වටහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

ගත්තා. විශේෂයෙන්ම ජනතාව රැවටුණා ඔබ කියා අමතන්නේ අප සියළු දෙනාටම ය, එනිසා ගම්බද ජනතාව අලුත් පරිච්ඡෙදයක් බලාපොරොත්තුවෙමින් ඡන්දය දුන්නා ; එයින් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වුණා. ඊට පසුව ජනතාවට තේරුම් ගියා ඔබ කියා කීවේ කාටද කියන කාරණය. එදා, එක්සත් ජාතික පක්ෂය ඔබ කියා අමතා තිබෙන්නෙ, මේ රටේ දුක් විඳින ජනතාවට නොව ඔවුන්ගේ පංක්තියේ උදවියටයි. ඔවුන්ගේ පංක්තියට අවශ්‍ය සැපපහසුකම් සලසා දුන්නා, ඔවුන්ගේ පංක්තියේ උදවියට රැකී රක්ෂා ප්‍රශ්නය විසඳා දුන්නා, ඔවුන්ගේ පංක්තියේ උදවියට අවශ්‍ය ලොරි, ජීප්රථ, මිනිමොක් රථ, ට්‍රැක්ටර් ගෙනැවිත් දුන්නා. දැන් මේ රටේ ජනතාව හොඳ හැටි අවබෝධ කර ගෙන තිබෙනවා, ජනතාවට අවබෝධ වී තිබෙනවා, එදා ඔබ කීවේ කාටද කියා. එම නිසා මීළඟ මැතිවරණයේදී, තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයෙහි ඔබ කියා සඳහන් කළොත් මහජනතාව පෙර මෙන් රැවටෙන්නේ නැති බව අවධාරණයෙන් මතක් කර දිය යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය ආණ්ඩු පැවැති කාලය තුළදී, අයවැය ලේඛන සකස් කරන විට මා කවදාවත් ආණ්ඩු පක්ෂයක සිටියේ නැහැ. එය එසේ වුණත්, මා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටියත්, මගේ කනට අසන්නට ලැබුනේ, මේ රටේ සිටින ධනපති පංක්තියෙන් අවශ්‍ය අයබදු අරගෙන පොදු ජනතාවගේ අවශ්‍යතාවන් පිරිමසා ලන්නට ක්‍රියා කළ බවයි. එදා ඒ අන්දමට ක්‍රියා කළත් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ඔවුන්ගෙන් අය කළ ඒ බදු කපා හැර, අඩු වශයෙන් බල්ලන් ගෙන්වීමේදී අය කළ බද්ද පවා ඉවත් කර තමන්ගේ හිතවතුන්ගේ සැපපහසුකම්, අවශ්‍යතාවන් ඉටු කර දීමට ක්‍රියා කිරීමෙන් පසුව ඇති වූ මුදල් අමාරුකම් පිරිමසා ගැනීමට විදේශ ණය ලබාගැනීමට සිදු වුණා. එපමණක් නොවෙයි, විදේශවලින් ලබාගත් ණය මුදල් වලින් ලොරි, ජීප් රථ, මිනිමොක් රථ, ට්‍රැක්ටර් ආදිය විවිහිස ක්‍රමය යටතේ සියයට පණස් පහක මුදලක් ගෙවමින් ගෙන්වා ගැනීමට ඉඩ සලසා දුන්නා. මෙවැනි කරුණු හේතුකොට ගෙන බඩු මිළ ඉහළ යාම නිසා අප රට ජනතාව ඉතාමත් අමාරු තත්ත්වයකින් ජීවත්වන අවස්ථාවකයි මෙම අයවැය ලේඛනය තමුන්නාන්සේලා සකස් කර ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, රජයේ මෙම ක්‍රියා කලාපය අපේ පොදු ජනතාව දැන් සම්පූර්ණයෙන්ම අවබෝධ කර ගෙන තිබෙනවා. යම්කිසි පක්ෂයකට ආණ්ඩු බලය ලබා දෙන්නේ රටේ රැකිරක්ෂා ප්‍රශ්නය, ගොවියාට එදිනෙදා මුහුණ පාන්න වන ප්‍රශ්න, ට්‍රැක්ටර් කුලිය ආදී ප්‍රශ්න විසඳා දීමට යම්කිසි පියවරක් ගන්නවාය කියන බලාපොරොත්තුවෙන්. ඇත්ත වශයෙන් උතුරු මැද පළාතේ ගොවියන්ට ලොරිවලින් එතරම් අවශ්‍යතාවක් නැහැ. ජීප් නැති වුණාට කමක් නැහැ. නමුත් තමන්ට ලැබෙන ආදායමින් කරදරයක් නැතුව ජීවත් වීමේ ක්‍රමයක් ඔවුන්ට අවශ්‍ය වෙනවා. එදා රුපියල් 23 ක් ව තිබුණු ට්‍රැක්ටර් කුලිය අද රුපියල් 80, 85 දක්වා වැඩි කර තිබෙනවා. ඔන්න ඔය කාරණා ගැන සිතන විට, ට්‍රැක්ටර් සඳහා ගෙවියයුතු ගාස්තු, පෝර ලබා ගැනීම සඳහා යන මුදල්, වෙනත් උපකරණ සඳහා ගෙවියයුතු මුදල් ගැන කල්පනා කරන විට ගොවිරාළලාට අන්තිමට සිද්ධ වන්නේ ණය ගෙවා උකුණු ගහයි, බෝල් අත්තයි කර ගහ ගෙන ගෙදර යන්න.

අද, උතුරුමැද පළාතේ මෙවැනි තත්ත්වයකුයි ඇති වී තිබෙන්නෙ. ගරු කථානායකතුමනි. මන්ත්‍රීකම මගේ රක්ෂාවක් නොවෙයි, මා ගොවිතැන් කරන ගොවියෙක්. මගේ අත්දැකීම් අනුවයි මා කියන්නෙ. ඇත්ත වශයෙන්ම අපේ රටේ ජනතාවට ජීවත්වන්න සිද්ධ වී තිබෙන්නෙ මේ තරම් අහේනියකිනුයි. මෙවර අයවැය ලේඛනයෙන් පස්සෙ ට්‍රැක්ටර් ගාස්තු තවත් වැඩි කර තිබෙනවා. ට්‍රැක්ටර් මිල වැඩි කරන විට ට්‍රැක්ටර් මුදලාලිලා අමතර මුදල ගෙවන්න ලැහැස්ති වන්නේ නැහැ. ඒ මුදල ගන්න අනික් පැත්තෙන් ගොවියාගේ බෙල්ල මිරිකනවා. එම නිසා තමුන්නාන්සේලා එක එල්ලේ ගොවියාට පහර නොගැසුවත් තමුන්නාන්සේලාගේ ධනපති මිත්‍රයන්ට වාහන ගෙන්වා ගැනීමට, අනිකුත් ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට ඉඩදී ඒ අයගෙන් බද්දක් අය කරන විට ඔවුන්ගේ මඩියෙන් මුදල් දී බේරෙන්නෙ නැහැ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් පැත්තෙන් දුප්පත් මිනිහාගේ බෙල්ල මිරිකා ඒ මුදල ගන්නා බව මතක් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, රුපියලේ මිල අඩු කළ නිසා එදා වී බුසලක සහතික මිල රුපියල් 14 කළා. ශත 80 ඒවා 14 ක් ගෙන බැලුවාම වෙන්නේ රුපියල් 11.20 යි. මේ අනුව වී බුසලක නියම මිල රුපියල් 11.20 යි. නමුත් මා කලින් සඳහන් කළ ද්‍රව්‍යවලට වැය කළ යුතු මුදල් ප්‍රමාණය ගැන කල්පනා කර බලන විට ගොවියා අද සිටින්නේ කොතැනද කියන එක අමුතුවෙන් පැහැදිලි කර දෙන්න ඕනෑ නැහැ. හාල් ගෙන්වා ගැනීම සඳහා මේ රටේ විදේශ විනිමය විශාල වශයෙන් පිට රටට ඇදී යනවාය, ඒක නවත්වා ගැනීම අපේ පරමාර්ථයය කියා ආණ්ඩු පක්ෂයේ අය කෑගසනවා. මේ ආණ්ඩුවේ අදහස ඇත්ත වශයෙන්ම වී ගොවිතැන දියුණු කිරීම නම් වී මිල වැඩි කරන්නය කියා මා මේ ආණ්ඩුවට යෝජනා කරනවා. එසේ කළොත් ගොවියා තව තවත් ධෛර්‍යයීමත් වී ගොවිතැන් කිරීමට පෙළඹෙන නිසා අපට අවශ්‍ය හාල් මෙහිම නිපදවා ගැනීමට පුළුවන් වෙනවා.

ආණ්ඩුවේ සේවකයන්ට පඩි වැඩි කරන්නට යන බව අපට දැනගන්නට ලැබුණා. අප ඒ ගැන විරුද්ධ නැහැ. මේ අය වැය ලේඛනයෙන් වී බුසලේ මිල රුපියල් දෙක තුනකින්වත් වැඩි වේය කියා ගොවි ජනතාව බලාපොරොත්තුව සිටියා. එහෙත් එය සිදු වුණේ නැහැ. මේ විධියේ ක්‍රමයක් යටතේ වී නිෂ්පාදනය කිරීමට සිදු වී තිබීම නිසා ඔවුන් අසහනයට පත් වී සිටිනවා; ඔවුන්ට ජීවත් වීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඔවුන්ගේ තත්ත්වය යහපත් කර ගැනීම සඳහා අය වැය ලේඛනය කෙරෙහි කිසිම බලාපොරොත්තුවක් තබන්නට බැරි බව අවබෝධ වීම නිසා ඔවුන් අද කළකිරීමට පත්වී සිටිනවා. පසු ගිය ආණ්ඩුව කාලයේදී ඉඩම් අක්කරයක් සඳහා අය කළ ශත පනහේ බද්ද අද රු. 4 දක්වා වැඩි වී තිබෙන බව අප මතක් කළ යුතුයි. මගේ අත්දැකීම අනුව කියන්නට පුළුවන්, මෙතෙක් කල් රු. 22.50 ක් ඉඩම් බදු ගෙවූ තිරප්පනේ එක්තරා පුද්ගලයකුට මෑතකදී කරන ලද බදු වර්ග කිරීම නිසා රුපියල් 125 ක් ගෙවන්නට නියම කර තිබෙන බව. මෙයින් සිදු වන්නේ දුක් විඳින ඒ ගොවි ජනතාව තව තවත් අසහනයට පත් වීමයි.

මේ රජය කාර්, ලොරි, ජීප්, මිනිමොක් ආදිය ගෙන්වූ බව තමුන්නාන්සේ දන්නවා. ඒවා ගෙන්වා බෙදා දුන්නේ කොහොමද ? මගේ කථාව වැරදි නම් නිවැරදි කරවා ගන්නට මා කැමතියි. ඊයේ පෙරේද ටැක්සි සඳහා ගෙන්වන ලද කාර් මන්ත්‍රීවරුන්ගේ නෝනා මහත්වරුන්ගේ නම්වලින් ටැක්සි වශයෙන් පාවිච්චි කරන බව ආරංචියි.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
නම් කියන්න; නම් කියන්න.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)
මම නම් කියන්නෙ නැහැ. ජීවිතයටම ටැක්සි පාවිච්චි නොකළ අය දන් ටැක්සි දුවවනවා. ජීවිතයට ටැක්සි එකක් පාවිච්චි නොකළ එප්පාවල ඩබ්ලිව්. පුංචිබණ්ඩා මුදලාලි මහත්මයාට, කහටගස්දිගිලියේ ඩී. ඒ. දිසානායක මුදලාලි මහත්මයාගේ පුතාට ටැක්සි දීලා තියෙනවා. ජීවිතයට ටැක්සි තිබුනෙ නැති අනුරාධපුරයේ කීප දෙනකුටත් ටැක්සි දී තිබෙනවා. මේ ටැක්සි දෙන ක්‍රමය මොකක්ද ? පන්දම්කාරයන් ගිහින් එක්සත් ජාතික පක්ෂයට බැඳුනම අවුරුදු 10 ක් තිස්සේ ඔවුන්ගේ ඉල්ලීම අනුව ක්‍රියා කරනවාය යන කොන්දේසියකට අත්සන් අරගෙන ටැක්සි දෙනවා. ඇමති තුමා එන විට ටැක්සිය ඇමතිතුමා පසුපස යන්නට ඕනෑ. ඒ විධියේ වැඩ කිරීමේ පොරොන්දු උඩ ටැක්සි දෙනවා. ලොරි දීම කෙරෙන්නෙත් ඔය විධියටයි. තත්ත්වය මෙසේ තිබියදී දුප්පත් ජනතාව අසහනයෙන් පෙළෙනවා. මේ විධියෙන් යම් යම් පුද්ගලයන්ට උපකාර කර ලබන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ඔවුන්ගේ උපකාරය ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා නම් එය නිහීන ක්‍රියාවක් බව කියන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

ගරු කථානායකතුමනි, තත්ත්වය මේ අන්දමට තිබෙද්දී එක්තරා කාරණයක් නිසා අප අගමැතිතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. රාජාසන කථා විවාදයේදී අගමැතිතුමා පැහැදිලි කළා, තමාගේ කැබිනට් මණ්ඩලයේ එක්තරා ඇමතිවරයකුට විරුද්ධව අල්ලස් චෝදනා තිබෙනවාය, ඒ ගැන පරීක්ෂා කරනවාය කියා. ඒ ප්‍රකාශය ගැන ගරු අගමැතිතුමාට අප හිස නමනවා. අගමැතිතුමාගේ ඒ කථාවෙන් පසු මහජනයා අපෙන් අහනවා, කව්ද ඒ ඇමතිවරයා කියා. ඒ නිසා අද කැබිනට් එකේ සිටින හැම ඇමතිවරයෙකුගේම නම නරක් වී තිබෙනවා. ඒ ඇමතිවරයා කව්ද කියා නොදන්න නිසා හැම ඇමතිවරයකුම සැක කරනවා. පාර්ලිමේන්තු වරප්‍රසාද නමැති ලෝගුවෙන් වැසී ගෙන ඕනෑම වැඩක් කරන්නට පුළුවන්. කථානායකතුමාගේ අවසරය නැත්නම් පරීක්ෂණයට ඉඩක් නැහැ. [බාධා කිරීමක්] මා ගරු කථානායකතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා, මට විරුද්ධව අල්ලස් චෝදනාවක් තිබෙනවා නම් අල්ලස් කොමසාරිස්තුමා ඉදිරියට මාව යැවීමට අවසර දෙන්නය කියා. මා එයට ලෑස්තියි.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

කාටවත් විරුද්ධව අල්ලස් චෝදනාවක් ලැබී නැහැ.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**

*(திரு. பீ. எம். கே. தென்னகூன்)*

(Mr. P. M. K. Tennekoon)

අගමැතිතුමා කිව්ව එකයි, මම කිව්වේ.

අද උතුරු මැද පළාතේ තත්ත්වය ගැන මොහොතක් කල්පනා කර බලමු. වර්ෂාව නියමිත විධියට නොලැබීම හේතුකොට ගෙන, පසුගිය මාස් මෝසමේදී අපේ ගොවි ජනතාව කළ ගොවිතැන් පාලු වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගොවි තාත්තාගේ පටන් අහිංසක ගොවි දරුවා දක්වා හැම කෙනකුගේම හාල් පොත් අද ආණ්ඩුව ආපසු අරගෙන තිබෙනවා. ජීවත් වන්න වත් බැරි තත්ත්වයකයි අද ඔවුන් ඉන්නේ. මහකනදරා ජනපදය, සාලියපුර, පානියංකඩවල, කෝපකුලම, ගල්කුලම, කලෑත්තාව, කුරුන්දන්කුලම වැනි ප්‍රදේශවල අය ජීවත් වන්නට බැරි තත්ත්වයකයි අද ඉන්නේ. ඔවුන්ට සහනාධාර ක්‍රමයක් ඇති කරන ලෙස නොයෙක් අවස්ථාවලදී කියා තිබෙනවා. එහෙත් මේ ආණ්ඩුව ඒ අයට සහනාධාර නොදෙන්නේ ඇයි කියා මා දන්නේ නැහැ. ඔවුන්ගේ ගොවිතැන් පාළුවීම නිසා ඔවුන්ට සහනාධාර දුන්නොත් රජයේ වගා ව්‍යාපාරය අසාර්ථක වුණාය කියා—පහරක් වදියි කියා—බයට සහනාධාර නොදෙනවාද මා දන්නේ නැහැ. මහ ජනතාව නම් කියන්නේ එයයි. කැකිරාව ආසනයේ හබදිවුල්වැව, පුස්දිවුල්වැව, මහ මිගස්වැව යන ගම්වලට මා මෑත දී ගියා. මුළු ගමේම සිටියේ වයස අය දෙතුන් දෙනෙක් පමණයි. මිනිස්සු නැහැ. ගමේ අනික් අය කොහේ ගිහින්දැයි මා ඇසූ විට කීවේ මී කොටන්න කැලෑවට ගිහිල්ලා කියලයි. ඔවුන්ට ජීවත් වන්නට ක්‍රමයක් නැතිව කැලයට ගිහින් මී කොටලයි ජීවත් වන්නට බලන්නේ. මොන ආණ්ඩුවක් තිබුණත් ඔවුන්ට සහනාධාර ක්‍රමයක් සැලසීමට ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. පසුගිය ආණ්ඩුව පැවැති කාලයේ ඔය විධියේ අසහනයන්ට මහජනතාව පත් වූ අවස්ථාවල සහනාධාර වැඩපොළවල් ඇති කර ඔවුන්ට ජීවත් වන්නට ක්‍රම සලස්වා දුන්නා. අනුරාධපුර ප්‍රදේශයේ ආසන වැඩි ගණනක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගොස් තිබෙන නිසා ඒ අහිංසක ජනතාවගෙන් පළිගන්නට මේ ආණ්ඩුව ඔවුන් වෙනුවෙන් යමක් නොකර සිටිනවාද කියා මා දන්නේ නැහැ. ඒ බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෑතදී ගොවි රජවරුන් තේරීමකුත් කළා. ගොවිතැන් පාළු වී මිනිසුන්ට කන්නත් නැහැ. එහෙත් ඔටුණු පලන්දනවා. මගේ ආසනයේ හීනුක්වැගම නමැති ගමේ නැනැත්තෙක් අක්කරයක් ගොවිතැන් කළා. ඒ අක්කරයේ ගොයම් පැගීමෙන් පසුව ඔහුට ලැබුණේ වී බුසල් 52 යි. එහෙත් පරීක්ෂා කිරීමට කැබැල්ල කපන විට වී බුසල් 148 කට ගණන් පෙන්නුවාලු. ඒ පුද්ගලයා කලාගම් පළාතේ තුන් වැනි ගොවි රජා හැටියට තේරී රුපියල් 300 ක තෑග්ගකුත් ගත්තා. අන්තිමේදී ගොවි ණය ගෙවා ගන්නට බැරිව, හාල් පොත ආණ්ඩුව ගත්තා. ඊට පසුව ඔහුට ජීවත් වන්නට ක්‍රමයක් නැතිව දූන් "සුම්කෝමෝ"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉලෙක්ට්‍රිකල් කොම්පැනියේ රුපියල් 4.50 ක වැටුපකට කුලී වැඩ කරනවා. ඔය විධියේ දූෂණ ඕනෑ තරම් තිබෙනවා. ගොවීන් ධෛර්යමත් කිරීමට ඔවැනි දේ කරන එක හොඳයි. එහෙත් කළ යුතු ක්‍රමය ඔක නොවෙයි. තරඟයකට ගොවීන් 5 දෙනෙක් එක කොට්ඨාශයකට එනවා නම් ඒ එක එක ගොවියාගේ ඉඩමේ ගොයම් කපා එය පැගීමට අර 5 දෙනාම ගෙන්වන්නට ඕනෑ. තරඟයට සිටින 5 දෙනාම ඒ ඉඩම් කැබැලිවල ගොයම් කපා ගනන් ගන්නවා නම් දූෂණයක් ඇති වන්නේ නැහැ. එහෙත් කරන්නේ එහෙම නොවෙයි. නිලධාරීන් දෙදෙනෙක් යනවා. ඒ නිලධාරීන් ගොවියා අල්ලාගෙන බෝතලයක් තබාගෙන අඩිය ගහනවා. අර අය අල්ලපු කුඹුරේ ගොයම් ටිකක් ගෙනැවිත් එයත් පෑගා සියයට ගණන කියනවා. ඔවුන්ට කැමති ගණනක් ඔවුන් කියනවා. මෙතන තිබෙන්නේ ගොවීන් අතර තරඟයක් නොවෙයි; නිලධාරීන් අතර තරඟයක්. ඒ නිසා ඔය ගොවි රජුන් තෝරීමේ ක්‍රමය සාර්ථක කර ගන්නට නම් තරඟයට ඉදිරිපත් වී සිටින ගොවීන් හැම දෙනාම එකට එක් කරගෙන එය කරන්නය කියා මා මේ ආණ්ඩුවට කියනවා. එසේ කළොත් ඔය ඉලක්කම් නම් ආණ්ඩුවට ලැබෙන්නේ නැති බව පමණක් මා කියනවා. ඔන්න ඔකයි නියම තත්ත්වය.

ගරු කථානායකතුමනි, උතුරු මැද පළාතේ ගොවිතැන් යල් කන්නයට අත රින් පතර කළත් ඔවුන් එය කර ගෙන යන්නේ තරමක අමාරුවකින්. විශේෂයෙන්ම යෝදඇල පාමුල. මට අද ටැලිග්‍රෑම් පණිවුඩයක් ලැබී තිබෙනවා. මම එය කියවන්නම්:

"මොරගොල්ලේගම අලුත් දඹෙවටන අලුවිහාරේගම වැඩකර ඇති කුඹුරුවලට වතුර ඒමට නොදී ඇල අවහිර කර කාගම ජනපදයට යන සුලුස්එක වාරිමාර්ග නිලධාරීන් විසින් විවෘත කර ඇත. වහාම පරීක්‍ෂණයක් පවත්වන්න—ලේකම් අලුත් දඹෙවටන ගොවි කාරක සභාව—"

ගොවිතැන්වලට වතුර නොදී නිලධාරීන් මේ විධියට ගොවිතැන් විනාශ කිරීමට කට යුතු කරනවා නම් ඇත්ත වශයෙන්ම උතුරු මැද පළාතේ අසරණ ගොවීන්ට කාගේ පිහිටක්ද කියා කල්පනා කර බැලිය යුතුයි.

අධ්‍යාපනය ගැන කල්පනා කර බලමු. අද උතුරු මැද පළාතේ අධ්‍යාපන තත්ත්වය සම්පූර්ණයෙන්ම විනාශ මුඛයට පත් වී තිබෙනවා.

සමහර ගරු මන්ත්‍රීවරු අද පවතින අධ්‍යාපන තත්ත්වය ගැන වර්ණනා කළා. මා ඒ ගරු මන්ත්‍රීවරුන්ට චෝදනා කරන්නේ නැහැ. එහෙත් එකක් කිව යුතුයි. ඒ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල තිබෙන තත්ත්වය නොවෙයි අප නියෝජනය කරන කොට්ඨාශවල තිබෙන්නේ. උතුරු මැද පළාතේ ප්‍රධාන නගරය වූ අනුරාධපුරයට පැමිණ අධ්‍යාපනය ලබා ගන්නට ඒ ප්‍රදේශයේ දරුවන් සැතපුම් හයක්, හතක් පයින් ගමන් කරන්නට ඕනෑ. ඒ ප්‍රදේශයේ මාර්ග පහසුකම් නැහැ. වාහන පහසුකම් නැහැ. ඒ නිසා දරුවන්ට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. එදා අපේ දරුවන්ට ගමේ පාඨශාලාවෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය දක්වා ඉගෙන ගන්නට පුළුවන්කම තිබුණා. උසස් අධ්‍යාපනය සඳහා නගරයේ මහා විද්‍යාලයට ගියේ ඊට පසුවයි. එහෙත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? අපේ වර්තමාන ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පාඨශාලා ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ නිසා ගමේ පාඨශාලාවේදී 7 වැනි පංක්තියෙන් එහාට ඉගෙනීමක් ලබන්නට පුළුවන්කමක් නැහැ. ගමේ පාසලේ 7 වැනි පංක්තියෙන් එහාට ඉගෙනීමක් ලබන්නට වර ප්‍රසාදයක් නොලබන ශිෂ්‍යයා වැඩි දුර අධ්‍යාපනයක් ලබන්නට වුවමනා නම් හැතැප්ම හයක් අටක් මඟ ගෙවා නගරයේ මහා විද්‍යාලයට එන්නට ඕනෑ. ගමනාගමන පහසුකම් නැති අපේ ප්‍රදේශවල දරුවන්ට මෙය ලේසි වැඩක් නොවෙයි. ඒ නිසා ඒ බොහෝ දරුවන් 7 වැනි පංක්තියෙන් එහාට ඉගෙනීමක් ලබා ගැනීම නතර කර දමන්නට පෙළඹෙනවා. 7 වැනි පංක්තිය දක්වා ඉගෙන ගත් දරුවාගේ පියා ගොවියෙකු නම් ඔහුත් පියාත් සමඟ කුඹුරට යනවා. ඒ දරුවාගේ පියා කම්මල්කාරයකු නම් පුතාත් යකඩ තලන්නට පටන් ගන්නවා. පියා වළං තලන්නකු නම් පුතාත් ඒ රක්ෂාව පටන් ගන්නවා. මේ විධියට 7 වැනි පංක්තියෙන් එහා අධ්‍යාපනය කප්පාදු කිරීමට වැඩ පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]
වෙළක් යොදා ඇති හෙයින් අර බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) කීවාක් මෙන් 1956 න් පෙර මේ රටේ තිබුණු වැඩ වසම් ක්‍රමය යළිත් මේ රටේ ඇති නොවේදැයි ප්‍රශ්න කරන්නට සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන සිය වස පිළිබඳව අද මුළු රට පුරාම උත්සව පවත්වනවා. කොතරම් උත්සව පැවැත්වූවත් අද දින උතුරු මැද පළාතේ පවතින තත්ත්වය ගැන සලකන විට අපට සතුටු වන්නට පුළුවන්කමක් නැහැ. කොතරම් ජයට සියවස උත්සව පැවැත්වූවත් අපේ දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. බොන්නට වතුර පොදක් නැතිව අද දරුවන් දහස් ගණනක් අනුරාධපුරයේත් උත්සව පවත්වනවා. ඇත්තෙන්ම ඒ දරුවන් මෙන්ම ඒ දරුවන්ගේ ගුරුවරුන්ද අද මහා අභේනියකට මුහුණ පා සිටිනවා. අගෝස්තු නිවාඩුවට කියන්නේ ග්‍රීෂ්ම නිවාඩුව කියලයි. ඒ කාලයේ පවතින අප හසු තත්ත්වය නිසා ගුරුවරුන් ගම් රට වල් බලා යන්නට ඕනෑ. එහෙත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? වතුර නැතිව, ආහාර නැතිව, සැප පහසුකම් නැතිව අනුරාධපුර නගරයට වී සියවස උත්සව පවත්වන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. මේක මොන තරම් අභේනියක්ද?

පාඨශාලා ගොඩනැගිලි ගැන කල්පනා කර බලමු. මිහින්තලා විද්‍යාලයේ සියවස උත්සවයට ඊයේ පෙරේදා මාත් ගියා. ඒ පාඨශාලාවේ ඉගෙන ගන්නා දරුවන්ට පමණක් නොව උගන්වන ගුරුවරුන්ටද වැසිකිළියක් නැහැ. එක පැත්තකින් ගුරුවරුන් කැලේට යනවා. අනෙක් පැත්තෙන් ළමයින් කැලේට යනවා. මෙය මොන තරම් ලජ්ජා විය යුතු වැඩක්ද? ඇත්තෙන්ම මේ ගුරුවරුන් වැඩ කර ගෙන යන්නේ මොන තරම් ලජ්ජා සහගත තත්ත්වයකින්ද? ඒ ගුරුවරුන් සහ ළමයින් වෙනුවෙන් වැසිකිළියක් දෙන්නට බැරි නම් කාටද ඒ තත්ත්වය ගැන සතුටු වන්නට පුළුවන් රසායනාගාර සහ අනෙකුත් ගොඩනැඟිලි කීසිවක් පසුගිය කාලය තුළ අපේ කොට්ඨාශවල පාඨශාලාවලට ලැබී නැහැ. පාඨශාලාවල තිබුණු අඩුපාඩු ඒ විධියෙටම තිබෙනවා.

ගරු කථානායකතුමනි, අනුරාධපුරයේ නුවර වැව යටතේ විශාල කුඹුරු යායවල් ගොවිතැන් කිරීමට සකස් කර තිබෙනවා. එහෙත් අනුරාධපුර නගරයේ සංවර්ධන වැඩවල අවශ්‍ය ජලය නුවර වැවෙන් ගැනීම හේතුකොටගෙන ඒ වැව පහළ ගොවිතැන් සම්පූර්ණයෙන්ම වාගේ අසාර්ථක වී ගොස් තිබෙනවා. නුවරවැවේ ජලය අනුරාධපුර නගරයට ගැනීම වෙනුවට වෙනත් යෝජනාවක් ක්‍රියාත්මක කිරීම ගැන ආණ්ඩුව කල්පනා කළයුතුයි. මල් වතු ඔයට ඇළ වල් කීපයක් කපා අනුරාධපුරයට අවශ්‍ය ජලය ලබාගන්නට පුළුවනි. කතරගමට ජලය ගන්නා ආකාරයට මල්වතු ඔයෙන් අනුරාධපුරයට ජලය ලබා ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කළහොත් නගර වාසීන් 25,000 කට විශාල යහපතක් සැලසෙන්නා වාගේම ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවියන්ට විශාල යහපතක් සිදු වෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ ඊළඟ මූලික මැතිවරණ තුරුම්පුව මහවැලි යෝජනා ක්‍රමයයි. කවුරුනුත් අනුරාධපුරයට ගොස් කථා කරන විට නම් කියන්නේ තව අවුරුදු දෙකකින් වතුර ලැබෙන බවයි. ඒ නිසා උදලු මිට ගසා නඟුල්වලට පතකඩ ගසා ලැස්ති වී සිටීමයි, අවශ්‍ය වන්නේ. ඇත්තෙන්ම මේ විධියට කියා මිනිසුන් රවටන්නට පුළුවන්කමක් නැහැ. අපට ඉදිරිපත් කර තිබෙන පොත්පත්වලට අනුව, ලේඛනවලට අනුව මහවැලි ගඟ යෝජනා ක්‍රමයේ වැඩ 1970 දී ආරම්භ කර 1976 දී අවසන් වෙනවා. එහෙත් ඒ එහි මූලික පියවර පමණයි. එහෙත් මහවැලි ගඟේ කලාවැව යෝජනා ක්‍රමයට මුල් ගල තබා මේ උදවිය කියන්නේ තව අවුරුදු පහක් යන කොට රැකීරක්ෂා ප්‍රශ්නය විසඳී යනවා පමණක් නොව වඳ පෙති දීම නවත්වා දමන්නට සිදු වන බවයි. මහවැලි යෝජනා ක්‍රමය නිසා රක්ෂා ප්‍රශ්නය විසඳී යනවා. ඊළඟට රක්ෂා තියෙනවා. මිනිසුන් මදි. මේ තත්ත්වය නිසා වඳ පෙති දීම නවත්වන්නට සිදු වෙයිලු. අගමැතිතුමා අනුරාධපුරයේදී එසේ කියා තිබෙනවා. දැන් වඳ පෙති දෙන නිසා මිනිසුන් අසහයකට පත් වී සිටියත්, මහවැලි ගඟ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනා ක්‍රමය සාර්ථක වුණාම රැකියා සඳහා මිනිසුන් විශාල ගණනක් වුවමනා නිසා ඒ අවස්ථාදේදී වඳ පෙති දීම සම්පූර්ණයෙන්ම නවත්වනවාලු. ඒ ප්‍රකාශය අනුව මට ලොකු භයක් ඇති වුණා. ඒ අනෙකක් නිසා නොව මහවැලි ගඟ යෝජනා ක්‍රමයට මිනිසුන් මදි වී, ඉන්දියාවට යවන්නට යන මිනිසුන් නොයවා මෙහිම රඳවා ගනීය යන සැකය නිසායි. මෙවැනි රැවටිලි කථාවලට උතුරු මැද පළාතේ ජනතාව රැවටෙන්නේ නැහැ. ඇලහැර හරහා අඹන් ගඟේ අදත් යන්නේ මහවැලි ගඟේ වතුරයි. දැනට අවුරුදු 13 කට අධික කාලයක සිටම සී. පී. ද සිල්වා මහතා ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති ධුරය දරනවා. එහෙත් මින්නේරිය ඡන්දදායක කොට්ඨාශයේ මැදිරිගිරියේ ගොවි ජනතාවට වතුර සපයන්නට එතුමා අපොහොසත් වුණා. අවුරුදු 13 ක් තුළ මැදිරිගිරියේ ගොවි ජනතාවට වතුර සපයන්නට එතුමාට බැරි වුණා නම්, අවුරුදු 2 ක් තුළ උතුරු මැද පළාතට මහවැලි ගඟේ වතුර ලබා දෙයි කියා අප බලාපොරොත්තු වන්නේ කොහොමද?

එපමණක් නොවෙයි. පසුගිය රජයෙන් නුවර වැවට පෝෂිත ඇළක් කැපුවා. වර්තමාන ඇමතිතුමාම පසුගිය රජය කාලයේදී ඒ ඇල සැතැපුම් 4 ක් කැපූ නමුත්, එහි ඉතිරි සැතැපුම් 1/4 කපන්නට මේ රජයට අවුරුදු 4 1/2 ක්ම ගියා. එහෙත් එය කපා බැලුවාම වතුර එන්නේ නැහැ. ඉන්පසු පොම්පයක් දමා ඉක්මණින් ඇළ පිරෙව්වා. එසේ කොට වතුර අරින්න කීවා. ඒ විධියට වැඩ කර කුඩානෙලුබැවෙ ඉඳගෙන ඇමතිතුමා කල්පනා කරන ගමන් කීවාලු, ඇරපු වතුර දැන් කොයි හරියේ එනවාද කියායි මා කල්පනා කරන්නේ කියා. එහෙත් වතුර කඳුලක්වත් ආවේ නැහැ. ඉංජිනේරු උන්නැහේ රැවැටුවා. එහෙත් උතුරු මැද පළාතේ ජනතාව නම් රැවටෙන්නේ නැති බව මා කියන්න කැමැතියි.

මෙවැනි කරදර මධ්‍යයේ ජීවත් වන උතුරු මැද පළාතේ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වන අපට නම් මොන විධියකින්වත් පුළුවන්කමක් නැහැ, මේ අයවැය ලේඛනය හොඳයි කියන්න. ජනතාවට ජීවත් වීමේ පහසුකම් සලකන්න ඕනෑ. එහෙත් ඔවුන් ඉතා මහන්සියෙන් එදිනෙදා උපයා ගන්නා සුළු මුදල පවා වැය කර බඩු බාහිරාදිය ගන්නට සිදු වී තිබෙන්නේ ඉතා අධික මිළකටයි. ගොවිතැන් කටයුතු සඳහා මේ රජයෙන් ඔවුන්ට කිසිම සහනයක් සලසා නැහැ. පසුගිය රජයෙන් සියයට 6 පොළියට ගොවි ණය ලැබුණත්, මේ රජය ඒ පොළිය සියට 12 දක්වා වැඩි කර තිබෙනවා. ගොවි උපකරණවල මිළත් ඒ වාගේම බොහොම ඉහළයි. එසේ බොහොම අමාරුවෙන් ජීවත් වන ජනතාවක් නියෝජනය කරන මන්ත්‍රීවරුන් වන අපට එක්සත් ජාතික පක්ෂයේ මේ ධනපති අයවැය ලේඛනයට සහාය දෙන්නට කොහෙත්ම පුළුවන්කමක් නැහැ.

අවසාන වශයෙන් මගේ කවි කථාව කරන්නට කලින්, වර්තමාන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවටත්, පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවටත් මා ස්තුති කළ යුතුව තිබෙනවා. මා කිසිම දවසක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුව සිටියෙ නැහැ. මා ඒ ආණ්ඩුවලට ස්තුති කරන්නේ බෞද්ධයෙක් වශයෙනුයි. ඊයේ පෙරේදා රන් වැට විවෘත කිරීමේ උත්සවය තිබුණා. ආණ්ඩු දෙකෙන්ම මේ සඳහා ආධාර දී තිබෙනවා. ඒ උත්සවයට සහභාගි වන්නට මටත් අවස්ථාව ලැබුණා. අගමැතිතුමා හා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත් ඒ උත්සවයට සහභාගි වුණා. දස දහස් සංඛ්‍යාත පිරිසක් ඒ මඟ දෙපස සිටියා. අගමැතිතුමාත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත් තමන්ට පැවරී තිබුණු වැඩ කොටස් ඉටු කළා. ඒ වැඩ හමාර වුණාට පසුව සිදු වුණේ මොකක්ද? නායක හාමුදුරුවෝ පඬුරක් හදාගෙන ආවා. ඒ පඬුර අගමැතිතුමා අතට දී කීවා, 1970 දී යළිත් බලයට එන්නට මෙය ගැට ගහන්නය කියා. එය ඇසී අගමැතිතුමාත් ගල් ගැහුණා. කොහොම වුණත් අගමැතිතුමා එය ගැට ගැසුවා. එය වැරදි වැඩක් බව එතුමාට පසුව අවබෝධ වන්න ඇති. කිසිම දේශපාලන පක්ෂයකට සීමා නොවුණු, මුළු ලෝක බෞද්ධ ජනතාවගේම පූජනීය වස්තුවක් වන මේ අසහාය බෝධි ද්‍රැමයන් වහන්සේ, එක්සත් ජාතික පක් පක්ෂය බලයට පැමිණවීම සඳහා පඬුරු ගැට ගහන ස්ථානයක් කර ගැනීම ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ තෙන්නකෝන් මයා.]

මා කනගාටු වෙනවා. මෙවැනි දේශපාලන කටයුතු සඳහා ජය ශ්‍රී මහා බෝධීන් වහන් සේ උපයෝගි කර ගන්නවා නම් මා ඊට තරයේම විරුද්ධ වෙනවා. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අපක්ෂපාත බෝධීන් වහන්සේ නමක්. මා තවත් කාරණයක් කියන්නම්. 1956 වර්‍ෂයේදී ජය ශ්‍රී බෝධීන් වහන්සේ භාරව සිටියේ බුලන්කුලම දිසා පති තුමායි. එවකට අටමස්ථාන සභාවේ සභාපතිව සිටියේ එතුමායි. නමුත් එතුමාත් 1956 මහා මැතිවරණයෙන් පරාජය වූවා නම්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ දේශ පාලන කටයුතුවලට මැදහත් නොවන බව හොඳටම පැහැදිළියි. එවැනි තත්ත්වයක් තිබියදී, රටේ ජනතාව රවටා, ගරු අගමැති තුමාත් රවටා පඩුරු ගැට ගස්වනවා නම්, කවුරු කළත්, මොන හාමුදුරුවො කළත්, ඒක කැත ක්‍රියාවක් බව මා මේ අවස්ථා වේදී මතක් කරනවා. මෙවැනි වැඩ කටයුතු දකින විට මුළු මහත් ජනතාව එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාමාර්ගය පිළිකුල් කොට හෙළා දකිනවා. මීළඟ මැතිවරණය පවත්වන්නේ කවදාද කියා රටේ ජනතාව බලාගෙන ඉන්නවා. එදා මැතිනිය උඩ මලුවට යන විට ජනතාව දුන් අත්පොල සත් හඩ ගැන කල්පනා කර බලන විට, මීළඟ මහා මැතිවරණයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ නායකත්ව යෙන් මේ රටේ ආණ්ඩුවක් ඇති වීම සහතික බව අපට පැහැදිළිවම පෙනෙනවා. එය එසේම වේවායි ප්‍රාර්ථනා කරමින් මා දුන් මගේ කවි කථාව පවත්වන්නට අදහස් කරනවා.

කිරිපැණි වලින් රට උතුරමු කියා රැකි
පිළිවෙත කතානායක මැති හෙලා දැකි
මානා තිබෙන ඡන්දය අහුලනා කෙකි
අය-වැය ඉනාවකි අයවැය හිනා වකි

හිතයට තබා ගෙන අතළඟ බව වන්දේ
ලෙඩ අලි නැගිටුවන්නට මෙන් මර නින්දේ
ගොරහැඩි දෙසුමකින් නැගු මළ බෙර සද්දේ
පුදුමය මුදල් ඇමතිඳු මෙහි ඉකි බින්දේ

කලිසම් කබා ඇඳගහන යාපහුව ළ
ගැවසෙන අයත් දුටුවෙමු යන අයුරු මග
ධනපති බෙර පදය අනුවම රහන රහ
පෙන්විය හිහනකම තව ණය හිහක වග

වගුරන කඳුළු ගොවි කම්කරු පිරිස දූගී
බිය මුසු කම්නි ලැබ අසරණ බවෙක ඉගී
ජීවන මිලද ඇත එකසිය තිහට [illegible]ගී
ගරුතර මුදල් ඇමතිගෙ ඔළු ගෙඩිය අගී

ජාතික ධනය රට පටවන රුදුරු යකා
බදුබර තැනිව අද වැජඹෙති හොඳට කකා
මැරියව් මැරෙන උන් මින්පසු බඩට නොකා
කියමින් පෙන්නුවා මුළු දිවයිනට කොකා

නැගුවන් වගා හඩ දුරලන පිරි පතය
වන්නියෙ කිසිම ගෙදරක නැත අත සතය
රටකෑ අයට කෙළවන්නට කෙළි පොතය
මේවර ගැහැණු අරගන්නේ ඉල පොතය

රැකිබව විදෙස් විනිමය කි රැගෙන දිරි
දහලන දුබල පිරිසක් රට කරනු බැරි
මොරදෙති කතානායක මැති දෙසට හැරි
විමසම් කො හෙද අද ඇත්තේ ළදරු කිරි

නොදී ළදරුවන් හට කිරි කරන රට
අදී වගා පිළිවෙත රට ඉදිරි පිට
හදී හූනියම් එන මැතිවරණ යට
වැදී මියෙන වගනම් කිව හැකිය මට

රිදවා දමා පිඩිතයට දිළිඳු පෙල
රැකගත් අයුරු අපි දුටුවෙමු ගසෙහි මුල
දනපතියනට සෙත සලසා දෙසුම කල
රැක්කා මුදල් ඇමතිඳු හොර වෙළඳ පොල

කම්හල් පැවැත්තුම ගැන හිස් වචන ගොඩ
තිබුනා උලුප්පා අයවැය පොදිය උඩ
නැගුවත් මහත් අබිමානෙන් දුබල හඩ
මේ රටේ කෙරෙන්නේ අද හෙන ගහන වැඩ

අසරණ අහිංසක පීඩිතයගේ දුක
නොමදත් රජය අති බිහිසුනු බයා නක
කම්හල් අයිතිකරුවන් මෙහි විජා තික
හේතුව නොදන්නෙම් සියට අසූ වක

" බිර්ලා " නැමැති ඉන්දිය ධනවතකු ලවා
වියවා අනගි රෙදි බලතල ඔහුට දෙවා
කම්හල් පැවැත්තුවහොත් මේ රටට එවා
ඇදගෙන වැටේ සැක නැහැ තුල්හිරිය පවා

හැට දහසක පමණ යන්තර වියන රෙදි
අසරණයිනට බිර්ලාගෙන පහර වදී
එය දැක දැක අහිංසක පිළිවෙතට බැදී
පුදුමය ඇමති බලු පැටියකු පරිදි නිදී

එලවලු ගොවින්ගෙන් සත දෙක තුනට ගෙන
විකිනේ රාත්තල රුපියල්වලට ගැන
මේවා සොයා නොබලන හත් හවුල පැන
පවසයි වගා දියුණුව ගැන රටට වණ

රජරට පළාතෙන් මහවැලි නදිය ගලා
යන්නට සලස්වන්නෙමු යයි දෙගොඩ තලා
බෙරිහන්දෙමින් දැගලූමුත් ගිරිය පලා
පැවසූ ඇමති ඇත චෛතිය රජකු වෙලා

මස් කිරි බටර් බිත්තර දරුවනට ගැමි
දෙන්නට ඉඩක් නැත දනපතියනට හිමි
බත්පත පරිප්පුද නැවතිනි වැඳුනි බැමි
ඔක්කොම නිකම් ඇස් බැන්දුම් මෙවර නිමි

වෙහෙසී දුකට පත්වීමෙන් දිළිඳු කුළේ
අන්තිම දිළිඳු කම්කරුවා පහළ පෙළේ
[illegible] බත නැතිමුත් තොලට කළේ
[illegible] බැරි නිසයි ඔහුහට දූමෙහි බලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | |
|---|---|
| අදහස් ගෙනෙන කිවිඳුට නැටවෙන | පැන |
| ලේඛකයාට සරසන පත් පිටු | ගාන |
| හරබර ගැඹුරු අදහස් කොතෙකුත් | ගේන |
| මොනවා නැති උනත් සිගරැට්ටුව | ඕන |
| | |
| අපගේ කවින් ගත් කරුවන් දෙතොල | මැද |
| රඳවන දුම්වැටියෙ මිල වැඩි කරන | ලද |
| අයවැය කිලුටු පුස්කෑ රෙදි පොදිය | ඇඳ |
| ජාතික රජය ගිනිබත් කල යුතුය | බැඳ |
| | |
| ගරු ඇමතියකු අල්ලස් උගුලකට | වැටී |
| ඇති බැව් දිනක් අගමැති මේ සබයේ | දිටී |
| දූනගත යුතුය රට ඒ උදවියගෙ | හැටී |
| හොඳ නැහැ ඇසුර මහ වස ජාතියකි | කොටී |
| | |
| කවුරුද ඔහුගෙ නම මොන ඇමතිඳුද | කියා |
| පැවසිය යුතුය මෙහිදී වැඩි දුරට | නොයා |
| ජඩකම් කළානම් ඔහු නිලබලය | තියා |
| පත්කළ යුතුයි අධිකරණය වෙතට | එයා |
| | |
| නොසිතු විලස බඳවා හැම අතින් | බැමි |
| රුඳවූ දෙනෙත උණු කඳුලැලි වලින් | තෙමි |
| පිරිසක් වෙසෙන දුකසේ අසරණුත් | ගැමි |
| මම මගෙ මිහින්තලයට දූන් හැරෙන් | නෙමි |
| | |
| පාලුයි කුඹුරුපිටි රජරට හතර | අත |
| නැවෙයි නිදි පැදුරතුළ දහදියව | ගත |
| නැග එන අවට හිරු රැස්කද අපරි | මිත |
| අද නම් කාන්තාරයකට දෙවැනි | නැත |
| | |
| වෙනද තිබූ අද එහි නැති සහන | වැඩ |
| දස අත නගි කුසගිනි පිට නොයෙක | හඩ |
| ඉවතට දමා මට තිබූ සැනසුමක | ඉඩ |
| නැබුවා වැන්න ගිණි කබලක් ඔළුව | උඩ |
| | |
| රෝහල මිහින්තලයේ ගව මඩු | වක්ය |
| ඔසු නැත ඇඳන් නැත මහ හිරිහැර | යක්ය |
| එය මහ විපතක්ය එය මහ විප | තක්ය |
| ඉවසා සිටින්නේ මැතිවරණය | තෙක්ය |
| | |
| පාසැල් ඇතත් වැසිකිලි පාසැලෙහි | නොවේ |
| සිසුනගෙ අවැසියාවට වන ගැබට | යැවේ |
| අඹතල දරුවනට ඇති කිරි සුවද | මුවේ |
| සැලකුම නරක නැත " වස ඇමතිඳුට | කැවේ " |
| | |
| ගැමි දරුවනට හත්වැනි පන්තියේ | සිට |
| නැවතුනි ඉගැන්නුම දූන් තීරනේ | පිට |
| විපතක් කළ නිසා රජරට පලා | තට |
| යනවා ඇමති යනවාමයි අපා | යට |
| | |
| සැතපුම් දහය පහලොව මහ වනය | මැද |
| විදුහල්වලට යති දරුවන් රිදෙන | හද |
| වල්අලි රහති මහරක අතු රිකිලි | බිද |
| දෙන්නට හොඳද පොඩිවුන්නට මෙවැනි | වද |
| | |
| කිසි සේවයක් නැති මගෙ රජ රටට | කොට |
| පස්වසරකම කෙරුවාවල් දනිති | රට |
| අනුමත කරන්නට අය-වැය කිසිම | විට |
| පුළුවන්කමක් නැති බව කිව හැකිය | මට |

අ. භා. 2.53

**එම්. එස්. අමරසිරි මයා.** (හිනිදුම)
*(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)*
(Mr. M. S. Amarasiri—Hiniduma)

ගරු කථානායකතුමනි, මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාගේ කවි කතාවට පසුව අයවැය ලේඛනයට පක්ෂව වචන සවල්පයක් කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාගේ කතාවෙන් අපට තේරුම් ගියේ, පසුගිය අවුරුදු 50 ඇතුළත මේ රටේ ඇති වී තිබෙන ආර්ථික පරිහානියට සම්පූර්ණයෙන්ම මේ රජයට දෙස් පැවරිය යුතු බවයි. මිහින්තලේ මන්ත්‍රීතුමා ඇතුලු විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මා අහන්න කැමතියි, 1965 ට කලින් මේ රට පාලනය කර ගෙන ගියේ, මේ රටේ වැඩ කටයුතු කර ගෙන ගියේ, කොහොමද කියා. ඒ කාලයේදී තිබුණ අසහනයන් ගැන ඒ මන්ත්‍රීවරුන්ට දැන් මතක නැතිවී ගොස් තිබෙන බව පෙනෙනවා. ඒ කාලයේදී මහජනතාවට තිබුණු අසහනයන්, බඩු බෙදා හැරීම් ආදී අනිකුත් හැම කටයුත් තකදීම මහජනතාව කොතරම් පීඩාවකට පත් වී සිටියාද යන්න ඒ අයට අද අමතක වී තිබෙනවා විය හැකියි.

ගරු කථානායකතුමනි, මේ රටේ ජාතික සංවර්ධනයක් ඇති කිරීම සඳහා ලංකාවේ පළමුවරට අයවැය ලේඛන 5ක් ම ඉදිරිපත් කළ අපේ ගරු මුදල් ඇමතිවරයාගේ 5 වෙනි අයවැය ලේඛනය ගැනයි අපි අද විවාදයක් පවත්වන්නෙ. මේ අයවැය ලේඛනවලින් මේ රටේ ජාතික සංවර්ධනය අවුරුද්දෙන් අවුරුද්ද වැඩි දියුණු කිරීමට කටයුතු යොදා තිබෙනවා. 1965 අවුරුද්දේ සිටම අවුරුද්දෙන් අවුරුද්ද ජාතික සංවර්ධනයේ ප්‍රගතිය කරා යාමට කටයුතු යොදා තිබෙනවා. 1964 වර්ෂයේදී පැවති සභාග රජයේ මුදල් ඇමතිව සිටි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) එදා අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් මොකක්ද කිව්වෙ ? රට ආර්ථික පීඩනයකට පත්ව තිබෙනවාය, ඉතාමත් අමාරු තත්ත්වයකට මුහුණ පා සිටින කාලයක්ය, මෙවැනි තත්ත්වයක් පවතිද්දීයි මේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න සිදුවී තිබෙන්නෙ කියායි. 1964 දී ඒ විධියේ තත්ත්වයක් තිබුණා නම්, 1965

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]
වර්ෂය වන විට රට ඊටත් වඩා භයානක තත්ත්වයක තිබුණ බව අපට තේරුම් ගත හැකියි. 1965 දී ජාතික ආණ්ඩුව මේ රටේ පාලනය භාර ගන්නා විට එදා රටේ තිබුණ තත්ත්වය ගැන මහජනතාව හොඳින් දන්නවා. ක්‍රම ක්‍රමයෙන් ජාතික සංවර්ධනය සඳහා මහජනතාව යොමු කරවමින් බදු මුදල් වශයෙන් ලබා ගන්නා මුදල් වැඩි කොටසක් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමෙන් අද රටේ සංවර්ධනයේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව ඒකාන්ත යෙන්ම කියන්න ඕනෑ.

දළ ජාතික නිෂ්පාදිතය, රටේ සංවර්ධන ප්‍රගතිය, 1965 ට වඩා 1966 වර්ෂයේදී කෝටි 28 කින් වැඩි වී තිබෙනවා. 1966 ට වඩා 1967 වර්ෂයේදී රුපියල් කෝටි 34 කින් වැඩි වී තිබෙනවා. 1967 වර්ෂයට වඩා 1968 වර්ෂයේදී රුපියල් කෝටි 68කින් දළ ජාතික නිෂ්පාදනය වැඩි වී තිබෙනවා. මෙම ජාතික නිෂ්පාදනය වැඩි කිරීමට හේතු වුණු කරුණු රාශියක් තිබෙනවා.

කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සඳහා වෙන අවුරුදුවලට වඩා ඉඩම් සංඛ්‍යාවක් මහජනතාව අතර බෙදා දී තිබෙනවා. ඒ බව මීට ප්‍රථම කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථාවලින්ද කියැවුණා. ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහාද ඉඩම් රාශියක් ලබාගෙන බෙදා දී තිබෙනවා. ජනපද ව්‍යාපාර, උස්බිම් ජනපද ව්‍යාපාර සහ තරුණ ගොවි ජනපද ව්‍යාපාර යනාදි යෙහි කෘෂිකාර්මික කටයුතු සඳහා විශාල මුදලක් පසුගිය අවුරුදු හතර ඇතුළතදී වැය කර තිබෙනවා. 1965-68 කාල සීමාව තුළ වී ගොවිතැන සඳහා අක්කර ලක්ෂ 3 කට වැඩි ප්‍රමාණයක් දුප්පත් ගොවි ජනතාව අතර බෙදා දී තිබෙනවා. ගොවි තැන්වලින් ලැබෙන අස්වැන්න වැඩි යෙන් ලබා ගැනීම පිණිස රසායනික පොහොර සහ නවීන ක්‍රම උපයෝගි කර ගෙන තිබෙනවා. ගොවීන්ට නවීන ක්‍රම අනුව උපදෙස් දීම නිසා අද රටේ වී නිෂ් පාදනය පසු ගිය කාලවලට වඩා—1965 ට ඉහතින් පැවතුණාට වඩා—දෙතුන් ගුණය කින් වැඩි වී තිබෙනවා. මෙවැනි තත්ත්ව යක් උදා කර ගැනීමට, කෘෂිකාර්මික කට යුතු අතින් සංවර්ධනයක් ඇති කර ගැනීමට ජාතික රජය පියවර රාශියක් ගෙන තිබෙනවා. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර ය යටතේ 1965 සිට 1968 අවසාන දක්වා අක්කර 61,000 ක් දුප්පත් ගම්වාසීන් අතර බෙදා දී තිබෙනවා. හිනිදුම ආසන යෙහි පමණක් අක්කර 2,000 ක් දුප්පත් ගම්වාසීන් අතර බෙදා දී තිබෙන බව ප්‍රීති යෙන් කියන්නට කැමතියි. ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහා ධනපති වතු හිමි යන්ගෙන් අක්කර 1,700 ගණනක් 1965-68 අතර ලබා ගෙන තිබෙනවා. හිනිදුම ආසනයේ වතුවලින් පමණක් අක්කර 400ක් පමණ අත්පත් කර ගෙන ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ බෙදා දී තිබෙනවා. ජනපද ව්‍යාපාර වෙනුවෙන් 1965-68 දක්වා අක්කර 57,515ක් ජානපදි කයන් අතර බෙදා දී තිබෙනවා. මේවායේ කට්ටිකරුවන් 20,000 ක් පමණ පදිංචි කරවා තිබෙනවා. ජනපදවල පදිංචි කරවන කට්ටිකරුවන්ට ගෙයක් තනා ගැනීම සඳහා රුපියල් 1,000 ක් ලැබෙනවා; තව තවත් ආධාර ලැබෙනවා. ජනපද දියුණු කිරීම සඳහා රජයෙන් මෙවැනි ආධාර සියල්ලක්ම දෙන අතර ජානපදික යන් 17,500 ක් පමණ ඒවායේ පදිංචි කරවා තිබෙනවා. විශෙෂයෙන් දකුණු පළාතේ හිනිදුම ආසනයේ උස් බිම් ජන පද ව්‍යාපාර සහ තේ ව්‍යාපාර යනාදිය ඇති කර තිබෙනවා. එසේම අළුතින් උස් බිම් ජනපද ව්‍යාපාර රාශියක් ආරම්භ කර තිබෙනවා. අක්කර 1,500 ක් පමණ උස් බිම් ජනපද ව්‍යාපාරවලට වෙන් කර තිබෙන වා. ලංකාවේ ප්‍රථමවරට කුරුඳු වගාව උස් බිම්වල ඇති කිරීම සඳහා හිනිදුම ආසන යෙන් අක්කර 600 ක් පමණ බෙදා දී වැඩ කටයුතු කර ගෙන යනවා. තරුණ ගොවි ව්‍යාපාර යනාදිය සඳහා රුපියල් කෝටි ගණනක් මුදල් වැය කරන නිසා ජාතික සංවර්ධනයේ විශාල ප්‍රගතියක් පසුගිය අවුරුදු 5 ඇතුළත ඇති වී තිබෙනවා. සෑම කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සඳහා— විශෙෂයෙන් පිටිසර ආසනවල පුවක්, කරදමුංගු සහ කුරුඳු යනාදී වගාවන් වැඩි දියුණු කිරීම සඳහා—ජාතික රජයෙන් විශේෂ පහසුකම් සලසා දී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එසේම කර්මාන්ත සංවර්ධනය නිසා රටේ දියුණුවට හා ප්‍රගතියට විශාල සේවයක් සිදු වී තිබෙනවා. එක පැත්තකින් කෘෂිකාර්මික අතින් රට සංවර්ධනය කෙරෙන අතර අනික් පැත්තෙන් කර්මාන්ත සංවර්ධනය නිසා රටට අවශ්‍ය විදේශ විනිමය ඉතිරි කර ගන්නවා. ඒවාගේම කර්මාන්ත සංවර්ධනයෙන් විශාල පිරිසකට රක්ෂා සැපයීමට පුළුවන් වී තිබෙනවා. මේ අන්දමින් කටයුතු කිරීම නිසා ජාතික රජයේ ඉදිරි ගමන ක්‍රම ක්‍රමයෙන් හෙමින් සීරුවේ ඉතා සීඝ්‍රකාරයෙන් දියුණුව කරා යන අතර ඊට අවහිර කිරීමට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් කොතෙකුත් චෝදනා එල්ල කළත් ඔවුන්ගේ එම උත්සාහයන් සම්පූර්ණයෙන්ම අසාර්ථක වන බව කියන්න කැමතියි. 1965-68 අතර මේ රටේ කර්මාන්ත සංවර්ධනයේ නිමැවුම් රුපියල් කෝටි සියයකින් වැඩි වී තිබෙනවා. එයින් පෙනෙන්නේ විදේශ විනිමය කොතරම් ප්‍රමාණයක් අප ඉතිරි කර ගෙන තිබෙනවාද, ඒවාගේම කර්මාන්ත සංවර්ධනය නිසා කොතරම් පිරිසකට රක්ෂා ලබා දීමට පුළුවන් වී තිබෙනවාද යන්නයි. 1965 දී ලංකාවේ කර්මාන්ත අංශවල වැඩ කරන මිනිස් දින ගණන 1,53,00,000 ක් තිබුණු අතර එය 1968 වන විට තුන් කෝටියක් දක්වා වැඩි වුණා. මේ කාලය තුළ ඒ තරම් උසස් ප්‍රගතියක් ඇති වෙලා තිබෙනවා. මේ තරම් ශීඝ්‍රාකාරයෙන් වැඩි දියුණු වන විට යම් යම් උදවිය තුළ යම් යම් ආකාරයේ අසහනයන් ඇති වීමට ඉඩ තිබෙනවා. ජාතික සංවර්ධනය කෙරෙහි හිත ඇති උදවිය එවැනි අවස්ථාවලදී හැකිතාක් දුර ඒවා ඉවසීමෙන් විඳ දරාගෙන රට වෙනුවෙන්, ජාතික දියුණුව වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, අනාගත පරම් පරාව වෙනුවෙන් සංවර්ධන කටයුතු කර ගෙන යෑමට ඉඩ සලසා දිය යුතුයි.

1965 දී කර්මාන්තශාලාවලින් පුද්ගලයන් 56,000 කට රැකිරක්ෂාවල් සපයා ඇති අතර 1968 වන විට කර්මාන්තශාලාවලින් රක්ෂාවල් සැපයුණු පිරිස එක් ලක්ෂයක් දක්වා වැඩි වී ගියා. වැටුප් සඳහා කර්මාන්තශාලාවලින් 1965 දී පඩිනඩි වෙනුවෙන් වැය කරන ලද මළු මුදල රුපියල් කෝටි අටහමාරක් වුවත්, 1968 දී දහඅට ලක්ෂයක වැඩිවීමක් ඇති වුණා. කර්මාන්ත සංවර්ධනයේ නියම ප්‍රගතිය මොන තරම් උසස් අන්දමට, සාර්ථක අන්දමට, වැඩි දියුණු වී ගොස් ඇද්දැයි එයින් තේරුම් යනවා.

කර්මාන්ත අමාත්‍යාංශය මගින් මගේ කොට්ඨාශයේ තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයේ වැඩ අංශයක් පටන් ගෙන තිබෙනවා. අක්කර 25,000 ක පමණ කැලෑ ප්‍රදේශයක් සංයුක්ත මණ්ඩලයට ගෙන එහි ඇට කැපීමේ ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවා. ඒ මගින් ජාතික ධනය විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට අවස්ථාවක් සැලසෙන අතර, විදේශ විනිමයත් බොහොම විශාල ප්‍රමාණයක් අපට ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා.

ජාතික සංවර්ධනය සඳහා පසුගිය පස් වර්ෂය තුළ ජාතික ආදායමෙන් විශාල මුදලක් වැය කරන ලද බව තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ. මේ රටේ සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් නැතිව, කෘෂිකාර්මික සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් නැතිව, කර්මාන්ත සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් නැතිව, දුක් විඳින ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අපහසු බව ජාතික රජය තේරුම් ගැනීම නිසා පසුගිය අවුරුදු පහ තුළ අවුරුද්දෙන් අවුරුද්ද සංවර්ධන කටයුතු සඳහා වැඩි වැඩියෙන් මුදල් වෙන් කර තිබෙනවා. 1966-67 අදායම් වර්ෂයේදී කෝටි 60 ක් ජාතික සංවර්ධනය සඳහා වෙන් කළ අතර, 1967-68 වර්ෂයේදී කෝටි 63 ක්ද, 1968-69 වර්ෂයේදී කෝටි 69 ක්ද, ඉදිරි වර්ෂය, එනම් 1969-70 වර්ෂය සඳහා කෝටි 74 කටත් වැඩි ප්‍රමාණයක්ද වැය කරන්නට විධිවිධාන යෙදීමෙන් අපේ ආණ්ඩුව ජාතික සංවර්ධනය කෙරෙහි දක්වන ඉමහත් සැලකිල්ල පැහැදිලි වෙනවා. වාරිමාර්ග, විදුලි බලය, මංමාවත් ආදී නොයෙක් අත්‍යවශ්‍ය දේවල් ලබා දීම නිසා ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය වඩා උසස් වීමට ඉඩ තිබෙනවා. මේ සඳහා පසුගිය අවුරුදු පහ තුළ වර්තමාන ආණ්ඩුව විසින් ගෙන යන ලද සුපරීක්ෂාකාරී වැඩ පිළිවෙළ නිසා ආර්ථික තත්ත්වයෙන් ඉතාමත් අමාරු අඩියක සිටි මේ රටේ ජනතාව වැටෙන්නට තිබුණු අමාරු තත්ත්වයෙන් බේරා ගන්නට හැකි වූ බව සන්තෝෂයෙන් කියන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

යම් යම් අවස්ථාවල අපේ ගැමි ජනතාව නොයෙක් විධියේ අසහනයන්ට පත් වී සිටි නමුත්, එන්ට එන්ටම ඔවුන්ගේ ජීවන තත්ත්වය දියුණු වී තිබෙන බව මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) මොන විධියට කිව්වත් කවුරුත් පිළිගන්නවා. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා මේ රටේ ජනතාව ඉතාමත් දුක්ඛිත අහිංසක තත්වයක වැටී සිටිනවාය කිවා. එහෙත් වෙන දාට වඩා අද ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් මට්ටමක පවතින බව එතුමාත් පිළිගන්නවා ඇති. සාමාන්‍ය වශයෙන් බඩුමුට්ටුවල මිල ටිකක් වැඩි වී ඇතත්, ආදායම් තත්ත්වයත් වැඩි වී තිබෙන බව කියන්නට පුළුවනි. 1964 වර්ෂයේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛන විවාදයේදී ජීවන අංකය ගැන කථාකරමින් එතුමා පෙන්වා දුන්නා ජීවන අංකය වැඩි වී තිබෙන අතර ජනතාවගේ ආදායම් තත්ත්වයත් වැඩි වී තිබෙනවාය කියා. අද අපටත් පෙන්නුම් කර දෙන්න පුළුවන් ජනතාවගේ ආදායම් තත්ත්වය මොන අන්දමින් වැඩි වී තිබෙනවාද කියා. දර්ශකය අනුව අපට පෙනී යනවා, 1960 වර්ෂයේදී ගොවියෙකුගේ ආදායම 106.5 ක් බව. එය 1964 දී 103.5 කට බැස්සා. ඒ කාලයේ මේ රටේ තිබුණ ආර්ථික පරිහාණිය නිසා ගොවීන්ගේ ආදායම් තත්ත්වය බැස්සා. 1968 වර්ෂයේ තත්ත්වය මොකක්ද? 114.3 දක්වා වැඩි වී තිබෙනවා. එයින් පෙනී යන්නේ නැද්ද, ගොවියන්ගේ, ගම්වල ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩි වී තිබෙන බව?

එපමණක් නොවෙයි, වාණිජ හා වෙළඳ අංශයේ කම්කරුවන්ගේ ආදායම 1960 දී 123.8 යි. 1964 දී 118.4 කට බැස්සා. නමුත් 1968 දී 133.1 දක්වා වැඩි වුණා. මෙයින් පෙනී යනවා කම්කරුවන්ගේ ආදායම් තත්වයත් වැඩි වී තිබෙන බව. ආදායම් තත්ත්වය වැඩි වන විට ජීවන තත්ත්වය උසස් වෙනවා. වැඩි වැඩියෙන් බඩු ලබාගන්න යනවා. ඒ හේතුව නිසා අද යම් යම් අවස්ථාවල අසහනයන් ඇති වී තිබෙන්න පුළුවන්.

අද ලංකාවේ විවිධ කර්මාන්ත සඳහා පඩි පාලක සභා ඇති කර තිබෙනවා. පඩි පාලක සභා යටතේ ඇති කර්මාන්තවල කම්කරුවන්ගේ මූර්ත වැටුප් ආදායම ගණන් බැලුවොත් 1960 දී 108 ක් බව දර්ශකවලින් පෙනී යනවා. එය 1964 දී 105 දක්වා අඩු වී තිබෙනවා. 1968 දී 116.3 දක්වා වැඩි වී තිබෙනවා. ලංකාවේ සාමාන්‍ය ජනතාවගේ මූර්ත වැටුප් ආදායම 1960 දී 126 යි. එය 1964 දී 116 දක්වා වැඩි වුණා. 1968 දී 134 දක්වා වැඩි වී තිබෙනවා.

ඉතුරු කිරීම් සම්බන්ධව මහා බැංකුවේ සංඛ්‍යා ලේඛන බලන විට 1964 දී තැපැල් කන්තෝරු සේවිංස් බැංකුවේ තැන්පත්කරුවන් 1,54,472 ක් සිට තිබෙනවා. 1968 අවසානයේදී සිටින තැන්පත්කරුවන්ගේ ප්‍රමාණය 1,71,437 යි. ඒ අනුව අපට පෙනී යනවා, තැන්පත්කරුවන් 17,000 ක් පමණ වැඩි වී තිබෙන බව. ඔවුන්ගේ තැන්පත් ප්‍රමාණය 1964 දී කෝටි 8.15 යි. 1968 දී කෝටි 9.8 දක්වා වැඩි වී තිබෙනවා. මෙයින් පෙනී යනවා ගම්බද ජනතාව වැඩි ආදායමක්ද ලබාගෙන තිබෙන අතර එයින් සෑහෙන මුදලක් ඉතුරු කිරීමටද ඔවුන් පෙළඹී තිබෙන බව.

1967 දෙසැම්බර් මාසයේදී කරන ලද රුපියලේ අගය අඩු කිරීම නිසා විශෙෂ දීමනාවක්ද රජය විසින් රජයේ සේවකයන්ට දෙන්න යෙදුණා. ඒ සහනය වෙළඳ අංශයේ සේවකයන්ටද ලැබුණා. මෙම අය වැය ලේඛනයෙන් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. ලංකාවේ මීට පෙර කීප විතාවක්ම රජයේ සේවකයන් නොයෙකුත් අන්දමින් කෑ කසා වෘත්තීය සමිති මගින්ද ඉල්ලීම් ඉදිරිපත් කරන ලද නමුත්, කිසිම රජයක් එයට ඇහුම්කන් නොදුන් අතර, ජාතික රජය පමණක් සේවකයන්ගේ වැටුප් පිළිබඳ අවබෝධයක් ඇතුව, වැටුප් කොමිෂන් සභාවක් පත්කර ලබාගත් වාර්තාව අනුව ලංකාවේ සියලුම රජයේ සේවකයන්ට සැනසීමක් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. ඒ නිසා ජාතික රජය වියදම් කරන මුදල් රටේ ජනතාවගේ සුභසිද්ධිය තකාම රටේ සංවර්ධනය සඳහාම වියදම් කරන බව රටට පෙනී ගොස් තිබෙනවා. ඒ නිසා තමයි, දැන් අවුරුදු පහක් ගත වීත් එකම මුදල් ඇමතිවර සෙසුම මේ රජයේ අද තව වසා තුරුත් ඉද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන අවුරුදු 5 ක් තුළ අය වැය ලේඛන 5 ක් ඉදිරිපත් කරන්නට පුළුවන්කම ලැබුණේ. 1965 න් එහා කාලය ගැන බලන විට, අවුරුද්දකට මුදල් ඇමතිවරුන් දෙදෙනා බැගින් සිටි බව අපට පෙනෙනවා. එයින් මොකද වුණේ ? මුදල් ඇමතිවරුන්ගේ වැඩ පිළිවෙලවල් හා ප්‍රතිපත්ති වෙනස් වීම නිසා මේ රටේ ආර්ථික දියුණුව ක්‍රමයෙන් නැති වී ගියා. මේ රට ඉතාම අමාරු තත්ත්වයකට වැටුණා. ජාතික රජය විසින් මේ රටේ දැන් ඇති කර තිබෙන කෘෂිකාර්මික සංවර්ධන ප්‍රගතිය නිසා විදේශ රටවලිනුත් ජාත්‍යන්තර බැංකුවලිනුත් වැඩි වැඩියෙන් ආධාර මුදල් හා ණය මුදල් ලබා ගැනීමට අපට පුළුවන් වී තිබෙනවා. රටේ සීඝ්‍ර සංවර්ධන ප්‍රගතිය සඳහා මේ රජය විසින් ගෙන තිබෙන පියවරවල් මොනවාද යන වග මේ අයවැය විවාදයේදී තමුන්නාන්සේට දැනගන්නට ලැබුණා. එහෙත් මේ කටයුතුවල යම් යම් අඩුපාඩුකම් තිබෙන බව මා මතක් කරන්නට ඕනෑ. යම් යම් දෙපාර්තමේන්තු මගින් අපගේ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සමහර දෙපාර්තමේන්තුවල යම් යම් අඩුපාඩුකම් ඇති වෙනවා. ඒවා සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය පියවරවල් ඒ ඒ අමාත්‍යාංශ විසින් ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

ගාලු දිස්ත්‍රික්කයට බල පාන ප්‍රශ්නයක් වන ගිං ගඟ යෝජනා ක්‍රමය මේ වර්ෂයේ ආරම්භ කිරීමට විධිවිධාන යොදා තිබීම ගැන වාරිමාර්ග අමාත්‍යාංශයට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මෙය ගාලු දිස්ත්‍රික්කයේ හැම දෙනාටම සන්තෝෂ විය හැකි කරුණක්. පසුගිය කාලය තුළ නොයෙක් විධියේ විමර්ශන පවත්වා මේ වර රාජාසන කථාවට ගිං ගඟ යෝජනා ක්‍රමය ඇතුළත් කිරීම නිසා එය මේ වර්ෂයේම ආරම්භ කිරීමට පුළුවන් වුණා. මේ සම්බන්ධයෙන් ඉඩම් වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය ගෙන යන වැඩ පිළිවෙළ අප ඉතාම සන්තෝෂයෙන් අනුමත කරනවා. මෙම යෝජනා ක්‍රමය ඉතාම ඉක්මනින් ආරම්භ කිරීම ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානයට මා මේ අවස්ථාවේදී යොමු කරවනවා.

අද අපේ රටේ තේ වෙළඳාම, විශේෂයෙන්ම පහත රට තේ වෙළඳාම, ඉතා දුර්වල තත්ත්වයකට වැටී තිබෙනවා. තේ අපනයනය කිරීමේදී ඇති වන යම් අඩුපාඩුකම් නිසාත්, තේ මිළට ගන්නා රටවල් සමග හරියාකාර සම්බන්ධකම් ඇති කර නොගැනීම නිසාත්, අද අපේ තේ මිළ පහළ බැස තිබෙනවා. මේ තත්ත්වය මග හරවා ගැනීමට සෑම රජයක්ම විශේෂ ප්‍රයත්නයක් දැරුවා. මේ රජයත් ඉතාම උනන්දුවෙන් මේ ගැන කටයුතු කරනවා. එහෙත් පහත රට තේ සම්බන්ධයෙන් අද ඇති වී තිබෙන තත්ත්වය නිසා පහත රට කුඩා තේ වතු හිමියන් ඉතාම අසීරු තත්ත්වයකට පත්ව සිටිනවා. කුඩා තේ වතු පාලනය කිරීම ඉතාම අමාරු වී තිබෙනවා. මේ ගැන වෙළඳ ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්න කැමතියි. කුඩා තේ වතු හිමියන් මේ අමාරු තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා එතුමා පසුගිය කාලය තුළ නොයෙක් වර යම් යම් අලුත් යෝජනා ක්‍රම ඇති කළත්, එයින් සෑහෙන ආධාරයක් හෝ සහනයක් හෝ ඒ තේ වතු හිමියන්ට මෙතෙක් සැලසී නැහැ. විශේෂයෙන්ම, උස් බිම් ජනපදවල සිටින අක්කරය දෙක බැගින් ඇති කුඩා තේ වතු හිමියන්ට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ ඉතාම අසීරු අවස්ථාවකටයි. තේ දළුවල මිළ ශත 15 ට බැස තිබෙනවා. එය ශත 25 ක් වත් වෙනවා නම්, යන්තම් තමන්ගේ තත්ත්වය රැක ගෙන තේ වතු නඩත්තු කර ගන්නට ඔවුන්ට පුළුවන් වෙනවා ඇති. එවැනි තත්වයක් ඇති කර ගැනීමට වෙළඳ ඇමතිතුමා අවශ්‍ය පියවර ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

මිළගට රබර් වගාව සම්බන්ධවත් වචනයක් කිව යුතුයි. ජාත්‍යන්තර වෙළඳ පොළේ රබර් මිළ හොඳ තත්ත්වයකට පත්ව තිබෙන නිසා ලංකාවේ රබර් මිළද හොඳ අතට හැරී තිබෙනවා. මේ නිසා කුඩා රබර් වතු හිමියන්ට විශාල සහනයක් සැලසී තිබෙන බව රබර් වගාව ඇති ප්‍රදේශයක කෙනෙකු වශයෙන් මට කියන්නට පුළුවනි. පසු ගිය දිනවල මගේ කොට්ඨාශයේ රබර් මිළට ගැනීමේ ගබඩාවක් පිහිටුවීම නිසා ප්‍රදේශයට විශාල සේවයක් සිදු වුණු බවද මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. තවත් ගබඩාවක් ඉදි කිරීමට


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

ගරු ඇමතිතුමා අදහස් කර තිබෙනවා. එය ද ඉතා ඉක්මණින් ආරම්භ කරන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනව.

අද අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන ඉතා බැරුරුම් ප්‍රශ්නයක් නම් රැකීරක්ෂා නොමැතිකමේ ප්‍රශ්නයයි. මෙය මේ රජයට පමණක් සීමාවූවක් නොවෙයි. පසුගිය රජය පැවති කාලයේදීත්, ඊටත් පෙර තිබුණු ආණ්ඩු කාලවලදීත්, මේ ප්‍රශ්නය උග්‍රව පැවතුණා. රැකීරක්ෂා ලබා ගැනීමේ අභිලාෂයත් රැකීරක්ෂා ලබා ගැනීමේ අපහසුකමත් නිසා අද තරුණයන් තුළ මානසික අසහනයක් ඇති වී තිබෙනවා. පසුගිය අර්ධ ශත වර්ෂය තුළ පැවති අධ්‍යාපන ක්‍රමයේ වරදින් රටේ අවශ්‍යතාවන්ට ගැළපෙන පිරිසක් මේ රටේ ඇති නොවීම මීට හේතුවයි. රටේ අවශ්‍යතාවන්ට ගැළපෙන, රටේ ආර්ථික පරිසරයට සරිලන, රටේ ආර්ථික තත්ත්වය නගා සිටුවන්නට අවශ්‍ය, කාර්මිකයන්, විද්‍යාඥයන්, ඉංජිනේරුවන් වැනි පුද්ගලයන් බිහි කරන අංශවල අධ්‍යාපන ක්‍රමය සෑහෙන තත්ත්වයක නොතිබුණු නිසා අද මේ තත්ත්වය ඇති වී තිබෙනවා. මේ පිළිබඳ සම්පූර්ණ වගකීම අවුරුදු 5 ක් රට ආණ්ඩු කළ අප වෙත පැවරීම වැරදියි. පසුගිය ආණ්ඩු කාලයේදී ඇති වුණු ප්‍රශ්න එකතු වී අද ජාතික රජයට බැරුරුම් රැකීරක්ෂා ප්‍රශ්නයකට මුහුණපෑමට සිදු වී තිබෙනවා. රටේ කෘෂිකර්ම අංශය පමණක් දියුණු කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳීමට පුළුවන්කමක් නැහැ. කර්මාන්ත සංවර්ධන අංශයෙන් විශාල පිරිසකට රැකී රක්ෂා සැපයීමට පුළුවන් වෙනවා. ඒ නිසා මේ රටේ කෘෂිකර්මාන්ත සංවර්ධනයක් ඇති වෙන්ම, ඇති වෙන්ම, ඒ වාගේම කර්මාන්ත සංවර්ධනයක් මේ රටේ ඇති වෙන්ම, ඇති වෙන්ම, වැඩි වැඩියෙන් රැකී රක්ෂා ලබා දීමට ඉදිරි කාලයේදී හැකි වෙනවා. මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය, ගිංගඟ සංවර්ධන යෝජනා ක්‍රමය ආදී විශාල සංවර්ධන යෝජනා ක්‍රමවල වැඩ කටයුතු සඳහා සාමාන්‍ය කම්කරුවන්, වඩුවන්, පෙදරේරුවන්, කාර්මිකයන්, ඉන්ජිනේරුවන්, ඕවර්සියර්වරුන්, ලිපිකරුවන් ආදී හැම අංශවලින්ම සේවකයන් වුවමනා වෙනවා. ඒ අවස්ථාව වන විට සෑහෙන ප්‍රමාණයකට රැකීරක්ෂා ලබා දීමට පුළුවන් වෙනවා. ඒ විධියට කර්මාන්ත හා කෘෂිකර්මාන්ත ප්‍රගතියක් ඇති නොකළොත් රැකී රක්ෂා ප්‍රශ්නයට මුහුණ දෙන්නට අපොහොසත් වෙනවා. රැකී රක්ෂා ප්‍රශ්නය මීට වඩා උග්‍ර තත්ත්වයකට පත් වුණොත් ලංකාවේ විශාල කලකෝලාහල ඇතිවී, තරුණයන් අතර මානසික අසහනයක් ඇතිවී, ඔවුන් දරදඬු හිතුවක්කාර ක්‍රියාවල යෙදෙන්නට ඉඩ තිබෙනවා. රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීම ජාතික රජයට අවුරුද්දකින්, දෙකකින් නැත්නම් අවුරුදු හතරකින්, පහකින් කළ හැක්කක් නොවෙයි. ක්‍රමයෙන් රටේ ඉතිරි වන මුදල් ප්‍රමාණය සංවර්ධන කටයුතුවල යොදවා ඒ වගේම ජාත්‍යන්තර අරමුදල්වලින් ලැබෙන මුදල් පහසුකම් රට සංවර්ධනයෙහි යොදවා කටයුතු කරන අතර මේ ප්‍රශ්නයත් විසඳෙන්නට අවස්ථාව සැලසෙනවා ඇති.

ඊළඟට ජනපද ව්‍යාපාරවල කුඩා තේවතු වගා කරගෙන සිටින සුළු තේවතු හිමියන්ට අද මුහුණපාන්නට සිදු වී තිබෙන දුක් කරදර මතක් කළයුතුව තිබෙනවා. ජනපදවල ජීවත්වෙන කුඩා තේවතු හිමි කට්ටිකරුවන්ට ඔවුන්ට නියමිත බදු පවා ගෙවා ගන්නට බැරි අමාරු තත්ත්වයක් අද පවතිනවා. ඔවුන්ට සහන සැලසීමක් වශයෙන් පසුගිය අවුරුදු 3 ඇතුළත ඔවුන්ගෙන් අයවිය යුතු බදු සම්පූර්ණයෙන්ම කපා හැරිය යුතු යයි අපි ගාල්ලේ දිස්ත්‍රික්ක සම්බන්ධ කරන කාරකසභාවේදී තීරණයක් ගත්තා. එය ගරු ඉඩම් ඇමතිතුමාගේ කාරුණික අවධානයට යොමු වෙනවා ඇතැයි අපි විශ්වාස කරනවා. 1968 අවසානය දක්වා සුළු තේවතු හිමි ජනපදිකයන්ගෙන් අය විය යුතු වාර්ෂික බදු මුදල් කපා හැර තේදළුවල මිළ පහළ බැස තිබෙන මේ අවස්ථාවේදී ඔවුන්ට සහනය සලසන ලෙස විශේෂයෙන්ම අපි ඉල්ලා සිටිනවා.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවේ යොදන වගා රක්ෂණ ක්‍රමය යටතේ අපේ පළාත්වල සමහර ගම්වල එක්තරා අසහනයක් ඇති වී තිබෙන බව මතක් කරන්නට ඕනෑ. සමහර ගම්වල වගා, රක්ෂණ ක්‍රමයට යටත් අතර සමහර ගම්වල වගා, රක්ෂණ ක්‍රමයට යටත් නැහැ. කුඹුරු පනත ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ කාලවලදී ඇතැම් ගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාශියක් එයින් ඈත් කර තිබෙනවා.

ඒ හේතුව නිසා කෘෂිකර්මාන්ත කටයුතු වල නිරතව සිටින ගොවියාට අද ලොකු අසහණයක් ඇති වී තිබෙනවා. විශේෂ යෙන්ම ඌනන්විටිය, අළුත්තානායම් ගොඩ, උඩවැලිවිටිය, පරණ තානායම්ගොඩ යන ගම්, වගා රක්ෂණ ක්‍රමයට ඇතුළත් කර නැති බැවින් එම ප්‍රදේශද වගා රක්ෂණ ක්‍රමය යටතට ගන්නා ලෙස එම ප්‍රදේශ වල ඇති ගොවි කාරක සභා විසින් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා; ඒවාගේම කෘෂිකර්ම ඇමතිතුමාටත් දන්වා යවා තිබෙනවා. මේ කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට ලක් වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්ව යේ මන්ත්‍රීවරුන්ගේ දැඩි විවේචනයට අපේ අධ්‍යාපන අමාත්‍යාංශය ලක් වුණා. මොන අන්දමට ඒ මන්ත්‍රීවරුන් විවේච නය කළත් අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිසංවිධා නයක් ඇති වී තිබෙන බව අනිවාර්යයෙන් පිළිගත යුතුව තිබෙනවා. අධ්‍යාපන ප්‍රති සංවිධාන ඇති වුණු හැම අවස්ථාවකදීම මේ අන්දමට විවේචන, මේ අන්දමට දෙස් දෑක්වීම ඒ ඒ වකවානුවලදී සාමාන්‍යයෙන් සිදු වූ දෙයක්. පළමුවන වරට නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කළ අවස්ථාවේ දීද, එවකට අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් සිටි සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා දැඩි ලෙස විවේචනයට ලක් වුණා; එතුමාට අප්‍රමාණ දොස් නැගුවා. එතුමා ක්‍රියාත්මක කළ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵල අද මේ රටේ ජනතාව භුක්ති විඳින නිසා එහි ප්‍රතිඵල දක්නට ලැබී තිබෙන නිසා එතුමා ගත් පියවර ජනතාව ගෙන් සියයට අනූනවයක් අද අනුමත කරනවා. ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමති තුමා දන් ඇති කරන අධ්‍යාපන ප්‍රතිසං විධානයේ ප්‍රතිඵල දැක ගැනීමට පුළුවන් වන්නේ තව අවුරුදු හත අටක් ගියාට පසු වයි. ඒ කාලය වන විට අද තිබෙන තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයක් ඇති වන බව නියම වශයෙන් කියන්න පුළුවනි. ගරු කථානායක තුමනි, අධ්‍යාපන ක්‍රමය, මේ රටට ගැළපෙන, මේ රටේ ආර් ථික පදනමට ගැළපෙන, රටේ අවශ්‍යතා වන්ට ගැළපෙන අන්දමට සකස් කර තිබෙනවා. එමගින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට පුළුවන්කම ලැබෙනවා පමණක් නොවෙයි, රටට ගැළපෙන පුරවැසියන් පිරි සක් බිහි කිරීමට ද හැකි වෙනවා. එබැවින් මෙම කාලසීමාව තුළදී රටේ ප්‍රගතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහ කර්මාන්ත අමාත්‍යාංශයෙන් විශාල සේවයක් සිදු වී ඇති බව නියම වශයෙන් කියන්නට කැමතියි. ගරු කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමාටම පස්වන වරටත් මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න ලැබීම ගැන එතුමාට ස්තුතිවන්ත වන අතර එතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා රටේ ජනතාවගේ සුභ සිද්ධියට හේතු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.25

ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා. (පැල්මඩුල්ල)
(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல் மதுல்ல)
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු කථානායකතුමනි, පළමුකොට අපේ වර්තමාන මුදල් ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා, මේ රටේ කිසිම මුදල් ඇමතිවරයකුට මෙයට පෙර කරන්න බැරි වුණු හාස්කමක් කරමින් පස් වන වර ටත් තම අයවැය ලේඛනය මේ ගරු සභා වට ඉදිරිපත් කිරීම ගැන. මට පෙර කථා කළ හිනිදුම මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දුන් අපට පෙනී ගියා එතුමා හිතින් මවා ගත් ලෝකයක සිට මුළා වී අදහස් ප්‍රකාශ කරන බව. ඒ වාගේම එතුමාගේ මට්ටමේ උදවිය ගැන සිතා අදහස් ප්‍රකාශ කරනවා මිස මේ රටේ සාමාන්‍ය ජනතාව ගැන කල් පනා කර අදහස් ප්‍රකාශ නොකරන බව පෙනී ගියා. ඒ කෙසේ වුණත් මට පෙර කථා කළ රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලකරත්න මයා.) කළ ඉල්ලීම—ග්‍රාම සේවා කොට්ඨාශ නැවත බෙදා වෙන් කළ යුතුය කියන ඉල්ලීම—මාද අනුමත කරන්න කැමතියි. ඒ අතරම එම මන්ත්‍රී තුමා සඳහන් කළා, විරුද්ධ පාර්ශ්වය අඩු පාඩු පෙන්වා දෙමින් රජයට උපදෙස් දුන්නේ නැත, පරණ රැකෝඩ්ම නැවත වාදනය කළා මිස ප්‍රයෝජනවත් විවේචනයක් කළේ නැත කියා. අප අදහස් දුන්නත් ඒ අදහස් අනුව ක්‍රියා කිරීමෙන් ආණ්ඩු පක්ෂයේ උදවියගේ පන්තියට වදින නිසා ආණ්ඩු පක්ෂයේ උදවිය ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස මයා.]

අදහස් ක්‍රියාත්මක කරයි කියා අප බලාපොරොත්තු වන්නෙ නැහැ. රාජ්‍ය උප ඇමතිතුමා එතුමාගේ කථාවේදී කියා සිටියා, නොමිලයේ හාල් දීම ගැන එතුමාගේ ආසනයේ අය එතුමාට පින් දෙනවාය කියා. ඒ ගැන අපට කියන්නට තිබෙන්නේ නොමිලේ හාල් සේරුව දීම ගැන පින් දෙන තත්ත්වයක මේ රටේ මහජනතාව ගෙන ආවා නම් එසේ ගෙන ඒමේ ගෞරවයත් වර්තමාන පාලක පක්ෂයට හිමි බවයි.

පසුගිය අය වැය කථා 4 න් මෙන්ම මේ අය වැය කථාවෙනුත් තියෙන මිනිහාටම පහසුව සලසා තිබෙනවා මිස නැති මිනිහාට කිසිම පහසුවක් සලසා නැහැ. පසුගිය ආණ්ඩු කාලයේදී ධනපතීන්ගෙන් අය කළ සියයට අසූවේ බද්ද මේ මුදල් ඇමතිතුමා සියයට 65 දක්වා අඩු කළා. මේ අය වැය ලේඛනයෙනුත් ඒ බද්ද ඒ තත්ත්වයෙන්ම තිබෙන්නට ඉඩ හැර ඇති අතර ගම්බද දුප්පත් මිනිහාට—නැති බැරි මිනිහාට, ගොවි කම්කරුවාට—කිසිම සහනයක් සලසා නැහැ. ඒ අය තවත් මිරිකෙන විධියටයි, බදු බර පටවා තිබෙන්නේ.

ආණ්ඩු පක්ෂයේ ඉදිරිපස ආසනවල සිටින අය මෙන්ම පසුපස ආසනවල සිටින අයත් මොනවා කීවත්, කොයි විධියේ සිනිවිලි පහළ කරගෙන සිටියත්, ගම්බද ජනතාව ජීවත් වන්නේ ඉතාමත් අමාරුවෙන් බව, ජීවන බරින් මිරිකී බව අප දන්නවා. ජීවන අංකය ඉහළ නැග තිබීම නිසා ගම්බද ගොවිකම්කරු ජනතාව අද ඉතා දුකසේ ජීවත් වන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් අප තමුන්නාන්සේලාට වරද පවරන්නෙ නැහැ. තමුන්නාන්සේලා විසින් මවා පෙන්වන ලද දිව්‍ය ලෝකයක් ගැන සිතාගෙන, තමුන්නාන්සේලාගේ පන්තිය ගැන අවබෝධයක් නැතිව, තමුන්නාන්සේලාගේ පන්තිය අමතක කර තමුන්නාන්සේලා බලයට පත් කළ උදවියට තමයි, දොස් පවරන්නට තිබෙන්නේ. ඒ අය කළ වරදට විපාක විඳින බව අප පිළිගන්නවා. තමුන්නාන්සේලාත් ඒ බව පිළිගන්නවා ඇති.

ගරු කථානායකතුමනි, අද ගම්බදව පිරිහෙන පවුල් තියෙනවා. දෙමව්පියන් මහන්සියෙන් හම්බ කර තිබූ දේ උගස් කර කන අය ඉන්නවා; විකුණා කන අය ඉන්නවා. කාලා ස්ටයිල් කරනවා. මේ අවුරුද්දේ රුපියල් 4,000 කට උගස් කළා නම් පොලිය එකතු වී රුපියල් 5,000 ට නැංග විට 7,500 කට උගස් කර 5,000 ගෙවා ඉතිරි 2,500 න් ස්ටයිල් එකට ජීවත් වෙනවා. 7,500 ට පොලී එකතු වී 9,000 ට නැංග විට 12,000 ට උගස් කර 9,000 ගෙවා ඉතිරි 3,000 න් සැපවත් ජීවිතයක් ගත කරනවා. ඒ වගේම මේ රජයත් ගෙන යන්නේ අවුරුද්දෙන් අවුරුද්ද මේ රට වැඩි වැඩියෙන් විදේශීන්ට ණය කර බාහිර ආටෝපයක් මහජනයාට පෙන්වීමේ වැඩ පිළිවෙළක් බව අපෙත්, ගම්බද මහජනයාගෙත් පිළිගැනීමයි. මේ විධියට ණය වන විට මේ ණය අපට කවදා ගෙවන්නට පුළුවන් වේද කියා හිතන්නට බැහැ.

රත්ගම මන්ත්‍රීතුමාගේ (ඩී. ඊ. තිලකරත්න මයා.) ඉල්ලීම ගැන ටිකක් කන් දෙන්න අපි සූදානම්. රජයක් නැත්නම් රටක් ආර්ථික අතින් අමාරු තත්ත්වයකට වැටෙන අවස්ථාවලදී ස්වාභාවිකව තිබෙන ධන නිධාන නැත්නම් ධන උල්පත්වලින් ප්‍රයෝජන ගන්නට රජයකට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. මේ රටේ ජනතාවට ලැබෙන ලොකු විස්තුවක් තමයි පොළොවෙන් ලැබෙන මැණික්.

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)
*(திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற)*
(Mr. M. A. Daniel—Hewaheta)
ඕක කියයි කියා බලාපොරොත්තු වුණා.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

මේ රටේ තිබෙන මැණික්වලින් සතයකවත් ආදායමක් ලබා ගැනීමට තරම් මුදල් ඇමතිතුමා ශක්තිමත් වී නැති බව මේ අයවැය ලේඛනයෙන් පෙනෙනවා.

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)
කවුද හන්ගන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)
හන් ගන්නේ කවුද කියා තමුන්නාන්සේලා සොයා ගන්න. තමුන්නාන්සේලාගේ කථාවලට අපි බාධා කළේ නැහැ. ඇයි මගේ කථාවට බාධා කරන්නේ ?

අවුරුදු පතා විශාල වශයෙන් මේ රටෙන් මැණික් පිටරට යනවා. ඒ සඳහා පිටරටින් එන ආදායම් රජයට ලැබෙන්නේ නැහැ. හොංකොං වෙළඳපොළේ මිල ගණන් අනුව දිනකට රුපියල් 11 ලක්ෂයක මැණික් මේ රටින් පිටවෙනවා ; අවුරුද්දකට කෝටි 40 ක පමණ මැණික්. ඔය හොංකොං වෙළඳ පොළේ මිල දර්ශනය අනුවයි. ගරු කථානායකතුමනි, පුරාණ කාලයේ, එනම්, අපි පරාදීන වන්නට පෙර, භාණ්ඩාගාරයට තිබුණු ලොකුම ආදායම් මාර්ගය තමයි මැණික්. එහෙත් අද මැණික්වලින් රජයට සතයකවත් ආදායමක් නැහැ. මෙවැනි විශාල ධන නිධානවලින් ප්‍රයෝජන ගන්නට තරම් රජය ශක්තිමත් වන්නට ඕනෑ. තමුන්නාන්සේලාට එවැනි හැකියාවක් නැතිකම ගැන අපට කරන්නට දෙයක් නැහැ.

පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය පැවැති කාලයේ සබරගමුවේ මන්ත්‍රීවරුන් කියා හිටියා සබරගමුවත් උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතට පත් කරන්නය කියා. ඒ ආණ්ඩුවෙනුත් එය කෙරුණේ නැහැ. මේ ආණ්ඩුවෙනුත් සබරගමුවේ මන්ත්‍රීවරුන් ඒ ඉල්ලීම කළා. මේ ආණ්ඩුවෙන් එය කෙරුණේ නැහැ. මීට පසුව අපි ඒ ඉල්ලීම කරන්නෙත් නැහැ. සබරගමුවේ වටිනා මැණික් තිබෙනවා. සබරගමුව උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතට පත් නොකළාට මීළඟ මැතිවරණයේදී අපි බලයට පත් වුණාම සබරගමුවෙන් ලැබෙන මැණික්වලින් සබරගමුවේ සෑම ප්‍රශ්නයක්ම විසඳන්නට අපි බලාපොරොත්තු වෙනවා. 1965 මැතිවරණයට පෙර, අපේ ආණ්ඩුව පැවැති කාලයේ මැණික් සංයුක්ත මණ්ඩලයක් ඇති කරන්නට බලාපොරොත්තුවක් තිබුණ නිසා, එම සභාග රජයේ ගරු මුදල් ඇමතිතුමාට බිය වූ මැණික් වලින් හම්බකර ගත් මුදලාලිලා, 1965 පැවැති මහා මැතිවරණයේදී දූනට ආණ්ඩුව කර ගෙන යන පක්ෂයට ඒ අයගේ සම්පූර්ණ සහයෝගය දෙමින් කටයුතු කළා. අප එකක් කියනවා. අප නැවත බලයට පත් වූ පසු පෞද්ගලික මැණික් වෙළෙඳුන්ට කිසි අවහිරයක් නොකර අපේ ප්‍රශ්න විසඳීම සඳහා එයින් රජයට ආදායම් ලබා ගැනීමට ක්‍රමයක් සකස් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
අනාගත මුදල් ඇමතිතුමා.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)
ඕවා කියන්නට බැහැ. අදත් මුදල් ඇමති වී සිටින්නේ වන්නියේ කෙනෙක්.

ගරු කථානායකතුමනි, මේ පොළොවේ ඇති හොඳ රතු කැට ක්‍රාත් එකක් බටහිර ජර්මනියට යවන්නේ රුපියල් 15,000 ගණනේයි. මංචාඩියක් පමණ වූ රතු කැටයක ක්‍රාත් පහක් හයක් තිබෙනවා. ඉතින් මේ ඉතාමත්ම වටිනා වස්තුවෙන් අප ප්‍රයෝජන ගන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පාන් පිටි ගෙන්වීම සඳහා මෙම රජය රුපියල් කෝටි 23 ක් ණය වී ඇති බව මා පසුගිය දවස්වල පුවත්පතකින් කියෙව්වා. ඒක අපේ පත්තරයක් නොවෙයි. ආණ්ඩුවේ පත්තරයක්.—[බාධා කිරීමක්] මේක පුදුම වැඩක්. මේ රටේ වැවෙන එළවලු පළතුරු ආදියෙන් සෝයා බෝංචි හැරුණු විට ඉතාමත්ම වැඩි පෝෂණ ගුණයක් ඇත්තේ කොස්වලයි. කොස් වාරයට අපතේ යන කොස් දෙස බැලුවොත්, වාරය අවසන් වී මාස දෙකක් තුනක් තරම යන තුරු කොස් ගස් ඇති මණ්ඩියකින් යන්නට අමාරුයි. ඒ කොස් ගෙඩි ගස් යට වැටී කුණු වී යනවා. සෝයා බෝංචි ළඟට පෝෂණ ගුණයක් ඇති කොස්වල ප්‍රෝටීන් තිබෙනවා. එහි ජීව ධාතු සියයට 20 ක් ඇති බව විශේෂඥයන් කියා තිබෙනවා. මේ කොස් පිටිකර තබා ගත හැකි ක්‍රමයක් යෙදුවහොත් පාන් පිටි සඳහා මේ තරම් මුදලක් පිටරට යවන්නට අපට සිදු වන්නේ නැහැ. සබරගමුවේ සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස මයා.]

මැද රටේ කඳු මුදුන්වල කෝස් වගා කිරීමේ පළල් ව්‍යාපාරයක් ගෙන යෑමට පාලක පක්‍ෂය ක්‍රියා කළ යුතුව තිබෙනවා. ඒ වාගේම අපතේ යන වටිනා දෙයකින් ප්‍රයෝජන ගැනීමට ක්‍රියා කළ යුතුයි. විද්‍යා පර්යේෂණ හා නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මේ පිළිබඳව සැලකිල්ල දක්වනැයි මා බලාපොරොත්තු වෙනවා. කෝස් හොඳ ආහාරයක්. උදේ, දවල්, රෑ යන තුන් වේලටම කෝස් හොඳයි. මා මෙසේ කියන විට සමහර මන්ත්‍රීවරුන් හිනා වෙනවා. හැම් බේකන් කන, කුකුළන් ගිළින මහතුන්ට කෝස් ගැන කියන විට හිනා යනවා ඇති. එහෙත් ගම්බද ගොවි කම්කරු පවුල්වලින් එන, ඔවුන්ගේ සිතුම් පැතුම් හොඳින් දන්නා අපට මේවා හිනාවට කරුණු නොවෙයි. "කැරලි ගැසි ගැසී සිරුරට මස් වඩන—හෙරළි වැනි දෙයක් කෝ මේ මුළු දෙරණේ" කියා පැරණි කවියකුත් තිබෙනවා. ඒ තරම් පෝෂ්‍ය දායක ආහාරයක් කෙරෙහි පාලක පක්ෂයේ අවධානය ලක් නොවීම කණගාටුවට කරුණක්. එහෙත් නුදුරු අනාගතයේදී අප බලයට ආවාම නම් මේවායින් නිසි ප්‍රයෝජන ගන්න අවශ්‍ය කටයුතු කරනවා.

එසේම රජය නිසි සැලකිල්ල නොදක්වීම නිසා අපේ තවත් ස්වාභාවික ධන නිධානයක් ගිනිබත් වෙනවා. "කංසා වැටලුවා ; ඇල්ලුවා ; ගිනි තිබ්බා ; නඩු දැම්මා" යනුවෙන් කොතෙකුත් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබෙනවා අපට දකින්නට ලැබෙනවා. කංසා ඉතා වටිනා ඖෂධයක්. පාලක පක්ෂයේ අවධානය ඒ කෙරෙහි යොමු විය යුතුයි. එවේලේම ගුණ ලැබෙන අත්දුටු බෙහෙත් හදන්න වෛද්‍යවරුන්ට අබිං වාගේම කංසාත් වුවමනා කරනවා. එම නිසා වෛද්‍යවරුන්ට කංසා ලබා ගැනීම සඳහා බලපත්‍ර ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ. ඒ හැරෙන්නට අපේ මුතුන් මිත්තන් මාළු පිනි හදන විට එය රසවත් කර ගැනීම සඳහා කංසා එකතු කිරීමටත් අමතක කර නැහැ. බේරුවල, මග්ගොන ආදි ප්‍රදේශවල තවමත් මාළු පිනිවලට කංසා දමනවා. කංසා අගුණ වන්නේ එය දුම් බීමක් වශයෙන් පාවිච්චි කළොත් පමණයි. එයට තවත් විටමින් වර්ග එකතු කර පෙති හදන්නට පුළුවන් නම් හුඟාක් ප්‍රයෝජනවත්. විද්‍යා පර්යේෂණ හා නිවාස ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන වීම සඳහා මා ඒ යෝජනාව ඉදිරිපත් කරනවා. අපේ බෙහෙත් බඩු විකිණීමෙන් රුපියල් 35,000 ක ආදායමක් ලබා ගන්නට යන බව මෙවර අයවැය කථාවේ සඳහන් කර තිබුණා. එහෙත් අර විධියට වෙනත් විටමින් වර්ග එකතු කර කංසා පෙති හදා පිටරට විකිණීමෙන් රුපියල් 35,000 ක් නොව 35,00,000 ක් උපයා ගන්නට පුළුවන් බව මතක් කරන්නට කැමැතියි. එසේම ශක්තිමත් පරපුරක් ඇති කිරීමටත් එය ඉවහල් වෙනවා. අපේ ආහාරයට කංසා එක් වීමෙන් ආහාර දිරවීමේ ශක්තිය දියුණු වෙනවා. ඒ මිස මෙය හිනාවට කාරණයක් නොවෙයි.

අපට විදේශ විනිමය පවා උපයා ගන්නට පුළුවන් තවත් දෙයක් තමයි, කිතුල් හකුරු. එහෙත් අද හොඳ කිතුල් හකුරු කෑල්ලක රස බලන්නටවත් පුළුවන් කමක් නැහැ. ශ්‍රාවස්තියේත් හකුරු තිබෙනවා. එහෙත් ඒවා සක්කරවලින් හෝ සීනිවලින් හැදූ හකුරු මිස හොඳ කිතුල් හකුරු නොවෙයි.

සබරගමුව බොහොම කිතුල් ගස් තිබෙන ප්‍රදේශයක් ; කිතුල් ගස් මදින උදවිය සිටින ප්‍රදේශයක්. නමුත් නීතිමය අවහිරකම් නිසා අද සබරගමුවේ කිතුල් ගස් මදින්නන්ට කිතුල් ගස් මදින්නට පුළුවන්කමක් නැහැ. මේ කාරණය පිළිබඳව ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි. ගම්බද කිතුල් ගස් මදින උදවියට අද එක්කෝ පොලිස් නිලධාරීන්ගෙන් නැත්නම් සුරා බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ගැහැට විඳින්නට සිද්ධ වී තිබෙනවා. මොවුන් තැබෑරුම්කරුවන් සමග එක් වී කිතුල් මල් කඩනවා. කිතුල් මලක් ගෙනැවිත් දුන්නොත් තැබෑරුම්කරුවා රුපියල් 10 ක් දෙනවා. සබරගමුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ අද එවැනි තත්ත්වයක් පවතිනවා. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදීත් මා මේ තත්ත්වය ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. තැබෑරුම්කරුවාට තැබෑරුම පවත්වාගෙන යන්නට පොල් ගස් 50 ක් තිබුණොත් ඇති. ඊටපසු හීස්ව ලොරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණන් ගෙන්වනවා. යිස්ට් ලොරි ගණන් ගෙන්වනවා වාගේම තැබෑරුම්කරුවා ලොරි ගණන් මුදලුත් හම්බ කරනවා. ඔය මුදල්වලට යට වන ගතියක් සමහර නිල ධාරීන් තුළ තිබෙන නිසා ගම්බද පැණි හකුරු කර්මාන්තයට අද බැරුරුම් තත්වයකට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. තේ වලින් ලැබෙන ආදායම දැන් ක්‍රමයෙන් අඩු වෙමින් පවතිනවා. තේ වවා තිබෙන කඳු මුදුන්වල කිතුල් ගස් වවන තත්ත්වයක් සමහර විට අනාගතයේදී ඇති වන්නට පුළුවනි. ඒවාගේම කිතුල්වලින් මේ රටට විශාල විදේශීය විනිමය ආදායමක් උපයා ගන්නට පුළුවනි. ඒ සමගම ස්වදේශිකයන්ටත් මේ බටිනා ආහාරය පිසිසේ ලබා ගැනීමේ මාර්ගය පාදා දෙන්නට ඕනෑ. කිතුල් රා බෝතල් කිරීමෙන් ගම්බද ලොකු කර්මාන්ත විප්ලවයක් ඇති කරන්නට පුළුවනි. මේ කරුණු ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා මැතිවරණ කාලයේ දුන් පොරොන්දු අමතක කර නැත්නම් ඕනෑකමින්ම අත් හැර අද රටේ සෑම තැනම කියා ගෙන යන ජාතික සමගිය ගැනත් විගාව ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මා අදහස් කරනවා. ඉහළ පෙළේ උදවිය අතර ජාතික සමගියක් තිබුණත් සාමාන්‍ය දුප්පත් පෙළේ ජනතාව අතර නම් ජාතික සමගියක් නැති බව අපට කියන්නට පුළුවනි. ජාතිවාදීන් සමග හවුල් වී ආණ්ඩුවක් පිහිටුවා ජාතිවාදීන්ගේ ඉල්ලීම් ඉටු කරන්නට මහා ජාතිය පාවා දීම නිසා දැන් මහා ජාතිය බලවත් සිත් වේදනාවකින් පෙළෙමින් සිටින බව මා ප්‍රකාශ කරනවා. අපේ සිංහල මිනිසුන් සිංහල ජාතිය ගැනත් සිංහල භාෂාව ගැනත් කථා කරන විට ඒක ජාති වාදය. ජාතිවාදීන් සමග එකතු වී ආණ්ඩුවක් පිහිටුවා ගැනීම රට සභා දෙනවාය කියා හොර ගිවිසුම් ඇති කර ගැනීම ජාති වාදය නොවෙයි. ඒ පිළිබඳව මා කථා කරන්නේ එපමණයි.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේත් එතුමාගේ පක්ෂයේ උදවියගේත් අදහස මේ රටේ ගම්බද ගොවීන්ගේ ආර්ථික තත්ත්වය බොහොම ඉහළ ගොස් තිබෙනවාය, වෙනදාට වඩා උසස් ජීවන තත්ත්වයක් දැන් ඔවුන්ට තිබෙනවාය යන්නයි. ආණ්ඩු පක්ෂයේ හැම උදවියගේම මතය එයයි කියා මා අදහස් කරනවා. නොයෙක් නොයෙක් විධියේ ගණන්හිලව් ඉදිරිපත් කරනවා. අපි මේ ගැන සලකා බලන්න ඕනෑ ගම්බද උදවියගේ මට්ටමෙනුයි; ග්‍රාමීය මට්ටමෙනුයි. සංඛ්‍යා ලේඛන ලොකු තර්ක මෙයට වුවමනා කරන්නේ නැහැ. මේ ගෙන යන පාලන ක්‍රමය නිසා ගොවියාගේ ආර්ථික තත්ත්වය ඉහළ නැග තිබෙනවාද, පහළ වැටී තිබෙනවාද කියා සොයා බැලීමට අපට ඔය ලොකු ගණන් හිලව් වුවමනා කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩු කාලයේ අපි වී බුසලකට රුපියල් 12 ක් දුන්නා. ඒ දුන්නේ බාල්දු නොකළ රුපියල්වලිනුයි. අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව වී බුසලකට රුපියල් 14 ක් දෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
රුපියල් 12 ක් දුන්නෙත් අපේ ආණ්ඩුවෙනුයි.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)
අපේ ආණ්ඩුවෙනුත් දුන්නා. මම නම් ඔය එක ආණ්ඩුවක වත් සිටියේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව රුපියල් 14 ක් දෙනවා. 20 ක් කප්පාදු කළ රුපියල්වලිනුයි තමුන්නාන්සේලා දෙන්නෙ.

**ඩැනියෙල් මයා.**
*(திரு. டானியல்)*
(Mr. Daniel)
කව්ද කප්පාදු කළේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධර්මදාස මයා.
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)
රුපියලක වටිනාකම සියයට 20 කින් අඩු කළ බව ගරු මුදල් ඇමතිතුමා විසිනුයි ප්‍රකාශ කළේ. බාල්දු කළ රුපියල්වලිනුයි තමුන්නාන්සේලා රුපියල් 14 ක් ගෙව්වෙ. තමුන්නාන්සේලාගේ රුපියලක වටිනාකම ශත 80 යි. ඒ අනුව බලන විට තමුන්නාන් සේලා වී බුසලකට ගෙවන්නේ රුපියල් 11.20 ක් පමණයි. ඒ කියන්නේ රුපියල් 12 කටත් අඩුවෙනුයි අද තමුන්නාන්සේලා වී බුසලකට ගෙවන්නෙ. අපි මේ මට්ටමෙන් කල්පනා කර බලමු.

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)
ඉල්ලපු මට්ටමෙන්ද කතා කරන්නෙ?

ධර්මදාස මයා.
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)
ඉල්ලපු මට්ටමෙන් නොවෙයි; තිබෙන මට්ටමෙන්.

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)
ඉල්ලමක් පැදෙන්න ඕනැ.

ධර්මදාස මයා.
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)
ඕනැ මට්ටමක් වෙන්න පුළුවනි. 1964 දී වී බුසලක් විකුණූ මිනිහෙකුට ඒ මුදල දී ලබා ගන්න පුළුවන් ද්‍රව්‍ය ටික අද මිල දී ගැනීමට නම් කොයි තරම් වී ප්‍රමාණයක් විකිණිය යුතුද යන කාරණාව ගැන අපක්ෂ පාතව ටිකක් කල්පනා කර බලමු. ගම්බද දුප්පත් තාලයට ජීවත් වෙන 6 දෙනෙකුගෙන් යුක්ත පවුලක් ගැන අපි සාමාන්‍යයෙන් සිතා බලමු. රුපියල් 12 කට වී බුසලක් වික්ක විට 1964 කාලයේදී ඒ පවුලට සතියට අවශ්‍ය ආහාර ටික මිලදී ගැනීමට පුළුවනි. මේ ද්‍රව්‍යවල එදා මිලත් අද මිලත් ගැන අපි ටිකක් සොයා බලමු. එදා මිරිස් රාත්තලක් රු. 1.20 යි; අද මිරිස් රාත්තල රු. 3.00 යි. රතුලූනු රාත්තල් 2 ක් එදා ශත 52 යි; අද ශත 80 යි. බොම්බයි ලූනු රාත්තල් 2 ක් එදා ශත 36 යි; අද ශත 60 යි. පරිප්පු සේරුවක් එදා ශත 80 යි; අද රුපියල් 2.40 යි. මුං ඇට සේරුවක් එදා ශත 72 යි; අද රු. 1.20 යි. කරවල රාත්තලක් එදා රු. 1.20 යි; අද රු. 2.40 යි. හාල්මැස්සන් රාත්තලක් එදා ශත 80 යි; අද රුපියල් 2.20 යි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
කුණු කරවල නේද?

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)
තමුන්නාන්සේලාගේ කරවලවලට ඔඩිකොලෝන් දමා තිබෙනවා නේ.

ධර්මදාස මයා.
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)
එදා ශත 20 කට ගත් තුන පහේ ටික ගන්න අද ශත 40 ක් ඕනැ. එදා කහ අරික්කාලක් ශත 10 යි; අද ශත 38 යි. එදා උලුහාල් අරික්කාලක් ශත 8 යි; අද ශත 20 යි. එදා හාල් සේරු 12 ක් රු. 3.36 යි; අද හාල් සේරු 6 ක් නිකම් ලැබෙනවා. අනික් හාල් සේරු 6 ගන්න රුපියල් 7.20 ක් වුවමනා කරනවා. එදා පිටි කිරි ටින් එකක් රුපියල් 1.90 යි; අද කිරි ටින් එකක් රු. 7.95 යි. එදා බැටරි කැලි 2 ක් ශත 80 යි; අද බැටරි කැලි 2 ක් රු. 1.60 යි.

එදා පවුලකට සතියකට අවශ්‍ය වන මේ ද්‍රව්‍ය ටික ගැනීමට වියදම් වන්නේ රුපියල් 12 කුත් ශත ගණනක් පමණයි. වී බුසලක් විකිණීමෙන් එදා මේ ද්‍රව්‍ය ටික ගන්න පුළුවන්කම තිබුණා. අද වෙළඳපොළේ පවත්නා මිළ ගණන්වල හැටියට එම ද්‍රව්‍ය ප්‍රමාණයම ලබා ගන්නට රුපියල් 27.33 ක් යනවා. ඒ සඳහා රුපියල් 14 ගණනේ වී බුසල් 2 ක් විකුණන්නට සිදු වී තිබෙනවා. එදා රුපියල් 12 ගණනේ එක වී බුසලක් විකුණා ලබාගත් මුදලෙන් එම පාරිභෝගික ද්‍රව්‍ය ටික ගන්නට පුළුවන් වුවත්, අද එය කරන්නට බැරි තත්ත්වයක් පැන නැගී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවියා රජ කෙරුවාය කියා, ගොවියාට ඔටුණු පැළැන්දුවාය කියා, සිතින් මවාගෙන සිටිනවා. දියුණු ලෝකයක් ඇති කළාය කියා සිතා සිටිනවා. එහෙත් ගොවියාට ඇති කර දී තිබෙන්නේ මෙවැනි තත්ත්වයක් බව මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, එක්තරා ගොවි පිරිසකට නම් මෙම රජයෙන් සෑම සෙතක් ම සැළසී තිබෙනවා. එනම් නියම ගොවියාට නොව ගොවිතැන් කරවන්නාටයි. අපට ලැබී තිබෙන සංඛ්‍යා ලේඛනවලට අනුව ගොවිතැන් කරවන්නාට කැලෑ අක්කර එක් ලක්ෂ හාර දහසක් දී තිබෙනවා. ඒවායේ ගොවිතැන් කර අවසාන වෙලා දැන් අක්කර 55 දහසක් ආපසු අර ගෙන තිබෙනවා. ඒ උදවියට එම කැලෑවල තිබෙන ලී ටික කපා ගැනීම සඳහා වුවමනා කරන ලොරි රථ, ට්‍රැක්ටර්ස්, මිනිමොක් රථ සහ ජීප් රථ යනාදිය පවා දී තිබෙනවා. ඒවායින් ප්‍රයෝජන ලබමින් ඒ උදවිය හම්බ කර ගත්තාට පස්සේ එම ඉඩම්වලින් අක්කර 55 දහසක් ආපසු ලබාගෙන තිබෙනවා. එවැනි පිරිසකට නම් තමුන්නාන්සේලා සිතා සිටින විධියේ සේවයක් සැළසී තිබෙනවා. එදා ගම්බද ගොවියාගේ ගෙදර වී ටික තිබුණා නම් සලාක පොත් 6 කට ලැබුණු සහල් සේරු 12 ප්‍රමාණය එකක් ශත 85 ගණනේ විකුණා රුපියල් 10.20 ක් ලබා ගන්නට හැකි වුණා. එසේ ලබා ගන්නා මුදලින් සතියකට වරක් ගෙදර කෙනෙකුට රෙදි යාර 6 ක් මිල දී ගන්නට පුළුවන් වුණා. අදත් ඔහුට සලාක පොත්වලට ලැබෙනවා සහල් සේරු 6 ක්. එම සහල් සේරු 6 විකුණන්නට පුළුවනි රුපියල් 7.20 කට. එම මුදලින් එදා ගත් රෙද්දෙන්ම යාර 3 ක් පමණයි, ඔහුට අද ලබාගත හැක්කේ. එදා ආණ්ඩුවෙන් ලැබුණු සහල් ටික විකුණා එම දුප්පත් ගොවියාට රෙදි යාර 6 ක් ලබා ගත හැකි වූ නමුත් අද ලබා ගන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ යාර 3 යි. ගම්බද ගොවියාගේ ජීවන මට්ටම ඒකයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා 4 ට ඉවර කරන්නට.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

මට පැය තුන්කාලක් දෙනවාය කිව්වා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මිනිත්තු 40 යි. ඒ කාලය 4 වන විට අවසානයි.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

එකින් එක ගෙන ටික දුරක් කතා කරන්නට ගිය නිසා මගේ කතාව දික් වුණා. මා තමුන්නාන්සේගේ අණට කීකරු වෙනවා. එම නිසා තව වචන ස්වල්පයක් ප්‍රකාශ කොට මගේ කතාව අවසාන කරන් නම්. ගරු කථානායකතුමනි, මම එහෙනම් අනික් අංශ අහකට දමා අපේ සංස්කෘතිය ගැන පමණක් වචන ටිකක් කතා කරන් නම්. [බාධා කිරීමක්] ආණ්ඩු පක්ෂයේ උදවිය මගේ කතාව කරන්න දෙන්නේ නැහැ. අවහිර කරනවා. එම නිසා මට තව ටිකක් වේලාව වුවමනා කරනවා. අපේ නායකයාණන් වූ දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා සිටියදී මේ රටේ සංස්කෘතිය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වා කටයුතු කළා. එතුමා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අමාත්‍යාංශයක්ද ඇති කළා. අද එය දෙපාර්තමේන්තුවක් බවට පත් වී තිබෙනවා. මේ පාලක පක්ෂයේ ඉහළ පෙළේම සිටින අය තමයි අපේ සංස්කෘතිය මකා දමන්නේ. මෙය සනාථ වන කරුණු ඉදිරිපත් කරමින් මගේ අදහස් ප්‍රකාශ කළ යුතුයි.

දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී අපේ රටේ අමරණීය විද්‍යා පියයන්ව පැවති විද්‍යාලංකාර පිරිවෙනත් විද්‍යෝදය පිරිවෙනත් විශ්ව විද්‍යාල දෙකක් බවට උසස් කරනු ලැබුවා. ඒවායේ උප කුලපතිවරුන් හැටියට අපේ කුල දේවතාවුන් වහන්සේලා දොපොළක් පත් කර ගනු ලැබුවා. එදා එසේ කරනු ලැබූ නමුත් අද මේ ආණ්ඩුව හිමින් සීරුවේ කර තිබෙන්නේ කුමක්ද? ඒ උපකුලපති ධුරවලින් අපේ ගෞරවනීය කුල දේවතාවුන් වහන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධම්දාස මයා.]

ලා ඇත් කර තිබෙනවා. අවසාන වශයෙන් හිටපු ගරු වල්පොල හාමුදුරුවන් වහන්සේ එදා ප්‍රංශයේ සිට මෙහාට එන විටත්, මෙහි විශ්ව විද්‍යාල උපකුලපති වශයෙන් වැඩ කරගෙන යන විටත්, බොහොම හොඳ කෙනෙකු හැටියටයි අපේ අධ්‍යාපන හා සාංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිතුමාට පෙනී ගියේ. ගරුතර වල්පොල හාමුදුරුවන් වහන්සේගේ වැරදි ගරු ඇමතිතුමාට පෙනෙන්නට පටන් ගෙන ඇති බව පෙනෙන්නේ උන්වහන්සේ මෙතැනින් පිට වෙලා ගියාට පස්සේ බව යි පුවත්පත් මගින් අපට දැන් දැන් කියවන්නට ලැබෙන්නේ.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
(திரு. ரி. பி. இலங்காரத்ன—கொலொன்னாவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
ලජ්ජයි, ලජ්ජයි.

**ධර්මදාස මයා.**
(திரு. தர்மதாச)
(Mr. Dharmadasa)
ගරු කථානායකතුමනි, අපේ සංස්කෘතිය රැකීමට දිවුරුම් දී එය භාරව ඉන්න අය අතින්මයි මගේ කල්පනාවේ හැටියට නම් අපේ සංස්කෘතිය විනාශ වන්නේ. වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසමු ඒ අමාරුව ? වැටත් නියරත් ගොයම කන්නා වාගේ අපේ සංස්කෘතිය නැති කිරීමට ලෑස්ති වන්නේත් සංස්කෘතිය භාරව ඉන්න අය බවයි මට පෙනෙන්නේ. මේ උදවියගෙන් අපේ සංස්කෘතිය රැකෙයිද කියන එක ගැන මා තුළ සැකයක් පහළ වී තිබෙන බව සඳහන් කරන්නට සිදු වී තිබෙනවා.

අපේ සංස්කෘතිය භාරව ඉන්න ගරු ඇමතිතුමා බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය විවෘත කළ දවසේ මහජනයා ඉදිරිපිට ප්‍රසිද්ධියේම අපේ බෞද්ධ චාරිත්‍ර අපහාසයට ලක් කළා. ඒ වාගේම අපේ සංස්කෘතිය භාර ගරු ඇමතිතුමා මේ ගරු සභාවේදී ඇතැම් විට කරන ප්‍රකාශත් අපට නම් දෙන්නෙකු ඉදිරියේ කියන්නට බැරි දේවල් බව කනගාටුවෙන් කියන්නට ඕනෑ. ඒවා **හැන්සාඩ්** වාර්තාව කියවා බලන විට අපට පෙනී යනවා. අපේ සංස්කෘතිය භාරව ඉන්න ඉහල පෙළේ ඇත්තන්ගේ කෙරුම් ගැන අපේ බලවත් අප්‍රසාදය මේ අවස්ථාවේ පළ කරන්නට ඕනෑ.

ඉංගිරිසින් අපේ රට පාලනය කළ කාලයේ අපේ දරු දැරියන්ගේ විභාග මාර්තු මාසය ඉකුත් වන්නට පෙර ඉවර කරන සිරිතක් තිබුණා. එහෙත් අද මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ අනුව —සංස්කෘතිය භාරව ඉන්න ගරු ඇමතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ අනුව—සිංහල බෞද්ධයන්ගේත් දෙමළ හින්දුන්ගේත් වැදගත් වාර්ෂික උත්සවයක් වන අලුත් අවුරුදු උත්සවය පවත්වන දවසේ පවා විභාග පැවැත්වීම විභාග අංශයෙන් කර ගෙන යනවා. පසුගිය අප්‍රේල් මාසයේ 16 වැනිදා සිංහල අලුත් අවුරුද්ද සඳහා තෙල් ගාන උත්සවය පැවැත්වීමට නියමිත දින යයි. ඒ දවසේත් විභාග පැවැත්වුණා. ඉතින් ඒ දවසේ සිංහල දරුවන්ට ඒ විභාගයට පෙනී සිටින්නට පුළුවන්කමක් නැහැ. විභාගයට පෙනී සිටියොත් තෙල් ගාන අවුරුද්දේ උත්සවයට සහභාගි වන්නට පුළුවන්කමක් නැහැ. ඒ දවසත් විභාග දිනයක් කර තිබුණා.

ගරු කථානායකතුමනි, අපේ සංස්කෘතිය භාරව ඉන්න ගරු ඇමතිතුමා හිතා ගෙන ඉන්නේ අපේ ගරුතර හාමුදුරුවන් වහන්සේලා කිසිම ශීලයක් නොරකින පිරිසක් හැටියටයි; ගරු සැලකිලි නොලැබිය යුතු පිරිසක් හැටියටයි. එවැනි හැඟීමක් එතුමා තුළ තිබෙන බවයි මට පෙනී ගොස් තිබෙන්නේ. මට එය ඔප්පු කරන්නට පුළුවනි. පසුගිය දවසක පවත්වන ලද උසස් අධ්‍යාපන විභාගයට හාමුදුරුවන් වහන්සේලාත් පෙනී සිටියා. හාමුදුරුවන් කියන උදවිය දැන් කාලයේ හැටියට ගල් ලෙන්වල, ගස් යට වාඩි වී සිටිමින් "අත්ථි ඉමස්මිං කායේ කේසා, ලෝමා, නඛා, දන්තා" යනාදී වශයෙන් කියමින් භාවනාවලම යෙදී ඉන්න පිරිසක් නොවෙයි. බුදු හාමුදුරුවන් වහන්සේ දේශනා කර තිබෙන්නේ, "චරථ භික්ඛවේ චාරිකං, බහුජන හිතාය, බහුජන සුඛාය, ලෝකානුකම්පාය" ආදි වශයෙනුයි. ඒ කාර්යය උන්වහන්සේලා අතින් කෙරෙන්නට ඕනෑ. ඒ සඳහා ධර්මය හදාරන්නට ඕනෑ. හාමුදුරුවරුන් රටේ ජනතාවගේ යහපත පිණිස නොයෙක් නො

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

යෙක් භාෂා ශාස්ත්‍ර ඉගෙනගන්න ඕනෑ. ඒකට අවහිර කෙළේ නැද්ද අපේ සංස්කෘතික ඇමතිතුමා ? එදා විභාගයට පෙනී සිටි හාමුදුරුවරුන්ට දවල් දානය ගන්න වත් ඉඩ ප්‍රස්තාවක් ලබා දුන්නෙ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඔය කථාව මේකට අදාළ නැහැ. දැන් වෙලාවත් මිනිත්තු 5 ක් වැඩියෙන් අර ගෙන තිබෙනවා.

**ධම්දස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

ඇයි කථානායකතුමනි, අදාළ නැත්තෙ ? මම කථා කරන්නෙ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති අංශය ගැනයි. මම තව මිනිත්තු 5 කින්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please ! The Sitting is suspended till 4.30 P.M. On resumption the Hon. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபா நாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

**ධම්දස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

**නැඟී සිටියේ ය.**

எழுந்தார்.

*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You have exhausted your time. I was not here, but I am told that you have gone beyond the time allotted to you.

**ධම්දස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

මා අවසන් කෙළේ නැහැ, තව විනාඩියකින් අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තේ පානය සඳහා විසිර යෑමට පෙර මා කියමින් සිටියේ පසු ගිය වාරයේ අධ්‍යයන පොදු සහතික උසස් පෙළ විභාගයට පෙනී සිටි ස්වාමීන් වහන්සේලාට දවල් දානය ගැනීමට ඉඩ ප්‍රස්තාවක් නොදීම ගැනයි. බුද්ධාගම සහ පාලි යන විෂයයන් දෙක ස්වාමීන් වහන්සේලා විසින් අනිවාර්යයෙන්ම ගත යුතුමයි. උදේ 9 සිට දවල් 12.30 වන තුරු මෙම විෂයයන්ට පෙනී සිටීමට සිදුවීම නිසා උන්වහන්සේලාට දානය ගැනීමට අවස්ථාවක් සලසා නොදීමෙන් අපේ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා අපේ ගරුතර ස්වාමීන් වහන්සේලාට නිගරුවක් කළ බව මේ ගරු සභාවේදී අප විසින් සඳහන් කළ යුතුව තිබෙනවා. ඉරු දිනවලදී ක්‍රිස්තු භක්තිකයන්ට පල්ලි යෑමට අවස්ථාවක් සලසා තිබීම ගැන අපි ගරු කරනවා. අන්න ඒ වාගේ අපේ බෞද්ධයන්ගේ සංස්කෘතිය රැකීමට මෙයින් මතුවටත් ඇමතිවරයා ක්‍රියා කරනවා ඇතැයි මා ප්‍රාර්ථනා කරනවා.

අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් කිව යුතු තවත් බොහෝ දේ තිබෙන නමුත්, ඒවා කාරක සභා අවස්ථාවේදී කියන්නට අවස්ථාව ලැබේවියයි මා අදහස් කරනවා.

අවසාන වශයෙන්, මේ රටේ දුක් විඳින ජනතාව තව තවත් ආර්ථික පරිහානියට ඇද වැටීමට හේතු වන විධියේ අයවැය යෝජනා ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති නිසා එම අය වැය යෝජනාවලට මගේ අප්‍රසාදය පළ කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.32

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්තාව ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පැල්මඩුල්ලෙ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට පසුව මට කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ මක්නිසාද ? රත්නපුර දිස්ත්‍රික්කය ගැන මාත් හොඳට දන්න කෙනෙක්. මා ආණ්ඩුවේ සේවකයකු වශයෙන් සිටින කාලයේදී ඒ දිස්ත්‍රික්කයේ ගමක් ගමක් පාසා ඇවිද තිබෙන නිසා මට හුඟක් දුරට රත්නපුරේ ගැනත් ඒ මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය ගැනත් කරුණු කියන්න පුළුවන්.

ඒ මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දී ගෙන සිටි මට විශේෂයෙන් විනෝද වීමට අවස්ථාවක් ලැබුණා. රත්නපුර දිස්ත්‍රික්කයේ—විශේෂයෙන් පැල්මඩුල්ල ආසනයේ වෙන්න ඇති—මා සිටි 1958-59 කාලයට වඩා ලොකු වෙනසක් අද ඇති වී තිබෙන බව මට එතුමාගේ කථාවෙන් දැනගන්නට ලැබුණා. පැල්මඩුල්ලෙ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ රජය බලයට පැමිණියාට පසුව ඒ පලාතේ ලැබෙන මැණික්වලින් රජයට වාසියක් නොහොත් ආදායමක් නැත කියා.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

මා එහෙම කිව්වෙ නෑ. මා කිව්වේ මැණික්වලින් ආදායම් ලබා ගැනීමේ මාර්ගයක් මේ අය වැය කථාවෙන් පිළියෙළ කර නැති බවයි.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

අය වැය කථාවේ වරදයි කියන්නෙ. අප කිරි පැණි කැව්වත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලාට ඒවා තිත්තයි.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)

කරුණාකර ඇස්තමේන්තු බලන්න.

**එස්. බී. හේරත් මයා.**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herat)

කතා කරන විට කෑගහන්න එපායයි තමුන්නාන්සේම කිව්වා. දැන් තමුන්නාන්සේම කෑගහනවා. කරුණාකර, මා කියන දේ අහගෙන ඉන්න.

මීට ටික කලකට පෙර නම් පැල්මඩුල්ල පළාතේ මැණික් විශාල වශයෙන් තිබුණා. එහෙත් දැන් එහි තිබෙන්නේ හිස් වළවල්, පරණ පතල් පමණයි. එහෙත්, පාර දෙපැත්තේ ලොකු මාළිගාවල් නම් පෙනෙන්න තිබෙනවා. ඒවා සමහර විට මැණික් විකිණීමෙන් ලැබුණු ආදායම්වලින් ඉදි කළ ඒවා වෙන්න ඇති. කවුද ඒ මැණික්වලින් ආදායම් ලැබුවේ ? එයින් කොටසක් රජයටත් දුන්නා නම් රජයට විශාල ආදායමක් ලබන්න තිබුණා. එසේ නොදීමයි කණගාටුවට කාරණය. මා රජයේ සේවකයකුව සිටියදී, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය සම්බන්ධ කටයුතු කරද්දී ඔය හැම පතලක් ගාණේම මාත් ගිහින් තිබෙනවා. මැණික් බිම් බෙදන ලද අවස්ථාවේ දීත් මා එහි සිටියා. ඒ බිම්වල අද තිබෙන්නේ හිස් වළවල් පමණයි. ඒවායින් ආදායම් ලැබූ අය එයින් කොටස් බද්දක් වශයෙන් වෙන යම් අන්දමකින් හෝ රජයට දුන්නා නම් එය රජයට විශාල ආදායමක් විය හැකිව තිබුණා. මැණික් සම්බන්ධව සොයා බැලීමට පිළිවෙළක් ඇති කරන ලෙස පැල්මඩුල්ලේ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. යම් යම් අය ඒ මැණික් ලබා ගත්තේ කෙසේද යන වග සොයා බැලීම සඳහා විශේෂ පරීක්ෂණයක් කරන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තම පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවන්නට පුළුවන් වුණොත් රත්නපුරයේ මැණික්වලින්ම රත්නපුර කොට්ඨාශය දියුණු කරන්නට පුළුවන් බව පැල්මඩුල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. තම පක්ෂයට ආණ්ඩු බලය ලැබෙන තුරු එතුමා රත්නපුරය දියුණු කරන්න බලා සිටිනවා නම් මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමාගෙන් ඉල්ලා සිටිනවා, අදම ඉල්ලා අස්වන ලෙස. රත්නපුරය ඉතාම දුෂ්කර ප්‍රදේශයක් බව මා හොඳින්ම දන්නවා. පැල්මඩුල්ලත් ඒ විධියයි. එවැනි ප්‍රදේශ දියුණු කරන්නට හොඳ මන්ත්‍රීවරයකු සිටිය යුතුයි. මැණික් විකුණා එසේ කරන්නට බලා සිටීමෙන් පමණක් ඒ වැඩේ සාර්ථක වේයයි මා විශ්වාස කරන්නේ නැහැ. යම් ප්‍රදේශයක් දියුණු කරන්නට නම්, මෙතැනට ඇවිත් කථා කරන්නට පමණක් නොව වැඩ කරන්නත් පුළුවන් මන්ත්‍රීවරයකු ඒ ප්‍රදේශයට සිටිය යුතුයි. කොයි තරම් ලොකුවට කොයි තරම් විනෝදමත් අන්දමට කථා කළත් පළාතට වැඩක් කෙරෙන්නේ නැත්නම් එවැනි මන්ත්‍රීවරයකුට පළාතක් දියුණු කරන්න බැහැ.

කොස් පිටි හදන්නත් එතුමා අපට කිව්වා. එසේ කියන්නට ඇත්තෙ පිට රටින් ගෙන්වන පිටි නතර කරන්න හිතා ගෙන වෙන්න ඇති. අප කවුරුනුත් කොස් පොළොස් කන අය නිසා කොස්, පිටි කරන්න වුවමනාවක් නැහැ. හැම් බේකන් කන උදවිය රත්නපුර පැල්මඩුල්ල පළාතේ නැහැ.

කංසා වගාව දියුණු කරන ලෙසත් එතුමා අපට උපදෙස් දුන්නා. වැරදි විධියට නොව හරි මාර්ගයකින් කංසා වගාව දියුණු කෙරෙතොත් මාත් ඊට කැමැතියි. එහෙත්, විරුද්ධ පාර්ශ්වයේ සමහර නියෝජිත මහත්වරුන් මිනිසුන්ට ගංජා, අරක්කු, අබිං වැනි දේ දී මිනිසුන්ගේ හිත් අවුල් කොට, "දැන් ඉතින් මේ රජයට කරන්න පුළුවන් දෙයක් නෑ, අපට ඡන්දය දීපල්ලා" යි මිනිසුන් මුළා කළ අවස්ථාත් ඇති වී තිබෙනවා. ඒ අන්දමට ජනතාව මුළා කර ඡන්දය ලබා ගන්ට සූදානම් වෙනවා නම් ඒකත් ලොකු ලෝක අපරාධයක් බව ගරු මන්ත්‍රීතුමාට කියන්ට කැමතියි. මා ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රකාශ ගැන මීට වඩා කාල වේලා ගත කරන්නෙ නැහැ.

මේ රජය විශාල මුදලක් වැය කර රථ වාහන 10,000 ක් පමණ ගෙන්වා තිබෙනවාය—විශේෂයෙන් කියන්නේ කාර් කියායි—ගොවියාට පිහිටවන කිසිවක් කර නැත, ලොරි ගෙන්වා තිබෙන නමුත් ඒවායින් ගොවියාට පිහිටක් නැත, ජීප් ගෙන්වා තිබෙන නමුත් ඒවායින් ගොවියාට පිහිටක් නැත, ආදී වශයෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් රාශියක ගෙන් කියවුණා. මට වැඩි වේලාවක් නැති නිසා මා මේ ප්‍රශ්න පිළිබඳව පුළුල් වශයෙන් නොව ඉතා කෙටියෙන් කියන්නටයි සූදානම් වෙන්නෙ. එහෙත් මේ ගෙන්වන ලද රථවාහන 10,000 න් කීයක් ලොරිද, කීයක් ජීප්ද, කීයක් මෝටර් බයිසිකල් හා ස්කූටර්ද, මිනිමෝක් කීයද, ආදී වශයෙන් කිසිම ගරු මන්ත්‍රීවරයෙකු ඒ සංඛ්‍යා ඉදිරිපත් කළේ නැහැ. ඒ වගේම කාර් එකකට වන වියදම හෝ ලොරියකට වන වියදම කීයදැයි කිව්වෙ නැහැ. මේවා ගෙන්නුවේ ආධාර ක්‍රම යටතේද, එසේ නැත්නම් මේ රටේ විදේශ විනිමය වියදම් කර මේවා ගෙන්නුවාද, කියාත් පහදා දුන්නෙ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රථවාහනවලින් වැඩි හරියක් විදේශ රටවලින් ආධාර හැටියට ලැබුණු ඒවායි. අපේ විදේශ විනිමය වැය කර මේවා ගෙන්නුවෙ නැහැ. දුෂ්කර ප්‍රදේශවල වගා කරන ද්‍රව්‍ය නගරවලට ගෙනෙන්නට ඒ ප්‍රදේශවලට දුම්රිය යන්නෙ නැහැ. ලොරි නැත්නම් ඒවා ගෙනෙන්නට වෙනත් පිළිවෙළක් නැහැ. කොළඹ සිටින ලොකු මුදලාලිලා මේ දුෂ්කර ප්‍රදේශවලට ගිහින් ඉතා අඩු මිළට ගොවීන්ගේ නිෂ්පාදන මිළදී ගන්නවා. රත්නපුරයේ ඇඹිලිපිටිය කියන ප්‍රදේශයේ ජනතාව ලොරි සොයා ගන්නට නැතිව කොයි තරම් දුක් වින්දාද කියා මා එහි සේවය කළ කාලයේ මට පෙනී ගියා. ඒ කොලනියේ ජීවත් වූ ජනතාවට හැතැප්ම 3 ක් තරම් දුර ගොස් කළයෙන් වතුර ගෙනැවිත් බොන්නට සිදු වුණා. ඒ වගේම ජල පහසුකම් නැති නිසා ළිං හාරාගෙන වගාවලට වතුර දමන්නට ඔවුන්ට සිදු වුණා. එතරම් මහන්සි වී ඔවුන් වගා කළත් ඔවුන් නිෂ්පාදනය කළ බණ්ඩක්කා රාත්තල ශතයටත්, වැටකොලු රාත්තල් 2 ශතයටත් විකුණන්නට සිදු වූ අවස්ථා ගැන මා හොඳින් දන්නවා. ඒ වැනි තත්ත්වයක් ඇති වුණේ කොහොමද කියා මා අහන්නට කැමතියි. ඒ ගොවිපොළවල නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වෙළඳපොළවලට යවන්නට ලොරි සොයා ගන්නට ගොවීන්ට බැරි වන තුරු මුදලාලිලා බලා සිටිනවා, එම ද්‍රව්‍ය අඩුවෙන් මිළදී ගන්න. අද ලොරි ඕනෑ තරම් තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. බී. හේරත් මයා.]

නිසා ගොවීන්ට තමන්ගේ නිෂ්පාදන ඉතා පහසුවෙන් කොළඹ නගරයට ගෙනැවිත් විකුණා ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ වගේම රත්නපුරයේ සිට කොළඹට බඩු ලොරියක් ගෙනෙන්න කුලිය වශයෙන් එදා රු. 250 ක් තරම් ගෙවන්නට සිදු වුණා නම්, අද රු. 75 කින් පමණ ඒ කට යුත්ත කර ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ සෙත සැලසුනේ ලොරි හිමියන්ටද, ගොවි මහජනතාවටද කියා මා අහන්නට කැමතියි.

අපේ මුදල් ඇමතිතුමා ඉතාම සාධාරණ අන්දමට අයවැය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් එය විවේචනය කරනවා. ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා, වරදක් තිබෙනවා නම් විවේචනය කරන්න කියා. එහෙත් මහ ජනතාවට යහපතක් සිදුවන අයවැය යෝජනාවක් ගැන කවදාවත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු නැගී සිට ප්‍රශංසාවක් කර තිබෙනවාද කියා මා අහන්නට කැමතියි. මේ ආණ්ඩුව පසුගිය අවුරුදු $4\frac{1}{2}$ තිස්සේ ගෙන ගිය ව්‍යාපාරය මගින් මේ රටේ ගොවියාට කිසි සෙතක් සිදු වුණේ නැත, මේ රටේ රක්ෂා ප්‍රශ්නය විසඳුනේ නැත, කියා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ කථාවලින් නිතරම කියවෙනවා. රුපියල් ලක්ෂ හය හත, දහය දොළහ වැය කර වාරිමාර්ග ක්‍රම ඇති කරන්නේ මේ නගරබද ජනතාව වෙනුවෙන්ද, ගොවි ජනතාව වෙනුවෙන්ද, කියා මා අහනවා. ඇයි ඒවා ප්‍රකාශ නොකර, මහජනයාත්, තමුන්නාන්සේලාගේ ඡන්දදායකයනුත් මුළා කරන්නට උත්සාහ කරන්නේ ? මේ රජයෙන් කළ එක හොඳ වැඩකට තමුන්නාන්සේලා ප්‍රශංසා කළාද ? හොඳ වැඩ ගැන ප්‍රශංසා කරන අතර වැරදි වැඩ විවේචනය කරන්න. වැරදි වැඩ සිදු වෙනවා නම් ඒවා පෙන්වා දුන් විට ඒවා පිළිගන්න මේ රජය සූදානම් බව මා මතක් කරන්නට කැමතියි. අපේ රටින් පිටරටට යවනු ලැබූ ද්‍රව්‍යවල මිල පහත වැටීම නිසා අපේ දේශීය ආදායම පහත වැටී තිබුණු අවස්ථාවේදී අප රට වැටී තිබුණු ආර්ථික පරිහාණියෙන් ගොඩ ඒමට හැකි වුණේ අපේ නායකතුමා විසින් ගෙන ගිය ආහාර වගා කිරීමේ සටන නිසා බව මතක් කර දෙන්න කැමතියි. මේ රටේ ගොවි ජනතාවට පිං සිදු වන්න, අපේ නායකතුමාට පිං සිදු වන්න අප වැටී සිටි ඒ ආර්ථික පරිහාණියෙන් ගොඩ ඒමට හැකි වුණා. නමුත් අපේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පළාත් පාලන මැතිවරණවලදී ගම්බද මහ ජනතාවට කියන්නේ මොනවාද ? මේ රජය පසුගිය කාලසීමාව තුළදී මහජනතාවට කිසිවක් කර නැත කියා වැරදි අවබෝධයක් ඇති කරලීමට උත්සාහ දරනවා.

ගරු කථානායකතුමනි, අපේ ප්‍රදේශවල පමණක් නොවෙයි, අනිකුත් ප්‍රදේශවල ඇති වැව් පසුගිය අවුරුදු දහය තුළ කිසිම ප්‍රතිසංස්කරණයක් කර නැහැ. ඒ වාගේම හිරියාලේ කෝට්ඨාශයට පසුගිය රජයේ කාල සීමාව තුළදී පාඨශාලා ගොඩනැගිලි දෙකයි ගොඩනංවා තිබුණේ. එහෙත් මේ රජය බලයට පැමිණීමෙන් පසු ඒ වැව් සියල්ලක්ම පාහේ ප්‍රතිසංස්කරණය කර තිබෙනවා ; පාඨශාලා ගොඩනැගිලි අලුතෙන් ඉදි කර තිබෙනවා. ඒ වාගේම අවුරුදු ගණනාවක් තිස්සේ නොසලකා හැරීම නිසා වලගොඩැලි වී ගිය, රථ වාහන ගමන් කිරීමට බැරි වී තිබුණු මාර්ග ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වය මොන අන්දමට විවේචනය කළත් ගොවියාගේ තත්ත්වය නගා සිටුවීම සඳහාත්, ආහාර අතින් ස්වයංපෝෂණය කිරීම සඳහාත් මේ රජය ක්‍රියා කර තිබෙන බව මහජනතාව පිළිගෙන අවසානයි.

ගරු කථානායකතුමනි, හිනිදුම ආසනය සඳහා මා තරඟ කරන විට විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීවරුන් කීවා, 1965 දී හිනිදුම මන්ත්‍රීවරයා වශයෙන් මා තේරී පත් වුණොත් මහවැලි ගඟ ඉහළට ගලන වාය කියා. මා සන්තෝෂයි කියන්න, එදා ඒ කී කථාව අද ඇත්ත වේගන යන බව. මහවැලි ගඟ ඉහළට නොගැලුවත්, එහි ජලය දුෂ්කර ප්‍රදේශ මැදින් ගලා යාමට සැලැස්වීමේ කටයුතු දැනට මත් ආරම්භ කර තිබෙනවා. මට පෙර කථා කළ මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා කීවා, ඒ ප්‍රදේශවල ගොවි ජනතාවට වගා කරන්න ජලය නොමැතිව මී කඩා, පැණි විකුණා ජීවත් වන බව. නමුත් දැනට මේ රජය අරඹා ඇති මහවැලි යෝජනා ක්‍රමය වැනි ව්‍යාපාර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු තිබුණු කාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යේදී ඇරඹුවා නම්, ජලය ලබා දීමට ක්‍රම සකස් කළා නම්, ඒ ප්‍රදේශවල ගොවිජනතාවට මී පැණි විකුණා ජීවත් වන්නට සිදු වන්නේ නැති බව මතක් කර දෙන්න කැමතියි. එම නිසා මහවැලි ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඒ ප්‍රදේශවලටත් ජලය ලබා දෙන්න අපේ රජය සූදානම් බව ඒ මන්ත්‍රීතුමාට මතක් කරනවා. ඒ වාගේම ප්‍රදේශයේ මහජනතාවට මේ රජය මගින් එබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති බවත් පෙන්වා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මෙම අයවැය ලේඛනය ගැන විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විවේචනය කරන විට 1965 ට පෙර අප රට ආර්ථික වශයෙන් කොයි විධියේ තත්ත්වයක තිබුණාද කියා කල්පනා කර බලන්න ඕනෑ. ඒ අවධියේදී, අපේ කර්මාන්තයන් කර ගෙන යාමට අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට අවශ්‍ය විදේශ විනිමය, ඒ වාගේම අපට ඉතා අවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට වුවමනා විදේශ විනිමය නොමැතිව, ඉතාමත්ම දුෂ්කර තත්ත්වයකට මුහුණ පා සිටි බව අමතක කරන්න නරකයි. එහෙත් අද ඒ තත්ත්වය වෙනස් වී තිබෙන බවත්, ලංකාවේ තිබෙන කර්මාන්ත ශාලා එදා මෙන් දෙගුණයක් භාණ්ඩ අද නිෂ්පාදනය කරන බවත් කියන්නට සතුටුයි. එදා සියයට 3 ක්ව තිබූ මේ රටේ දියුණුව අද සියයට 6 ක් පමණ දක්වා නැග තිබෙනවා. ඒ දියුණුව තව තවත් වැඩි වන බව සතුටින් ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු මන්ත්‍රීවරුන් වී වගාව සම්බන්ධයෙන් අප ලබා ඇති දියුණුව ගැනත් කල්පනා කරන්නට ඕනෑ. 1965 දී වර්ෂාපතනයේ තිබුනේ ඉතා සුළු අඩුපාඩුවක් පමණයි. එහෙත් ඒ අවුරුද්දේ බුසල් 3,60,00,000 ක් වූ වී අස්වැන්න අද වන විට 7,10,00,000 දක්වා නැග තිබෙන බව තමුන්නාන්සේලා මහජනතාවට කියනවද කියා මා අහන්නට සතුටුයි. ඇයි මේවා ගැන කියන්නෙ නැත්තෙ? තමුන්නාන්සේලාගේ රට දියුණු වෙනවාද නැද්ද කියා තමුන්නාන්සේලා මහජනයාට කියන්නට ඕනෑ. දේශපාලන පක්ෂ ගැන කල්පනා කර බලය ඇල්ලීමට පමණක් ඉදිරිපත් වෙනවා නම් එය රටටත් ජාතියටත් කරන ලොකු දුෂ්ඨකමක් බව, ලොකු හානියක් බව මා කියන්නට කැමතියි. රබර් අංශයේත් අද එදාට වඩා දියුණුවක් තියෙනවා. 1965 දී සංස්ථාවලින් ලාභ ලැබුනේ 7,00,00,000 ක් පමණයි. එහෙත් අද සංස්ථාවලින් ලැබෙන ලාභය 26,20,00,000 ක් බව තමුන්නාන්සේලා මහජනතාවට ප්‍රකාශ කළාද කියා මා අහන්නට කැමතියි. 1965 සිට මේ දක්වා මේ රජයෙන් අළුත් කර්මාන්ත 667 ක් සූදානම් කර තිබෙන බව අප මහජනතාවට ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජාතික රජය, ලැබෙන මුදල් සියල්ලක්ම වියදම් කරන්නේ ගොවි ප්‍රදේශවලටයි. මේ රජය මේ රට දියුණු කිරීමට බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම ආහාර නිෂ්පාදන අංශය දියුණු කිරීමෙන් බව මේ සභා ගර්භයේ සිටින මන්ත්‍රීවරුන් පමණක් නොව මුළු මහජනතාවම පිළිගෙන අවසානයි. කොළණි ක්‍රමය යටතේ ඉඩම් කට්ටි 57,000 ක් පමණ මේ කාල සීමාව තුළ දී තිබෙනවා. අළුත් කට්ටිකරුවන් 17,000 ක් පමණ දැනට පදිංචි කරවා අවසානයි. අළුත් වාරිමාර්ග ක්‍රම 51,700 ක් පමණ සූදානම් කර තිබෙනවා. වතුර නැතිව තිබුණු කුඹුරු අක්කර 32,000 කට වැඩි ප්‍රමාණයකට වතුර සැපයීමට ජලාශ සූදානම් කර අවසානයි. ඉඩම් කට්ටිකරුවන්ට ඉක්මනින්ම ඉඩම් දීමට මේ රජය සංවිධානයක් ඇති කරගෙන යනවා. බලෙන් ඉඩම් අල්ලා ගෙන සිටින ගොවි මහත්වරුන්ට නඩු වැටි වැටී සිටින්නට ඉඩ නොතබා ඔවුන්ට ඒ ඉඩම් ලබා දී ඉක්මණින් ඒ සඳහා ඔප්පු දෙන්නට මේ ආණ්ඩුව වැඩ පිළිවෙළක් සූදානම් කරගෙන යනවා. එහි ප්‍රමාදයකට තිබෙන්නේ ඒ ඉඩම් මැනලා ඒවාට හතර මායිම් හඳන්නේ නැතිව ඔප්පු පිළියෙළ කරන්නට ක්‍රමයක් නැතිකමයි. උතුරට මේක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැගෙනහිරට මේක දකුණට මේක බස්නාහිරට මේක යනාදී වශයෙන් හතර මායිම් හදන්නට ඕනෑ. එසේ නොකර ඔප්පු ලියන්නට බැහැ. ඒ සඳහා පැන නැඟ තිබෙන ප්‍රශ්නය නම් මිනින්දෝරු මහත්වරුන්ගේ හිඟය යි. පසුගිය ආණ්ඩු කාලයේදී මිනින්දෝරු අංශය පුළුල් නොකිරීම නිසා මිනින්දෝරුවන්ගේ හිඟයක් පවතිනවා. අන්න ඒකයි ප්‍රමාදයට හේතුව.

මේ රජයේ අධ්‍යාපන ඇමතිතුමා කාර්මික විද්‍යාල ඇති කර අපේ තරුණ පරම්පරාව කලා අංශයට පමණක් යොමු නොකර ලංකාවට අවශ්‍ය ඉංජිනේරු, මිනින්දෝරු ආදී අංශ මෙන්ම කෘෂිකර්ම වාණිජ ආදී අංශත් ඇති කර ලංකාවේ දියුණුව ඉක්මණින් ගෙන යන්නට පුළුවන් වන අන්දමට අධ්‍යාපනය සකස් කිරීම ගැන එතුමාට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙල අනුව ඉක්මණින් මිනින්දෝරුවන් ලබා ගන්නට පුළුවන් වුණොත් මේ ඉඩම් ප්‍රශ්නයත් ඉක්මනින් විසඳන්නට පුළුවන් වේවි. මා හිතන විධියට දැනටමත් ඔප්පු ලක්ෂ දෙකකටත් වැඩි ප්‍රමාණයක් ලියා අවසානයි. මේ වගා සටන නිසා අපට සන්තෝෂ විය හැකි දියුණුවක් ලැබී තිබෙනවා. මෙතෙක් කල් පිටරටින් ගෙන්වූ හාල් ප්‍රමාණයෙන් දැන් ගෙන්වන්නට ඕනෑ කරන්නේ බාගයයි. අපට අවශ්‍ය හාල් වලින් සියයට 75 ක්ම දැන් ලංකාවෙන්ම ලබා ගන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඉතා ඉක්මණින්ම අපට ඕනෑ හාල් ප්‍රමාණය සියයට සියයක්ම ලංකාවෙන්ම ලබා ගන්නට පුළුවන් වේවි. දැනට ලොකු ඉඩෝරයක් තිබුණත් අප බලාපොරොත්තු වූ හාල් ප්‍රමාණය දැනට අපට ලැබී තිබෙනවාය කියා මා හිතනවා. මහවැලි ගඟ යෝජනා ක්‍රමය ඇති කළාට පසුව මේ තත්ත්වය තවත් හොඳ වේවි. ඊට පසුව දැනට වේලී පාළු වී යන කුඹුරු යායවල් සශ්‍රීක කරගන්නට පුළුවන් වේවි. දැන් අපි අනුරාධපුරය පැත්තට යන විට පාර දෙපස ඔක්කොම වේලිලා රතු පාට වී තිබෙනවා. එහෙත් මහවැලි ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණාට පසුව ඒවා කොළ පාටින් බැබලෙයි කියා මා කල්පනා කරනවා.

ගොවිතැන සඳහා අයවැයකින් වැඩිම මුදලක් මෙතෙක් ලංකාවේ වෙන් කර තිබෙන්නේ මෙවර අයවැය ලේඛනයේ නුයි. මේ ශීර්ෂය යටතේ මෙතෙක් වැඩිම මුදල මෙවර වෙන් කර ඇත්තේ ස්වයම් පෝෂිතභාවය ඉක්මණින් ඇති කර ගැනීමටයි. එය දෙපාර්තමේන්තුවට තනිකර කරන්නට අමාරු නිසා අපි ගොවි හමුදාවක් ඇතිකර තිබෙනවා. ඔවුන්ට ඉතා දුෂ්කරතාවයන් මැද වැඩ කරන්නට සිදු වුණත් ඔවුන් ඉතා සන්තෝෂයෙන් වැඩ කර මේ වගා සටනට රුකුලක් දීම ගැන අපි ඔවුන්ට ස්තුතිවන්ත වන්නට ඕනෑ.

අපට ලැබෙන විදේශ ආධාර ගැන බලන විට එක කරුණක් ගැන කියන්න සන්තෝෂයි. එදා වැටී සිටි ආර්ථික ප්‍රපාතය අනුව එයින් ගොඩ එන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. මහජනයාට බඩගින්නේ මැරෙන්නයි සිදු වී තිබුණේ. එහෙත් විදේශීය රටවල් මේ ආණ්ඩුව පිළිගෙන මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබා මේ රටට විදේශ ආධාර විදේශ ණය ආදිය දී අපේ රට ඒ ආර්ථික පරිහානියෙන් බේරා ගැනීම නිසා දැන් අපි සෑහෙන ප්‍රමාණයකින් දියුණු වී සිටිනවා. අවුරුදු ගණනාවක් තිස්සේ දුෂ්කර ජීවිත ගත කළ, පඩි වැඩි කිරීමේ සටන් ගෙන ගිය, රජයේ සේවකයන්ට සෙතක් සලසමින් ලබන ඔක්තෝබර් මාසයේ සිට වැටුප් කොමිෂන් සභාවේ අතුරු වාර්තාව ඒ වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිද්දෙන්ම ක්‍රියාත්මක කරන්නට මේ ආණ්ඩුව තීරණය කරගෙන සිටින්නේ දැනට ලබාගෙන ඇති දියුණුව නිසයි. මමත් රජයේ සේවකයකු හැටියට සිටි කෙනෙක්. පුළුවන් තරම් උනන්දුවෙන් තම රාජකාරි කටයුතුවල යෙදෙමින් මෙම රජයේ කට යුතුවලට සහාය දෙන ලෙස හිටපු රජයේ සේවකයකු වශයෙන් මා සියලුම රජයේ සේවක සහෝදරයන්ගෙන් ඉල්ලා සිටිනවා.

ගම් ප්‍රදේශවලට ටැක්සි රථ ලැබී ඇති බව කියමින් මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) මෙම ආණ්ඩුවට දෝෂාරෝපණය කළා. කවදාවත් ටැක්සි රථ නොතිබුණු ගම් ප්‍රදේශවලට ටැක්සි රථයක් දෙකක් දීම ගැන ඒ ගරු මන්ත්‍රීතුමා අසතුටු වෙනවා නම් එය කන ගාටුදායක කාරණයක්. ඊට අසතුටු වීම අපරාධයක්. එදා ටැක්සි රථ නොතිබුණු ගම්බද ප්‍රදේශවල උදවියට අද ටැක්සි රථ වල අයිතිකාරයන් වන්නට පුළුවන් වී තිබෙනවා නම් ඒක සැලකිය යුතු කාරණයක්.

මේ ආණ්ඩුව පෞද්ගලික අංශයට සැහෙන තැනක් දී තිබෙනවා. පෞද්ගලික අංශය දියුණු වන විට ඒ මගින්ද රැකී රක්ෂා නැති මහජනතාවට රැකිරක්ෂා ලබා ගන්නට පුළුවන් වෙනවා. ඒ බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට අමුතුවෙන් වටහා දෙන්නට වුවමනාවක් නැහැ. මේ අන්දමට අපේ ගරු මුදල් ඇමතිතුමා වන්නියෙන් ආවත් නියම වන්නිනායකයකු හැටියට අපේ වන්නියේ දුෂ්කර ජීවිත ගත කරන දුප්පත් ගොවි ජනතාවට ලොකු සෙතක් කිරීමේ අභිලාෂය ඇතිව වැඩ කරගෙන ගොස් තිබෙනවා. මෙම රජය අප්‍රසාදයට ලක් කිරීම සඳහා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් චෝදනා ඉදිරිපත් කරනවා; කෑ කෝ ගසනවා. එහෙත් එකක් කිව යුතුයි. ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ ඔය චෝදනා, ඔය විවේචන, ඔය කෑ කෝ ගැසීම් මෙම ගරු සභාවට පමණක් සීමා වෙනවා. ඒ උදවියගේ කථා හැන්සාඩ් වාර්තා ගත වුණත්, පුවත් පත්වල පළ වුණත් මහජනතාව ඒවා ගැන වැඩිපුර සලකන්නේ නැහැ. ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ බොරු ප්‍රචාරවලට මහජනයා රැවටෙන්නේ නැහැ. පසු ගිය රජය පැවති කාලයේ බෝඩ් ලෑලිවලට පමණක් සීමා වී තිබුණු අපේ මහා විද්‍යාලවල දැන් විද්‍යා, වාණිජ හා කලා අංශ ඉතාමත් හොඳ තත්ත්වයක පවතිනවා. එම නිසා අපේ කුඩා දරුවන් පවා අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. එම මහා විද්‍යාල ඒ තත්ත්වයට ගෙන ඒම නිසා ඒවායේ ඉගෙන ගන්නා බණ්ඩලාට, බයියලාට දැන් පුළුවන්කම තිබෙනවා; කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය ආදී නගරවල මහා විද්‍යාලවල ඉගෙන ගන්නා ශිෂ්‍යයන් සමඟ තරඟ කර ජය ගන්න පවා.

මට වෙන් කර දී තිබෙන කාල සීමාව අවසාන වේගෙන එන නිසා මීට වඩා කථා කරන්නට පුළුවන්කමක් නැහැ. ලංකාවේ 5 වැනි වරටත් අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ එකම මුදල් ඇමතිතුමා වශයෙන් වර්තමාන මුදල් ඇමතිතුමා ඉතිහාසගත වුණා. මේ අයවැය ලේඛනයෙන් අපේ ප්‍රදේශවල දුෂ්කර ජීවිත ගත කරන ගොවි මහතුන්ටත්, ඔවුන්ගේ අඹු දරුවන්ටත් විශාල සහනයක් ලැබෙන නිසා මේ 5 වැනි අයවැය ලේඛනයත් ඉතිහාසගත වෙනවා. මේ රට දියුණුව කරා ගෙන යාම සඳහා ඒ තරම් හොඳ අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ මුදල් ඇමතිතුමාටත්, එවැන්නකට ඉඩකඩ සැලසූ ජාතික රජයටත්, මෙතෙක් මට කථා කරන්නට අවස්ථාව දුන් නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මංගල මූණසිංහ මයා. (බුලත්සිංහල)
(திரு. மங்கள முனசிங்க—புலத்சிங்கள)
(Mr. Mangala Moonesinghe—Bulathsinhala)

Sir, if one were to examine this Budget, one would actually describe it as a maintenance Budget because there is an underlying principle in all the five Budgets presented by this Government. It is working on the principle, on the advice given to us and to most other Asian nations, that in order to get out of this economic stagnation in which we find ourselves we should look into the question of import substitution both in the agricultural and industrial sectors ; that by foreign finance we might at some stage arrive at better economic conditions and also achieve more favourable terms of trade. Now, I am not going into the question of the merits or demerits of this policy, but I think we must examine the question to see where this policy is going to take us ; whether this policy has proved a success in any of the Asian or South East Asian countries so far ; whether we can say openly and boldly that we have come out of the economic morass in which we were and that we are now living in a society that is affluent and rich.

If you actually examine this Budget more carefully, examine the real merits, the so-called achievements as enunciated by the Hon. Minister of Finance, and analyse them, you will see whether this principle has really paid.

I shall confine my remarks mainly to two or three aspects of this Budget in reference to the Hon. Minister's statement that terrific achievements have been made on the economic front. First of all I shall take the question of paddy production. We all know that certain positive steps were taken by this Government towards import substitution. Whether they were right or wrong is a different matter, but, certainly, the Government did take some steps. Now, having taken those steps very rightly, they went all out to achieve these ends. This Government strained every nerve, used the heavy propaganda machinery at its disposal and organized and used the people to achieve these ends.

After all these efforts, we would like to see what are the real achievements of this grow more food campaign. In 1964 the production of paddy amounted to 50 million bushels and in 1968 there was a yield of 64 million bushels. That is, in about five years you have increased paddy production by about 14 million bushels. That is your achievement after all these efforts; but what have you done to achieve this ? To achieve this how much did you spend on fertilizer ?

In 1961 a sum of Rs. 46.9 million was spent on imports of fertilizer. That was the foreign exchange allocation that was made in 1961—Rs. 46 million. In 1966 the foreign exchange allocation for imports of fertilizer was Rs. 91 million—almost double the amount spent in 1961. I am not sure what it was in 1967 and 1968. Fertilizer was also brought into this country

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

on commodity aid. Be that as it may, in 1966 alone so much was spent on fertilizer.

In 1966 a foreign exchange allocation of Rs. 12.98 million was made for imports of agro-chemicals into this country, and in 1967 the allocation was Rs. 13 million. In 1968 it was increased to Rs. 15.66 million.

In 1967 Rs. 40 million was set aside in the Budget for the import of tractors, agricultural implements, and tractor spares, and it was indicated in the Budget speech of 1967 that the government agents in the various administrative districts would give permits to those who wished to purchase tractors, and that it was incumbent on them, apart from harvesting their paddy fields, to harvest the fields of anybody else at a rate of Rs. 55. I do not know whether the hon. Member for Polonnaruwa (Mr. Leelaratne Wijesinghe) can say what the tractor hire rate is today, whether it is Rs. 55 or more.

රාසමානික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

Rs. 80.

මංගල මූණසිංහ මයා.
(திரு. மங்கள முனசிங்க)
(Mr. Mangala Moonesinghe)

Then, Sir, in 1964, 100 tractors were imported. Foreign exchange was allowed for the import of 100 tractors. In 1967, 1,707 tractors have been imported. That is the massive effort you have made towards this food drive. You have spent foreign exchange in this way. I am taking these figures haphazardly. Much more foreign exchange must have been spent. I am taking the figures from the Budget speeches of the Hon. Minister of Finance.

In 1967 the Hon. Minister of Finance said, " In order to push our food drive we are appointing fourteen more additional government agents in the most important administrative districts of this country. We will set up a special administration to man these kachcheries, and set aside Rs. 4 million for that purpose alone. "

This Government has given the cultivator a subsidy of 50 per cent on fertilizer purchased on cash, and a subsidy of $33.\frac{1}{3}$ per cent on fertilizer purchased on credit.

This Government has utilized the services of 345,000 school-children for the first time in this country to weed 13,600 acres in the 1965-66 Maha season alone. 84,000 school-children were engaged in transplanting and harvesting paddy. In 1966, 300,000 acres were hand-weeded by over one million school-children. Apart from engaging these children for this purpose, you can imagine, Sir, the organizational efforts that have gone into it on the part of the school teachers of the Education Department and of the transport system, not to speak of the amount of money that was spent on it. All that was done to achieve success in the food drive.

You created a new regal dynasty—a dynasty of *govi rajas* who are as weak as the crowns they wear on their heads and who are looked down upon by the people of this country. You had your massive agricultural exhibitions all over the country, from the north to the south, spending large sums of money and using your departmental officers to organize those exhibitions. You utilized the Commercial Service of the Ceylon Broadcasting Corporation to implement your food drive. I am not saying these are bad things. If you want to achieve success, certainly you must go ahead. All I am asking is, what benefits have you achieved from your food drive ?

Then, 51,000 acres are claimed to have been brought under irrigation for the first time. From 1965 to 1968 you claim to have provided better



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

irrigation facilities for 32,000 acres. New colonization schemes have been set up. Youth settlement schemes have been set up. About 80,000 acres have been granted to the private sector by the Special Leases Board for the development of those lands and to increase food production. I am not going into the amount of foreign exchange allocated to those people to import tractors, bulldozers, jeeps—that matter has been much debated in this House. The main thing is, you claim to have brought under paddy cultivation 287,000 new acres from 1965 to 1968. All these have been done for the purpose of increasing food production.

After five years, having spent so much of foreign exchange, having done all this work—I do not know, I have not worked out the amount of foreign exchange spent—you have increased production by only 15 million bushels. That is what you have achieved after all this mighty effort. If you take the earlier figures you will find that in 1958 and 1959 the production of paddy in this country was 36 million bushels. That was at a time when nobody talked about paddy production, when nobody talked about a food drive. I am not comparing the previous Government with this Government; I am only saying that your achievement is not sufficient. Without any effort by the previous Government, paddy production increased from 36 million bushels in 1959 to 50 million bushels in 1964. There was an increase of 14 million bushels of paddy without any effort at all on the part of the previous Government.

Actually, one wonders whether this effort has been worth-while after all; whether something has not gone wrong; whether your officers have worked wholeheartedly; whether you have been hoodwinked; whether your exhibitions were not bloated-up exhibitions. These are the questions we must ask. This is not your duty only; it is our duty also. It is public money that has been spent.

Look at the figures of rice imports. In 1965, 642,200 tons of rice were imported into this country. In 1968, three years later, after this massive effort of yours, you had to import 344,000 tons of rice, almost half the amount you imported in 1965. But remember, Sir, that one measure of rice had been withdrawn from the ration since then.

So, apart from giving 10 million measures of rice free every week—today you are not giving 10 million measures of rice every week—it is no achievement at all if, after all your efforts, you are still importing 300,000 tons of rice. You have not made very much headway.

Look at the hospitals. Ever since you withdraw one measure of rice from the ration, hospital patients are not given any rice for their mid-day meal or their dinner. So, where is this increased production ?

What is the price of rice today ? A measure of rice, at its lowest, costs Re. 1.25 anywhere. If there is such a massive increase in rice production as you claim, the cost of rice must come down a little. Before you withdrew one measure of rice from the ration, any person in this country could have bought two measures of rice for 50 cents. Today, one has to pay at least Re. 1.25 for a measure of rice.

Then I ask : What is the proportion of the population that produces rice in this country ? Those who produce rice—the smallholders, the men who own vast tracts of paddy land, the tenant cultivators—constitute a very small proportion of the population in this country. The ordinary man, in the rural areas or in Colombo, has to buy a measure of rice today at Re. 1.25, in spite of this increased production of rice.

The Hon. Minister went on to say that, apart from the massive strides made in the field of rice production, there has also been an increase in the rate of industrial growth; that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the industries have begun to come into satisfactory production. I concede that there has been some sort of industrial development in this country.

There was a time when our industries were languishing, when they were starved of raw materials, when the capital invested was insufficient. No doubt when you suddenly begin to feed them with foreign aid, with industrial raw materials, with massive capital investment, the rate of industrial growth will shoot up. That is a natural phenomenon.

Another matter one must consider is that most of these industries were started only a few years back. They were started about six or seven years ago by the previous Government; at that time they were nascent industries. They may have had their teething troubles, their initial problems; but year by year, as the technicians and the officers gained experience, the industries begun to bear fruit. The rate of production grew. With all the foreign aid that has been diverted into these industries, naturally there has to be a growth in industrial production.

But with all this industrial production, whether it be in the private sector or in the public sector, there has not been a full absorption of workers; there has not been a solution to the unemployment problem completely.

Take the private sector. There has been an increase in production in the private sector. Anybody would concede that. You have been able to give the private sector certain tax reductions; you have been able to give the private sector tax holidays. You removed the moratorium on certain dividends and profits so that private capital can come into this country, but I do not know whether the private capital that you expected to come in has actually come into this country.

But one thing is sure. After you fed the private industry with all this aid and the private industry started going, the private industrialists has started making money. If you will examine the private industrialists in this country—they are a very microscopic minority—you will see that they are making huge profits, they are making unconscionable profits. These profits have not come down to the workers; they have not come down to the consumer. You have not been able to control prices where the private industry is concerned. You have not been able to have your quality standards. You have talked of standards in quality but nothing has been done so far.

Sir, to be fair to the Hon. Minister of Education, he made an order on three or four occasions transferring certain teachers, but they went to their respective Members of Parliament and had their transfers cancelled. At one stage a particular M. P.—I have no reason to hide his identity—the hon. Member for Jaffna had gone right up to the Hon. Prime Minister to get the transfer of a teacher cancelled. I became very angry about it and I took up this matter with the Hon. Prime Minister. I think the hon. Member referred to a certain Colleague from the Eastern Province and obviously he was referring to me, because all these teachers were transferred to Nintavur Maha Vidyalaya. If there is political interference in the transfer of teachers to schools where they are actually required, I do not think that we can make any headway in the matter of higher education. I should have expected a leader of a political party to sympathize with the students and see that the teachers are sent to this area which does not have a sufficient number of science teachers. Instead of persuading the teachers to go and teach in those areas, to say that we are trying to win elections at the cost of transferring teachers or interfering with the education provided in Jaffna, is, to say the least, most uncharitable, because Jaffna is well served by schools and teachers.

If this attitude is persisting then I can only say this. I will insist on the Education Department selecting graduates on a regional basis. We will say that none of the vacancies in the Batticaloa schools should be filled by teachers from Jaffna ; that vacancies in Batticaloa schools should be filled by graduates from the Batticaloa District or the Amparai District ; though they may be slightly lower in grade we shall prefer to have somebody rather than have nobody at all.

In fact, the two teachers who were transferred have not reported for duty though they have been told that if they do not report they will be considered as having vacated their posts. What is this discipline ? The Government is not going to crash by serving vacation notice on two teachers if that is the only way to maintain discipline among teachers and public servants. If this does not go through I will go to the Minister with the names of three graduates from the Batticaloa District and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තාපා මයා.]

insist on their being appointed to this particular school because we have as much right to teachers as anybody else in this country. It is the first and foremost duty of the Government to send teachers wherever they are required.

Then, Sir, the hon. Member for Walapane (Mr. T. B. M. Herath) is in the habit of repeating the same thing over and over again during the course of a Budget Debate. He was talking about land alienation to capitalists. I think the then Minister of Finance, Dr. N. M. Perera, in 1964 gave a moratorium because he wanted hidden money to come out. He said, " If you declare your assets by such and such a date, I will relieve you of income tax, or you will not be penalized. " He gave that concession to enable the hoarded money to come out.

We have done it in a different way. This Government wants more and more people to produce paddy, and more and more paddy to be produced anywhere in this country. Who are the people who have been given this land—these extents of 1,000 acres and 500 acres ? They have been given to people with large financial resources. I do not know whether my hon. Friend has been to some of these farms. I have been to these lands and I think these people have done a very very creditable job of work. I think the money that they have spent on developing this land, in bringing this land under cultivation, must be running into lakhs. Who is the peasant who can spend so much money ? As a result of more money being invested on development of this land, more and more people are being employed. I went to a farm where no less than 100 people are working. They are being paid wages. They are living on the land. That is what is called economic activity. What else do you call economic activity ? The more economic activity we have the easier will be the solution to the unemployment problem. If we confine ourselves to giving two acres to a peasant it is a good thing. Even that is being done, on the one hand. While not interfering with that kind of alienation, the Government had thought it necessary to alienate large extents of land to people who have money, so that they may help in the food production effort of the Government.

I would conclude by saying that this Government has done its best under the inspiring leadership of the Hon. Prime Minister, Mr. Dudley Senanayake. No Prime Minister has walked miles and miles through muddy paddy fields. In fact, it is not the business of a Prime Minister to do that. When he came to Amparai—my good Friend will bear testimony to it thought he is in the Opposition—the Hon. Prime Minister walked two to three miles through muddy fields. Why ? Because he wanted the peasants to feel that to produce food is the noblest duty a patriotic citizen can perform today. Time and again he has paid the highest tribute to the peasants of this country. Representing as I do a rural electorate, I know that, whoever may let the Hon. Prime Minister down, the peasants and workers of this country will stand by him at the next elections.

අ. භා. 6.50

**සෙනරත් මයා.**

*(திரு. செனாரத்)*

(Mr. Senerath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්වර මගේ මිත්‍ර නිත්තවූර්හි ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු මට වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ප්‍රීති වෙනවා. නිත්තවූර්හි ගරු මන්ත්‍රීතුමාගේ කථාවට මා විශේෂ වුවමනාවකින් ඇහුම්කන් දුන්නා. එහෙත් එතුමා ප්‍රකාශ කළ සමහර දේවල් ගැන මා එකඟ වන්නේ නැහැ. එතුමාත්, මාත් නියෝජනය කරන්නේ වැඩි වශයෙන්ම ගොවියන් සිටින, වැඩියෙන් වී නිෂ්පාදනය කරන ප්‍රදේශ නිසා ඒ ප්‍රදේශ ගැන එතුමා සඳහන් කළ ඇතැම් දේ සත්‍යයයි මට කියන්නට බැහැ. වී නිෂ්පාදනය සම්බන්ධයෙනුත්, ගොවියන්ගේ ජීවන තත්ත්වය සම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බන්ධයෙනුත් එතුමා කළ ප්‍රකාශයන් ඇත්ත වශයෙන්ම හිතට එකඟව කළාද කියන එක මට සැක සහිතයි.

නින්තවූර්හි ගරු මන්ත්‍රීතුමා ට්‍රැක්ටර් ගැන සඳහන් කළා. විසිපන් දහසක් පමණ සිටින ජනපදවාසීන්ගෙන් එකම එක ජන පදවැසියකුටවත් ට්‍රැක්ටරයක් තිබෙනවා දැයි මට නම් අවිශ්වාසයි. මා නියෝජනය කරන ප්‍රදේශයේ නම් නැහැ. උන්නැහේගේ ආසනයේ තිබෙනවාදැයි මා දන්නේ නැහැ. ගොවියන්ට නොව වෙළෙන්දන්ට නම්—යමක් කමක් හරි හම්බ කරගත් ව්‍යාපාරිකයන්ටත් නම් ට්‍රැක්ටර් දහය, පහළොව නොවෙයි, විස්ස, තිහ වුවත් තිබෙන්නට පුළුවනි. කුලියට වැඩ කරන්නට ඒවා පාවිච්චි කරන බව සාමාන්‍යයෙන් කවුරුත් පාහේ දන්නා කාරණයක්. අක්කරයකට රුපියල් 90 බැගින් නැත්නම් රුපියල් 100 බැගින් ට්‍රැක්ටර් හිමියන් අය කරන බව නමුන්නාන්සේත් දන්නවා, මාත් දන්නවා. මගේ ආසනයේ ට්‍රැක්ටර් නැති වුණාම නින්තවූර් ආසනයේ ට්‍රැක්ටර් හිමියන් තමයි කුලියට වැඩ කරන්නට ට්‍රැක්ටර් යවන්නේ. සාමාන්‍යයෙන් අය කරන මුදල අක්කරයකට රුපියල් 100 ක් හැටියට සඳහන් කරන්නට පුළුවන් නමුත් ඒ ගණනත් දන් එන්ට එන්ටම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා සෑම ගොවියාටම ට්‍රැක්ටරයක් බැගින් තිබෙනවාය යන්න මා පිළිගන්නේ නැහැ. එවැනි තත්ත්වයක් මගේ ආසනයේ නම් ඇත්තේත් නැහැ. මගේ මිත්‍ර නින්තවූර් මන්ත්‍රීතුමාත් ඉඩම් හිමියෙක්. නින්තවූර් ආසනයේ ඉඩම් හිමියන්ටත්, ව්‍යාපාරිකයන්ටත්, ධනවතුන්ටත් ට්‍රැක්ටර් දහය, පහළොව පමණ තිබෙන බව මා දන්නවා. නැගෙනහිර පළාතේ තිබෙන ට්‍රැක්ටර්වලින් වැඩි හරියක්, සියේට 75 ක් පමණ තිබෙන්නේ නින්තවූර් ආසනයේත් ඒ ආසනය අසබඩ ආසනවලත් බව ගණන් හිලවුවලින් නමුන්නාන්සේ දන්නවා ඇති. මගේ ආසනයේ නම් එහෙම නැහැ. මගේ ආසනයේ තිබුණත් තිබෙන්නේ වෙළෙන්දන්, ව්‍යාපාරිකයන්, ධනපතියන් වැනි අය ළඟයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මට කියන්නට තිබෙන්නේ මෙයයි. සාමාන්‍ය ගොවියාගේ ජීවන තත්ත්වය දියුණු වෙලා තිබෙනවාය. ඔවුන්ට ට්‍රැක්ටර් තිබෙනවාය, උළු සෙවිලි කරන ලද ගෙවල් ඒ උදවියට තිබෙනවාය යනාදී දේ මේ ගරු සභාවේ කීවාට කමක් නැහැ; නමුත් ගොවියන් ඉදිරියේ නම් කරන්නට හොඳ නැහැ. ගොවියන් ඉදිරියේ එවැනි කථාවක් කළොත් මගේ මිත්‍ර නින්තවූර් මන්ත්‍රීවරයාට පාරේ බැහැලා යන්නටවත් හම්බ වෙන්නේ නැති බව මා දන්නවා.

දැන් මේ ගරු සභාවේ සාකච්ඡාවට භාජන වෙමින් තිබෙන්නේ මේ ආණ්ඩුවේ අන්තිම අයවැය කථාවයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ගමනක අවසානය.

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)
මෙය ගමනක අවසානය නොවෙයි; මේ කණ්ඩායමේ මළ බෙරයයි. මේ රටේ ජනතාව අවුරුදු පහක් බලාගෙන සිටියා. පළමුවැනි අවුරුද්දේ තමන් අපේක්ෂා කළ දේ නොලැබුණාම ඊළඟ අවුරුද්දේවත් ලැබෙනවා ඇතැයි සිතා බලාගෙන සිටියා. ඊළඟට දෙවැනි අවුරුද්දේත්, තුන්වැනි අවුරුද්දේත්, සිව් වැනි අවුරුද්දේත් ඔය ආකාරයට දැන් දැන් ලැබේයයි බලාපොරොත්තු වෙන් බලා සිටියා. පස්වැනි අවුරුද්දත් ආවා. පස්වැනි අවුරුද්දේ තමයි මේ ආණ්ඩුවේ මළ බෙරය ගසා තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනරත් මයා.]

ආණ්ඩු පක්ෂය අයවැය ලේඛනය ඉදිරිපත් කළාම එය සනාථ කිරීමට නොයෙක් නොයෙක් සංඛ්‍යා ලේඛන සහ කරුණු ඉදිරිපත් කරනවා. එවිට විරුද්ධ පාර්ශ්වය ඒවා අසත්‍යයයි කියමින් ඊට විරුද්ධව කථා කරනවා. එය සිරිතක්. ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කළ අයවැය යෝජනා ඇත්ත වශයෙන්ම හරිද කියන එක කියන්නට පුළුවන් වන්නේ විරුද්ධ පාර්ශ්වය ඉදිරිපත් කරන අදහස් සහ ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන කරුණුත් එකට සලකා බලා ඒ අනුව මධ්‍යස්ථව කල්පනා කිරීමෙන් බව පිළිගත යුතුව තිබෙනවා. මා ළඟ මේ අවස්ථාවේ සංඛ්‍යා ලේඛන කිසිවක් නැහැ. සාමාන්‍ය මිනිසකු මේ අයවැය යෝජනා දෙස බලන විධියටයි මාත් මේ අයවැය යෝජනා දෙස බලන්නේ. මා ළඟ සංඛ්‍යා ලේඛනත් නැහැ ; ඒවා මා මේ ගරු සභාවට අද ගෙනාවෙත් නැහැ ; මේ අවස්ථාවේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නට මා උත්සාහ කරන්නෙත් නැහැ.

රටේ ජීවන තත්ත්වය හොඳ නම් සාමාන්‍ය මිනිහාට ඒක තේරෙනවා. සාමාන්‍ය මිනිහාට රටේ තිබෙන තත්ත්වය දැනෙනවා. ඒ නිසා කොයි තරම් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළත්, කොයි තරම් වේගවත් ලෙස කථා කර, පුවත්පත්වල පළ කළත්, රේඩියෝවෙන් කිව්වත්, මහ බැංකුවෙන් වර්ෂයක් පාසා වාර්තා පළ කළත් වැඩක් නැහැ. වැඩක් සිදු වන්නට නම් නියම තත්ත්වය සාමාන්‍ය මිනිහාට හැඟෙන්නට ඕනෑ. ලාබෙට කන්න බොන්න තිබෙනවා නම් සාමාන්‍ය මිනිහාට ඒ බව දැනෙනවා. අද එවැනි තත්ත්වයක් තිබෙනවාද ? මහජනයා සංඛ්‍යා ලේඛන බලන්නේත් නැහැ ; ඒවායින් සෑහීමකට පත් වන්නේත් නැහැ. ඔවුන් කල්පනා කරන්නේ, කන්න බොන්න තිබෙනවාද, සල්ලිය බාගය අතේ මිටේ තිබෙනවාද, ජීවත් වීමට පහසුකම් තිබෙනවාද යන කරුණුයි. අද මේ රටේ එවැනි තත්ත්ව යක් තිබෙනවා යයි යමෙක් කියනවා නම් ඔහු කථා කරන්නේ හිතට එකඟව නොවෙයි.

මේ රජය බලයට පත් වී දැනටමත් අවුරුදු 4½ක් ගත වී තිබෙනවා. ඒ කාලය තුළ ජීවන වියදම අඩු වී තිබෙනවාද ? සංඛ්‍යා ලේඛන පැත්තක දමා හිතට එකඟව ඒ ගැන කල්පනා කරන්න. පසුගිය රජය පැවති කාලයේ තිබුණු ජීවන වියදම හා සමඟ මේ කාලයේ ජීවන වියදම සංසන්දනය කර බලන්න. සාමාන්‍ය දුප්පත් මිනිහකුට ජීවත් වන්නට තරම් පුළුවන් කමක් අද තිබෙනවාද ? මා ජීවත් වන්නේ කොහොමද ? මගේ පවුලේ ඉන්නේ තුන් දෙනයි. එනම් මාත්, මාගේ භාර්යාවත් පුංචි ළමයාත් පමණයි. මා සාමාන්‍ය විධියට ජීවත් වන කෙනෙක්. මට වතුපිටි, කුඹුරු ආදිය ඇත්තේ නැහැ. මා කඩෙන් බඩු ගන්නෙ. පොල් ගන්නෙත් කඩෙන්. මා කඩයේ පොතක් තබා තිබෙනවා. මාසය අවසානයේදී මා ගත් බඩුවලට මුදල් ගෙවනවා. මේ විධියට බඩු ගත් අවුරුදු හයක හතක පොත් මා ළඟ එකතු කර තිබෙනවා. මේ කාලය තුළ අප කන ප්‍රමාණය වැඩි වූයේ නැහැ. අප අඳින ප්‍රමාණය, අප ගන්නාවූ රෙදි ප්‍රමාණය වැඩි වුණේ නැහැ. සාමාන්‍ය වශයෙන් මේ සම්පූර්ණ කාලය තුළම එදත් අදත් අප එකම මට්ටමෙනුයි ජීවත් වී තිබෙන්නෙ. මා පාර්ලිමේන්තුවට පත් වූවාට පසු ටිකක් වියදම කපා හැරියා. වැඩිපුර වියදම් ටිකක් අඩු කළා. මේ පොත් අරගෙන සංසන්දනය කර බැලුවාම මට එක් කාරණයක් පැහැදිලිවම පෙනෙනවා. තිදෙනෙකුගෙන් යුත් අප පවුලට අවුරුදු හත අටකට උඩදී හොඳට කෑම ඇඳල ජීවත් වන්නට මසකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වියදම් වූ වැඩීම මුදල රුපියල් 150 යි. නැත්නම් රුපියල් 155 යි. අප දිනපතාම රෙදි මිළදී ගන්නේ නැහැ. ඉද හිට ඔය රෙද්දක් සරමක් බැනියමක් මිළදී ගන්නවා. අවුරුදු හත අටකට ඉහතදී අපට ජීවත්වන්නට වියදම් වූයේ එපමණයි. නමුත් පසුගිය අවුරුදු හයක හතක කාලය තුළ ඒ මුදල ක්‍රමයෙන් ඉහළ ගොස් දැන් ඒ තිදෙනාගෙන්ම යුත් අප පවුලට මාසයකට රුපියල් 350 ක් 360 ක් 375 ක් වියදම් කරන්නට සිද්ධ වී තිබෙනවා. අප කන කහ, මිරිස්, ලූනු, හාල්, පොල් ටිකට දැන් යන වියදම මසකට රුපියල් 375 යි. මේක සත්‍යයක්. මගේ ජීවිතයේම අත් දැකීමක්. මේ ගණනට මාගේ වාහනයට දමන පෙට්රල්වල ගාස්තුව ඇතුළත් වූයේ නැහැ. ඉද හිට ගන්නා සරමක් බැනියමක් ඇතුළුව සාමාන්‍ය පවුලේ ජීවිකාවට ගන්නා හාල් පොල් තුනපහ වලට යන වියදමයි මේ. සංඛ්‍යා ලේඛන පැත්තක තිබුණාවෙ.

"ඉන්ඩෙක්ස්" ගැන සමහර විට සාමාන්‍ය මහජනතාව දන්නෙත් නැහැ; අහන්නෙත් නැහැ. ඒ අනුව පසුගිය අවුරුදු හතර හමාර තුළ රටේ ජීවන තත්ත්වය එකට එකක් නැග තිබෙන බව අපට පැහැදිලිවම පෙනෙනවා නොවේද? ඒක සිතට එකඟව කල්පනා කරන සියළු දෙනාම පිළිගතයුතු කාරණයක්. පසුගිය අවුරදු හතර හමාර ඇතුළත මෙසේ ඉහළ ගිය ජීවන වියදම පහත හෙළීම සඳහා මේ ආණ්ඩුව කිසිම පියවරක් නොගත් බව අපට කෙලින්ම ප්‍රකාශ කරන්නට සිද්ධ වී තිබෙනවා. වරින් වර මේ ආණ්ඩුව ගත් පියවරවල් නිසා ජීවන තත්ත්වය තව තවත් බැරුරුම් වුණා. රුපියලේ අගය අඩු කිරීම නිසා සාමාන්‍ය මිනිසුන්ගේ ජීවන තත්ත්වය පිරිහුණා. බඩු මිළ ඉහළ ගියා. ඊළඟ අවුරුද්දේදී නමුන්නාන්සේලා විදේශීය විනිමය සම්බන්ධයෙන් අර වි. වි. හි. ස. ක්‍රමය ඇති කළා. එයින් තව තවත් බඩු මිළ ඉහළ ගියා. ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩුව ගත් සෑම පියවරකින්ම සාමාන්‍ය පොදු මිනිසාගේ එදිනෙදා ජීවිකාවට අවශ්‍ය ද්‍රව්‍යවල මිළ ඉහළ ගියා මිස කිසිම සහනයක් අත් වූයේ නැහැ. මේ රටේ මහජනතාවට ඒ කාරණය පැහැදිළි වී තිබෙනවා. එමනිසා තමයි, මහා මැතිවරණයට පෙර ඉදිරිපත් කරන ලද මේ අවසාන අයවැය ලේඛනයෙන්වත් අපට මොකක් හරි සහනයක් ලැබේවිය කියා මහජනතාව බලාපොරොත්තු වුණේ. නමුත් මහජනතාවගේ ඒ බලාපොරොත්තු සුන් වී ගියා. මේක නිකම් හිස් අයවැය ලේඛනයක් බව පෙනී ගියා. ඇත්ත වශයෙන්ම දේශපාලනඥයකු වන මමත් මේ අයවැය ලේඛනයෙන් මහජනතාවට සැහෙන සහනයක් අත්කර දේවිය කියා සිතුවා. නමුත් ඒ කිසිම දෙයක් මහජනතාවට ලැබී නැහැ. ඒ වෙනුවට මොනවාද ලැබී තිබෙන්නෙ? පිරිවැටුම් බද්ද වැඩි කර තිබෙනවා. දේශීය නිෂ්පාදනවලටත් පිරිවැටුම් බද්ද වැඩි කර තිබෙනවා. පිරිවැටුම් බද්ද වැඩි කළාම නිෂ්පාදකයා මිළ තවත් වැඩි කරනවා. නිෂ්පාදකයා මිළ වැඩි කළාම පාරිභෝගිකයා පිටයි ඒ බර වැටෙන්නෙ. පාරිභෝගිකයාට ඒ ද්‍රව්‍ය වලට තිබුණාටත් වැඩි මිළක් ගෙවන්නට සිද්ධ වෙනවා. ඒ නිසා මේ අයවැය ලේඛනය සාමාන්‍ය මහජනයාට කිසිම දෙයකින් උදව්වක් උපකාරයක් කර නැති අයවැය ලේඛනයක් වශයෙන් හඳුන්වන්න පුළුවනි. සාමාන්‍ය මහජනයාගේ ජීවන තත්ත්වය තවත් පහත් වෙන අන්දමටයි කටයුතු යෙදී තිබෙන්නෙ. ජීවත් වීමේ අමාරුව තවත් දියුණු කර තිබෙන බවයි පෙනෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනරත් මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාල් පිළිබඳ ප්‍රශ්නය ගනිමු. ඉලක්කම් පැත්තකින් තබා අපි වගාව ගැන බලමු. අපේ පළාත්වල මේ ඊයේ පෙරේදා සිට නොවෙයි, අවුරුදු 10 ක් 15 ක් තිස්සේම මේ වී ගොවිතැන කෙරෙනවා. එදා තිබුණු කුඹුරු ටික අදත් වැඩ කරනවා. ඔය වගා කටයුතු ගැන වචනයක් කතා නොකරම බැහැ. සහල් නිෂ්පාදනය මේ රටේ වැඩි වුණා නම් විවෘත වෙළඳ පොලේ සහල් මිල බහින්න ඕනෑ. අපේ ප්‍රදේශයේ දොඩම් පලදාව හටගන්නා කාලයට දොඩම් ගෙඩියක් ශත 5 කටවත් විකුණා ගන්න බැරිව කානුවල කුනු වෙවී යන තත්ත්වයට වැටෙන අවස්ථා තිබෙනවා. ඒවා විකුණා ගන්න බැරි තරම් තත්ත්වයක් ඇති වෙනවා. විවෘත වෙළඳ පොලට ඒ තරමට දොඩම් සැපයෙනවා. ඒ විධියට වී නිෂ්පාදනයත් දැන් බොහොම වැඩියි කියා කියනවා. නමුත් නිෂ්පාදනය කොතෙක් වැඩි වුණත් ඒවා විකුණා ගන්න බැරුව අහක දමන බවක් නම් අහන්න නැහැ. ක්‍රම ක්‍රමයෙන් මිල නම් ඉහළ යනවා. නිෂ්පාදනය වැඩි වෙනවා නම් ඇයි අර දොඩම්වල මිල බහින්නා වාගේ හාල්වල මිල බහින්නෙ නැත්තෙ? එන්න එන්නම මේ අවුරුදු හතර හමාර ඇතුළත මගේ ප්‍රදේශයේ නම් හාල් මිල ඉහළ යනවා. සමහර කාලවලට හාල් සේරුවක මිල රුපියල් 1.60 දක්වා ඉහළ යනවා. ගොයම් කපන පාගන කාලයට හාල් සේරුව රුපියල් 1.25 ක්, 1.30 ක් නැත්නම් 1.40 ක් පමණ වෙනවා. දැන් මේ දවස්වලත් හාල් සේරුවක් රුපියල් 1.40 ක් 1.45 ක් පමණ වෙනවා. නිෂ්පාදනය වැඩි වී තිබෙනවා නම් විවෘත වෙළඳ පොලේ හාල් සේරුවේ මිල බහින්න ඕනෑ නේද? මේ නිෂ්පාදනය කරන හාල්වලට මොකද වෙන්නෙ?

මා තමුන්නාන්සේලාට පෙන්නා දෙන්නම් මෙතෙක් නිෂ්පාදනය කළාය කියන හාල් ප්‍රමාණය. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සංඛ්‍යා ලේඛන අනුවයි මේ නිෂ්පාදනය කර තිබෙන හාල් ප්‍රමාණය ගැන මා දැන ගත්තෙ. හාල් සේරුව බැගින් මහජනතාවට බෙදා දීමට යන හාල් ප්‍රමාණයත්, ඉතිරි වෙන හාල් ප්‍රමාණයත් මේ විධියට දක්වන්න පුළුවනි. නිෂ්පාදනය කර තිබෙනවා නම් ඒවා සඟවා ගෙන සිටින්න බැහැ නේ. සඟවා ගෙන සිටියත් අවුරුදු දෙක තුනක් සඟවා ගෙන තබා ගන්න බැහැ. මාස දෙක තුනකට වඩා තබා ගන්න බැහැ, ඒවා නරක් වෙන නිසා. එහෙම නම් මේවා මහජනයාට විකුණන්න ඕනෑ. මහජනයාට ලබා ගැනීම සඳහා විවෘත වෙළඳ පොලට එන්න ඕනෑ. එහෙම නැත්නම් මේ සංඛ්‍යා ලේඛන වැරදි වෙන්න ඕනෑ. 1967-68 මාස් කන්නයේ වගා කළ අක්කර ප්‍රමාණය 9,16,175 යි. ලැබුණ වී බුසල් ප්‍රමාණය 4,35,09,000 යි 1967 යල් කන්නයට වගා කළ අක්කර ප්‍රමාණය 4,72,842 යි මේ ගණන් හිලව් සියල්ලම මා ලබා ගත්තේ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙනුයි. එහි වරදක් තිබෙනවා නම් පෙන්නා දුන්නාට කමක් නැහැ. ඊළඟට යල් කන්නයේ නිෂ්පාදනය වී බුසල් 2,10,60,000 යි. එවිට එකතුව වී බුසල් 6,45,69,000 යි. මේ 1967-68 වර්ෂයේ වී නිෂ්පාදනයයි. මේ තරම් වී බුසල් ප්‍රමාණයක් 1967-68 වර්ෂයේදී මේ රටේ නිෂ්පාදනය කර තිබෙනවා. එක් අවුරුද්දක ගණන් හිලව් අරගෙනයි මා මේ සංසන්දනය කර පෙන්වන්නෙ. එතකොට මහජනයා නිෂ්පාදනය කර තිබෙන මේ වී බුසල් ප්‍රමාණයෙන් බිත්තර වී සඳහා අක්කරයකට වී බුසල් 2 බැගින් වෙන් කරනවා. අක්කර 1 කට වී බුසල් 2 බැගින් බිත්ර වී වැය වූ ප්‍රමාණය 27,78,034 යි. එවිට පාරිභෝගිකයාට ඉතිරි වන වී බුසල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රමාණය 6,17,90,966 යි. ඔය මේ රටේ පාරිභෝගිකයාගේ පාවිච්චිය සඳහා ඉතිරි වූ වී බුසල් ප්‍රමාණයයි. පළමුවෙන් නිපද වෙන වී ප්‍රමාණය සම්පූර්ණයෙන් ගත්තා. ඒකෙන් බිත්තර වී වෙන් කළා. පාරිභෝගිකයාට ඉතිරි වූ ප්‍රමාණය බැලුවා. දැන් ඒ ප්‍රමාණය සහල්වලට හරවමු. ගොවි ජන සේවා කොමසාරිස්තුමාගේ වාර්තාවලට අනුව එක බුසලකින් සේරු 16 ක් සකස් කරන්නට පුළුවනි. එහෙත් ගණන් සෑදීමේ පහසුව තකා මා එය සේරු 15 ක් හැටියට සලකනවා. එතකොට එක සේරුවක් අඩු වෙනුයි මා සලකන්නේ. පාරිභෝගය සඳහා ඉතිරි වූ හරියෙන් ලැබුණු ප්‍රමාණය සහල් බුසල් 3,08,95,483 යි. මෙ සහල් ප්‍රමාණයට පිටරටින් ගෙන්වන සහල් ප්‍රමාණයත් එකතු කරන්නට ඕනෑ. 1968 වර්ෂය සඳහා පිටරටින් ගෙන්වන ලද සහල් ප්‍රමාණය ටොන් 364 දහසයි. එතන සහල් ප්‍රමාණය —සහල් ටොන් එකක බුසල් ප්‍රමාණය 35 යි—බුසල් 1,20,40,000යි. 1968 වර්ෂයේදී පිටරටින් ගෙන්වන ලද සහල් ප්‍රමාණය සහ මේ රටේ නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය එකතු කළ විට බුසල් 4,29,35,483 යි. මේ රටේ තිබෙන සම්පූර්ණ සහල් ප්‍රමාණයයි ඒ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සහල් පොත් කීයක් තිබෙනවාදැයි බලමු. මා එසේ බලන්නේ එම සහල් පොත් ගණනට අනුව මෙම සහල් ප්‍රමාණය බෙදිය යුතු නිසායි. 1968 ජූනි මාසයේ නිකුත් කර තිබෙන මුළු සහල් සලාක පොත් ප්‍රමාණය 1,02,03,878යි. 1968 වර්ෂයට නිකුත් කර ඇති මුළු ටෝකන් පත් වල ප්‍රමාණය 11,21,584යි. මෙම ටෝකන් පත් වතුවලට එහෙම දුන්නා. ඒ සියල්ලම එකතුව 1,13,25,462යි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුවයි, මා මේවා සකස් කළේ. සලාක පොත් එකකට සහල් සේරුව බැගින් දුන් විට ඒ සඳහා මුළු වර්ෂයකට අවශ්‍ය වන සහල් ප්‍රමාණය බුසල් 1,84,03,875යි. ඒ අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වාර්තාවල හැටියට මේ රටේ නිපදවෙන සහල් ප්‍රමාණය දැන් අපි දන්නවා. පිට රටින් ගෙන්වන සහල් ප්‍රමාණයත් අපි දන්නවා. පොත්වලට දෙන ප්‍රමාණයත් අපි දන්නවා. එසේ දෙනුලැබූ පසු ඉතිරි විය යුතු සහල් බුසල් ප්‍රමාණය 2,45,31,608 යි. මෙම සහල්වලට වුනේ කුමක්ද? මෙම සහල් මේ රට තුළ තිබෙන්නට එපායැ. මුට්ට ගහගෙන හංගාගෙන ඉන්න බැහැ. ඒවා එක්කෝ කන්නට ඕනෑ. එහෙම නැතිනම් විකුණන්නට ඕනෑ. ඉතින් මෙම ඉතිරි සහල්වලට මොකද වුණේ? විවෘත වෙළඳ පොළට මෙම සහල් ආවා නම් සහල් වල මිල අඩු වන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්කෝ මෙම නිෂ්පාදන ගණන් හිලව් වැරදියි. මේ ප්‍රමාණය නිෂ්පාදනය වී නැහැ; ගණන් හිලව් වැරදියි. එහෙම නැත්නම්, මේවා සත්‍ය නම්, වෙළඳ පොළේ තිබෙන හාල් මිල අඩු වෙන්න ඕනෑ. මහජනයාට සහල් ගැනීමට මීට වඩා පහසුකම් තිබෙන්න ඕනෑ. ඒකෙන් පෙනෙන්නෙ මේ ගණන් හිලව් වැරදි බවයි. මේවා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වාතර්ාවලින් අරගෙන තිබෙන සංඛ්‍යා. ඕනෑම කෙනෙකුට පරීක්ෂා කර බලන්න පුළුවනි. සියල්ලක්ම මා ළඟ තිබෙනවා.

සහල් ප්‍රශ්නය ජීවන වියදම පිළිබඳව ඇති මූලික ප්‍රශ්නයයි. බත ජීවන වියදමට විශෙෂ බලපෑමක් කරනවා. සාමාන්‍ය මහ ජනතාව පරිභෝග කරන මූලික ආහාරය බතයි. දැන් නොමිලේ සහල් සේරුවක් ලැබෙනවා. සහල් රාත්තල් දෙකයි. ඒකත් සෝදා පිරිසිදු කර ගත්තම ගල් වැලි ආදියට රාත්තල් බාගයක් පමණ ඉවත ගොස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනරත් මයා.]

ඉතුරු වන්නේ රාත්තල් එකහමාරයි. සාමාන්‍ය මිනිහාට වේල් දෙකක් කන්න මදි. විවෘත වෙළඳ පොළෙන් අඩුම ගණනේ සහල් සේරු තුන හතරක් පමණ ගන්න ඕනෑ. දැනට මගේ ආසනයේ සහල් සේරුවක් රු. 1.25 සිට 1.60 අතරතුර මිලකයි පවතින්නෙ. මා 1.25යි කිව්වත් වැරදියි, 1.60 කිව්වත් වැරදියි, වී නිෂ්පාදනය වන කාලෙට රු. 1.25යි. එතැන් සිට නැවත වී නිෂ්පාදනය සිදු වනතුරු 1.40, 1.50, 1.60 දක්වා එහා මෙහා වෙනවා.

වගාව කියන එක ඇත්ත වශයෙන්ම රටට අවශ්‍ය දෙයක් බව අපි පිළිගන්නවා. නියම ආකාරයෙන් එය කරනවා නම් ඒ ගැන කවුරුවත් විරුද්ධ වෙන්නෙ නැහැ. එහෙත් බොරු සංඛ්‍යා ලේඛන පෙන්වා ජනතාව මුළා කිරීමට තැත් කිරීම වැරදියි. කෙසේ වෙතත් එයින් මහජනතාව රැවටෙන්නෙ නැහැ. ඒ කියන අයමයි, ආණ්ඩුවමයි, ඒවායින් රැවටෙන්නෙ. ආණ්ඩුව කියන විධියට වැඩියෙන් වී නිෂ්පාදනය වෙනවා නම් වැඩිවැඩියෙන් මහජනයාට ගැනීමට ඒවා තිබෙන්න ඕනෑ. අනික් කාරණය නිෂ්පාදනය වැඩි වී තිබෙනවා නම් මා අහනවා ඇයි අනික් සහල් සේරුව දෙන්න බැරි කියා. කපාපු සහල් සේරුව දෙන්න බැරි ඇයි? ආරෝග්‍යශාලාවල ලෙඩුන්ට බත් වේල දෙන්න බැරි ඇයි? නිෂ්පාදනය වැඩි වී තිබෙනවා නම් ඇයි පිටරටින් සහල් වැඩිපුර ගෙන්වීමට යෝජනා කර තිබෙන්නෙ? ඇයි වැඩිපුර ගෙන්වා තිබෙන්නෙ? සහල් සේරුවක් කපා දැම්මා නම් පිටරටින් ගෙන්වන සහල් ප්‍රමාණය අඩුම ගණනේ සියයට 50කින් කපා දමන්න ඕනෑ. ඒකත් සිද්ධ වී නැහැ. ඔන්න ඔය ප්‍රශ්න ගැන කල්පනා කර බලන විට තමුන්නාන්සේලාගේ වගා ව්‍යාපාරය සාර්ථකයි කියා අපට සෑහීමට පත් වෙන්නට බැහැ. වගාව පිළිබඳව අරහෙ මෙහෙ කලබගෑනියක් ඝෝෂාවක් තිබෙන එක ඇත්ත. තමුන්නාන්සේලා නියරවල බඩගාමින් මඩ හාගන්න එක ඇත්තයි. නමුත් එයින් වගාව දියුණු වෙනවාද? දියුණු වෙන්නෙ නැහැ. නියරවල බඩ ගෑමෙන් වගාව දියුණු වෙනවා නම් කවුරුත් නියරවල බඩ ගාවි.

මම දන්නවා අපේ ප්‍රදේශයේ ගොවීන්ට වතුර නැතුව විශාල අමාරුවකට පත් වී සිටින බව. වැව් ඉවුරු කැඩී බිඳී ගොස් ඒවා හරි ගස්සාගන්නට බැරුව ඔවුන් ළත වෙනවා. අන්න ඒවයි සකස් කර දිය යුත්තෙ. විස්තර පිළිබඳව කරුණු දැක්වීමට මෙය අවස්ථාව නොවෙයි. කාරක සභා අවස්ථාවේදී ඒ ගැන කරුණු ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

විවිධිස ක්‍රමයෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණේ මොකක්ද? විදේශ විනිමය කළු කඩේට විකුණා ආණ්ඩුවේ අයවැය පරතරය පියවා ගන්න ගමන්ම හැකි තරම් මේ රටට බඩු ගෙන්වා ගොඩ කර ගන්නටයි. එහෙත් එය සිදු වුණේ නැහැ. ඕ. ජී. එල්. ක්‍රමය යටතේ වෙළෙන් දන්ට ඕනෑ හැටියට බඩු ගෙන්වන්න තමුන්නාන්සේලා ඉඩ දුන්නා. ඔවුන් ගෙන්වූ බඩු මොනවාද? වෙනත් රටවල මිනිසුන් ඇඳලා වීසි කළ පරණ රෙදි කෝටි විශාල තොගයක් ගෙන්වා තිබෙනවා. ඒවා නොවෙයි අපේ රටට අවශ්‍ය. තවත් නොයෙක් "ෆැන්සි" බඩු ගෙන්වා තිබෙනවා. කූපනයට මේ රජයෙන් දෙන්නේ රෙදි යාර දෙක බව කවුරුනුත් දන්නවා. මේ රටේ මිනිසුන් අඳින්න නැතිව කන්න නැතිව සිටියදී, අවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වීමට විදේශ විනිමය නැතැයි රජයේ උදවිය තර්ක කරද්දී, වෙනත් රටවල අය ඇඳලා ඉවත දැමූ පරණ රෙදි මෙහි ගෙන්වන්නට ඉඩ දෙන්නේ ඇයි? තවත් නොයෙක් "ෆැන්සි" බඩු ගෙන්වා එකට එකක් නොව එකට දෙක තුන ලාභ ගන්නට වෙළෙන්දන්ට ඉඩ දෙන්නේ ඇයි? මේ රටට අවශ්‍ය බඩු ගෙන්වීම තමුන්නාන්සේලාගේ විදේශ විනිමය සහතික පත් ක්‍රමය නිසා ඇණහිටියා. ඒ සමගම, එයින් ආණ්ඩුව බලාපොරොත්තු වුණු ආදායම ලැබුණෙත් නැහැ. "පික්ස් රේට්" එක සියයට 45 සිට 55 දක්වාද කොහේදෝ වැඩි කර තිබෙන්නේ ඒ නිසයි. මා හිතන හැටියට ක්‍රමයෙන් එය තව තවත් නගගන්න ඉඩ ඇත්තේ. අන්තිමේදී සියයට සියය දක්වාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නග්ගයි. එවිට මහජනතාවට හුස්ම ගන්නවත් පුළුවන් වන්නේ නැහැ. මේ රජයේ ආර්ථික ක්‍රමය සම්පූර්ණයෙන්ම අඩාළ වුණේ රජයේ ආර්ථික විශේෂඥයන්ගේ උපදෙස් අනුව ඇති කරන ලද පික්ස් ක්‍රමයත් රුපියලේ මිළ අඩු කිරීමත් නිසයි. අන්තිමේදී මේ ආණ්ඩුවේ මළගම වන්නේත් ඒ දෙකමයි.

රැකීරක්ෂා හිගය ගැනත් යමක් නොකියාම බෑ. විශේෂයෙන්ම උගතුන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන සඳහන් කළ යුතුමයි. විශ්ව විද්‍යාලවලින් උපාධි ලැබූ කී දාහක් අද රක්ෂා නැතිව සිටිනවාද? 14 දාහයි. පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත්ව පාසල්වලින් අස් වූ ලක්ෂ කීපයක් රක්‍ෂා නැතිව සිටිනවා. මේ අයගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ඔවුන්ගේ මිනිස් ශ්‍රමය මේ රටේ දියුණුව සඳහා යොදා ගැනීමට කිසිම වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව විසින් යොදා නැහැ. "ඔන්න රක්ෂා දෙනවා, මෙන්න රක්ෂා දෙනවා" කියමින් මේ රජය උගත් තරුණයන්ට නොයෙක් පොරොන්දු නම් දෙනවා. ඔවැනි දේවල් කුමන රජයකින් කීවත් අද තරුණයන් ඒවාට රැවටෙන්නේ නැහැ. මේ ප්‍රශ්න විසඳෙන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි සැලැස්මක් තරුණයන්ට පෙන්විය යුතුයි. ඉස්සර මිනිසුන් වචනවලට රැවටුණත්, මුළා වුණත්, අද ඒ විධියේ තත්ත්වයක් නැහැ. අද මිනිසුන් දේශපාලනය අතින් හුඟක් දියුණුයි. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට මෙතෙක් කල් මේ ආණ්ඩුව ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් සකස් කොට නැති නිසා මහජනතාව රජය කෙරෙහි කලකිරී සිටින බව මා ප්‍රකාශ කරනවා.

මට නියමිත කාල වේලාව අවසාන නිසා මා මීට වඩා කථා කරන්නේ නැහැ. මෙය මේ රජයේ අන්තිම අයවැය කථාවයි. මැතිවරණයක් ළඟ එන නිසාවත් මේ ආණ්ඩුවෙන් යමක් ලැබේයයි මහජනතාව බලාපොරොත්තුවෙන් සිටියා. කිසිම සහනයක් ලැබී නැහැ. එබැවින් මීළඟ වර්ෂයේ නම් අයවැය යෝජනා ඉදිරිපත් කිරීමට අපේ වර්තමාන මුදල් ඇමතිතුමාවත් ආණ්ඩුවවත් මෙහි නොසිටින බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 7.23

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
(ගලගෙදර)
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா—கலகெதர)*
(Mr. W. M. G. T. Banda—Galagedara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන ජීවිතයේ එක වහලක් යට ඉඳගෙන දෙපිළක දේශපාලන කටයුතු කරන මා හිතවත් අම්පාරේ ගරු මන්ත්‍රීතුමාගේ (සෙනරත් මයා.) මළබෙර කථාවෙන් පසු මට කථා කරන්නට අවසථාවක් ලැබීම ගැන සන්තෝෂ වෙනවා. ජාතික රජයේ පස්වෙනි අයවැය ලේඛනය පිළිබඳ මේ විවාදයේදී විරුද්ධ පාර්ශ්වයේ කවීක මන්ත්‍රීවරුන්ගෙන් වැඩි වශයෙන්ම ප්‍රකාශ වුණේ, සංඛ්‍යා ලේඛනවල වැරදි බව හා වගා ව්‍යාපාරය දියුණු තත්ත්වයකට පත් වී නැති බවයි. අම්පාරේ ගරු මන්ත්‍රීතුමා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සංඛ්‍යාය කියා සංඛ්‍යා ලේඛන වගයක් ඉදිරිපත් කළා. මේ රටේ වගා ව්‍යාපාරය දියුණු වී තිබෙන බව ඒ සංඛ්‍යා ලේඛන අනුව එතුමාගේ කථාවෙන් එතුමා පිළිගෙන තිබෙන බව සම්පූර්ණයෙන්ම පැහැදිලියි. මේ රටේ නිකුත් කර තිබෙන හාල් පොත් සංඛ්‍යාව 1,13,25,462ක් බව එතුමා කිව්වා. ඒ අනුව හාල්පොත්වලට දිය යුතු හාල් ප්‍රමාණය බුසල් 1,84,34,075ක් බවත් කිව්වා. තවත් හාල් බුසල් 2,45,31,645 ක ඉතුරුවකුත් එතුමා පෙන්නුම් කර දුන්නා. මේ ඉතුරුවන හාල් යන්නෙ කොහාටද? ඒවාට සිදු වෙන්නේ කුමක්ද කියා එතුමා ප්‍රශ්න කළා. ඒ එක්කම එක් අයෙකුට වෙළඳපොළෙන් හාල් සේරු තුන බැගින් මිළදී ගැනීමට අවශ්‍ය වන බවත් එතුමාම කියා සිටියා. එහෙම නම්, සේරුව බැගින් බෙදා දෙන්නට හාල් බුසල් 1,84,34,075ක් වුවමනා නම්, ඉතිරිය 2,45,31,645ක් නම්—

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)
පිටරටින් ගෙනෙන හාල්——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)

පිටරට හාල් සමග එක් අයෙකුට පිට වෙළඳපොළෙන් සේරු තුනක් ලබා ගන්නට අවශ්‍ය නම් මේ සංඛ්‍යා ලේඛනවල ගණන් අඩුවෙන් වැටී තිබෙන බව එතුමා පිළිගන්නට ඕනෑ. සංඛ්‍යා ලේඛන ගැන සඳහන් කරමින් එතුමා වැරදි ආකාරයට තර්ක කිරීම ගැණයි අපි කනගාටු වෙන්නෙ. ගොවියෙකුගේ පුතෙකු හැටියට එතුමාගෙන් මා අහන්ට කැමතියි, මේ රටේ වගා ව්‍යාපාරය දියුණු නොවුණා නම් හාල් සේරුව අඩු කළායින් පසුව මුල් අවස්ථාවේදී නිදහස් වෙළඳපොළේ රු. 1.60 ට, 1.65 ට තිබුණු හාල් සේරුව දැන් රු. 1.20 ට බැස තිබෙන්නේ කොහොමද කියා. වගා ව්‍යාපාරය දියුණු නිසාද, එසේ නැත්නම් වගා ව්‍යාපාරය නොදියුණු නිසාද ? එතුමාත්, මාත්, ගොවි ජනතාවත් මේ ගැන සාකච්ඡාවක් කළොත් එතුමාත්, ගොවි ජනතාවත් පිළිගන්නවා ඇති වෙළඳ පොළේ බඩු මිළ බසින්නේ බඩු සුලභ වීම නිසා බව. අද මේ තත්ත්වය ගොවි ජනතාව පිළිගෙන අවසානයි.

පැල්මඩුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ධර්මදාස මයා.) සංඛ්‍යා ලේඛන වගයක් ඉදිරිපත් කළා. ඒ සංඛ්‍යා ලේඛන අනුව ඇති වී තිබෙනවාය කියන කනගාටුදායක තත්ත්වයක් ගැන එතුමා සඳහන් කළා. එදා වී බුසලක් විකුණා ජීවත් වුණු මිනිහාට වියදම් වුණේ රු. 11.50 ක් බවත්, අද වී බුසල් 2 ක් විකුණාවත් ඒ වියදම පිරිමසා ගන්නට මිනිහෙකුට බැරි බවත්, අද ඒතරම්ම ජීවන වියදම වැඩි වී තිබෙන බවත්, ගොවියාට කිසිම යහපතක් සිදු වී නැති බවත් එතුමා ප්‍රකාශ කළා. එතුමා මා ඉදිරියෙන්ම සිටින නිසා මා එතුමාට කියන්නට කැමතියි, "මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කර තිබෙන්නේ මැණික් ගැරීම විතරයි, තමුන්නාන්සේ ගොවිතැන් කර නැහැ" කියා. 1964 දී මේ රටේ ගොවි ජනතාව අක්කරයකින් ලබාගත් වී ප්‍රමාණය බුසල් 30 යි. දැන් එම අක්කරයෙන්ම බුසල් හැටක් ලබාගන්නවා. එහෙම නම් වැඩියෙන් ලැබෙන බුසල් තිහට කොපමණ මුදලක් ලැබෙනවාද කියා කල්පනා කර බැලුවාද? එසේ කල්පනා කර බලන්නේ නැතුව ගොවියාට යහපතක් සිදු වී නැත කියා තමුන්නාන්සේලා ප්‍රකාශ කරනවා. 1964 සංඛ්‍යා ලේඛන සහ 1968 සංඛ්‍යා ලේඛන ගෙන සසඳා බැලුවාම එකකට එකක් නිෂ්පාදන ප්‍රමාණය වැඩි වී නැද්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වය ජීවන තත්ත්වය ගැන කථා කරනවා. නමුත් උතුරුමැද පළාතේ නැතිනම් අම්පාරෙ වැනි ප්‍රදේශවල ජීවත්වන ගොවියා උදේ සිට රෑ වනතුරු දහඩිය මහන්සියෙන් කුඹුරු කොටා නිදහස් වෙළඳ පොළට සහල් ගෙනැවිත් සේරුව රු. 1.20 ගණනේ විකුණන විට හෙනගහපන් යයි කියනවා. නමුත් බුරුමයේ, සියමේ ගොවීන් නිෂ්පාදනය කරන සහල් මෙරට ජනතාවට ගෙනැවිත් දී, එම මුදලින් ඒ රටේ ගොවීන් සැප විඳින විට, විදුලි පංකා යට ජීවත් වන විට තමුන්නාන්සේලා හෙන ගහපන් යයි කියන්නේ නැහැ. තමුන්නාන්සේලා තුළ ජාත්‍යාලයක් තිබෙනවා නම්, රටට ආදරයක් තිබෙනවා නම්, ආත්ම ගරුත්වයක් තිබෙනවා නම් මේ අන්දමට කථා කරනවා දැයි අහන්න සිදු වී තිබෙනවා. එපමණක් නොවෙයි, එදා ඉන්දියාවෙන් මෙරටට ගෙන්වන ලද මිරිස් අපේ ජනතාවට කන්න සිද්ධ වුණා. නමුත් අපේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ඉන්දියාවෙන් මිරිස් ගෙන්වීම සීමා කළා. ඉන් පසුව මිරිස් රාත්තලක මිල රුපියල් හත දක්වා ඉහළ නැංගා. නමුත් උතුරු මැද පළාතේ ගොවීන්, යාපනේ ගොවීන් මිරිස් වගා කර නිදහස් වෙළඳ පොළට ගෙන ආ විට රාත්තල රු. 2.75 දක්වා පහත වැටුණා. මිරිස්වල මිල පහත වැටුණේ අප රට ගොවියා මිරිස් වගා කළ නිසා නොවෙද? එහෙම නම් මිරිස් වගා කරන්නෙ නැතැයි තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද? එදා ඉන්දියානු ගොවියා පොහොසත් කරන්න වෙහෙස ගත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්, අද අපේ රටේ ගොවියා අතට මුදල් යන විට නොයෙකුත් ගොවිතැන් ව්‍යාපාර මේ රටේ අරඹන විට අපේ රටේ ගොවියා දියුණු නැත, වගාව දියුණු වී නැතැයි ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා කියන අන්දමට දියුණුවක් නැතිනම් රුපියල් හතට තිබුණු මිරිස් රාත්තල රුපියල් දාහතරක් වෙන්න ඕනෑ නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රු. 2.75 දක්වා මිල අඩු වන්න විධියක් නැහැ නේද ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්පාරේ ගරු මන්ත්‍රීතුමා කියනවා, කූපනයකට රෙදි යාර දෙකයි දෙන්නෙ කියා. මේ විධියෙ කථා කියන්නෙ 1970 දී ඉන්න සියලු දෙනාම, 1965 ට පස්සෙ ඉපදුනු අයයයි සිතා ගෙන වෙන්න ඇති. 1965 ට පෙර ඉපදුන ජනතාවට නොවෙයි මේ අය කථා කරන්නෙ. ඇත්ත වශයෙන්ම ඒ රජය බලයේ සිටි කාලයේදී කූපනයට රෙදි යාර තුනක් දුන්නා. එහෙම යාර තුනක් දෙන විට අපි වේදිකාවක් ගානේ ගිහින් " උඩරට කාන්තාවකට ඔසරිය අඳින්න යාර හයක් ඕනෑය, නමුත් දෙන්නෙ යාර තුනයි " කියමින් අප ඒ රජයට එදා දොස් නැගුවා. අද ඒ අය අපට කියනවා. අප කූපනයකට දෙන්නෙ යාර දෙකයි කියා. කූපනයට යාර තුනක් දුන්නෙ හය මාසයකට වරක් බව ඒ අයට සමහර විට දැන් අමතකව ඇති. කූපනය අරගෙන ගිහින් එක යාරයක් ගත්තාම, ඒ කූපනය කපා ගෙන ඉතිරි යාර දෙක මැනේජර් අර ගන්නවා. එක පුද්ගලයකුට රෙදි යාර 6 බැගින් දෙන්නට කටයුතු කළේ මේ රජය බව අප ප්‍රකාශ කරන්නට ඕනෑ. මේ අය ගම්බදට ගිහින් කියනවා, දැන් දෙන්නේ රෙදි යාර දෙකය කියා. දෙකේ ඒවා තුනක් දෙනවා ; රෙදි යාර 6 ක් දෙනවා. ඒ නිසා අද උඩරට කාන්තාවට ඔසරිය අඳින්නට පුළුවන්.

දැන් ට්‍රැක්ටර්වලට කුලිය වශයෙන් රුපියල් සිය ගණනක් අය කරනවාය කියා අම්පාරේ මන්ත්‍රීතුමා (සෙනරත් මයා.) කිව්වා. 1964 දී මේ රටට ට්‍රැක්ටර් සියයක් ගෙන්නුවා නම් මේ රජය බලයට පත් වූ පසු 1704 ක් ගෙන්වා තිබෙනවා. එසේ ට්‍රැක්ටර් 1704 ක් නොගෙන්නුවා නම් අද ට්‍රැක්ටර් කුලිය රුපියල් පන්සියයක්, හය සියයක් පමණ වෙනවා. ට්‍රැක්ටර් 1704 ක් තිබෙන විට ට්‍රැක්ටර් කුලිය රුපියල් සියයක් වෙනවා නම් ට්‍රැක්ටර් සිය ගණනක් පමණක් තිබුණා නම් කුලිය රුපියල් 500 ට 600 ට නගිනවා නේද ? තමුන්නාන්සේලා මේ කථා කරන්නේ මැරිලා ඉපදුණු මිනිසුන්වද ?

දැන් රැකීරක්ෂා ප්‍රශ්නය අහස උසට නැග තිබෙනවාය කියා තමුන්නාන්සේලා කියනවා. 1964 වර්ෂයේදී රැකීරක්ෂා නැති අය වශයෙන් ලියාපදිංචි වූ සංඛ්‍යාව 1,65,000 යි. 1968 දී 2,76,000 යි. එහෙමනම් 1965 ට පසු ඉපදුණු මිනිසුන්ද ලියාපදිංචි වී තිබෙන්නේ ? ඊට කලින් සිටි මිනිසුන් නොවෙයිද රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී සිටින්නේ ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැකීරක්ෂා කාර්යාලයක ලියාපදිංචි වීමට පවා මේ රටේ වැඩි කොටසකට ඒ කාලයේ අවස්ථාව තිබුනේ නැහැ. මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් වුණත් මේ රටේ ජීවත්වන දුගී ජනතාවට ඒ කාලයේ රැකීරක්ෂා කාර්යාලයකට ගොස් ලියාපදිංචි වී රක්ෂාවක් ලබා ගැනීමේ අයිතිවාසිකම තිබුනේ නැහැ. එදා මහනුවර දිස්ත්‍රික්කයටම තිබුණේ මහනුවර මහාලේකම් කාර්යාලයේ තිබෙන රැකීරක්ෂා කාර්යාලය පමණයි. අද මහනුවර දිස්ත්‍රික්කයේ රැකීරක්ෂා කාර්යාල 12 ක් තිබෙන බව මා කියන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික රජයේ 5 වැනි අය වැය ලේඛනයයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. පසුගිය රජයේ යම්කිසි සැලැස්මක් අනුව අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට පුළුවන් පිටකොන්දක් ඇති මුදල් ඇමතිවරු සිටියේ නැහැ. ඒ අතින් අපේ ගරු වන්නිනායක මුදල් ඇමතිතුමා මේ රටේ ඉතිහාසයක් තැබුවා.එතුමා යම්කිසි සැලැස්මක් අනුව පරිච්ඡේද 5 කට තමාගේ අය වැය ලේඛන ඉදිරිපත් කළා. එක එක අවුරුද්දට එක එක පරිච්ඡේදය බැගින් ඉදිරිපත් කරන ලද එතුමාගේ අය වැය ලේඛනමාලාවේ 5 වන අය වැය ලේඛනයත් මේ ගරු සභාවේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේලා අපි එගොඩ මෙගොඩ සිට මොන විධියට පුරසාරම් කථා කීවත්, මොන විධියට විවාද කළත් මේ රටේ ජීවත් වන පොදු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඒ අයට සේවය කිරීම මහජන නියෝජිතයන් වශයෙන් අපේ යුතුකමක් බව අප කල්පනා කරන්නට ඕනෑ. මේ රටේ අනාගත සුභසිද්ධියට අවශ්‍ය වැඩ පිළිවෙළ අප සකස් කරන්නට ඕනෑ. මේ රටේ ජනතාව අද කාලා හෙට මැරෙන්නට සිටින කොටසක් හැටියට මේ රජය කල්පනා කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.]

එදා තිබුණු වී නිෂ්පාදනය අද දෙගුණයක් වී තිබෙන බව ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා ලේඛනවලින් තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා ඇති. එසේ නිෂ්පාදනය කරන වී වලින්, මහජනයා අතර බෙදා දෙන සහල් සඳහා යම් කිසි ප්‍රමාණයක් හැරුණාම තවත් එක්තරා ප්‍රමාණයක් ස්ථිරවම වී වශයෙන් තබා ගන්නට ඕනෑ. අම්පාරේ ගරු මන්ත්‍රීතුමා (සෙනරත් මයා.) වී සහ දොඩම් එක හැටියට සලකා සංසන්දනය කර කථා කළා. වී පිදිලා සුමානයකින් ගත්තොත් දොඩම් වගේ කුණු වන බව එසේ සංසන්දනය කළ ඒ ගරු මන්ත්‍රීතුමාට මා කියන්නට ඕනෑ. එහෙත් වී පැහුනොත් අවුරුදු ගණනක් තබා ගන්නට පුළුවන්. දොඩනුයි වී යි තෝරා ගන්නට බැරි මන්ත්‍රීවරු මේ විධියට කථා කිරීම ගැන අපි කණගාටු වෙන්නට ඕනෑ. දොඩනුයි වී යි අතර යම් කිසි වෙනසක් තිබෙන බව කවුරුත් පිළිගන්නට ඕනෑ.

ඒ සමගම තවත් කරුණක් මා කියන්නට ඕනෑ. අද මේ රටේ යම්කිසි දියුණුවක් තිබෙනවාද නැද්ද කියන එක ගැන 1965ට පෙර මේ රටේ ජීවත්වූ ජනතාව කල්පනාකාර බැලුවොත් මංමාවත්, ආරෝග්‍යශාලා, පාසැල් ගොඩනැගිලි, පාළම් ආදී මහජන හිත සුව පිණිසත් රටේ අනාගත දියුණුව පිණිසත් හේතු වන යම්කිසි වැඩ කොටසක් කෙරී තිබෙනවාද නැද්ද යන්න මනාව අවබෝධ වේවි. තම තමන්ගේ හදවත්වලට තට්ටු කර බැලුවොත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු වුණත් අවිවාදයෙන් පිළිගන්නවා ඇති මේ රට දියුණු කිරීම සඳහා ස්ථිර අඩිතාලමක් දමා තිබෙන බව.

මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) කිව්වා අද අඹන්ගඟ දිගේ මහවැලි ගඟේ වතුර අනුරාධපුරයට යනවා කියා. එතුමා ඉපදී තිබෙන්නේ ලංකාවේ නොවේද කියා මා අහනවා. එතුමා වෙන කොහෙදෝ ඉඳලයි මිහින්තලේ පදිංචියට ඇවිත් තිබෙන්නේ. ලංකාවේ උපන්නා නම් අඹන් ගඟේ ඇල අනුරාධපුරයට යනවාය කියාවියැ. එහෙත් මා කියනවා අඹන් ගඟේ අත්තක් ඇල හැර මැදින් ගිරිතලේ හරහා මින්නේරියට යනවාය කියා. මා මිහින්තලේ මන්ත්‍රීතුමාට කියනවා ඇල හැරට ගොස් බලන්න ඒ ඇල ගිරිතලේටද වෙන කොහාටවත්ද යන්නේ කියා. මහවැලි ගඟේ වතුර එවා මිහින්තලේ මන්ත්‍රීතුමාත් සමග තවත් කීපදෙනෙක් ම වතුරට ගසාගෙන යන්නට මහවැලි ගඟ යෝජනා ක්‍රමයේ වැඩ මේ මාසයේම පටන් ගෙන ඒ වතුර ඉක්මනින් අනුරාධපුරයට එවන බව මා මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාට කියනවා.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කියනවා අපි රථ වාහන ගෙන්නුවාය ජීප් ගෙන්නුවාය කියා. හොඳයි ජීප් ගත්තේ අපි පමණක් ද? අනුරාධපුරේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) ගත්තේ නැද්ද? අම්පාරේ ගරු මන්ත්‍රීතුමා ගත්තේ නැද්ද? අම්පාරේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා එතුමාට කුඹුරු අක්කර කාලක්වත් නැත කියා. එහෙනම් ඒ මන්ත්‍රීතුමා ජීප් එකක් අර ගෙන තිබෙන්නේ ආණ්ඩුව රවටා බොරු සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලයි. ඒ නිසා ඒ ජීප් එක වහාම ආපසු ගන්නය කියා මා ගරු මුදල් ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සිටින ගොවි ජනතාව වෙනුවෙන් යම් වැඩ කොටසක් කළ යුතුව තිබෙනවා නම් ඒ මොනවාද? ඔවුන්ට සැපවත් ජීවිත ගත කිරීමට හැකි වන අන්දමට මහා මාර්ග අංශය, රථවාහන අංශය, වෛද්‍ය අංශය, අධ්‍යාපන අංශය ආදී වූ සෑම අංශයකින්ම සැපවත් ජීවිතයක් ගෙනයෑමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙන්නට ඕනෑ. මේ රජය බලයට පත් වන්නට කලින් නුවරඑළියේ වවන එළවලු ලොරියක පටවාගෙන විත් කොළඹ දී ඒවා විකුණා ලබා ගන්නා මුදලට වඩා වැඩි මුදලක් ලොරි ගාස්තු වශයෙන් ගෙවන්නට සිදු වෙනවා. ඒ තරමට රථ වාහන හිඟයක් ඒ කාලයේ තිබුණා. ඒ හිඟය මඟහැරවීම සඳහා අවශ්‍ය තරමට වාහන ගෙන්වා ගොවියා නිෂ්පාදනය කරන බඩු අඩු මුදලකට වෙළඳ පොළට ගෙන්වා ගැනීමට කටයුතු සැලැස්වීමෙන් ගොවීන්ට යහපතක් සිදු වුණාද නැද්ද කියා මේ රටේ ගොවි ජනතාව දන්නවා ඇති. මේ රජය ලොරි ගෙන්නුවා ජීප් ගෙන්නුවා ගොවියාට මොකවත් නැහැ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා වේදිකාවට නගින්නට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කල්පනා කරනවා ඇති. වේදිකාවට කථාවක් ඕනෑනම් ලියා දෙන්නම් මෙහාට එන්න. අපි තමුන්නාන්සේලා කල්පනා කළ යුත්තේ එහෙම නොවෙයි. අපි කල්පනා කළ යුත්තේ මේ රටේ ජනතාවගේ වගකිවයුතු නියෝජිතයන් වශයෙනුයි. මේ රටේ සමෘද්ධිමත් අනාගතය උදෙසා සකස් කරන ලද වැඩ පිළිවෙළේ පස් වැනි පරිච්ඡේදයයි, ගරු මුදල් ඇමතිතුමා පසුගියදා මෙම ගරු සභාවට ඉදිරිපත් කෙළේ. තවත් අවුරුද්දක් ගත වන විට මේ රටේ තවත් තිබෙන ප්‍රශ්නවලින් විශාල කොටසක් විසඳන්නට මෙම ජාතික රජයට පුළුවන් වේවි. මෙම රජය බලයට පත් වන්නට පෙර ලංකාවාසීන් සැක සහිත තත්ත්වයකිනුයි, ජීවත් වුණේ. ඉතාමත්ම අවදානම් තත්ත්වයක සිටි ජනතාවකට ස්ථිර බලාපොරොත්තු ඇති කරගත හැකි සහනදායක කාලයක් උදා වුණේ මේ ආණ්ඩුව පිහිටු වූවායින් පසුවයි. දැන් අනාගත පරම්පරාවේ සුභසිද්ධිය පිළිබඳව බලාපොරොත්තු සහගත තත්ත්වයකින් ජීවත් වන්නට මහජනතාවට පුළුවන්කම ලැබී තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අන්න, අම්පාරේ ගරු මන්ත්‍රීතුමා යනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)

තව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් එක් කෙනයි, දැන් ඉන්නේ. ඔහුත් යනතුරු කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. ජීවන වියදම වැඩි වී ඇති බව ඒ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. අද ජීවන වියදම් අංකය 129ක් බව කීවා. හොඳයි, ජීවන වියදම් අංකය 129ක් බව සලකනවාත් සමගම අද එක් පුද්ගලයකුගේ ආදායම් තත්ත්වය ගැනත් කල්පනා කර බලන්නට ඕනෑ. එදා කුඹුරු අක්කරයකින් වී බුසල් 30ක් ලබා ගත් තැනැත්තා අද වී බුසල් 60ක් ලබනවා වන්නට පුළුවනි. එහෙම නම් එක වී බුසලක් රුපියල් 14 බැගින් විකුණන විට ඔහුට වැඩියෙන් ලැබුණු වී බුසල් 30 වෙනුවෙන් ඔහුට වැඩිපුර රුපියල් 420ක් ලැබෙණවා නේද?

ජීවන අංකය වැඩි වීමට තවත් හේතුවක් තිබෙනවා. විදේශ විනිමය තිබෙනොත් තමයි, අපට පිටරටින් බඩු ගන්නට පුළුවන් වන්නේ. අපට විදේශ විනිමය ලැබෙන්නේ අපේ බඩු පිටරටට විකිණීමෙනුයි. අපේ අමු ද්‍රව්‍ය පිටරටට විකිණීමෙන් ලබා ගන්නා ලද විදේශ විනිමය යොදා එදා අප සියමෙන්, බුරුමයෙන්, චීනයෙන් හාල් ගත්තා. මේ අතර ජාත්‍යන්තර වෙළෙඳ පොළේ අපේ බඩුවල මිළ අඩු වීම නිසා අපට ලොකු අවදානම් තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වුණා. අපගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන හාල් නිෂ්පාදනය කිරීම සඳහා සරුසාර පොළොවක් අපට තිබෙනවා; වතුර තිබෙනවා. අපේ අමු ද්‍රව්‍ය ලෝක වෙළෙඳ පොළේ අඩු මිළ ගණන්වලට යන විට, අමතර මුදලක් වියදම් කොට අපේ ආහාරය මෙහිම නිපදවා ගන්නට ක්‍රියා කරද්දී බඩු මිළ සැහෙන තරමකින් වැඩි වෙනවා. බඩු නැතැයි, ගෙවල් නැතැයි, රක්ෂා නැතැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නිතරම කියනවා. එහෙත් ඒ ගරු මන්ත්‍රීවරුන්ට පාලන බලය තිබුණු කාලයේදී පටන් ගත් ව්‍යාපාරවලින් ආදායම ලැබෙන්නට පටන් ගෙන තිබෙන්නේ අවුරුදු හතකට පසුවයි. ජනසතු ව්‍යාපාරවලින්, කර්මාන්තවලින් අවුරුදු හතක් යනතුරු ආදායම් ලැබුණේ නැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඒ කර්මාන්ත නිසා තමයි, තමුන්නාන්සේලා රැකෙන්නේ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)

අප හදන කුඹුරු ටික නිසයි, තමුන්නාන්සේලාගේ දරුවන් රැකෙන්නේ. මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාගේ පොල් කෙඳි මෝලෙන් අනෙක් අයට ජීවත් වන්නට බෑ. මේ ආණ්ඩුව කර්මාන්ත වඩා කාර්යක්ෂම විධියට පවත්වාගෙන යනවා. ඒ අතර වගා ව්‍යාපාරය ඔස්සේ අප හදන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.]

කුඹුරු ටික නිසා අනාගත පරම්පරාව අපට පිං දිදී ජීවත් වන බව මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා දැන ගන්නට ඕනෑ. ඒ නිසා ගොවිතැන වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන ට්‍රැක්ටර් ගෙන්වන කොට, අවශ්‍ය ඇළවල් කපන කොට, ඒ ඇළවල්වලට වතුර සපයන වැව් ප්‍රතිසංස්කරණය කරන කොට, ගොවියන්ට අවශ්‍ය මූලික කටයුතු ටික සකස් කර දෙන කොට, ඒ අයගේ වෙනත් ප්‍රශ්න විසඳන කොට ජීවන අංකය වැඩි වන බව ඇත්තයි. එහෙත් ඒ වතුර කුඹුරුවලට ගලා ගොස්, ඒවා සශ්‍රීක වී, අස්වැන්න නෙළා ගන්නා විට ජීවන තත්ත්වයත් ඉහළ නඟිනවා; බඩත් තද වෙනවා. ඊයේ වපුළ කුඹුරේ අද වී පාගා පෙන්වන්න බැරි බව ගොවියකුගේ පුතෙක් හැටියට මෙහිදී මතක් කරන්නට කැමතියි. ජාතික රජය පටන් ගත් සත් ව්‍යාපාරයේ ප්‍රතිඵල තව අවුරුදු දෙකකින් පෙන්වන්නට පුළුවනි.

මළබෙරයක කථාවක් අම්පාරේ ගරු මන්ත්‍රීතුමා කීවා. මළ බෙර වැදීගෙන ගිහින් මේ වේලාව වන විට ඔය පැත්තේ ඉතුරු වී තිබෙන්නේ එක බෙරයක් පමණයි. අපේ වගා ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම සාර්ථක වූ දට ඒ බෙරෙන් පළුවක් යන බව කියන්නට ඕනෑ. වගා ව්‍යාපාරය කෙරෙහි යම් යම් ජනතා කොටස් අතර සැක සහිත තත්ත්වයක් මුලදී ඇති වී තිබුණා නම්, දැන් ඒ සැකයත් හොඳටම තුනී වේගෙන යනවා. වී නිෂ්පාදනය කරන අම්පාරේ හාල් සේරුවක් රුපියල් 1.45ක් වන බව අම්පාරේ ගරු මන්ත්‍රීතුමා කීවා. එහෙත් කොළඹ නම් හාල් සේරුවක් රුපියල් 1.20 ගන්න පුළුවනි. එහෙම නම් වී නිෂ්පාදනය කරන අම්පාරෙන් හාල් සේරුවක් රුපියල් 1.40 බැගින් මිළ දී ගෙනැවිත් කොළඹදී ඒවා රුපියල් 1.20 බැගින් විකුණනවා වෙන්න ඇති. දේශපාලන වේදිකාවල ඔවැනි කථා කීවත් මේ ගරු සභාවේ කීම නම් කොහෙත්ම ඔබින්නේ නැහැ.

එතුමා තවදුරටත් කීවා, මේ රජය ගෙන්වන රථ වාහන සියල්ලම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් බෙදා ගන්නවාය කියා. එහෙම නම් අම්පාරේ ගරු මන්ත්‍රීතුමා මෙන්ම, අනුරාධපුරේ ගරු මන්ත්‍රීතුමාත් (කේ. බී. රත්නායක මයා.) මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාත් (මෛත්‍රීපාල සේනානායක මයා.) ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වෙන්න ඇති.

අපේ මුදල් ඇමතිතුමා වාර්තා ගණනාවක් ඉදිරිපත් කර තිබෙන බවත් විරුද්ධ පාර්ශ්වයෙන් කියවුණා. ඔව්, අප ඒ බව පිළිගන්නවා. එහෙත් දැනට විරුද්ධ පාර්ශ්වයේ සිටින හිටපු මුදල් ඇමතිවරු ඊට වඩා ඉතිහාසගත වන වාර්තා පිහිටුවා තිබෙනවා. එවැනි එක මුදල් ඇමතිවරයෙක් තමාගේ අයවැය ලේඛනය මේ ගරු සභාවෙන් සම්මත කරගෙන සති කීපයකින් බලයෙන් තල්ලු වුණා. එහෙත් අපේ මුදල් ඇමතිතුමා නම් පස් වැනි අයවැය ලේඛනයත් ඉදිරිපත් කර ඉදිරි පෙළේ ආසනයකට වී හිනා වෙමින් ඉන්නවා. එතුමා වාර්තා පිහිටුවා ඇත්තේ නොකඩවා අවුරුදු 5ක්ම අයවැය ලේඛන ඉදිරිපත් කළ මුදල් ඇමතිවරයා වශයෙන් පමණක් නොවෙයි. පොදු මහජනතාව මත බදු බර පටවන්නේ නැතිව රයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් කෝටි 12 ක් වෙන්කිරීමෙනුත් එතුමා වාර්තාවක් පිහිටුවා තිබෙනවා. ඒ ගැන රජයේ සේවකයන් පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් පවා එතුමාට ස්තුතිවන්ත විය යුතුව තිබෙනවා.

කොයි රජයක් බලයට පත් වුණත්, යම් කිසි රජයකින් මේ රටේ දියුණුව සඳහා වැඩ පිළිවෙළක් සාර්ථක විධියට ගෙන යනවා නම්, එය හොඳ දෙයක් හැටියට පෙනෙනවා නම්, ඒ බව අවංකවම පිළිගැනීමට තරම් ආත්ම ශක්තියක් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන්නට ඕනෑ. එයින් ඔවුන්ගේ ආත්ම ගරුත්වයට කිසිම කැළලක් ඇති වන්නේ නැහැ. ආත්ම ගරුත්වයට කැළලක් වන්නේ එසේ අවංකව නොපිළිගැනීමයි. පසුගිය අවුරුදු 4½ තුළ මේ රටේ ජනතාවගේ සියලුම ප්‍රශ්න සියයට සියයකින්ම විසඳන්නට ජාතික රජයට පුළුවන් වුණා යයි මා කියන්නේ නැහැ. අවුරුදු 9ක් තුළ පසුගිය ආණ්ඩු දෙකක් විසින් ගෙන ගිය අදූරදර්ශී පාලනය නිසා වූ ආපදාවන්ගෙන් රට මුදාගෙන ගොවි කම්කරු ජනතාවගේ යහපත සඳහා මේ රජය නියම සැලැස්මක් ඇති වැඩ පිළිවෙළක් අරඹා තිබෙන බව නම් මට කියන්නට පුළුවනි. අවුරුදු නවයක පාලන කාලයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළ රජයේ සේවකයන්ට එක සතය කින්වත් පඩි වැඩි කරන්නට තමුන්නාන්සේලාට බැරි වූ බව මා මතක් කරනවා. නමුත් අපේ ආණ්ඩුව බලයට පත් වූවාට පසු දූන් රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරන්නට තීරණය කර තිබෙනවා. වැටුප් කොමිෂන් සභාවක් පත් කර අතුරු වාර්තා වක් ලබා ගත්තාට පසු වැටුප් වැඩි කිරීම ගැන සලකා බලනවාය කියා අපේ ගරු අගමැතිතුමා රජයේ සේවකයින්ට පොරොන්දුවක් දුන්නා. ඒ පොරොන්දුව මේ අයවැය ලේඛනයෙන් ඉෂ්ට කරමින් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට අප කටයුතු සලසා තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ගොවිතැන දියුණු කිරීමටත් මේ රටේ අනාගත දියුණුව උදෙසා යම් සැලැස්මක් උඩ මේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙන බවත් දූන් මහජනතාව පිළිගෙන අවසානයි. කවුරු මොනවා කිව්වත් මේ ගරු සභාවට නියෝජිත මහත්වරුන් තෝරා එවීමට මහ ජනතාවට තිබෙන වරප්‍රසාදය අප ආරක්ෂා කළ බව මහජනතාව පිළිගෙන අවසානයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය, නැත්නම්, ජන සම්මතවාදී ආණ්ඩු ක්‍රමය ආරක්ෂා කිරීමටත් එය තව දුරටත් තහවුරු කිරීමටත් මේ රජය ගත් ව්‍යායාමය මහජනතාවට අවබෝධ වී අවසානයි. යම් විධියකින් 1965 දී අද ඔය විරුද්ධ පක්ෂයේ අසුන් ගෙන සිටින සමහර මන්ත්‍රීවරුන් බලයට පැමිණියා නම් මේ රටේ ජනසම්මතවාදී ආණ්ඩුවක් ඇති වෙනවා තබා මේ කථා කරන අප ජීවතුන් අතර තබයිද කියන එක ගැනත් සැක සහිත තත්ත්වයක් තිබුණ බව මා මතක් කරනවා. එමනිසා මොන විධියේ පුරසාරම් දෙඩුවත් 1970 දී, මීළඟ මැතිවරණයේදී මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) පවා වීසිවන බව මට කියන්නට පුළුවනි. මීට වඩා දීර්ඝ වශයෙන් මා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. හද්ද පිටිසර තුම්පනේ ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වන මටත් අපේ ජාතික රජයේ පස් වන අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගි වන්නට ලැබීම ගැන මා බෙහෙවින් සතුටු වෙනවා.

අ. භා. 7.55

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.** (කල්කුඩා)

*திரு. கே. டபிள்யூ. தேவநாயகம்—கற்குடா)*

(Mr. K. W. Devanayagam—Kalkudah)

Mr. Deputy Speaker, let me at the outset congratulate the Hon. Minister of Finance on having created history in this country by introducing the fifth consecutive Budget of any Government. He has introduced it very successfully. An unassuming and simple working man, he has performed a Herculean task. When this Government came to power in 1965 it inherited a completely empty exchequer. That economic morass and financial debacle this Government has, to some extent, changed into a state of progress.

In 1956, when the S. L. F. P. Government came to power, it inherited foreign assets totalling over £ 1,000 million. Yet, the two S.L.F.P. regimes completely impoverished this country. Thereafter, it fell to the lot of the present Hon. Minister of Finance to achieve a measure of economic progress. He succeeded in doing that in spite of the fact that during the last four years the prices of one of our principal products, the one that brings us much-needed foreign exchange, have been declining, so much so that the country suffered a loss to the tune of about Rs. 530 million. In spite of this loss, the economy of this country has been so capably handled that it is in a stable position today.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1969 අගෝස්තු 16 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.

1969 ஒகஸ்ட் 16, சனிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 8 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 16th August 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී :**

" මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය ".— [ගරු වන්නිනායක].

" சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".,— [கௌரவ வன்னிநாயக்க] பிரேரணை பிரேரிக்கப்பட்டு வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

" That the House do now adjourn. "— [*The Hon. Wanninayake.*]

**ගාමිණී ජයසූරිය මයා.**
*(திரு. காமினி ஜயசூரிய)*
(Mr. Gamani Jayasuriya)

Mr. Deputy Speaker, last evening the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) raised a matter regarding the results of the last G. C. E. (Ordinary Level) Examination. I think he has got his facts mixed up and I should like, with your permission, to place on record the correct position.

The next G. C. E. (Ordinary Level) Examination is due to commence on 14.12.1969. Over three lakhs of candidates are expected to enter for this examination. It was necessary to close applications for this examination on 15th August 1969 to enable all preliminary work to be done in time. For this reason the results of the last G. C. E. (Ordinary Level) Examination had to be released as early as possible before 15th August. They were actually released on 6.8.69. The marks of approximately 2,000 candidates were not available at the time these results were released due to non-receipt of marks. However, the results of the remaining 281,000 candidates could not be withheld on this account. This procedure is not unusual as some marks have always been found to be outstanding when the results of previous examinations were released as well.

In previous years the time taken to release the results of this examination with a smaller number of candidates was approximately five months. On this occasion results have been released within 3½ months of the termination of the examination. It will be seen, therefore, that the results of this examination are not late. On the contrary, they have been released earlier than on any previous occasion. In the case of candidates who have not received complete results, supplementary results are being issued as and when they become available. It has been found that in one or two instances certain punching errors have occurred because of wrong index numbers given by candidates. These are being reviewed. This type of mistake occurs in other countries too where mass scale data have to be punched.

Schools and private candidates who have not been able to finalize their entries for the next examination owing to non-receipt of their complete results will be able to obtain an extension of time for sending in their entries. A notification to this effect is being published.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1 ට, 1969 අගෝස්තු 2 වන දින සභා සම්මතය අනුව, 1969 අගෝස්තු 16 වන සෙනසුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

அதன்படி பி. ப. 8.1க்கு, சபைஅதனது 1969 ஒகஸ்ட் 2 ஆம் தேதிய தீர்மானத்துக் கிணங்க, 1969 ஒகஸ்ட் 16, சனிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.

*Adjourned accordingly at 8.1* P.M. *until 10* A.M. *on Saturday, 16th August 1969, pursuant to the Resolution of the House of 2nd August 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org